

# මූලික වර්ණනාව.

# මූලසික වණ්ණනාව.

වස්කඩුවේ තාලරුක්ඛාරාම විහාරාධිපතිව වැඩවිසූ

මුනිවර සාසනවංසාලඞ්කාර ගණාචරිය

**වරාපිටියේ සිරි සුගතපාල තිස්සාභිධාන**

නායක මාහිමියන් වහන්සේගේ

— ශි ෂ්‍ය වූ —

කල්දේමුල්ලේ පුලිනතලාරාමාධිපති

## ආචරිය සීනාවත්තේ ගුණාලඞ්කාර තිස්ස

**ස්වාමීන් වහන්සේ විසින්**

ප්‍රතිපාදිත යි.

---

ර ත් ම ලා නේ

**ධනවත්**

## බී. ආබ්‍රහම් සිල්වා උපාසක මහතාගේ

අනුමතය පරිදි

**පී. රැක්ස් ද සිල්වා විසින්**

ප්‍රකාශිතයි.

---

**අලුත්ගම විද්‍යාවිලාස යන්ත්‍රාලයෙහි**

මු ද්‍රි ත යි.

---

**2479 - 1935.**

# සංඥපනය.

---

**වෙනෙය්‍යසඤ්ඤොහරවින්දභාණුනං**
**විසුද්ධසද්ධම්මමරීචිසඤ්චයං**
**පබුද්ධසබ්බඤ්ඤු දිවාකරං වරං**
**නමෙ මුද්ධහං නරදම්මසාරථිං**

**විනය.** ශ්‍රීමත් ශ්‍රී ඝන ශාක්‍යමුනීන්ද්‍රොත්තමයන් වහන්සේ විසින් සකල ප්‍රජාව කෙරෙහි මහාකාරුණිකත්වයෙන් වදාළ ත්‍රිවිධ කල්‍යාණතාදී පරමොදාරගුණසමන්විතවූ බුද්ධභාෂිතය ධර්මවිනයයි ද්විප්‍රකාර වේ. ඒ ද්විප්‍රකාර බුද්ධභාෂිතය අතුරෙන් කායවාචසික දුරාචාරව්‍යතික්‍රමයන් නිවාරණයෙහි පොහොසත්වූ ප්‍රඥප්තිය විනය නම් විය. විනය වනාහී ප්‍රථම සඞ්ගීතිකාරක මහාකාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ පඤ්චශතවශීගණයා විසින් තදවස්ථාවෙහි උභතො විභඞ්ග ඛන්ධක පරිවාර නාමයෙන් බෙදන ලද්දේය. පාරාජිකපාළි පාචිත්තියපාළි යී ප්‍රකට ග්‍රන්ථයෝ භික්ඛු විභඞ්ග භික්ඛුණී විභඞ්ග විසින් විධවූවෝ උභතො විභඞ්ග නාමයෙන් ද දෙවිසිඛන්ධකයින් යුත් මහාවග්ගපාළි චුල්ලවග්ගපාළි යී ප්‍රකට ග්‍රන්ථයෝ ඛන්ධක නාමයෙන් ද සොළොස් පිරිවරින් හෙබියාවූ විනය පාළිය පරිවාරනාමයෙන් ද ව්‍යවහාරප්‍රාප්තකරණ ලදහ. සූත්‍රාභිධර්ම වශයෙන් විධවූ ධර්මය වූකලී ශ්‍රාවක පාරමී ඥාණයට ද විෂය විය. තෘතීය සංගීතිකාරක **මොග්ගලිපුත්තතිස්ස** මහරහත් තෙමේ බුදුන් වදාළ මාතෘකා නය ගෙණ කථාවස්තුප්‍රකරණය වදාළ හෙයින් එය සඳුවය. විනය ප්‍රඥප්ති තොමෝ සර්වඥ බුදුවරයින්ට ම විෂය වූවකි. ඕ තොමෝ සර්වඥවරයින් විසින් ම පණවන ලද්දීය. පසේබුදුන්ට හා රහතුන්ට උත්සුකවූවත් අවිෂය මය. එසේ හෙයින් විනය ප්‍රඥප්තියෙහි විශිෂ්ටතරභාවය ප්‍රකාශ වන්නේය.

**මූලසික්ඛා.** අධිශීල අධිචිත්ත අධිප්‍රඥාවෝ මෙහි ශික්ෂා නම්වූහ. ඒ ශික්ෂාත්‍රයෙන් ප්‍රාතිමොක්ෂසංවරසංඛ්‍යාත අධිශීලය මූලශීලය වේ. තදධිශීලයවූ මූලශීලය ග්‍රන්ථනයින් හකුළුවා කියනලද හෙයින් ද උපසම්පන්නලාභී මූලාවස්ථාවෙහි පටන් භික්ෂූන් විසින් පරිහරණය කටයුතු ශික්ෂාවන් ග්‍රන්ථවශයෙන් හකුළුවා කියනලද හෙයින් ද මෙය **මූලසික්ඛා** යී ව්‍යවහෘතය. **“උපසම්පන්නස්ස සුපතිට්ඨිතභාවසාධනෙන මූලා ච සා**

**සික්ඛිතබ්බතො සික්ඛා චා ති මූලසික්ඛා"** යනු මෙහි නිරුක්ති යි. පාරාජිකනිද්දේශය සංඝාදිශෙෂනිද්දේශය නිස්සග්ගිපාචිත්තිය නිද්දේශය ශුද්ධපාචිත්තිය නිද්දේශය ප්‍රකීර්ණකනිද්දේශය වත්තාදී නිද්දේශය යි නිද්දේශෂට්කයකින් උපලක්ෂිත කොට පාළිය සංක්ෂෙප කිරීම් වශයෙන් මෙය මොනවට ගලපා තිබෙන රහ පෙණේ. ශාසනාවචර මහළු පැවිද්දන්ට ග්‍රහණ ධාරණ ප්‍රතිපත්ති විසින් නිරන්තර පරිහරණයට යොග්‍යවූ විනය ශික්ෂාවෝ මෙහි විද්‍යමානයහ. සංක්ෂෙපනයින් නිපයූ විනය ග්‍රන්ථයන් අතර මෙතරම් සංක්ෂිප්ත විනය ග්‍රන්ථයක් තව ඇතැයි කිය නොහැක. එසේ නමුත් විනය පාළියෙහි ශාකල්‍යඅර්ථසාරය උරාගැණීම මාර්ගී කොට ග්‍රන්ථනය කිරීම ග්‍රන්ථගෞරවයට හෙතුවන්නේය

**කර්තෘ හා නිර්මාණ කාලය.**

මූලුසික නම්වූ මෙම ග්‍රන්ථය අසවල් කාලයෙහි අසවල් ආචාර්යවරයා විසින් රචනා කරණ ලදැයි නිර්ණය කිරීමට උපකාරීවන කිසිම ප්‍රවෘත්තියක් මෙම ග්‍රන්ථයෙහි හෝ ග්‍රන්ථාන්තර යක නොදක්නා ලැබේ. එසේ වුවත් ශ්‍රී බුද්ධ වර්ෂ නවසිය තෙපණස් (953) වැන්නෙහි ලඞ්කා රාජ්‍ය ශ්‍රී පදප්‍රාප්ත මහානාම රජු දවස ලඞ්කාවතීර්ණවූ අනුබුද්ධ බුද්ධඝොෂ මහා ස්වාමිපාදයන් වහන්සේගේ අට්ඨුවා නිර්මාණයට සමීපකාලයෙහි විනය ධර්ම විෂයෙහි ප්‍රවීනතර බුද්ධිමත් ආචාර්යවරයෙකු විසින් ග්‍රන්ථිත බැව් රචනා විලාශයෙන් හැගේ

බුද්ධඝොෂකාලය හෝ තත් සමීපකාලය ලක්දිව පාළිග්‍රන්ථයන්ගේ නිර්මාණය ආරම්භවූ හෙයින් ඊට ග්‍රන්ථකාලය යි කීම වටී. බුද්ධඝොෂ ආචාරීන් ආදර්ශ කොට ගත් තදනන්තරික ඇතැම් ආචාර්යවරු බොහෝ ග්‍රන්ථ නිෂ්පාදනය කළෝ. අට්ඨුවා නිර්මාණයෙන් මොබෙහි රචනාකළ ග්‍රන්ථයන් අතර කුදුසික මූලුසික යන ග්‍රන්ථයෝ මූලිකවූහ. කුදුසික රචනා කළ **ධර්මශ්‍රී** ආචාර්යපාදයෝ බුද්ධඝොෂ කාලයෙන් ශතවර්ෂකාලයෙහි ජීවමානවූහයි නිකාය සංග්‍රහයෙහි දක්වෙන ඇදුරුපරපුර සලකනවිට වැටහේ. මූලුසික ද ඊට පූර්වයෙහි හෝ තත් සමයෙහි රචනා කරණලදැයි සිතීමට අවකාශ තිබේ. නමුත් මේ ග්‍රන්ථවයෙන් කවරක් පූර්වීදැයි නිගමනය කිරීමට තරම් ප්‍රවෘත්ති අවිද්‍යමානය

**පරිවාර ග්‍රන්ථ.**

මූලුසික ග්‍රන්ථයට පුරාණ අභිනව වශයෙන් ටීකා වයකි. සිඛවළඳ එහි භාවසන්නයකි. සිඛවළඳ විනිස භාවයෙහි ගැටපදයෙකි. සිඛවළඳ සිඛවළඳ විනිස යන ග්‍රන්ථයෝ මීට පසුකාලයෙහි එකම ආචාර්යවර

යෙකු විසින් නිපයන ලදැයි පිළිගතයුතුය. භාෂාවිලාශය හා ග්‍රන්ථවිලාශය ඊට ශාක්ෂි කියයි. තවද "සික්ඛාපදවලඤ්ජන" නම් ග්‍රන්ථය මූලික ග්‍රන්ථයක් හැටියට රචිත නමුත් මෙය ගුරුත්ව යෙහි ලා රචිත බැව් ග්‍රථිත විලාශයෙන් හැඟෙන හෙයින් හෙද මීට්ම පරිවාරයකැයි කිවයුතු.

**ව්‍යාඛ්‍යා.**

බුරුමරට මුද්‍රිත ව්‍යාඛ්‍යානයක් හා ලක්දිව මුද්‍රිත ව්‍යාඛ්‍යානවයක් දැයි මීට ව්‍යාඛ්‍යානත්‍රයක් ප්‍රකට වූය. තද් ව්‍යාඛ්‍යානයෝ වූකලී අපගේ මේ කෘත්‍ය විෂයෙහි සාතිශය වහල්වූ බැව් කෘතඥතා පූර්වව ප්‍රකාශ කරමු.

**මූලසික්ඛා වණ්ණනාව.**

විනය සාගරය තරණය කරන්නවුන්ට ක්ෂුද්‍ර සවර්ණ නෞකාවක් බඳුවූ මෙම මූලසික්ඛා නම් ග්‍රන්ථයට දැනට නිපදවාලූ ව්‍යාඛ්‍යානයෝ නොවියත්නට විෂය නොවන බැවිනුත් විනය හදාරණ ආධුනිකයන්ගේ මනදොළ පූරණයෙහි නොසමත්ය. එසේ හෙයින් සාමාන්‍ය ආධුනිකයන්ගේ විජානනයට ඉවහල්වනසේ මීට සවිස්තර වර්ණනාවක් සියබසින් ප්‍රතිපාදනය කළොත් මැනවයි වරාපිටියේ සුගත දස්සනාරාම විහාරාධිවාසී ආචාර්‍ය වරාපිටියේ **ධම්මපාල තිස්සාභිධාන** ස්ථවිර පාදයන් වහන්සේ විසින් සමාරාධිතවූ අපි පාළ්‍යර්ථකථාටීකා සමාශ්‍රයෙන් මෙම මූලසික්ඛා වර්ණනාව ප්‍රතිපාදනය කෙළෙමු.

**ශම්.**

මීට,

**සිනාවත්තේ ගුණාලඞ්කාරතිස්ස.**

2479

1935. අගොස්තු 20 වෙනි දින

පුලිනතලාරාම විහාරස්ථානයේ දීය.

කල්දේමුල්ල-අගුලාන.



ධනවත්

රත්මලානේ බී. ආබ්‍රහම් සිල්වා මැතිතුමා

# සූචි පත්‍රය.


ගාථාව

2 මෙථුන පාරාජිකාව
3 අදින්නාදාන ,,
4 මනුස්සවිග්ගහ ,,
5 උත්තරිමනුස්සධම්ම

**පාරාජික නිද්දේශය.**

6 සුක්කවිස්සට්ඨි සංඝාදිශේෂය
7 කායසංසග්ග ,,
8 දුට්ඨුල්ලවාචා ,,
9 අත්තකාමපාරිචරියා ,,
10 සඤ්චරිත්ත ,,
11 අමූලක ,,
12 දුතිය අමූලක ,,

**ගරුකාපත්ති නිද්දේශය.**

13 දසාහාතික්කමනචීවරනිස්සග්ගි පාචිත්තිය
14 චීවරවිප්පවාස ,,
15 පුරාණචීවරධෝවාපන ,,
16 චීවරාදාන ,,
17 චීවරවිඤ්ඤාපන ,,
18 රූපියපටිග්ගහණ ,,
19 රූපියපරිවත්තන ,,
19 කයවික්කය ,,
20 දසාහාතික්කමනපත්ත ,,
21 ඌනපඤ්චබන්ධනපත්ත,,
22 සත්තාහාතික්කමන
23 චීවරඅච්ඡින්දන
24 චීවරවායාපන
25 ලාභපරිණාමන

**නිස්සග්ගිපාචිත්තිය නිද්දේශය**

26 සම්පජානමුසාවාද සුද්ධපාචිත්තිය

ගාථාව

26 ඕමසවාද සුද්ධපාචිත්තිය
26 පෙසුඤ්ඤහරණ ,
27 පදසොධම්ම ,,
28 අනුපසම්පන්නසහසෙය්‍ය,,
29 මාතුගාමසහසෙය්‍ය ,,
29 ධම්මදෙශනා ,,
30 දුට්ඨුල්ලාරොචන ,,
31 පඨවිඛණන ,,
31 භූතගාමපාතව්‍යතා ,,
32 අජ්ඣොකාසසත්ථරණ ,,
33 විහාරසත්ථරණ ,,
34–35 සප්පාණක ,,
,, චීවරදාන ,,
,, චීවරසිබ්බන ,,
අනතිරිත්තභොජන,,
36 ආසාදනාපෙක්ඛ ,,
37 සන්නිධිභොජන ,,
37 විකාලභොජන ,,
38 පණීතභොජන ,,
38 අපටිග්ගහිතභොජන ,,
39 අචෙලකදාන ,,
39 රහොනිසජ්ජ ,,
40 සුරාමෙරයපාන ,,
40 අඞ්ගුලිපතොද ,,
40 උදකහසධම්ම ,,
41 අනාදරිය ,,
41 භිංසනක ,,
42 ජොතිසමාදහන ,,
43–44 කප්පබින්දුඅනාදාන ,,
,, චීවරාපනිධාන ,,
,, ජීවිතාවොරොපන ,,
45 දුට්ඨුල්ලපටිච්ඡාදන ,,
45 සංවිධානගමන ,,
46 පහාරදාන ,,
46 තලසත්තිකඋග්ගිරණ ,,

ගාථාව

46 චොදපන
47 කුක්කුච්චුප්පාදන
47 උපස්සුති
48 ලාභපරිණාමන
48 විකාලගාමප්පවෙසන ,,

**සුඛපාචිත්තිය නිදේශය.**

49 ගරුභණ්ඩදාන ථුල්ලච්චය
50 චීරධාරණ ,
51 සන්ථකම්ම ,,
51 වත්ථිකම්ම ,,
51 නිමිත්තච්ඡෙදන ,,
51 මනුස්සමංසඛාදන ,
52 අකප්පියචීවරධාරණ ,,
53 මංසභොජන දුක්කටය
54 යථානුපුබ්බජහන ,,
55 වච්චකුටිපවිසන ,,
55 වච්චකුටිනික්ඛමන ,,
56 වච්චකරණ ,,
56 වච්චඛිපන ,,
57 අවලෙඛන ,,
57 කඨපාත ,,
57 අධොවන ,,
57 අසොධන ,,
58 ආචමනකරණ ,,
58 පාතිමොක්ඛුද්දෙසන ,,
59 පඤ්හකථන ,,
59 පඤ්හවිස්සජ්ජන ,,
59 සජ්ඣායකරණ ,,
59 දීපජාලන ,,
59 විජ්ඣාපන ,,
60 වාරවිවරණ ,,
60 වාරථකන ,,
60 නග්ග ,
61 පරිකම්ම ,,
61 සරීරඝට්ටන ,,

ගාථාව

62 නහාණ ,,
62 උපාහණ රුහණ ,,
63 උපාහණධාරණ ,
63 ඉත්ථිඔලොකන ,,
64 උජ්ඣානසඤ්ඤිපත්ත ඔලොකන ,,
64 ආදාසොලොකන ,,
64 උච්චාසන මහාසන ,,
65 උක්ඛිත්තවන්දන ,,
65 අනුපසම්පන්නවන්දන ,,
65 නානාසංවාසකවන්දන ,,
66 දීඝාසන නිසජ්ජ ,,
67 අදීඝාසනසයන ,,
67 කුලසංගහ ,,
68 පුප්ඵකරණ ,,
68 පච්චයපරිභොග ,,
68 නිස්සයවිප්පවාස ,,
69 භෙසජ්ජකරණ ,,
69 උපොසථපවාරණ ,,
70 දිවාසෙය්‍ය ,,
71 ආමසන ,,
72 කෙසොසණ්ඨහණ ,,
72 එකතොභොජන ,,
73 එකතොසයන ,,
73 දන්තකඨඛාදන ,,
74 නච්චන ,,
74 නච්චදස්සන ,,
75 වච්චඡඩ්ඩන ,,
75 දීඝකෙසධාරණ ,,
76 නඛමට්ටකරණ ,,
76 සම්බාධලොමහරණ ,,
77 අක්කමන ,,
77 භිත්තිආමසන ,
78 පල්ලත්ථ ,,
78 චීවරදුප්පරිභොග ,,
78 අකායබන්ධගාමප්පවෙසන,,

ගාථාව
79 නාවමත ,,
79 අකප්පියසමාදාන ,,
79 සභාගාපත්තිදෙසනාරොචන,,
80 අවසන ,,
80 පටිස්සවවිසංවාදන ,,
80 වස්සච්ඡෙද ,,
81 රුක්ඛඅභිරූහණ ,,
81 අද්ධානමග්ගපටිපත්ති ,,
81 පරිස්සාවනඅදාන ,,
82 අත්තඝාත ,,
82 ඉත්ථිරූපකරණ ,,
82 චිත්තකම්ම ,,
83 භුඤ්ජනාවුට්ඨාපන ,,
83 ඔකාසඅදාන ,,
84 යානාභිරූහණ ,,
84 දවකරණ ,,
84 පරිසොපලාලන ,,
85 කායවිවරණ ,,
85 ලොකායතුග්ගහණ ,,
85 පලිතකෙසගහණ ,,
86 පෙළාභුඤ්ජන ,,
87 පත්තඨපන ,,
88 වලක ,,
88 හත්ථධොවන ,,
89 උච්ඡිට්ඨඋදකනීහරණ ,,
89 අකප්පියපත්තපරිභොග,,
90 ජීවාතිවදන ,,
90 සෙඛිය අනාදර ,,

ගාථාව
91 භණ්ඩපටිසාමන පාචිත්තිය
91 දුබ්භාසිතය

## ප්‍රකීර්ණක නිර්දේශය

92 උපජ්ඣාචෙරාදි වත්ත නය
93 පටිග්ගහණ ,,
94 චීවරාධිට්ඨාන ,,
94 චීවරපච්චුද්ධරණ ,,
95 පරික්ඛාරචොළ චීවරාධිට්ඨාන ,,
95 පරික්ඛාරචොළචීවර පච්චුද්ධරණ ,,
96 පත්තාධිට්ඨාන ,,
96 පත්තපච්චුද්ධරණ ,,
97 සචිත්තාචිත්තආපත්ති ,,
103 උපොසථපවාරණ ,,
105 චාතුද්දසීආදිනවඋපොසථ,,
106 චාතුද්දසීආදිනවපවාරණ
107 සුවිසිඋපොසථ ,,
109 ඡන්දදාන ,,
110 පාරිසුද්ධිදාන ,,
111 පවාරණාදාන ,,
112 ආපත්තිදෙසනා ,,
113 විමතිආපත්තිදෙසනා ,,
114 අධිට්ඨානුපොසථ ,,
115 පාරිසුද්ධිඋපොසථ ,,
118 පුග්ගලපවාරණ ,,
119 ගණපවාරණ ,,
123 සංඝපවාරණ ,,

## වත්තාදිනිර්දේශය.



මුනිවර ශාසනවංශාලංකාර ගණාචාරිය
වගපිටියේ
සිරි සුගතපාලතිස්සාභිධාන
නායකමාහිමියානන්වහන්සේ

# මූලසික්ඛා වණ්ණනාව.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

මහාකාරුණිකං නාථං ඤෙය්‍යසාගරපාරගුං
භවාභවකරං ධම්මං සංඝං චාපි නිරඞ්ගණං
ගරූනං පපදෙ මය්හං වන්දිත්වා වන්දනාරහං
පාළිඅට්ඨකථාටීකා නයං තදනුලොමිකං
නිස්සාය සංඛිපිත්වාන මූලසික්ඛාය වණ්ණනං
වක්ඛාමි නිජභාසාය සික්ඛිතුං බ්‍රහ්මචාරිනං.

ශ්‍රීඝන ශාසනභාරධාරණයෙහි මූලප්‍රතිෂ්ඨාවූ "**මූලසික්ඛා**"භිධාන එතද් ග්‍රන්ථසමාරබ්ධ ආචාර්‍ය්‍යපාදයෝ නිර්විඝ්නපරිසමාප්තියට කාරණාවූ ඉෂ්ටදෙවතා ප්‍රණාමය හා සංඥාදී අර්ථ පඤ්චකය ප්‍රකාශ කරණු සඳහා "**නත්වා නාථං**" යනාදිය ග්‍රන්ථමුඛ කොට ප්‍රකාශ කළෝ.

1 **නත්වා නාථං පවක්ඛාමි මූලසික්ඛං සමාසතො**
**භික්ඛුනා නවකෙනාදෙ මූලභාසාය සික්ඛිතුං**

නාථං, ත්‍රිවිධ සත්ත්වලොකයාගේ ඇදහිමට ස්ථානවූ සම්‍යග් සම්බුද්ධයන් වහන්සේ; නත්වා, කාය වාග් මනො චාරත්‍රයෙන් සකසා වැඳ; ආදෙ, උපසම්පදාවූ ක්ෂණයෙහි පටන්; නවකෙන භික්ඛුනා, අළුත මහළු පැවිදි ලත් භික්ෂුවට; සික්ඛිතුං, හික්මී (උගෙණී)ම පිණිස; මූලසික්ඛං, මූලශික්ෂා නම්වූ ප්‍රකරණය; මූලභාසාය, මූලභාෂා නම්වූ මාගධී භාෂාවෙන්; සමාසතො; සැකෙවින්; පවක්ඛාමි, ප්‍රකාශකොට කියමි.

එහි "නත්වා නාථං" යනුවෙන් ප්‍රණාමය හා ප්‍රණාමාභිධෙය ප්‍රකාශ කළහ. "**මූලසික්ඛං**" යන්නෙන් සංඥාව ද "**සික්ඛිතුං**" යන්නෙන් නිමිත්ත හා ප්‍රයෝජනය ද "**පවක්ඛාමි**" යන භවිෂ්‍යන්ති විභක්ති කර්තෘකාරක පරස්මෛපද උත්තමපුරුෂෛක වචනයෙන් කර්තෘ ද "**සමාසතො**" යන්නෙන් ප්‍රමාණය ද දක්වූහ.

එයින් කීහ.

> සඞ්ඛ්‍යා නිමිත්තං කත්තාරං පරිමාණං පයොජනං
> සබ්බාගමස්ස පුබ්බෙව වත්තබ්බං වත්තුමිච්ඡතා'යි

### සංලක්ෂ්‍යඃ:– 1 නාථං

යාචන උපතාප ඉස්සරිය ආසිංසන යන මොවුහු නාථාඞ්ග වෙති. වෛනෙයජනයන්ට හිත සැප පැතීම යාචන නම්. වෛනෙයජනයන් කෙරෙහි විද්‍යමාන කෙලෙස් තැවීම උපතාප නම්. හැමසතුන් මැඩලීම ඉස්සරිය නම්. හැමසතුන් කෙරෙහි ඉටු පැතීම ආසිංසන නම්. මෙසේ චතුර්විධ නාථාඞ්ගයෙන් සමන්විත හෙයින් භාග්‍යවතුන් වහන්සේ නාථ නම් වනසේක.

### සං:– 2 මූලසික්ඛං.

අධිශීල අධිචිත්ත අධිප්‍රඥාවෝ මෙහි ශික්ෂා නම් වෙත්. එයින් ප්‍රාතිමොක්ෂ සංවරසංඛ්‍යාතමූලශීලය මෙහි අධිශීල නම් වේ. ග්‍රන්ථ වශයෙන් හකුළුවා කියනලද හෙයින් ඒ අධිශීලවූ මූලශීලය ප්‍රකාශවත ග්‍රන්ථය ද මූලශික්ෂා යි කියන ලදී.

ටීකාවෙහි.

“මූලසික්ඛා ති අධිසීල අධිචිත්ත අධිපඤ්ඤාවසෙන තිස්සොපි සික්ඛා ගන්ථවසෙනෙත්ථ සංඛිපිත්වා වුත්තත්තා තදීපනො ගන්ථො මූලසික්ඛාති වුච්චති උපසම්පන්නස්ස සුප්පතිට්ඨිත භාවසාධනෙන මූලා ච සා සික්ඛිතබ්බතො සික්ඛාචාති මූලසික්ඛා, තත්ථ කතමං සීලං, කතමං අධිසීලං, කතමං චිත්තං, කතමං අධිචිත්තං, කතමා පඤ්ඤා, කතමා අධිපඤ්ඤාති වුච්චතෙ. පඤ්චංග අට්ඨංග දසංග සීලං තාව සීලමෙව පාතිමොක්ඛසංවරසීලම්පන අධිසීලන්ති වුච්චති. තඤ්හි සුරියො විය පජ්ජොතානං සිනෙරු විය පබ්බතානං සබ්බලොකියසීලානං අධිකඤ්චෙව උත්තමඤ්ච පාතිමොක්ඛසංවරතොපි ච මග්ගඵලසම්පයුත්තමෙව සීලං අධිසීලං, තං පන ඉධ අනධිප්පෙතං නහි තං සික්ඛන්තො මෙථුනං ධම්මං පටිසෙවති, කාමාවචරානි පන අට්ඨකුසලචිත්තානි ලොකිය අට්ඨසමාපත්ති චිත්තානි ච එකජ්ඣං කත්වා චිත්තමෙව විපස්සනාපාදකං අට්ඨ සමාපත්තිචිත්තම්පන අධිචිත්තන්ති වුච්චති, තඤ්හි සබ්බලොකිය චිත්තානං අධිකඤ්චෙව උත්තමඤ්ච නතොපි මග්ගඵලචිත්තමෙව අධිචිත්තං තං පන ඉධ අනධිප්පෙතං නහි තං සික්ඛන්තො මෙථුනං ධම්මං පතිසෙවති, අත්ථි දින්නං අත්ථි ඉට්ඨන්ති ආදිනයප්ප

චත්තං කම්මස්සකතාඤාණං පඤ්ඤා තිලක්ඛණපරිච්ඡෙදකං පන විපස්සනාඤාණං අධිපඤ්ඤාති වුච්චති. සා හි ලොකියපඤ්ඤාණං අධිකා එව උත්තමා ච තතො පි ච මග්ගඵලපඤ්ඤා ච අධිපඤ්ඤා, සා පන ඉධ අනධිප්පෙතා. නහි තං සික්ඛන්තො මෙථුනං ධම්මං පටිසෙවති. තාසු තීසු අධිසීලසික්ඛා චාරිත්තවසෙන දුවිධම්පි සීලං යථානුසිට්ඨං පටිපජ්ජමානෙන තප්පටිපක්ඛෙ කිලෙසෙ තදඞ්ගප්පහාණවසෙන පජහන්තෙන සික්ඛිතබ්බා අධිචිත්තසික්ඛා, යථා වුත්තෙසු ආරම්මණෙසු අභියොගවසෙන ඣානපටිපක්ඛානං නීවරණ ගණානං වික්ඛම්භනප්පහාණං කුරුමානෙන සික්ඛිතබ්බා; අධිපඤ්ඤා සික්ඛා පන යථානුරූපතදඞ්ගප්පහාණ සමුච්ඡෙදවසෙනසානුසයෙ කිලෙසෙ සමුච්ඡින්දන්තෙන සික්ඛිතබ්බා, තස්මා සුප්පතිට්ඨිත භාවසාධනට්ඨෙන මූලා ච සා සික්ඛිතබ්බතො සික්ඛා චාති මූලසික්ඛා ති.

### සං :- 3 **නවකෙන භික්ඛුනා.**

මෙහි කර්ත්‍රාර්ථ තෘතීයා යි.

යමෙක් තෙමේ අකොප්‍යවූ ස්ථානාර්හවූ ඥප්තිය සතරවෙනි කොට ඇති උපසම්පදාකර්මයෙන් උපසම්පන්නවූයේ ද හෙතෙම මෙහි භික්ෂුව වශයෙන් අදහස් කරණ ලදී.

කඞ්ඛාවිතරණීයෙහි

“යො ඉමිනා එවං අකුප්පෙන ඨානාරහෙන ඤත්තිචතුත්ථෙන උපසම්පදාකම්මෙන උපසම්පන්නො අයං ඉධ භික්ඛූති අධිප්පෙතො”යි.

යම් භික්ෂුවක් පස්වස් නො ඉක්මවූයේ උනුපස්වස් ඇතියේ නවක නම්. “ඌන පඤ්චවස්සතාය නවකො‘යි ටීකාවෙහි දැක්වේ.

### සං :- 4 **සික්ඛිතුං.**

“සික්ඛිතුන්ති උග්ගණ්හිතුං”යි ටීකාවෙහි දැක්වෙන හෙයින් “සික්ඛ විජ්ජොපාදනෙ” යන ධාතුවෙන් නිපන් බැව් දතයුතු.

---

**4 සන්නිමිත්තං පවෙසෙන්තො භික්ඛු මග්ගත්තයෙ චුතො පවෙසන ඨිතුද්ධාර පච්ඡෙ චෙපි සාදියං**

සන්නිමිත්තං, තමා අයත් අංගජාතය; මග්ගත්තයෙ, (මුඛමල පස්සාව සංඛ්‍යාත) මාර්ගත්‍රයෙහි; පවෙසෙන්තො, ප්‍රවෙශකරන්නාවූ; භික්ඛු, මහණ තෙමේ; චුතො, (භාග්‍යවත්හුගේ ශාසනයෙන්) පැරද ගියේ (හවෙ, වන්නේයි.)

නොහොත් (යො) භික්ඛු, යම් මහණෙක්තෙම; මග්ගත්තයෙ, මාර්ගත්‍රයෙහි; සකනිමිත්තං, ස්වකීය අංගජාතය; පවෙසන්තො, ප්‍රවෙශකරණුයේ; (වෙ අපි හොති, ඉදින් වී නම්; සො භික්ඛු, ඒ මහණතෙම;) චුතො, (හවෙ) ශාසනයෙන් ගිලිහුනේ වන්නේයි.

(සො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) පවෙසනඨිතුද්ධාරපවිට්ඨෙ, ප්‍රවෙශකරන්නාවූ ක්ෂණය පිහිටීමට නො පැමිණියාවූ ක්ෂණය පිහිටීමට පැමිණියාවූ ක්ෂණය උද්ධරණය කරන්නාවූ ක්ෂණය යන මේ ක්ෂණයෙහි; සාදියං, (සාදියන්තො) රසවිඳිනුයේ (වෙ අපි හොති, ඉදින් වීනම්; සො භික්ඛු, ඒ මහණතෙමේ) ද චුතො, ශාසනයෙන් ගිලිහුනේ නම් වේ හෙවත් පැරද ගියේ නම් වෙයි.

### සං:– 1 පවෙසනඨිතුද්ධාර පවිට්ඨෙ

මෙහි පවිට්ඨ ශබ්දය අවශානයෙහි දක්වීම ඡන්දානුරක්ෂණය පිණිසමුත් අර්ථරක්ෂණය පිණිස නො වේ, අර්ථ වශයෙන් වනාහි "පවෙසන පවිට්ඨඨිතුද්ධාරෙ"යි කිය යුත්තේයි.

පාරාජිකා පාළි යෙහි.

"සො වෙ පවෙසනං සාදියති පවිට්ඨං සාදියති ඨිතං සාදියති උද්ධරණං සාදියති"යි.

මූලශික්ෂා පාඨවශයෙන් වනාහි අර්ථ ගන්නාලද කල්හි උද්ධරණය කිරීමෙන් ඇතුල්වූයේය යන අර්ථය ලැබේ. ඒ අර්ථය උපිළිවෙල හෙයින් නො යෙදෙන්නේයි. මේ ගාථාවෙහි පූර්වදෙපාද යෙන් තමාගේ උත්සාහය පෙරටු කොට ගෙණ ඇතුල් කිරීමෙන් පරිජීවනබව ප්‍රකාශකොළේයි. පශ්චිම දෙපාදයෙන් වනාහි තමාගේ සතුරන් විසින් මිණිස් මාගමුන් එලවා බලාත්කාරයෙන් තමාගේ අංගජාතය මාගමුන්ගේ අංගජාතයෙහි ප්‍රවෙශකරවන කල්හි පවෙසන පවිට්ඨ ඨිත උද්ධාර යන සතර ආකාරවූ ක්ෂණයන් අතුරෙන් එකෙකී ක්ෂණයෙක්හි රසාස්වාදනය කරන්නාවූ මහණ ද පරාජිකාවට පැමිණෙන බව හැඟවූයේයි. ඒ සතරාකාර ක්ෂණයන් අතුරෙන් ස්වාංගජාතය තල ඇටක් පමණකුදු ප්‍රවෙශ කිරීම පවෙසන නම්වෙයි. පිහිටීමට නො පැමිණි තෙක් සියළු කාලය මුළුල්ලෙහි ඇතුලත් කිරීම පවිට්ඨ නම් වේ. ආධාරස්ථානයට පැමිණීම හෙවත් ශුක්‍ර මොචන අවස්ථාව ඨිත නම් වේ. අදහස සම්පූර්ණ කොට ඉදිරීම උද්ධාර නම් වේ.

සං:- 2 සනිමිත්තං.

සවකීය අංගජාතයයි කීමෙන් මෙරමාගේ අංගජාතය තමාගේ උත්සාහයෙන් මෙරමාගේ අංගජාතයෙහි ඇතුලත් කිරීමෙන් පාරාජිකාවට නො පැමිණේ. එයින් දුක්කෘතාපත්තියක් ම වන්නේයි.

සං:- 3 මග්ගනානෙ.

මෙහි ත්‍රිවිධ මාර්ගපර්‍ය්‍යාපන්න සමතිස් මාර්ගයෝ වන්නාහ. ඒ සමතිස් මාර්ග වනාහී මනුෂ්‍ය යක්ෂ තිරශ්චීන ස්ත්‍රීන් තිදෙනා පිළිබඳ එකිනෙකා කෙරෙහි වච්ච පස්සාව මුඛ වශයෙන් මාර්ගනවයෙක් වෙයි. මනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනක තිරශ්චීන උභතො බ්‍යඤ්ජනක යක්ෂ උභතොබ්‍යඤ්ජනක යන තිදෙනා පිළිබඳ වච්චපස්සාව මුඛමාර්ගයන්ගේ වශයෙන් නවයෙක් වෙයි. ඒ උභය නවකය පිඬුකොට ගත්කල්හී අටළොසෙක් වෙයි. මනුෂ්‍යපණ්ඩක යක්ෂ පණ්ඩක තිරශ්චීන පණ්ඩක යන නපුංසක පණ්ඩකයන්ගේ වච්ච මුඛ මාර්ගවශයෙන් සයෙක් වෙයි මනුෂ්‍යපුරුෂ යක්ෂපුරුෂ තිරශ්චීනපුරුෂයන්ගේ වච්චමුඛමාර්ගවශයෙන් සයක් වෙයි. ඒ උභය ෂට්කය පිඬුකොට ගත්කල්හි දොළොසෙක් වේ. මෙකී දොළොස හා යටකී අටළොස එක්කොට ගත්කල්හී සමතිස් මාර්ගයෝ ලැබෙත්. මෙසේ සමතිසක් මාර්ගයෝ මෛථුන පාරාජිකාවට ගොචර වෙති.

මෛථුනසෙවනය කරණු කැමති සිත් ඇතිබවය මාර්ගයෙන් මාර්ගය ගැටීමය යන දෙදෙන මීට අංග වෙති.

**3 අදින්නං මානුසං භණ්ඩං ථෙය්‍යාසයෙන ආදියං**
**පඤ්චවීසාවහාරෙසු ගරුකං චෙ චුතො භවෙ**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) අදින්නං, වස්තු හිමියා විසින් කාය වාග් දෙකින් නොදෙන ලද්දාවූ; ගරුකං, පස්මස්සක් හෝ ඉතිරි පස්මස්සක් අගනාවූ; මානුසං භණ්ඩං, මනුෂ්‍යසන්තක වස්තුවක්; පඤ්චවීසාවහාරෙසු, පස්විසි ගැණුම් අතුරෙන්; එකෙන, එක එකකින්; ථෙය්‍යාය, සොරසිතින්; ආදියං චෙ, ඉදින් ගණීනම්; (සො භික්ඛු, ඒ මහණ තෙමේ;) චුතො භවෙ, සර්වඥ ශාසනයෙන් ගිලිහුනේ (පරිජිවූයේ) වන්නේයි.

සං:- 1 අදින්නං.

කාය වාග් දෙකින් නුදුන් අන්සතු වස්තුව අදින්න නම්.

පාරාජිකා පාළි යෙහි.

† "අදින්නං නාම යං අනිස්සට්ඨං අපරිච්චත්තං රක්ඛිතං ගොපිතං මමායිතං පරපරිග්ගහිතං එතං අදින්නං නාම" යි.

(අ) දුන්නපොත ශික්ෂාපදයෙහි තමාසතු පිළිනොගත් ගිලිනා ලද වස්තුව ම කියන ලද්දේයි. අදත්තාදානශික්ෂාපදයෙහි මෙරමා රැකි නුදුන් වස්තුව කියන ලද්දේයි.

සමන්තපාසාදිකාවෙහි

"අදින්නන්ති දන්තපොනසික්ඛාපදෙ අත්තනො සන්තකම්පි අපටිග්ගහිතකං කප්පියං අජ්ඣොහරණීයං වුච්චති. ඉධ පන යං කිඤ්චි පරපරිග්ගහීතං සස්සාමිකං භණ්ඩං තදෙතං තෙහි සාමිකෙහි කායෙන වාචාය වා නදින්නන්ති අදින්නං"යි.

සඃ– 2 මානුසං භණ්ඩං.

මිණිස් සතුවූ ම වස්තුවකැයි දක්වූ හෙයින් දෙව යක්ෂ ප්‍රෙත තිරශ්චීනයන් අයත් වස්තුව පැහැර ගැණීමෙන් පරිජිනොවන් නේය යන අර්ථය හැඟවූයේයි.

පාරාජිකා පාළියෙහි

"අනාපත්ති පෙතපරිග්ගහෙ තිරච්ඡානපරිග්ගහෙති"

(අ) චාතුම්මහාරාජිකාදි සියළු දෙවගණයා ප්‍රෙත සංඛ්‍යාවට යෙති.
සමන්ත පාසාදිකාවෙහි

"චාතුම්මහාරාජිකාදයො දෙවාපි සබ්බෙ පෙතානෙව සංඛ්‍යං ගතා තෙසං පරිග්ගහෙ අනාපත්ති"යි.

---

† අනිස්සට්ඨං, හිමියාවිසින් නො හරණලද්දවූ; අපරිච්චත්තං, පරිත්‍යාග නො කරණලද්දවූ; රක්ඛිතං, රක්ෂා කරණලද්දවූ; ගොපිතං, ගොපනය කරණලද්දවූ; මමායිතං, මාගේ වස්තුවැයි උතුම් කොට සලකන ලද්දවූ; පරපරිග්ගහිතං, මෙරමාගේ වස්තුවැයි පරිග්‍රහය කරණලද්දවූ; යං, යම් වස්තුවක්; (අත්නී, ඇත්තේවේ ද;) එතං, ඒ වස්තුව; අදින්නං නාම, අදින්න නම් වෙයි.

## සං:– 3 ථෙය්‍යාය.

ථෙය්‍යෙන"යි කිණිය යුතුතන්හි "ථෙය්‍යාය"යි ලිඞ්ග විපය්‍යාසයයි "ථෙය්‍යායෙකතෙන" යනු කියයුත්තේ නමුදු ඡන්දානුරක්ෂණ වශයෙන් එක් තකාරයක් ලොප් කොට "ථෙය්‍යායෙකතෙන"යි කීහු.

ටීකාවෙහි

"ථෙය්‍යායාති ලිඞ්ගවිපල්ලාසො එකෙනාති එකතෙන වීච්ඡා ලොපොයං"යි

අන්සතු වස්තුව පැහැර ගැන්මෙහි කාය වාග් විඥප්ති සංඛ්‍යාත ප්‍රයොගය උපදවන්නාවූ ලොභචෙතනා තොමෝ සොරසිත නම්. ඉන් මිදුනේ පරිජි නො වේ.

## සං:– 4 පඤ්චවීසාවහාරෙසු.

නානාභණ්ඩපඤ්චකය එකභණ්ඩපඤ්චකය සාහත්ථිකපඤ්චකය පුබ්බපයොගපඤ්චකය ථෙය්‍යාවහාරපඤ්චකය යන පංචකයන් පස්දෙනාගේ වශයෙන් පිඬුකොට ගත් කල්හි පස්විසි අවහාරයෝ ලැබෙත්.

## නානා භණ්ඩ පඤ්චකය.

ආදියන අවහාරය හරයන අවහාරය අවහරණ අවහාරය ඉරියාපථවිකොපන අවහාරය ඨානාචාවන අවහාරයයි නානාභණ්ඩපංචකයෙහි භෙද පසෙකි.

පාරාජිකා පාලි යෙහි

> "ආදියෙය්‍ය හරෙය්‍ය අවහරෙය්‍ය ඉරියාපථං විකොපෙය්‍ය ඨානාචාවෙය්‍යා"ති.

(1) **ආදියන අවහාරය**– අනුන්ගේ ආරාමකොත්වත් ආදීවූ වස්තුව තාමාගේ යයි විනිශ්චය කොට ගන්නාවූ මහණ තෙමේ දුකුලාවට ද (සිල්රක්නා උවසුවෙක් නම් ශීලය කෙලෙසීමට ද) පැමිණේ. ආරාම සවාමි තෙමේ මාගේ ආරාමය මට අයත් නොවේදෝ හෝයි සැකයට පැමිණියේ නම් එසේ සැකයට පැමිණෙව් මහණතෙමේ තුලසි ඇවතට ද (උවසුවෙක් නම් රැකි ශීලය කෙලෙසීමට ද) පැමිණේ, ධර්මයට එකහ නොවන්නාවූ විනිශ්චය හෙතුකොටගෙණ මාගේ ආරාමකොත්වත් ආදිය මට අයත් නො වන්නේයයි ආරාමසවාමි තෙමේ බර බහාතැබුයේ වී නම් එසේ කරවූ මහණතෙමේ පරිජි ඇවතට ද (උවසුවෙක් නම් ශීලය භෙදයට ද,) පැමිණේ.

සමන්තපාසාදිකාවෙහි

†"ආදියෙය්‍යාති ආරාමං අභියුඤ්ජති ආපත්ති දුක්කටස්ස සාමිකස්ස විමතිං උප්පාදෙති ආපත්ති ථුල්ලච්චයස්ස සාමිකො න මය්හං භවිස්සතීති ධුරං නිපති ආක්ඛිපත්ති පාරාජිකස්ස"යි

(2) **හරණන අවහාරය–** අනුන්ගේ වස්තුව හිසින් ගෙණ යන්නාවූ මහණ තෙමේ සොරකම් කරණු කැමති සිතින් අල්වන්නේ වීනම් දුකුලාවට ද උවසුවෙක් නම් ශීලය කිළුටු බවට ද, පැමිණෙයි. හිසින් නො ඉක්මවා ම තුබූ භාණ්ඩය සොර සිතින් ඔබිනොබ සොලවන්නේ වීනම් ඒ භික්ෂුතෙමේ තුලසි ඇවතට (උවසුවෙක් නම් ශිලය කිළුටු බවට) ද පැමිණෙයි. හිසින් ගෙණයන බඩුව සොරකම් කරණු කැමති සිතින් උරහිස පිට තබා නම් භික්ෂු තෙමේ ඨානාචාවනය හෙතුකොට ගෙණ පරිජිඇවතට (උවසුවෙක් නම් ශීලභෙදයට) ද, පැමිණෙයි.

සමන්තපාසාදිකාවෙහි

* "හරෙය්‍යාති අඤ්ඤස්ස භණ්ඩං හරන්තො සීසෙ භාරං ථෙය්‍යචිත්තො ආමසති ආපත්ති දුක්කටස්ස ඵන්දපෙති ආපත්ති ථුල්ලච්චයස්ස ඛන්ධං ඔරොපෙති ආපත්ති පාරාජිකස්ස"යි

---

† ආදියෙය්‍යාති, ආදියෙය්‍ය යනු වනාහි; ආරාමං, ආරාමය; අභියුඤ්ජති, අනුන්ගේ ආරාමය තමාගේ ආරාමයයි විනිශ්චය කෙරේ නම්; දුක්කටස්ස, දුකුලාවට ද; ආපත්ති, (ආපජ්ජනං හොති) පැමිණීම වෙයි; සාමිකස්ස, වස්තු හිමියාහට; විමතිං උප්පාදෙති, සැක උපදවන්නේ වී නම්; ථුල්ලච්චයස්ස, තුලසි ඇවතට; ආපත්ති, පැමිණීම වෙයි; සාමිකො, වස්තු ස්වාමි තෙමේ; මය්හං, මට; න භවිස්සතීති, අයත් නොවන්නේ යයි; ධුරං, බර; නික්ඛිපති, බහා තබන්නේ වී නම්; පාරාජිකස්ස, පාරාජිකාපත්තියට; ආපත්ති, පැමිණීම වෙයි.

* හරෙය්‍යාති, හරෙය්‍ය යනු වනාහි; අඤ්ඤස්ස, අනිකක්හුගේ; භණ්ඩං, භාණ්ඩය; හරන්තො, ගෙණයන්නාවූ; භික්ඛු, භික්ෂු තෙමේ; සීසෙ, හිසෙහි; භාරං, බර; ථෙය්‍යචිත්තො, (ථෙය්‍ය චිත්තක) සොරකම් කරණු කැමති සිතින් (මෙහි කරණාර්ථ ප්‍රථමායි) ආමසති, අල්වන්නේ වීනම්; දුක්කටස්ස, දුකුලාවට; ආපත්ති පැමිණීම වෙයි; ඵන්දපෙති, සොලවන්නේ වී නම්; ථුල්ලච්චයස්ස, තුලසි ඇවතට ආපත්ති, පැමිණීම වෙයි; ඛන්ධං, උරහිසට; ඔරොපෙති, බස්වන්නේ වීනම්; පාරාජිකස්ස, පාරාජිකාපත්තියට; ආපත්ති, පැමිණීම වෙයි.

(3) **අවහරණ අවහාරය**– සමීපයෙහි තබන ලද්දාවූ භාණ්ඩය මාගේ බඩු දෙවයි ඉල්වනු ලබන්නාවූ භික්ෂු තෙමේ මම නො ගත්තෙමි යි කියන්නේ වීනම් දුකුලාවට ද වස්තුහිමියාහට සැක උපදවන්නේ වීනම් තුලසි ඇවතට ද වස්තුස්වාමි තෙමේ මට අයත් නො වන්නේය යි බර බහා තබන්නේ වීනම් පාරාජිකාවට (උවසුවෙක් නම් ශීල භේදයට) ද පැමිණෙයි.

සමන්ත පාසාදිකාවෙහි

† "අවහරෙය්‍යාති උපනික්ඛිත්තං භණ්ඩං දෙහි මෙ භණ්ඩන්ති වුච්චමානො නාහං ගණ්හාමීති භණති ආපජ්ජති දුක්කටස්ස සාමිකස්ස විමතිං උප්පාදෙති ආපජ්ජති ථුල්ලච්චයස්ස සාමිකො න මය්හං භවිස්සතීති ධුරං නික්ඛිපති ආපජ්ජති පාරාජිකස්ස"යි.

(4) **ඉරියාපථ විකොපන අවහාරය**:– ඉරියව් විනාශ කොට ගැණීමෙන් මෙම අවහාරය සිදු වේ. වස්තුව ඔසවන්නාවූ පුරුෂයාහා සමග කැමති ස්ථානයකට ගෙණ යන්නෙමි යි සිටි තැනින් පියවරක් ඉක්මවූයේ නම් තුලසි ඇවතට ද දෙපියවර ඉක්මවූයේ නම් පරිජි ඇවතට (උවසුවෙක් නම් ශීලභෙදයට) ද පැමිණේ.

---

† අවහරෙය්‍යඉති, අවහරෙය්‍ය යනු වනාහී; උපනික්ඛිත්තං, සමීපයෙහි තබන ලද; භණ්ඩං, භාණ්ඩය; මෙ, මාගේ; භණ්ඩං, භාණ්ඩය; දෙහිඉති, දෙව යි; වුච්චමානො, කියනු ලබන්නාවූ භික්ෂු තෙමේ; අහං, මම; න ගණ්හාමිඉති, නොගත්තෙමි යි; භණති, කියන්නේ වීනම්; දුක්කටස්ස, දුකුලාවට; ආපජ්ජති, පැමිණීම වෙයි. සාමිකස්ස, වස්තුහිමියාහට; විමතිං, සැකය; උප්පාදෙති, උපදවන්නේ වීනම්; ථුල්ලච්චයස්ස, තුලසි ඇවතට; ආපජ්ජති, පැමිණීම වෙයි; සාමිකො, වස්තුහිමිතෙමේ; මය්හං, මට; න භවිස්සතීති, අයත් නොවන්නේය යි; ධුරං, බර; නික්ඛිපති, බහා තබන්නේ වීනම්; පාරාජිකස්ස, පාරාජිකාවට; ආපජ්ජති, පැමිණීම වෙයි.

සමන්ත පාසාදිකාවෙහි.

* "ඉරියාපථං විකොපෙය්‍යාති සහ භණ්ඩහාරකං නෙස්සාමීති පඨමං පාදං සඞ්කාමෙති ආපත්ති ථුල්ලච්චයස්ස දුතියං පාදං සඞ්කාමෙති ආපත්ති පාරාජිකස්ස"යි.

(5) **ඨානා චාවන අවහාරය:-** ස්ථාන පෙරළා ගැණීමෙන් මෙම අවහාරය සිදු වේ. ගොඩ පිහිටි භාණ්ඩය සොරසිතින් ඇල්වීමෙන් දුකුලාව ද සොලවන්නේ වී නම් තුලසි ද තුබූ තැනින් වෙනස් කිරීමෙන් පරිජි (උවසුවෙක් නම් ශීලභෙදය) ද වන්නේයි.

සමන්ත පාසාදිකාවෙහි

† "ඨානා චාවෙය්‍යාති ථලට්ඨං භණ්ඩං ථෙය්‍යචිත්තො ආමසති ආපත්ති දුක්කටස්ස ඵන්දාපෙති ආපත්ති ථුල්ලච්චයස්ස ඨානා චාවෙති ආපත්ති පාරාජිකස්ස"යි.

## ඒකභණ්ඩ පංචකය.

නානා භාණ්ඩ පංචකයෙහි කී ක්‍රමයෙන් මේ ඒක භාණ්ඩ පංචකයෙහි ද ආදියන හරණ අවහරණ ඉරියාපථ විකොපන ඨානා චාවන වශයෙන් අවහාරයෝ පස්දෙනෙකි.

---

* ඉරියාපථං විකොපෙය්‍ය ඉති, ඉරියාපථං විකොපෙය්‍ය යනු වනාහි; සහ භණ්ඩහාරකං, බඩු ගෙණ යන්නාවූ පුරුෂයා හා සමග; නෙස්සාමි ඉති ගෙණ යන්නෙමි යි; පඨමං පාදං, පළමු වෙනි පියවර; සඞ්කාමෙති, ඉක්මවන්නේ වී නම්; ථුල්ලච්චයස්ස; තුලසි ඇවතට; ආපත්ති, පැමිණීම වෙයි; දුතියං පාදං, දෙවෙනි පියවර; සඞ්කාමෙති, ඉක්මවන්නේ වී නම්; පාරාජිකස්ස, පාරාජිකාපත්තියට; ආපත්ති, පැමිණීම වෙයි;

† ඨානා චාවෙය්‍ය ඉති, ඨානා චාවෙය්‍ය යනු වනාහි; ථලට්ඨං භණ්ඩං, ගොඩතුබූ භාණ්ඩය; ථෙය්‍යචිත්තො; සොර සිතින්; (කරණාර්ථ ප්‍රථමායි) ආමසති, අල්වන්නේ වී නම්, දුක්කටස්ස, දුකුලාවට; ආපත්ති, පැමිණීම වෙයි; ඵන්දාපෙති, සොලවන්නේ වී නම්; ථුල්ලච්චයස්ස, තුලසි ඇවතට; ආපත්ති, පැමිණීම වෙයි; ඨානා චාවෙති, තුබූ තැනින් වෙනස්කරන්නේ වී නම්; පාරාජිකස්ස, පාරාජිකාපත්තියට; ආපත්ති, පැමිණීම වෙයි;

කඞ්ඛා විතරණියෙහි.

"* සස්සාමිකස්ස පන දසස්ස වා තිරච්ඡානගතස්ස වා යථා වුත්තේන අභියෝගාදිනා නයෙන ආදියන හරණ අවහරණ ඉරියාපථ විකෝපන ඨානා චාවන වසෙන ඒකභණ්ඩපඤ්චකං වෙදිතබ්බං"යි.

(1) **ආදියන අවහාරය:-** ස්වාමියෙක් ඇති දූසි දස් ගව මහිෂාදි සචේතනික වස්තූන් විනිශ්චය කොට සොරසිතින් ගැණීමෙන් මෙම අවහාරය සිදු වේ.

(2) **හරණ අවහාරය:-** එලවන ලද්දාවූ සචේතනික වස්තු සොරසිතින් ගැණීමෙන් මෙම අවහාරය සිදුවේ.

(3) **අවහරණ අවහාරය:-** භාර කොට තුබූ සචේතනික වස්තු සොරකම් කිරීමෙන් මෙම අවහාරය සිදු වේ.

(4) **ඉරියාපථ විකෝපන අවහාරය:-** ඉරියව් විනාශකොට සොරසිතින් ගැණීමෙන් මෙම අවහාරය සිදු වේ.

(5) **ඨානා චාවන අවහාරය:-** ස්ථාන පෙරළා ගැණීම් වශයෙන් මෙම අවහාරය සිදු වේ.

නානාභාණ්ඩපංචකය සචේතනික අචේතනික වස්තූන්ගේ වශයෙන් ද ඒකභාණ්ඩපංචකය සචේතනික වස්තූන්ගේ වශයෙන්ද යෙදීම ම මෙහි වෙනස වේ.

---

* පන, නානාභාණ්ඩ පංචකයෙන් අන්‍යවූ ඒකභාණ්ඩ පංචකය දක්වමි; (පන, යි අන්‍යාර්ථද්‍යෝතක නිපාතයි) සස්සාමිකස්ස, ස්වාමියා ඇත්තාවූ; දසස්ස වා, දසයෙකුගේ හෝ; තිරච්ඡානගතස්ස වා, තිරිසන්ගතයෙකුගේ හෝ; යථා වුත්තේන, නානා භාණ්ඩපංචකයෙහි කියන ලද්දාවූ; අභියෝගාදිනා නයෙන, විනිශ්චය ආදීවූ ක්‍රමයෙන්; ආදියන හරණ අවහරණ ඉරියාපථ විකෝපන ඨානා චාවනවසෙන, විනිශ්චය කොට සොරෙන් ගැණීමය එලවන ලද වස්තුව ගැණීමය භාර කොට තැබූ වස්තුව ගැණීමය ඉරියව් වෙනස් කොට ගැණීමය ස්ථානයෙන් පෙරළා ගැණීමය යන මොවුන්ගේ වශයෙන්; ඒකභණ්ඩපඤ්චකං, ඒකභාණ්ඩපංචකය; වෙදිතබ්බං, දතයුතු යි.

කඞ්ඛා විතරණියෙහි.

† "තත්‍ථ නානා භණ්ඩපඤ්චකං සවිඤ්ඤාණකාවිඤ්ඤාණකවසෙන දට්ඨබ්බං ඉතරං සවිඤ්ඤාණක වසෙනෙව"යි.

**සාහත්‍ථික පංචකය.**

සාහත්‍ථිකය ආණත්තිකය නිස්සග්ගියය අත්‍ථසාධකය ධුර නික්ඛෙපය යි මෙහි ද්‍ද අවහාර වශයෙන් හෙද පසෙක් වේ.

කඞ්ඛා විතරණියෙහි.

* "කතමං සාහත්‍ථිකපඤ්චකං? සාහත්‍ථිකො ආණත්තිකො නිස්සග්ගියො අත්‍ථසාධකො ධුරනික්ඛෙපො"ති.

(1) **සාහත්‍ථික අවහාරය:**– අනුන්ගේ වස්තුව තමා අතින් සොරකම් කිරීමෙන් සාහත්‍ථික අවහාරය සිද්ධ වේ

(2) **ආණත්තික අවහාරය:**– මෙ නම් ඇත්තාවූ පුරුෂයාගේ භාණ්ඩය සොරකම් කරව යි අනුන් මෙහෙයා සොරකම් කරවීමෙන් ආණත්තික අවහාරය සිද්ධ වේ.

(3) **නිස්සග්ගිය අවහාරය:**– දියෙහි හෝ ගොඩෙහි තබන ලද්දාවූ වස්තුව තුබූ තැනින් දමා ගසා තබා සොරකම් කිරීමෙන් මෙම අවහාරය සිද්ධ වේ.

---

† තත්‍ථ, ඒ නානා භාණ්ඩපංචක ඒකභාණ්ඩපංචකයන් අතුරෙන්; නානාභණ්ඩ පඤ්චකං, නානා භාණ්ඩ පංචකය; සවිඤ්ඤාණකාවිඤ්ඤාණකවසෙන, සචෙතනික අචෙතනික වස්තූන්ගේ වශයෙන්; දට්ඨබ්බං, දතයුතු යි; ඉතරං, මෙයින් අන්‍යවූ ඒකභාණ්ඩ පංචකය; සවිඤ්ඤාණක වසෙන එව, සචෙතනික වස්තූන්ගේ වශයෙන් ම වේ යයි දතයුතු යි

* සාහත්‍ථික පඤ්චකං, සාහත්‍ථික පඤ්චකය; කතමං, කවරේද යත්? සාහත්‍ථිකො, තමා අතින් සොරකම් කිරීමය; ආණත්තිකො; මෙරමාහට නියොග කිරීමෙන් සොරකම් කිරීමය; නිස්සග්ගියො, අත්හැර සොරකම් කිරීමය; අත්‍ථසාධකො, සොරකම් කිරීමට පූර්වභාගයෙහි පාරාජිකාපත්තියට පැමිණීම් සංඛ්‍යාත අර්‍ථය සිද්ධවීමය; ධුරනික්ඛෙපො ඉති, බර බහා තැබීමෙන් සොරකම් කිරීමය යන පස යි.

(4) **අත්‍ථසාධක අවහාරය**:- මෙනම් ඇත්තහුගේ භාණ්ඩය යම් කාලෙක්හි හැකි වේ නම් එකල්හි සොරකම් කරව යි අනුන් මෙහෙයා සොරකම් කරවීමෙන් මෙම අවහාරය වේ. එසේ මෙහෙයුම් ලද මහණ තෙමේ අනතුරක් නොමැතිව සොරකම් කොළේ නම් මෙහෙයුම් කළ මහණ තෙමේ මෙහෙයූ කෙණෙහි ද මෙහෙයුම් ලදහු සොරකම් කළ කෙණෙහි ද පාරාජිකාවට පැමිණේ. (උවසුවෝ නම් ශීල හෙදයට පැමිණෙත්.) ඇණවූ කෙණෙහි සොරකම් කිරීම ආණත්ති වශයෙන් ද අණවා කාලාන්තරයකින් මුත් සොරකම් කිරීම අත්‍ථසාධක වශයෙන්දැ යි මෙසේ ආණත්ති අත්‍ථසාධකයන්ගේ වෙනස වෙයි.

(5) **ධුරනික්ඛෙප අවහාරය**:- භාර කොට තුබූ වස්තුවක් භාරගත් මහණ තෙමේ මම නොදෙමි යි සිතීම ද වස්තු ස්වාමි තෙමේ මට නො ලැබෙන්නේය යි සිතීම ද යන උභය පක්‍ෂයේ ධුරනික්‍ෂෙපය වන්නේ නම් බාරගත් මහණ තෙමේ පරිජි ඇවතට (උවසුවෙක් නම් ශීලහෙදයට) ද පැමිණේ. එක් පසෙකින් බර බහා තැබීම මෙම අවහාරයට හෙතු නොවන හෙයින් දෙපසම බර බහා තැබීම උවමනා කෙරේ එක් පසෙකින් බර බහා තැබීමෙන් පරිජි නොවේ.

## පුබ්බපයොග පඤ්චකය.

පූර්ව්ප්‍රයෝගය සහප්‍රයෝගය සංවිදාවහාරය සංකෙතකර්මය නිමිත්ත කර්මය යි මෙහි දූ ප්‍රභෙද වශයෙන් පංචකයකි.

කඞ්ඛා විතරණියෙහි.

† "කතමං පුබ්බපයොග පඤ්චකං? පුබ්බපයොගො සහ පයොගො සංවිදාවහාරො සඞ්කෙතකම්මං නිමිත්තකම්මන්ති"

(1) **පූර්ව්ප්‍රයෝග අවහාරය**:- ඇණවීම් වශයෙන් පූර්ව්ප්‍රයෝග අවහාරය වන්නේයි. මෙසේ සොරකම් කරව යි මෙහෙයුම් ලද මහණ තෙමේ ඒකාන්තයෙන් සොරකම කොළේ නම් මෙහෙයූ මහණ එකෙණෙහි ද මෙහෙයුම් ලද මහණ සොරකම කළ කෙණෙහි ද පාරාජිකාවට පැමිණේ. උවසුවෙක් නම් සිල් බිඳේ.

---

† පුබ්බපයොගපඤ්චකං, පූර්ව්ප්‍රයෝග පංචකය; කතමං, කවරේද යත්? පුබ්බපයොගො, ඇණවීම් වශයෙන් සොරකම් කිරීමය; සහපයොගො, වස්තුව සමග උත්සාහ කිරීමෙන් සොරකම් කිරීමය; සංවිදාවහාරො, බොහෝ දෙන එකතුව සොරකම් කිරීමය; සඞ්කෙතකම්මං, සලකුණු කොට තබා සොරකම් කිරීමය; නිමිත්තකම්මං ඉති, නිමිති දක්වා සොරකම් කිරීමය යන මේ පසයි.

(2) **සහප්‍රයෝග අවහාරයඃ-** වස්තුව සමග උත්සාහ කිරීමෙන් සහප්‍රයොග අවහාරය වන්නේයි. ආරාම කෙත් ආදියෙහි මායිම් පිණිස තුබූ ගල්වැටි ආදිය වෙනස් කොට කෙසගක් පමණකු දු අන්සතු බිම් පෙදෙසක් සොරකම් කරන් නාවූ මහණ තෙමේ සහප්‍රයෝගය වීමෙන් පරිජි ඇවතට (උවසුවෙක් නම් ශීල භෙදයට) ද පැමිණේ.

කඞ්ඛා විතරණියෙහි.

* ඨානා චාවනවසෙන ඛීලාදීනි සඞ්කාමෙත්‍වා ඛෙත්තාදිගහණ වසෙන ච සහපයොගො වෙදිතබ්බො''ති.

(3) **සංවිදාව හාරයඃ-** බොහෝ දෙනා එකතුව සොරකම් කිරීමෙන් සංවිදාවහාරය වන්නේයි. මෙනම් ඇත්තාවූ වස්තුව අපි සොරකම් කරම්හ යි එකතුව මන්ත්‍රණය කළවුන් අතුරෙන් යමෙක් තෙමේ සොරකම් කෙළේ නම් අභිප්‍රාය සඳහශවූ ඒ සියලු දෙනම පාරාජිකාපත්තිය සපශී කෙරෙත්. උවසුවෝ නම් ශීල භෙදයට පැමිණෙත්.

කඞ්ඛා විතරණියෙහි

‡ ''සංවිදාවහාරො නාම අසුකං නාම භණ්ඩං අවහරිස්සා මාති සංවිදහිත්‍වා සම්මන්තයිත්‍වා අවහරණං එවං සංවිද හිත්‍වා ගතෙසුපි එකෙනාපි තස්මිං භණ්ඩෙ ඨානා චාවිතෙ සබ්බෙසං අවහාරො හොති'' යි.

---

* ඨානා චාවනවසෙන, පිහිටියාවූ ස්ථානයෙන් වෙනස් කිරීම් වශයෙන්; ඛීලාදීනි, කටුකණු ආදී මායිම්; සඞ්කාමෙත්‍වා, වෙනස් කොට; ඛෙත්තාදි ගහණවසෙන ච, කෙත් ආදිය ගැණිම් වශයෙන් ද; සහපයොගො, සහප්‍රයොගය; වෙදිතබ්බො, දතයුතු යි.

‡ සංවිදාවහාරො නාම, සංවිදාවහාරය නම් වනාහි; අසුකං නාම භණ්ඩං, අසවල් නම් භාණ්ඩයක්; අවහරිස්සාම ඉති, සොරකම් කරමහ යි; සංවිදහිත්‍වා, සියළුදෙනා එක්ව; සම්මන්තයිත්‍වා, මන්ත්‍රණය කොට; අවහරණං, ගැණීමයි; එවං සංවිද හිත්‍වා, මෙසේ සංවිධාන කොට; ගතෙසුපි, ගියවුන් අතුරෙනුදු; එකෙන අපි, එකෙකු විසින් ද; තස්මිං භණ්ඩෙ, ඒ භාණ්ඩය; ඨානා චාවිතෙ, තුබූ තැනින් වෙනස්කළ කල්හි; සබ්බෙසං, සියල්ලන්ගේ; අවහාරො හොති, සොරකම වෙයි;

(4) **සංකෙතකම් අවහාරයඃ–** සලකුණු වශයෙන් සොරකම් කිරීමෙන් මෙම අවහාරය සිදු වේ. පෙර බත් පසු බත් ආදී යම් කිසි කාලයක් සීමා කොට මෙනම් කාලයෙහි මෙනම් බඩුව සොරකම් කරව යි දන්වනු ලැබූ භික්ෂු තෙමේ ඒ සල කුණෙන් පෙරපසු නොවී ඒ භාණ්ඩය සොරකම් කොළේ නම් දැන්වීම කල භික්ෂු තෙමේ **එකෙණෙහි** ද දැන්වීම් ලැබූ භික්ෂු තෙමේ සොරකම් කළ කෙණෙහි ද පරිජි වේ. උවසු වෝ නම් ශීල භෙදයට පැමිණෙති.

කඞ්ඛා විතරණියෙහි

* "සඞ්කෙත කම්ම නාම සඤ්ජානන කම්මං සචෙ හි පුරෙ භත්තාදිසු යං කිඤ්චි කාලං පරිච්ඡින්දිත්වා අසුකස්මිං කාලෙ ඉත්ථං නාමං භණ්ඩං අවහරාති වුත්තො සඞ්කෙතතො අපච්ඡා අපුරෙ තං අවහරති සඞ්කෙතකාරකස්ස සඞ්කෙත කරණක්ඛණෙයෙව අවහාරො"ති.

(5) **නිමිත්ත කම් අවහාරයඃ–** සංඥ ඉපදීමට හෙතුවූ නිමිති දක්වා සොරකම් කිරීමෙන් මෙම අවහාරය සිදුවන්නේ යි. ඇසිපිය හෙලීම් නිමිති කළාවූ කාලයෙහි සොරකම් කරව යි මෙහෙයනු ලැබූමහණ තෙමේ සොරකම් කළේ නම් නිමිති කළ මහණ **එකෙණෙහි** ද මෙහෙයුම් ලදහු සොරකම් කළ කෙණෙහි ද පරිජි වේ. (උවසුවෝ නම් ශීල භෙදයට පැමිණෙත්.)

---

* සඞ්කෙත කම්මං නාම, සංකෙත කර්මය නම් වනාහී; සඤ්ජානනකම්මං, දැනගන්නා ලද්දාවූ කර්මය යි; හි, ඒ එසේ මැයි; පුරෙභත්තාදිසු, පෙර බත් කාලාදීන් අතුරෙන්; යං කිඤ්චි කාලං, යම් කිසිකාලයක්, පරිච්ඡින්දිත්වා, වෙන් කොට; අසුකස්මිං කාලෙ, මෙනම් කාලයෙහි; ඉත්ථං නාමං භණ්ඩං, මෙනම් භාණ්ඩයක්; අවහර ඉති, සොරකම් කරවයි; වුත්තො, කියන ලද්දාවූ භික්ෂු තෙමේ; **සඞ්කෙතතො**, ඒ සලකුණු කිරීමෙන්; **අපච්ඡා අපුරෙ**, පෙර පසු නොවී; තං භණ්ඩං, ඒ භාණ්ඩය; සචෙ අවහරති, ඉදින් සොරකම් කරන්නේ වීනම්; සඞ්කෙතකාරකස්ස, **දැන්වීම** කළාවූ මහණහට; සඞ්කෙතකරණක්ඛණෙ එව, **සලකුණු** කළ කෙණෙහිම; අවහාරො ඉති, අවහාර (සොරකම) තෙමේ වෙයි;

කඞ්ඛා විතරණියෙහි.

* "නිමිත්තකම්මං නාම සඤ්ඤුප්පාදනත්ථං අක්ඛිනිඛණාදී නිමිත්තකරණං සචෙ හි එවං කතනිමිත්තතො අපච්ඡා අපුරෙ යං අවහරාති වුත්තො තං අවහරති නිමිත්තකාරස්ස නිමිත්තකරණක්ඛණෙයෙව අවහාරොති"

**ථෙය්‍යාවහාර පඤ්චකය.**

ථෙය්‍යාවහාරය පසය්හාවහාරය පරිකප්පාවහාරය පටිච්ඡන්නාවහාරය කුසාවහාරය යි මෙහි ප්‍රභෙද පසෙක් වේ.

කඞ්ඛා විතරණියෙහි.

"කතමං ථෙය්‍යාවහාරපඤ්චකං ථෙය්‍යාවහාරො පසය්හාවහාරො පරිකප්පාවහාරො පටිච්ඡන්නාවහාරො කුසාවහාරොති"

(1) **ථෙය්‍යාවහාරය** – අප්‍රකට ශරීරයෙන් හිඳ ගෙවල් බිඳීම් ආදී සොරකම් කෙරේ ද ප්‍රකට ශරීරයෙන් හිඳ බොරු තරාදි කුරුණි ලාස් ආදියෙන් කිරීම් මැණීම් වශයෙන් වංචා කෙරේද හේ ථෙය්‍යාවහාර නම් වේ.

(2) **පසය්හාව හාරය**:– ගම් පහරණ සොරු මෙන් බලාත්කාර කම් කිරීමෙන් අන් සතු වස්තුව ගණිද රාජභටාදීහු මෙන් තමහට පැමිණි අවසර වශයෙන් අධික සේ ගණිද එය පසය්හාවහාර නම් වේ.

(3) **පරිකප්පාවහාරය**:– කල්පනා කොට ගැණීම පරිකප්පාවහාරනම්. හේ භණ්ඩපරිකප්ප ඔකාසපරිකප්ප වශයෙන් ද්විප්‍රකාරවේ. ඇතුල් ගබඩාවට වැද වස්ත්‍ර වීනම් ගන්නෙමි හූ වී නම් නො ගන්නෙමි යි මෙසේ කල්පනා කොට අන්ධකාර ගබඩාවෙහි තුබූ බඩු පොදිය ගන්නේ වෙයි. එසේ ගත්දෙය වස්ත්‍ර වී නම් එසවූ කෙණෙහි භික්ෂු තෙමේ පාරාජිකාවට (උවසුතෙමේ ශීල භෙදයට) ද පැමිණේ. බැහැර ගෙණ ගොස් මුදා බැලූ කල්හි

* නිමිත්තකම්මං නාම, නිමිත්තකර්මය නම් වනාහී; සඤ්ඤුප්පාදනත්ථං, සංඥා ඉපදවීම පිණිස; අක්ඛිනිඛණාදී, ඇසිපිය නැටවීම් ආදිවූ; නිමිත්තකරණං, නිමිති කිරීම යි; හි, ඒ එසේ මැයි; එවං, මෙසේ; කතනිමිත්තතො, කරණලද නිමිත්තෙන්; අපච්ඡා අපුරෙ, පෙරපසු නොවී; යං, යම් වස්තුවක්; අවහර ඉති, සොරකම් කරවයි; වුත්තො, කියනු ලැබූ පුද්ගලතෙමේ; තං, ඒ වස්තුව; සචෙ අවහරති, ඉදින් ගන්නේ වී නම්; නිමිත්තකාරස්ස, නිමිති කළාහට; නිමිත්තකරණක්ඛණෙ එව, නිමිති කළ කෙණෙහිම; අවහාරො ඉති, සොරකම වේ.

හු පොදිය බැව් දැන නැවත තුබු තැන ගෙණවුත් තබා නම් පරිජි නොවේ. එසේ නො තබා බඩු පොදිය ඔසවා ගෙණ යන්නාවූ මහණ තෙමේ පියවරක් පාසා දුකුලාවට පැමිණෙයි. යම් තැනක ගෙණ ගොස් තබා ද එවිට තුලසියට පැමිණේ· නැවත ගෙණ යනු පිණිස තුබූ තැණින් ඔසවා ද එකෙණෙහි පාරාජිකාවට පැමිණේ. වසතු සවාමියා විසින් එහුබඳනොලද සොර තෙමේ බඩු දමා යේ ද එකල සවාමීහු දැක ඒ බඩු ගත්තේ නම් පරිජි නොවේ. අන් කිසිවෙක් ගත්තේ හෝ දිරා විනාශ වූයේ හෝ වටිනාකම දීම් සංඛ්‍යාත භාණ්ඩ දෙය්‍යය වේ. භාණ්ඩපරිකල්පය මෙසේ දතයුතු.

ස්ථාන පිරිසිඳ ගැණිම ඕකාෂ පරිකල්ප නම්. ආරාමයන්හි තුබූ වසතුව ආරාමික තෙමේ අසවල් තැනින් මෙපිට දිටී නම් දෙන්නෙමි නො දිටී නම් ගන්නෙමි යි පිරිසිඳි ස්ථානය ඉක්ම වී නම් පරිජි වේ. නො ඉක්ම වී නම් පරිජි නොවේ. මේ වනාහි ඕකාෂ පරිකල්ප විනිශචය යි.

(4) **පටිච්ඡන්නාවහාරය**:– වසතු සවාමීන් මූලාකොට වසතුව ගැණීම පටිච්ඡන්නාවහාර නම් වේ. යමෙක් තෙමේ උයන් ආදියෙහි අන් සතු වසතුව රජස් තෘණ පණිාදියෙන් වසයි ද එවිට වසතු සවාමීහු සොයා එ දවස් නොලැබ දෙවෙනි දවස සොයා ගන්නෙමු යි පෙරලා අවුත් සොයා ධූරනික්‍ෂෙප කොට යාද එකෙණෙහි භික්‍ෂුවක් නම් පාරාජිකාවට (උවසුවෙක් නම් ශීල භෙදයට) ද පැමිණේ.

(5) **කුසාවහාරය**:– කුසපත් ආදිය හෙලා සොරකම් කිරීම කුසාවහාර නම් වේ. සමානවූ හෝ අසමානවූ වටිනා කම් ඇති බෙදූ වසතුව සොරකම් කරණු කැමති පුද්ගල තෙමේ තමන්ගේ නම ඇති කුසපත අන්සතු ගොඩ ගණු කැමැත් තෙන් හෙලූ ඇසිල්ලෙහි භික්‍ෂුව පාරාජිකාවට (උවසුව ශීල භෙදයට) ද පැමිණේ.

පසක් පසක් බැගින් ප්‍රභෙදවත්වූ පංචකයන් එක් කොට පස්විසි අවහාරයෝ මෙසේ දතයුත්තාහුය.

සං:– 5 **ගරුකං.**

මෙහි ගරුක යනු පාදය වෙයි. කාෂීාපණයෙන් සතරෙන් එක් කොටසක් පාද නම් වේ. මදටිය විස්සක් බරවූ රන් කාසිය කහවණු නම් වෙයි. මදටිය පහක් බරවූ රන් පාදයක් වෙයි. මදටියක් බර රන් මස්සක් වේ.

විනයත්‍ථ මඤ්ජුසාවෙහි

"මාසකො නාම පොරාණකස්ස කහාපණස්ස වීසතිමො භාගො යා ලොකෙ මඤ්ජෙටඨි ති පි වුච්චති"

පාරාජිකා පාළියෙහි

> "තෙන ඛො පන සමයෙන රාජගහෙ පඤ්චමාසකො පාදො හොති"

සමන්තපාසාදිකාවෙහි

> † "තදා රාජගහෙ වීසති මාසකො කහාපණො හොති තස්මා පඤ්චමාසකො පාදො එතෙන ලක්ඛණෙන සබ්බජනපදෙසු කහාපණස්ස චතුත්ථො භාගො පාදොති වෙදිතබ්බො සො ච ඛො පොරාණස්ස නීලකහාපණස්ස වසෙන"යි

විමති විනොදනියෙහි

> * "පොරාණසත්ථානුරූපං උප්පාදිතො වීසති මාසප්පමාණ උත්තමසුවණ්ණග්ඝනකො ලක්ඛණසම්පන්නො නීලකහාපණොති වෙදිතබ්බො යස්මිං පදෙසෙ නීලකහාපණා න සන්ති තත්ථාපි කාලවිරහිතස්ස නිද්ධන්තසුවණ්ණස්ස පඤ්චමාසග්ඝනකෙන භණ්ඩෙන පාදපරිච්ඡෙදො කාතබ්බො"යි.

---

† තදා, ඒ දෙවෙනි පාරාජිකාව පැණවූ කාලයෙහි; රාජගහෙ, රජගහනුවර; වීසතිමාසකො, විසි මස්සක් තෙමේ කහාපණො හොති, කහවණුවක් වේ ද; තස්මා, එහෙයින්; පඤ්චමාසකො, පස් මස්සක් තෙමේ; පාදො, පාද නම්; එතෙන ලක්ඛණෙන, ඒ ලක්ෂණයෙන්; සබ්බජනපදෙසු, සියළු දනව්වල; කහාපණස්ස, කහවණුවගේ; චතුත්ථො භාගො, සතරවන භාගය; පාදො ඉති, පාදය යි; වෙදිතබ්බො, දතයුත්තේ යි; සො ච ඛො, ඒ කාර්ෂාපණයාගේ සතරින් එක් කොටසක්වූ පාදය ද; පොරාණස්ස, පුරාණයෙහිවූ; නීලකහාපණස්ස වසෙන, නිර්දෝෂවූ නීල කාර්ෂාපණයාගේ වශයෙන්; වෙදිතබ්බො, දතයුතු යි.

* පොරාණසත්ථානුරූපං, පෞරාණික ශාස්ත්‍රවලට එකඟව; උප්පාදිතො, උපදවන ලද; වීසතිමාසප්පමාණ උත්තමසුවණ්ණග්ඝනකො, විසි මස්සක් පමණ උතුම් රන් මිල අගනාවූ; ලක්ඛණසම්පන්නො, ලක්ෂණයෙන් සම්පූර්ණවූ කාර්ෂාපණය; නීලකහාපණො ඉති, නීලකාර්ෂාපණය යි; වෙදිතබ්බො, දතයුත්තේය; යස්මිං පදෙසෙ, යම් ප්‍රදෙශයෙක්හි; නීලකහාපණා, නිල් කහවණු; න සන්ති, විද්‍යමාන නො වෙත් ද; තත්ථ අපි, ඒ නිල් කහවණු නැති ප්‍රදෙශයෙහි ද; කාලවිරහිතස්ස, කාලවර්ණයෙන් මිදුනාවූ; නිද්ධන්තසුවණ්ණස්ස, පිඹගත්තාලද ස්වර්ණයාගේ, පඤ්චමාසග්ඝනකෙන, පස් මස්සක් අගනාවූ; භණ්ඩෙන, වස්තු වෙන්; පාදපරිච්ඡෙදො, පාදය වෙන්කිරීම; කාතබ්බො, කටයුත්තේ යි; (රිදී මසු පහක් ද රන්මසු පහක් ද තඹමසු දහයක් ද වී ඇටයක් පමණ ලොහ (යකඩ) ද ගෙණ සංයොග කිරීමෙන් සාදනලද්දේ නීලකාර්ෂාපණ නම් වේ.)

(අ) මෙකල ශත පසළොසක් රිදී එකකි. රිදී පහක් මාසක හෙවත් පතා එකකි. පතා පහක් පාද එකකි පාද සතරක් හෙවත් පතා විස්සක් කහවණු එකකි. මෙසේ බලන කල බුදුන් ජීවමාන කාලයෙහි කහවණුවක වටිනාකම මෙ කල රුපියල් පසළොසක් බැව් පෙනේ.

වත්මානික රන් කාසිය බරින් මසු (මඤ්චාඩි) අට විස්සකි. වටිනා කමින් රුපියල් දෙවිස්සකි. මෙය කලින් කල වටිනා කම හෝ බර ඌනාධිකව පැවති බව පෙනේ. නමුත් භීයොවෘති යෙන් ලොකයෙහි ව්‍යවහාරප්‍රාප්තවූයේ රුපියල් පසළොසක් අගනා කර්‍ෂාපණය ම බැව් අතීතය දෙස බැලීමෙන් සැලකේ. එහෙයින් මෙහි පාදවිනිශ්චය භීයොවෘතියට පැමිණි කර්‍ෂාපණ යෙන් ම උපාදෙයය.

එවිට මෙකල පාදයේ වටිනාකම රුපියල් තුණකුත් ශත හැත්තෑපහක් වේ. ශතහැත්තෑ පහක් වටිනා බඩු සොරකම් කිරීමෙන් පරිජිවන බව ඇතැම් ආචාර්‍ය්‍යවරු ශික්‍ෂා ගෞරවයට ඇතිකරගත් මතයක් මුත් පරිජි ඇවතට ප්‍රමාණ නොවන බව පැරණි තිදශීණ සැලකීමෙන් සඵුට වේ.

පරිවාර පාළියෙහි.

* "චත්තාරො ජනා සංවිධාය ගරුභණ්ඩං අවහරුං
තයො පාරාජිකා එකො න පාරාජිකො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා" යි,

සමන්ත පාසාදිකාවෙහි.

"චත්තාරො ජනා ආචරියන්තෙවාසිකා ජ මාසිකං ගරුභණ්ඩං හරිතුකාමා ජාතා තත්‍ර ආචරියො ත්වං එකං මාසකං හර ත්වං එකං ත්වං එකං අහං තයො හරිස්සාමීති ආහ. අන්තෙ වාසිකෙසු පන පඨමො තුම්හෙ භන්තෙ තයො හරථ ත්වං එකං හර ත්වං එකං හර අහං එකං හරිස්සාමී ති ආහ

---

* චත්තාරො ජනා, සතර දෙනෙක්; සංවිධාය, එකිනෙකාට විධානකොට; ගරුභණ්ඩං, ගරු බඩුවක්; අවහරුං, සොරාගත්හ; (තෙසු, ඔවුන් අතුරෙන්;) තයො, තුන් දෙනෙක්; පාරාජිකා, පාරාජිකා වූහ; එකො, එකෙක්; න පාරාජිකො, පරිජි, නුවූයේය; එසා පඤ්හා, මේ ප්‍රශ්නය තෙම, (මෙහි ලිංගවිපර්‍ය්‍යාශයි) කුසලෙහි, විනයෙහි දක්‍ෂයන් විසින්; චින්තිතා, සිතිය යුත්තාහ.

> ඉතරෙපි වෙ එවමෙවං ආහංසු එකමෙකස්ස එකො මාසකො සාහත්ථිකො හොති තෙන තෙසං දුක්කටං පත්තියො පඤ්ච ආණත්තිකා තෙහි තිණ්ණම්පි පාරාජිකං ආචරියස්ස පන තයො සාහත්ථිකා තෙ හිස්ස ථුල්ලච්චයං තයො ආණත්තිකා තෙ හි පි ථුල්ලච්චය මෙව."

(ආ) මස්සක් හෝ උණු මස්සක් සොරකම් කිරීමෙන් දුකුලාවට ද ඉතිරි මස්සක් හෝ උණු පස් මස්සක් ගැණීමෙන් තුලසියට ද පස් මස්සක් හෝ ඉතිරි පස් මස්සක් ගැණීමෙන් පාරාජිකාවට ද පැමිණේ. "**අදින්නාදානෙ තිණසලාකමත්තෙනාපි වත්ථුනා**"යි **සමන්ත** පාසාදිකාවෙහි ආ හෙයින් හෙරණුන්ට හා උවසුවන්ට තණ කූරක් පමණකු දු සොරසිතින් ගැණීමෙන් අදත්තාදාන විරමණ ශික්ෂාවගේ භින්නත්වය ලැබේ.

කඞ්ඛා විතරණියෙහි.

> "ආදියන්තස්ස මාසකෙ වා ඌනමාසකෙ වා දුක්කටං අතිරෙකමාසකෙ වා ඌනපඤ්චමාසකෙ වා ථුල්ලච්චයං පඤ්චමාසකෙ වා අතිරෙකපඤ්චමාසකෙ වා පාරාජිකං"

අන්සතු වස්තුවක් වීමය අන් සතු වස්තුවකැයි හැඳිනීමය වටිනා කමින් මසුපහක් වීමය සොරසිත ඇතිවීමය තුබූ තැණින් කෙසගක් පමණකුදු ඉවත් කිරීමය යන මේ පස්දෙන **අදත්තාදාන පාරාජිකාවට** අංග වෙති.

### 4 මනුස්සපාණං පාණො ති ජානං වධක චෙතසා ජීවිතා යො වියොජෙති සාසනා සො පරාජිකො

යො, යම් මහණෙක් තෙම; මනුස්සපාණං, මිණිස් සතෙකු; පාණො ඉති, පණ ඇත්තෙකැ යි; ජානං, (ජානන්තො) දැනගණිමින්; වධකචෙතසා, නසනු කැමති සිතින්; (හෙවත් මරණු කැමති සිත කරණ කොට ගෙණ) ජීවිතා, ජීවිතෙන්ද්‍රියෙන්; වියොජෙති, වෙන් කෙරේ ද; සො, ඒ මහණ තෙමේ; සාසනා, **සම්බුද්ධ** ශාසනයෙන්; පාරාජිකො, (භවෙ) පැරදුනේ වන්නේ යි.

සං:– 1 **මනුස්සපාණං.**

මෙහි මනුෂ්‍ය ජීවිතය ම අභිප්‍රේත හෙයින් දෙව යක්ෂ ප්‍රේත තිරශ්චීන ජීවිත තොර කිරීමෙන් පරිජි නො වේ.

ජීවිතින්ද්‍රිය වනාහි නාම ජීවිතින්ද්‍රියය රූප ජීවිතින්ද්‍රිය ය යි ද්වි ප්‍රකාරවේ. නාම ජීවිතින්ද්‍රියය චිත්ත නම්වූ විඤ්ඤාණයෙහි ද රූප ජීවිතින්ද්‍රියය රූපස්කන්ධයෙහි ද පවත්නේය. එයින් නාම ජීවිතෙන්ද්‍රියය හෙලනු නොහැකි වෙයි. කුමක් හෙයින යත්? ජීවිතෙන්ද්‍රිය චෛතසිකයා තමා උත්පාදස්ථිතිභංග වශයෙන් යුහුසුළු පෙරලුම් ඇති බැවිනි. රූප ජීවිතෙන්ද්‍රිය හෙලනු හැකිවෙයි. කුමක් හෙයින යත්? රූප ජීවිතෙන්ද්‍රියයා තමා ආයුෂ දීර්ඝවන හෙයිනි. නාම ජීවිතෙන්ද්‍රියෙන් යුත් කුඩා චිත්තක්ෂණ සතලොසක් ගතවන කාලය එක රූප ජීවිතෙන්ද්‍රියයක් වෙයි. රූප ජීවිතෙන්ද්‍රියය හෙලූකල්හි නාම ජීවිතෙන්ද්‍රියය ද හළුයේ නම් වේ. රූප ජීවිතෙන්ද්‍රියය සමග නාම ජීවිතෙන්ද්‍රියයාගේ නිරුධය ඇතිහෙයින් එසේ වන්නේය. ප්‍රත්‍යුත්පන්න අතීත අනාගත යයි කියන ලද්දාවූ කාලත්‍රය අතුරෙන් ප්‍රත්‍යුත්පන්න කාලයෙහි පවත්නාවූ රූප ජීවිතෙන්ද්‍රියය ම හෙලිය හැක්කේ වෙයි. අන් කාලෙක නොහැකි වෙයි. ඒ ප්‍රත්‍යුත්පන්න තෙමේ ද ක්ෂණ ප්‍රත්‍යුත්පන්නය සන්තති ප්‍රත්‍යුත්පන්නය අද්ධා ප්‍රත්‍යුත්පන්නය යි ත්‍රිවිධාකාර වේ. ඒ ත්‍රිවිධාකාරයන් අතුරෙන් කුඩා චිත්තක්ෂණයවූ උත්පාදස්ථිතිභංග කාලතෙමේ ක්ෂණ ප්‍රත්‍යුත්පන්න නම් වේ. ස්වභාව සදෘශවූ සප්ත වීථියක් හෝ අෂ්ට වීථියක් ආයුෂ ඇත්තාවූ කුසල ජවනය අකුසල ජවනය ක්‍රියා ජවනය යන මොවුන්ගේ කාල තෙමේ සන්තති ප්‍රත්‍යුත්පන්න නම් වේ, ච්‍යුතිය හා ප්‍රතිසන්ධිය අතර කාලතෙමේ අද්ධා ප්‍රත්‍යුත්පන්න නම් වේ. යථෝක්ත ප්‍රත්‍යුත්පන්නයන් අතුරෙන් සන්තති අද්ධා ප්‍රත්‍යුත්පන්න වයෙහි වූ රූප ජීවිතෙන්ද්‍රියය හෙලනු හැකි වෙයි; ප්‍රතිසන්ධික්ෂණයෙහි කායදසක වස්තුදසක භාවදසක යන්ගේ වශයෙන් ත්‍රිංසති ප්‍රභේදයක් ඇත්තාවූ කලල රූපය හටගණී. ඒ අවස්ථාවෙහි පටන් බෙහෙත් ආදීවූ උපක්‍රම මාර්ගයෙන් ජීවිතෙන්ද්‍රියය හෙලිය හැකි බව දතයුතු

## සං:– 2 වධකචේතනා.

ජීවිතෙන්ද්‍රියය නැසීමට යොදන ලද ප්‍රයොගයෙන් හටගත්තාවූ මරණු කැමති චේතනාව මෙහි වධක චිත්තය යි ප්‍රකාශ කෙළේ යි. ස්වභාව වශයෙන් තියුණුවූ දෞර්මනස් වේදනාව හා සමග එකොත්පාදාදී වශයෙන් මිශ්‍රීභාවයට ගියාවූ ප්‍රතිඝයෙන් යුත් මෙහෙයුම් රහිතවූ එක් සිතෙක මෙහෙයුම් සහිතවූ එක් සිතෙක යන මොව්හු ජීවිතෙන්ද්‍රියය නසන වධක චිත්තයෝ වෙත්. මරණු රිසිනැත්තේ මැරී නම් පරිජ් නොවේ. තුලසි වේ. මැරූ පසු රිසි වීනම් පරිජ් වේ.

## සං:– 3 විශෝජේති

සාහත්ථිකය නිස්සග්ගියය ආණත්තියය ථාවරය විජ්ජාමයය ඉද්ධිමය යි පණ වෙන් කිරීමෙහි ප්‍රයෝගයෝ සදෙනෙක් වන්නාහ.

කඞ්ඛා විතරණියෙහි

"පාණාතිපාතස්ස ඡප්පයොගා සාහත්ථිකො නිස්සග්ගියො ආණත්තියො ථාවරො විජ්ජාමයො ඉද්ධිමයො ති"

(1) **සාහත්ථික ප්‍රයෝගය:–** තමා අතින් හෝ තමාගේ ශරීරය පිළිබඳ වූ කඩු දුනු ආදියකින් රූප ජීවිතෙන්ද්‍රියය හෙලීම සාහත්ථික නම් වේ. මෙසේ මිණිස් දිවි හෙලන්නා වූ භික්ෂු තෙමේ පාරාජිකාපත්තියට පැමිණේ.

(2) **නිස්සග්ගිය ප්‍රයෝගය:–** දුර සිටියාවූ මිණිසෙකු ඊතල ආදියෙන් පහර දී මැරීම නිස්සග්ගිය නමි. නිස්සය නිස්සග්ගිය අනිස්සය නිස්සග්ගිය යි නිස්සග්ගිය විප්‍රකාර වේ. අසවල් නම් ඇති මිණිසා මරමැ යි ඊතල ආදිය යෙදීමෙන් එම මිණිසා මැරේ නම් භික්ෂු තෙමේ පාරාජිකාවට පැමිණේ. අනිකෙකු මැරි නම් උද්දිස්සය වැරද ගිය හෙයින් පරිජි නොවේ. නිස්සය නිස්සග්ගිය විනිශ්චය මෙසේ දතයුතු. අසවලා මැරේවා යි විශෙෂයක් නොසිතා මරණු පිණිස ඊතල හැරීමෙන් මිණිසෙකුගේ දිවිතොරවූ කල්හි භික්ෂුවක් නම් පරිජි ඇවතට (උවසුවෙක් නම් ශීල භෙදයට) ද පැමිණේ. යම් භික්ෂුවක් තෙමේ මුවහත් තබන ලද්දවූ ආවුධයක් මුවහත් දකිනු පිණිස පිදුරු ගොඩකට ඒ ආවුධය ගසන්නාවූ කල්හී මව හෝ පියා හෝ රහත් කෙනෙක් ඒ පහර ලබා මලේ වීනම් ව්‍යවහාර වශයෙන් මරණය කිය යුත්තේ නමුදු පාරාජිකාවට හා ආනන්තරියට නො පැමිණේ. මරණු කැමති සිත ඇති කල්හි ම කම් බඩ වේ. අනිස්සය නිස්සග්ගියය මෙසේ දතයුතු වෙයි.

(3) **ආණත්ති ප්‍රයෝගය:–** මෙරමා ලවා මැරවීම ආණත්තිය යි කියනු ලැබේ. වස්තුය කාලය ඕකාශය ආවුධය ඊයාපථය ක්‍රියාවිශෙෂය යන සයාකාරය ආණත්තීහුගේ ප්‍රභෙද වන්නාහ.

ඔවුන් අතුරෙන් වස්තු යනු මරණු ලැබූ සත්ව තෙමේ යි කාල යනු පෙරවරු පස්වරු ආදී කාලය යි. ඕකාශ යනු

ග්‍රාමාරණ්‍යාදී ස්ථානය යි. ආවුධය යනු කඩු දුනු ආදී ආවුධය යි ඊයඪාපථ යනු යාම් ඊම් ආදිය යි. ක්‍රියා විශෙෂ යනු ඇණීම් කැපීම් ආදිය යි.

## නිදේශ ප්‍රතිනිදේශ විනිශචය.

a **වස්තු විනිශචය:-** අසවල් මිණිසා මරව යි මෙහෙයුම් ලද මහණ තෙමේ මෙහෙයූ පරිදිම මැරී නම් දෙදෙන ම කම් බඩ (පරිජි) වේ. අන් මිණිසෙක් මැරී නම් ඇණවුම් කළහු වස්තුව වැරද ගිය හෙයින් පරිජි නො වේ. ඇණවූම් ලදහු ම පරිජි වේ.

b **කාලවිනිශචය:-** පෙරවරු කාලයෙහි මරව යි මෙහෙ යුම්ලද මහණතෙමේ පස්වරු කාලයෙහි මැරී නම් මෙහෙයුම් කළහු කාලය වැරද ගිය හෙයින් පරිජි නො වේ. මෙහෙයූ පරිදි මැරී නම් දෙදෙනම කම් බඩ (පරිජි) වේ.

c **ඕකාශ විනිශචය:-** මෙ ගම්හි මිණිසෙකු මරව යි මෙහෙයුම් ලද මහණ තෙමේ අන් ගම්කයෙකු මැරී නම් මෙහෙයුම් කළ මහණ ස්ථානය වැරද ගිය හෙයින් පරිජි නො වේ. මෙහෙයුම් ලදහු ම පරිජි වේ. මෙහෙයූ පරිදි මැරී නම් දෙදෙන ම පරිජි වේ.

d **ආවුධ විනිශචය:-** කඩුවකින් ඇණ මරව යි මෙහෙ යුම් ලද මහණ තෙමෙ හෙල්ලකින් ඇණ මැරී නම් ආවුධය වැරද ගිය හෙයින් මෙහෙයුම් කළ මහණ පරිජි නො වේ. මෙහෙයුම් ලදහු ම පරිජි වේ. මෙහෙයූ පරිදි මැරී නම් දෙදෙන ම පරිජි වේ.

e **ඊයඪාපථ විනිශචය:-** යන්නහු මරව යි මෙහෙයුම් ලද මහණ තෙමේ හුන්නහු මරා නම් ඉරියව් වැරද ගිය හෙයින් මෙහෙයුම් කළහු පරිජි නො වේ. මෙහෙයුම් ලදහු ම පරිජි වේ මෙහෙයූ පරිදි මැරී නම් දෙදෙන ම පරිජි වේ.

f **ක්‍රියාවිශෙෂ විනිශචය:-** ඇණ මරව යි මෙහෙයුම් ලද මහණ තෙමේ සිඳ මරා නම් ක්‍රියා විශෙෂය වැරද ගිය හෙයින් මෙහෙයුම් කළහු පරිජි නො වේ. මෙහෙයුම් ලදහු ම පරිජි වේ. මෙහෙයූ පරිදි මරා නම් දෙදෙන ම පරිජි වේ.

සමන්ත පාසාදිකාවෙහි.

"වත්ථු කාලො ච ඔකාසො ආවුධං ඉරියා පථො
කිරියා විසෙසො ති ඉමෙ ඡ ආණත්ති නියාමකා"යි

(4) **ථාවර ප්‍රයෝගය**:- බොරු වල් කැණීම් වැව් පොකුණු ආදියෙහි විෂ ලෑම් වශයෙන් මැරීම ථාවර ප්‍රයොග නම් වේ. අසවල් මිණිසා වැටී මැරේවා යි බොරු වල් කැණීමෙන් වැව් පොකුණු ආදියෙහි විෂ ලෑමෙන් නියම කළහු ම මැරී නම් භික්ෂුව පාරාජිකාවට පැමිනේ. අනිකෙක් මැරී නම් නියමය වැරද ගිය හෙයින් පරිජි නො වේ.

(5) **විද්‍යාමය ප්‍රයෝගය**:- මන්ත්‍ර ජප කිරීමෙන් මැරීම විද්‍යාමය ප්‍රයොග නම් වේ. අථර්වන වේදය හැදෑරූ භික්ෂුහු තුමූ සතුරන් ඉදිරියට පැමිණි කල්හි භය උපදවන්නාවූ වනාන්තර හෝ විෂම අතීසාරාදී රෝග උපදවත්. එසේ මිණිස් ජීවිතය නැසුයේ නම් පරිජි වේ.

(6) **ඍද්ධිමය ප්‍රයෝගය**:- කර්මයාගේ විපාකවූ ආනුභාශක්ති යෙන් මැරීම ඍද්ධිමය ප්‍රයෝග නම් වෙයි. හේ වනාගී නාගිද්ධි සුපණ්ණිද්ධි යක්ඛිද්ධි දෙවිද්ධි රාජිද්ධි යන මොවුන්ගේ වශයෙන් බොහෝ ප්‍රභෙද වන්නාහ.

දෂ්ට දිෂ්ට පුෂ්ට වශයෙන් නාගරාජයෝ අනුන්ට හිංසා පීඩා කෙරෙති. හේ නාගිද්ධි නම් වේ. සුපර්ණ රාජයෝ මහා සමුද්‍ර යෙහි බඹ දෙතුන් සියයක් පමණවූ නාගයන් අල්වා ගණිත්. ඒ සුපණ්ණිද්ධි නම් වේ. යක්ෂයෝ එන්නාහු පහර දෙන්නාහු නොපෙනෙත්. ඔවුන් ගසන ලද්දෝ එතන්හි ම මැරෙත්. හේ යක්ඛිද්ධි නම් වේ. වෛශ්‍රවණ වරම් රජතෙමේ සෝවාන් වීමට පෙර කුම්භාණ්ඩයන් දෙස ඇස රවා බැලී නම් කුම්භාණ්ඩයෝ මැරෙත්. අන් දෙවියන්ගේ දේවානුභා ශක්තිය ද දෙවිද්ධි නම් වේ. සක්විති රජුගේ ආකාශචාරී භාවය ද ධර්මාශොක රජහුගේ ආඥාචක්‍රය යට පොළොවෙහි හා මතු ආකාශයෙහි පැතිරීමෙහි ද සිංහල ද්වීපය ආණ්ඩුකළාවූ පිතු නම් රජහුගේ දළ මැඩීමෙන් චූලසුමන සිටුහුගේ මරණයෙහි ද රාජිද්ධිය දතයුතු. මෙසේ ඍද්ධි මාර්ගයෙන් මිණිස් දිවි ගැලවූ භික්ෂුව පාරාජිකාවට (උවසුව ශීල භෙදයට) ද පැමිණේ.

සං:- **පරාජිකො.**

"පාරාජිකො"යි වක්තව්‍ය නමුත් ඡන්දානු රක්ෂණ වශයෙන් පකාරයාගේ අවයවවූ ආකාරය හ්‍රස කොට, "පරාජිකො"යි වියු.

ටීකාවෙහි.

"පාරාජිකො ති වත්තබ්බෙ ජනුනුරක්ඛණත්ථං පරාජිකො ති වුත්තං"

**"කිලෙසාරීහි පරාජීයතෙ පරාජියිත්ථා ති වා පාරාජිකො"**යි නිර්වචන හෙයින් කෙලෙස් සතුරන් විසින් එම අත් බැව්හි පුනොපසම්පදා බවට අභව්‍ය කිරීම් වශයෙන් පරදවනු ලැබේ නුයි පාරාජිකා නම් වේ.

පරිවාර පාළියෙහි.

* "පාරාජිකන්ති යං වුත්තං තං සුණොහි යථා තථං
චුතො පරද්ධො භට්ඨො ච සද්ධම්මාහිනිරාකතො
සංවාසො පි තහිං නත්ථි තෙනෙතං ඉති වුච්චති."

(අ) පරිජිවූ මහණ තෙමේ ගිහි බවට හෝ හෙරණ බවට හෝ පත්වී නැවත සරණාගමනය පටන් සිල් රැක මනාව පිළිපැදීමෙන් අභීත් මාගීඵල හැර සෙසු මාගීඵල ලබන්ට සුදුසු වන්නේය.

විශුඩිමාගී අනුටීකාවෙහි.

"ජිනනමූලානම්පි හි පාරාජිකාපත්තිවුඨානෙන හෙඨා පරිරක්ඛිතං සීලං විසුඩං නාම හොති තෙන තෙසං මග්ගපටිලාභොපි සම්පජ්ජතී ති"

තිරිසන් ගතයෙකුට දුක් ඉපදවීමෙහි දුකුළාව ද මිණිසෙකුට දුක් ඉපදවීමෙහි තුලසිය ද යක්ෂ ප්‍රේතයින් මැරීමෙහි තුලසිය ද තිරිසනුන් මැරීමෙහි පචිතිය ද මිණිසුන් මැරීමෙහි පාරාජිකාව ද වන්නේය.

කඞ්ඛා විතරණියෙහි.

"තිරච්ඡානස්ස ච දුක්ඛුප්පත්තියම්පි දුක්කටමෙව මනුස්සජාතිකස්ස දුක්ඛුප්පත්තියං ථුල්ලච්චයං තථා යක්ඛාදීනං

* පාරාජිකං ඉති, පාරාජිකායයි; යං, යමක්; වුත්තං, කියන ලද ද; තං, ඒ අර්ථය; යථා තථං, තත්වූ පරිද්දෙන්; සුණොහි, අසව; සද්ධම්මා, ශාසනයෙන්; චුතො, සැවේ ද; පරද්ධො, පැරදුනේ වේ ද; භට්ඨො ච, ගිලිහුනේ වේ ද; අභිනිරාකතො, ඔහු විසින් වෙසෙසින් දුරු කරණලද ද; තහිං, ඔහු කෙරෙහි; සංවාසො අපි, එක කම් එකොද්දෙශ සමශික්ෂා සංඛ්‍යාත සමග විසීමෙක් ද; නත්ථි, නැත; තෙන, එහෙයින්; එතං, මේ ආපත්තිය; ඉති වුච්චති, පාරාජිකය යි මෙසේ කියනු ලැබේ.

4.

මරණෙ තිරච්ඡානගතමරණෙ පාචිත්තියං මනුස්සමරණෙ පාරාජිකන්ති”

තෙමේ තම දිවි තොරකර ගැණීමය තෙමේ තම දිවි අනුන් ලවා තොර කරවා ගැණීමය යන දෙදෙන පාරාජිකාවට වස්තු නො වේ. එයින් දුකුලා වේ.

සමන්ත පාසාදිකාවෙහි.

“අත්තනො අත්තානං ජීවිතා වොරොපෙන්තං මිගලණ්ඩිකෙන ච වොරොපාපෙන්තං පාරාජිකවත්ථුං න හොති”යි.

මනුෂ්‍යජාතිය වීමය ප්‍රාණය ඇතැයි දැනීමය මරණු කැමති සිත ඇතිබවය ඊට සුදුසු උපක්‍රමය මැරීමය යන මේ පස “මනුෂ්‍ය විග්‍රහ පාරාජිකාවට” අංග වෙති.

5 ඣානාදිභෙදං හදයෙ අසන්තං
අඤ්ඤ, පදෙසඤ්ච විනාධිමානං
මනුස්සජාතිස්ස වදෙය්‍ය භික්ඛු
ඤාතක්ඛණෙ තෙන පරාජිතො ති.

භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ; අඤ්ඤපදෙසං ච, අනිකක්හුගේ කීම ද; අධිමානං ච, අධිගතය යි උපන්මානය ද; විනා, හැර හදයෙ, තමාගේ සිත්හි; අසන්තං, නැත්තාවූ; ඣානාදිභෙදං, ධ්‍යානාදී ප්‍රභෙද ඇති උත්තරි මනුෂ්‍යධර්මය; මනුස්සජාතිස්ස, මිණිස් ජාති ඇත්තෙක්හට; වදෙය්‍ය, කියා නම්; තෙන, ඒ මිණිස් ජාති ඇත්තහු විසින්; ඤාතක්ඛණෙ, දැනගණුලැබූ ඇසිල්ලෙහි; (සො, ඒ භික්ෂු තෙමේ;) ඉති, මේ සර්වඥශාසනයෙන්; පාරාජිකො; පැරදුනේ වේ;

සං:- 1 ඣානාදිභෙදං.

මෙහි ආදි ශබ්දය කාරණකොට ගෙණ ත්‍රිවිධ විමොක්ෂය ත්‍රිවිධ සමාධිය අෂ්ටසමාපත්තිය සතර මාර්ගය සතර ඵලය ක්ලෙශ ප්‍රහාණය යනාදී වූ උතුරු මිණිස් දම් ගැණෙත්.

මෙසේ වූ උතුරු මිණිස් දම් ගැණීමෙන් සිල් නැත්තෝ සිල් ඇත්තෙමි ත්‍රිපිටකය නොදරන්නෝ ත්‍රිපිටකය දරමි ධුතාඞ්ග නොදරන්නෝ ධුතාඞ්ග දරමි යි කීම් මාත්‍රයකින් පාරාජිකාවට නො පැමිණෙන්නේය යන අර්ථය ආචාර්‍ය්‍ය තෙමේ හැඟවූයේය. අන්‍ය ආපත්තීන්ට වනාහී පැමිණෙන්නේය.

සං: 2 **භද්දෙස අසන්තං.**

උතුරු මිණිස් දම් ලැබියැටි මහණ තෙමේ තම අදහස් මෙරමාහට කීමෙන් පරිජි නො වේ.

සං:– 3 **අඤ්ඤාපදෙසං.**

අසවල් මහණ තෙමේ රහත. තොපගේ වෙහෙර වස්වා ගණිව්. මේ ආදී වශයෙන් මෙරමා ගන්වා අසත්‍යවූ මිථ්‍යාවචන කීයේ නම් පරිජි නො වේ. තුලසි ම වේ.

සං:– 4 **මනුස්ස ජාතිකො.**

මිණිස් දූ හට යයි කීමෙන් මිණිස් වෙස් ගත් ගරුඬ නාගාදී තිරිසනුන්ට ද දිව්‍ය යක්ෂ ප්‍රේතාදීන්ට ද උත්තරි මනුෂ්‍ය ධර්මය කීමෙන් පරිජි නො වේ.

සං:– 5 **ඤාතකභාවො.**

උතුරු මිණිස් දම් කියන ලදහු තබා අතිකෙක් දූනගණි නම් පරිජි නො වේ.

උත්තරි මනුෂ්‍ය ධර්මය ප්‍රකටව නැතිබවය අයහපත් ඊප්සාවක් සඳහා කියා පෑමය තමාගේ ශරීරයට සුදුසු පරිද්දෙන් එලවා කීමය කියන ලදහු මිණිසෙක් වීමය එකෙණෙහි දූන ගැණිමය යන මේ පස්දෙන මේ **"උත්තරි මනුෂ්‍ය ධර්ම පාරාජිකාවට"** අංග වෙති.

මූලසික්ඛා වර්ණනාවෙහි

**පාරාජිකා නිර්දේශය නිමි.**

---

## 6 මොචෙතුකාමචිත්තෙන උපක්කම්ම විමොචයං සුක්කමඤ්ඤත්‍ර සුපිනා සමණො ගරුකං ඵුසෙ

මොචෙතුකාමචිත්තෙන, සුකුරු මිදියැටි සිතින්; සුපිනා, සවප්නයක්; අඤ්ඤත්‍ර, හැර; සුක්කං, ශුක්ලය; උපක්කම්ම, උත්සාහ කොට; විමොචයං, (විමෝචයන්තො) මුදවන්නාවූ; සමණො, මහණ තෙමේ; ගරුකං, උඪාත ගරුත්වයෙන් ගරුක නම්වූ සංඝාදි ශෙෂාපත්තියට; ඵුසෙ, පැමිණෙන්නේයි.

### සං:- 1 මොචෙතුකාමචිත්තෙන.

මොචනාස්වාද රාගයෙන් මෙහෙයූ කාමාවචර ලොභමූලික අකුසල්සිත මෙහි මොචෙතුකාමචිත්ත නම් වේ. මොචනාස්වාද රාගයෙන් තොරව හස්ත ග්‍රහණාදී වශයෙන් මාගමක් ස්පර්ශ කිරීමෙන් සුකුරු මිදුනේ නමුදු මොචනාස්වාද රාගය නැති හෙයින් සුක්කවිස්සට්ඨිකා නම් සංඝාදිශෙෂය නො වේ. මෙවුම්දම් සෙවියැටි සිතින් ස්පර්ශ කොළේ නම් කාය සංසග්ග සංඝාදිශෙෂය වන්නේ යි.

මොචනාස්වාද රාගය වනාහී එකොළොස් රාගයන් අතුරෙන් එකකි. ඒ එකොළොස නම් මොචනාස්වාදය මුච්චනාස්වාදය මුක්තාස්වාදය මෛථුනාස්වාදය ස්පර්ශාස්වාදය කණ්ඩුවණාස්වාදය දර්ශනාස්වාදය නිශද්‍යාස්වාදය වාචාස්වාදය ගෙහසිත ප්‍රෙමාස්වාදය වණභඞ්ග්‍යාස්වාදය යන මොහු යි.

සමන්ත පාසාදිකාවෙහි.

> “තත්‍රිමෙ එකාදසරාගා මොචනස්සාදෙ මුච්චනස්සාදෙ මුත්තස්සාදෙ මෙථුනස්සාදෙ ඵස්සස්සාදෙ කණ්ඩුවණස්සාදෙ දස්සනස්සාදෙ නිසජ්ජස්සාදෙ වාචස්සාදෙ ගෙහසිතපෙමං වණභඞ්ගියං ති”

### සං: 2 උපක්කම්ම

උත්සාහ කිරීම මෙහි උපක්‍රම නම්. අත්පා දඬුමුගුරු ආදියෙන් උත්සාහ කොට සුකුරු මිදියැටි සිතින් සුකුරු නො මුදවා රසවිඳ ගැණීම් මාත්‍රය පමණක් කරන්නාවූ මහණහට සඟ වෙසෙස් නො වේ. තමාගේ අඞ්ගජාතයෙහි මෙරමා ලවා උපක්‍රම යොදවා සුකුරු තුබූ තැනින් නො සෙල්වී නම් තුලසියට ද සෙලවී නම් සඟ වෙසෙසට ද පැමිණේ. කුඩා මැස්සෙක් බොන පමණකුදු සුකුරු සෙලවීම් මාත්‍රය ම මීට පමණී. මූත්‍ර මාර්ගයට බැස පිටවූයේ හෝ නුවූයේ සඟ වෙසෙස් වන්නේය.

කඞ්ඛා විතරණියෙහි

> සචෙ පන පරෙන අත්තනො අඞ්ගජාතෙ උපක්කමං කාරෙත්වා මොචාපෙති ආපජ්ජතියෙව චෙතෙත්වා අනන්තමසො ආකාසෙ කටිකම්පනෙන පි නිමිත්තෙන උපක්කමන්තස්ස සචෙ නමුච්චති ථුල්ලච්චයං සචෙ පන අනන්තමසො යං එකා බුද්දකමක්ඛිකා පිවෙය්‍ය තත්තකම්පි ඨානතො මුච්චති දකසොතං අනොතිණ්ණෙ පි සඞ්ඝාදිසෙසො ඨානතො පන චුතං අවස්සමෙව දකසොතං ඔතරති තස්මා දකසොතං ඔතිණ්ණමත්තෙන බහි නික්ඛන්තෙ වා අනික්ඛන්තෙ වා සඞ්ඝාදිසෙසො”යි.

සං:– 3 **අඤ්ඤත්‍ර සුපිනා.**

‘සුපිනා”යි කම්මාර්ථ නිස්සක්ක වචන යි.

රාගයෙන් මඩනාලද සිත් ඇතිව ඌරු අත්මිටි ආදියෙන් අඞ්ගජාතය දැඩිකොට පෙළා සුකුරු මිදවීම පිණිස උත්සාහ වනුයේ හොවී ද එසේ හෝනා ලද්දහුට සුකුරු මිදුනු කල්හි සඟවෙසෙස් වේ. රාගය පිළිකුල් වශයෙන් මෙනෙහි කොට සුඛවූ සිත් ඇත්තේ සයනය කෙරේ නම් එසේ සයනය කළාහට සුකුරු මිදුන කල්හි සඟ වෙසෙස් නො වේ.

සමන්තපාසාදිකාවෙහි.

> “සචෙ පන සයනකාලෙ රාගපරියුට්ඨිතො හුත්වා ඌරූනා වා මුට්ඨිනා වා අඞ්ගජාතං ගාළ්හං පීළෙත්වා මොචනත්ථාය සඋස්සාහො සුපති සුපන්තස්ස චස්ස අසුචි මුච්චති සංඝාදිසෙසො සචෙ රාගපරියුට්ඨානං අසුභමනසිකාරෙන වූපසමෙත්වා සුඛචිත්තො සුපති සුපන්තස්ස මුත්තෙපි අනාපත්ති”

සං:– 4 **ගරුකං.**

උඨාන ගරුත්වයෙන් සඟ වෙසෙස් ඇවතට “**ගරුක**”යි නම් කළෝ “**සංඝො ආදිම්හි චෙව සෙසෙසු ච ඉච්ඡිතබ්බො අස්සා ති සංඝාදිසෙසො**”යි නිරුක්ති හෙයින් සඟ වෙසෙස් අවන් භික්ෂුව විසින් පිහිටිය යුතු ආදිය යි කියන ලද පිරිවෙස්හි ද ශෙෂය යි කියන ලද මානත් අබ්භාන කර්මයන්හි ද සංඝයා විසින් කැමති විය යුත්තේ මේ ඇවතට නුයි සංඝාදිශෙෂ නම්.

පරිවාර පාළියෙහි.

† "සංඝාදිසෙසො ති යං වුත්තං තං සුණොහි යථා තථං
සංඝො ව දෙති පරිවාසං මූලාය පටිකස්සති
මානත්තං දෙති අබ්භෙති තෙනෙතං ඉති වුච්චති"යි

දූෂිත සිල් ඇති භික්‍ෂුවගේ සුඛය පිණිස වත් මානත් අබ්භාන කර්‍මයන්ට සංඝයා ම උවමනා බැවින් සංඝාදි ශෙෂ නාමය යෙදේ.

(අ) පිළිසන් සඟ වෙසෙස් ඇත්තහුට පිරිවෙස් දීම ද පිරිවෙස් අතර සඟ වෙසෙස් අවන්හුට මූලාය පටිකස්සනය ද පිළිසන්වූ ද නොපිළිසන්වූ ද ඇවැත් ඇත්තහුට මානත් දීම ද පුරුදුකළ මානත් ඇත්තහුට අබ්භානය ද මොනවට පිළිපන්න හුට ඔසාරණිය ද මොනවට පිළිනොපන්නහුට නිස්සාරණිය ද පණවන ලදී.

මණොරථ පූරණියෙහි.

"ගරුකාපත්තිං ආපන්නස්ස පටිච්ඡන්නාය ආපත්තියා පරිවාසදානං පඤ්ඤත්තං පරිවාසෙ අන්තරාපත්තිං ආපන්නස්ස මූලාය පටිකස්සනං පඤ්ඤත්තං පටිච්ඡන්නායපි අපටිච්ඡන්නායපි ආපත්තියා මානත්තදානං පඤ්ඤත්තං චිණ්ණමානත්තස්ස අබ්භානං පඤ්ඤත්තං සම්මා වත්තන්තස්ස ඔසාරණියං පඤ්ඤත්තං අසම්මා වත්තන්තස්ස නිස්සාරණියං පඤ්ඤත්තං"යි

සුකුරු මිදියැටි සිත් ඇතිබවය උත්සාහ කිරීමය තුබූ තැනින් සෙලවීමය යන තිදෙන "**සුක්ක විස්සට්ඨිනා සංඝාදිසෙසයට**" අංග වෙති.

---

† සංඝාදිසෙසො ඉති, සංඝාදිශෙෂයයි; යං, යමක්; වුත්තං, කියන ලදද; තං, එය; යථා තථං, තතු සේ; සුණොහි; අසව; සංඝො එව, සංඝයා ම; පරිවාසං, පිරිවෙස්; දෙති, දෙයි; මූලාය පටිකස්සති, මූලාය පටිකස්සනකර්‍මය කෙරෙයි; මානත්තං, මානත්; දෙති, දෙයි; අබ්භෙති, අබ්භාන කර්‍මය කෙරෙයි; තෙන, සංඝයා මුල මැද අග යන තුන් තැනම කැමතිවිය යුතුය යන අර්‍ථයෙන්; එතං, මේ ආපත්තිය; ඉති වුච්චති, සංඝාදි ශෙෂය යි කියනු ලැබේ. (මේ ඇවතට පැමිණ ඉන් නැගී සිටිනු කැමති මහණහට ආදියෙහි පිරිවෙස් දීම පිණිස ද මධ්‍යයෙහි මූලාය පටිකස්සන මානත් ආදිය දීම පිණිස ද අවශානයෙහි අබ්භානය කිරීම පිණිස ද සංඝයා කැමතිවිය යුතුයි. එහෙයින් සංඝාදිශෙෂය යි කියනු ලැබේ.)

## 7 කායසංසග්ගරාගෙන මනුස්සිත්ථිං පරාමසං ඉත්ථිසඤ්ඤී උපක්කම්ම සමණො ගරුකංඵුසෙ

මනුස්සිත්ථිං, මනුෂ්‍ය ස්ත්‍රියෙකු ඉත්ථිසඤ්ඤී, ස්ත්‍රියෙක යන සංඥ ඇතිව; උපක්කම්ම, උත්සාහ කොට; කායසංසග්ගරාගෙන, කායසංසර්ගයෙහි ඇලෙන්නාවූ රාගයෙන්; පරාමසං, (පරාමසන්තො) අල්වන්නාවූ; සමණො ශ්‍රමණ තෙම; ගරුකං, ගරුකාපත්තියට; ඵුසෙ, පැමිණෙන්නේ යි.

### සං:– 1 කායසංසග්ගරාගෙන.

රාගී සිතින් ස්ත්‍රී ශරීරය ස්පර්ශ කිරීමෙන් කාය සංසර්ග රාගය ලැබේ. එසේ ස්පර්ශ කළාහට මේ ඇවත කියන ලදී. රාගයෙන් තොරව ගෙහසිත ප්‍රේමයෙන් මව හෝ අල්වන්නා වූ භික්‍ෂු තෙමේ දුකුළාවට පැමිණේ. යටත් පිරිසයින් සිත් කම් කළ ඉතිරි රූ ඇල්වීමෙහි ද දුකුළා වේ

සමන්ත පාසාදිකාවෙහි.

“ගෙහසිත පෙමෙන ඵුසතො පච්චයා දුක්කටං ති”

එහිම

“අනන්තමසො චිත්තකම්මලිඛිතෙ පි ඉත්ථිරූපෙ දුක්කට මෙව” යි.

රාගයෙන් තොරව පාත්‍රා පිළිගැණීම් ආදිය ඇතිකල්හි මාගමුන් ස්පර්ශ වීමෙන් ද සිහි නැතිව අත්පා දිගහැරීම් ආදිය ඇතිකල්හි මාගමුන් ස්පර්ශ වීමෙන් ද කායසංසර්ග සංඝාදිශෙෂය නො වේ (මෛථුන සේවනය කළාහට පූර්වභාගයෙහි කාය සංසර්ගය ද අවශානයෙහි පාරාජිකාව ද වේ.)

විනයත්ථ මඤ්ජූසාවෙහි

“එවං හි අචෙතෙත්වා පත්තපටිග්ගහණාදීසු මාතුගාමස්ස අඞ්ග ඵුට්ඨෙ පි අනාපත්ති අසතියා හත්ථපාදපසාරණකාලෙ ඵුසන්තස්ස අනාපත්ති” යි.

### සං:– 2 මනුස්සිත්ථිං.

මිණිස් මාගම්හු ම මීට ගොදුරු වෙත්. අන්හු නො වෙත්. දෙවඟනක් ඇල්වීමෙන් තුලසියට ද තිරිසන් ගිය මාගමක් ඇල්වීමෙන් දුකුළාවට ද පැමිණේ.

සමන්ත පාසාදිකාවෙහි.

“සචෙ පි පරනිම්මිතවසවත්තිදෙවියා කායසංසග්ගං සමාපජ්ජති ථුල්ලච්චය මෙව නාගමානවිකාය පි සුපණ්ණමානවිකාය පි කින්නරියා පි ගාවියාපි දුක්කට මෙව” යි.

සං:– 3 ඉත්ථිසඤ්ඤී.

මේ ආපත්තිය පහළවීමට ස්ත්‍රී සංඥව විද්‍යමානවියයුතු හෙයින් පුරිස් සංඥ ඇතිව මාගමුන් සපශී කෙළේ නම් සඟ වෙසෙස් නො වේ තුලසි වේ.

කඞ්ඛා විතරණියෙහි.

"ඉත්ථියා වෙමතිකස්ස පණ්ඩක පුරිස තිරච්ඡානගත සඤ්ඤිස්ස ච ථුල්ලච්චයං"යි.

සං:– 4 උපක්කමම.

කායික උත්සාය මෙහි උපක්‍රමය යි විඥත යි. සේවන අද හස් ඇතියේ නිශ්චලවූ කයින් හුදෙක් සපශීය ඉවසා නම් ඔහට චිත්තුප්පාද මාත්‍රයෙන් ඇවැත් නො වේ.

විනයත්ථ මඤ්ජුසාවෙහි.

"යො සෙවනාධිප්පායො නිච්චලෙන කායෙන කෙවලං ඵස්සං පටිවිජානාති සාදියති අනුභොති තස්ස චිත්තුප්පාද මත්තෙන න ආපත්තියා අභාවතො අනාපත්තී ති ආහ"

මිණිස් මාගමක් වීමය මාගමකැ යි හැඳිනීමය රාගයෙන් මෙහෙයූ සිත් ඇති බවය කායික උත්සාහය සපශීය යන මේ පස් දෙන "කායසංසග්ග සංඝාදි ශෙෂයට" අංග වෙති.

8 දුට්ඨුල්ලවාචාස්සාදෙන මගගං වා රබ්භ මෙථුනං ඔභාසනෙතා මණුස්සිත්ථිං සුණමානං ගරුං ඵුසෙ

සුණමානං, ඇසියයුතු ස්ථානයෙහි සිටියාවූ; (නො:– ශ්‍රොත ප්‍රශාදයේන් යුක්තවූ;) මණුස්සිත්ථිං, මිණිස් මාගමකට; මගගං වා, වච්ච පස්සාව මාර්ගයන් ද; මෙථුනං වා, මෛථුනය ද; ආරබ්භ (උද්දිස්ස) උදෙසා; දුට්ඨුල්ලවාචාස්සාදෙන, මෛථුන ධම් ප්‍රතිසංයුක්ත රාගයෙන්; ඔභාසන්තො, ලාමකවචන බණින්නාවූ ශ්‍රමණ තෙමේ; ගරුං, ගරුකාපත්තියට; ඵුසෙ, පැමිණෙන්නේය;

සං:– 1 දුට්ඨුල්ලවාචාස්සාදෙන

මල මූත්‍ර මාර්ගයන් පිළිබඳ මෛථුන ධම් ප්‍රතිසංයුක්ත වාග් බිණීම දුට්ඨුල්ලවාචාස්වා ද නම් වේ. එසේ වාග් බිණීමෙන් මේ ආපත්තිය සිඩ යි. අර්ථ ධර්මූපසංහිත වාග් බිණීමෙන් මෙහි ඇවත නො වේ.

### සං:- 2 මග්ගං.

වච්ච පස්සාව මාර්ගයෝ මාර්ග නම් වෙත්. නී වතාගී නිමිත්ත නැත්තියෙකි. නිමිති මාත්‍රයක්ම ඇත්තියෙකි. ලෝහිතය නොම දෙන්නියකි. ඒකාන්තයෙන් ලෝහිතය මිදෙන්නීයෙකි. ලේවැකුණු වස්ත්‍ර ඇත්තියෙකි. පුරුෂයෙකු වැනි දූලි රැවුල් ඇත්තියෙකි. නීගේ නිමිත්ත දික්වූ මස් වැදලි සහිතය. නී වතාගී ස්ත්‍රී පණ්ඩකියක් වන්නීය. ස්ත්‍රී උභතොබ්‍යඤ්ජනකියක් වන්නීය. මේ ආදීවූ බිණුම් මාර්ගය සඳහා බිණුම් වෙති. මෙසේ මාර්ගය සඳහා බිණීමෙන් සඟ වෙසෙස් වේ. කාය පිළිබඳ බිණුම් වලින් දුකුළා වේ. මෙසේ කියන්නහුට වචන ගණනින් ද ස්ත්‍රී ගණනින් ද ඇවැත් සිදුවේ.

කඞ්ඛා විතරණීයෙහි.

> "සිඛරිණීසි සම්භින්නාසි උභතොබ්‍යඤ්ජනාසී ති ඉමෙසු තීසු අඤ්ඤතරෙන අක්කොසවචනෙන වා මාතුගාමං ඔභාසන්තස්ස සංඝාදිසෙසො නාම ආපත්ති නිකායො හොතී ති කායපටිබද්ධං ච ආදිස්ස වණ්ණාදිභණනෙ සබ්බත්ථ දුක්කටං ඔභාසන්තස්ස සම්බහුලා ච ඉත්ථියො එකාය වාචාය ඔභාසන්තස්ස වාචා ගණනාය චෙව ඉත්ථි ගණනාය ච ආපත්තියො."

### සං:- 3 මෙථුනං.

ස්ත්‍රී පුරුෂයන්ගේ සාමග්‍රි රසාස්වාදය මෛථුන නම්. එසේවූ මෛථුන පූජාව උතුම් ය. මෛථුනය තෙපි පිදූහු ද? මෛථුනය පූජාර්හ වස්තුවකි. කවර කලෙක තොපගේ මව්පියෝ ප්‍රසන්න වූවාහු ද? කවර කලෙක මම මෛථුනය ලැබූයෙම් ද. කෙසේ දුන්කල්හි මෛථුනයෙහි යෙදෙන්නෙම් ද? යන මේ ආදී වශයෙන් කීම මෛථුනය සඳහා කීම නම් වේ.

### සං:- 4 සුණමානං.

නො ඇසෙන ස්ථානයෙහි සිටියාවූ ස්ත්‍රියකටද භාෂාව නො දත් ස්ත්‍රියකට ද ලාමක වචන බිණීමෙන් සඟ වෙසෙස් නො වේ යයි මේ පදයෙහි අර්ථ විසින් හැගේ.

මිණිස් මාගමක් වීමය මිණිස් මාගකැයි හැඳිනීමය ලාමක වචනයෙන් උපන් රාගය ඒ රාගයෙන් කීමය කී ඇසිල්ලෙහි දූනීමය යන මේ පස්දෙන දුට්ඨුල්ලවාචා සංඝාදිශෙෂයට අංග වෙති.

### 9 වණ්ණං වත්වා අත්තනො කාම පාරිචරියාය මෙථුනං ඉත්ථිං මෙථුනරාගෙන යාචමානො ගරුම්ඵුසෙ

අත්තනො, තමහට; කාමපාරිචරියාය, මෛථුනයෙන් උත්සාහ කිරීමක්හුගේ; වණ්ණං වත්වා, ගුණ කියා; මෙථුන රාගෙන, මෛථුනයෙහි ඇලීම කරණ කොට ගෙණ; ඉත්ථිං, මිණිස් මාගමක් අතින්; මෙථුනං, මෛථුනය; යාචමානො, ඉල්වන්නාවූ; (සමණො, ශ්‍රමණ තෙම;) ගරුං, ගරුකා පත්තියට; ඵුසෙ, පැමිණෙන්නේ යි.

#### සං:– 1 අත්තනො කාමපාරිචරියාය.

තමහට මෛථුනයෙන් උත්සාහ කිරීමෙන් සඟ වෙසෙස් වන්නේය යි කීහෙයින් මෙරමාහට මෛථුනයෙන් උත්සාහ කරවා නම් සඟ වෙසෙස් නො වේ.

#### සං:– 2 ඉත්ථිං.

මෙසේ සාමාන්‍ය ස්ත්‍රිය කීයේ නමුදු මනුෂ්‍ය ස්ත්‍රියක් ම ගතයුත්, තේය. යක්ෂ ප්‍රේත තිරශ්චීනස්ත්‍රීහු නොගත යුත්තාහුය.

#### සං:– 3 යාචමානො.

මෛථුනය ඉල්වූ කල්හී ලැබුනේ හෝ නො ලැබුනේ ඉල්වීම් මාත්‍රයකින් ම සඟ වෙසෙස් වේ.

මිණිස් මාගමක් වීමය මිණිස් මාගමකැ යි හැඳිනීමය තමා සඳහා මෛථුන රාගය ඉපදවීමය මෛථුනය ඉල්වීමය මාගම් තොමෝ දැනගැණීමය යන මේ පස **අත්තකාමපාරිචරියා සංඝාදිශෙෂයට** අංග වෙති.

### 0 සඤ්චරිත්තං පටිග්ගණ්හිත්වා පුරිසස්සිත්ථියා පි වා වීමංසිත්වා හරං පච්චා සමණො ගරුකම්ඵුසෙ

පුරිසස්ස පි වා, පුරුෂයෙකුගේ හෝ; ඉත්ථියා පි වා, මාගමක්හුගේ හෝ; සඤ්චරිත්තං, කෙලෙස් පිළිබඳ පණිවුඩ වචනය; පටිග්ගණ්හිත්වා, පිළිගෙණ; වීමංසිත්වා, අදහස් විමසා; පච්චාහරං, (පච්චා හරන්තො) නැවත පණිවුඩය ගෙණ යන්නාවූ; සමණො ශ්‍රමණ තෙමේ; ගරුකං, ගරුකාපත්තියට; ඵුසෙ; පැමිණෙන්නේයි.

සං:- 1 සඤ්ඤං.

අඹු සැමි බැව් පිණිස හිමියාගේ හෝ අඹුවගේ පණිවුඩ වචනය එලවා පුරුෂයාහට හෝ ස්ත්‍රියහට හෝ ඇස්වීම සඤ්ඤ පැමිණවීම නම් වෙයි. එසේ ඇතිකල්හි මේ සඟ වෙසෙස සිදු වේ.

ස්ත්‍රී පුරුෂයන්ගේ සඤ්ඤ පිළිගැණීමය අදහස් විමසීමය අදහස් කීමය යන තිදෙන **සංචරිත්ත සංඝාදිශෂශට** අංග වෙති.

**11 චාවෙතුකාමො චොදෙනො අමූලනතිම වඤ්ඤ**
**චොදපයං වා සමණො සුණමානං ගරුම්දූසෙ.**

චාවෙතුකාමො, ශාසනයෙන් නෙරපනු කැමැත්තෝ; සුණ මානං, ඇසියයුතු සථානයෙහි සිටියාවූ; (භික්ඛුං, භික්ෂුවට;) අමූලකනිම වඤ්ඤා, ඇසින් දැකීමය කණින් ඇසීමය යන මූලක් නැත්තාවූ පාරාජිකා වස්තුවකින්; චොදෙනො වා, තමා චොදනා කරමින් හෝ; චොදපයං වා, අනුන් ලවා චොදනා කරවමින් හෝ; සමණො, ශ්‍රමණ තෙමේ; ගරුං, ගරුකාපත්ති යට; දූසෙ, පැමිණෙන්නේ යි.

සං:- 1 චාවෙතුකාමො.

ශාසනයෙන් නෙරපනු කැමැත්ත ඇතිවියයුතු හෙයින් සස්නෙන් නෙරපනු නොරිසිවූයේ චොදනා කෙරේ නම් අමූලක සඟ වෙසෙස් නො වේ.

සං:- 2 අමූලකනිම වඤ්ඤා.

පාරාජිකා වස්තුව ඉක්මවා හැසිරීම සිය ඇසින් දැකීමය අනුන් කියන වචන ඇසීමය ඡායාව වැටහීමය යන මූල් සහිතව ප්‍රතික්කූල සංඥවෙන් චොදනා කෙළේ නම් සඟ වෙසෙස් නො වේ.

සං:- 3 සුණමානං.

චොදනාව ඇසියයුතු යයි කී හෙයින් චුදිතයා හට චොද නාව නො ඇසුනේ නම් සඟ වෙසෙස් නො වේ. ආක්‍රොෂ අදහසින් අසම්මුඛයෙහි කීමෙන් දුකුලාව ද සම්මුඛයෙහි කීමෙන් පචිති ද වේ.

විනයත්‍ථ මඤ්ජුසාවෙහි.

> "අක්කොසාධිප්පායෙන පරම්මුඛා වදන්තස්ස දුක්කටං සම්මුඛා වදන්තස්ස පාචිත්තියං"යි.

චුදිතයා කෙරෙහි සුඩ සංඥවය මූලක් නැතිබවය ශාසන යෙන් නෙරපනුකැමැත්තය චොදනා කිරීමය දැන ගැණීමය යන මේ පස මීට අංග වෙති.

## 12 ලෙසමත්තමුපාදය අමූලන්තිම වත්ථුනා චාවෙතුකාමො චොදෙන්තා සුණමානං ගරුම්ඵුසෙ

චාවෙතුකාමො, සස්නෙන් නෙරපනු කැමතිව; ලෙසමත්තං, ලෙස මාත්‍රයක්; උපාදය, රැගෙණ; සුණමානං, ඇසිය යුතු ස්ථානයෙහි සිටියාවූ; (භික්ඛුං, භික්ෂුවට;) අමූලන්තිම වත්ථුනා, මූලක් නැත්තාවූ අන්තිම වස්තුවකින්; චොදෙන්තා, (චා) චොදනා කරන්නාවූ හෝ චොදනාකරවන්නාවූ ශ්‍රමණ තෙමේ; ගරුං, ගරුකාපත්තියට; ඵුසෙ, පැමිණෙන්නේ යි.

### සං:– 1 ලෙසමත්තං.

ජාත්‍යාදීන් අතුරෙන් එක් කොටසක් වෙන් කිරීම ලෙස නම් වේ. එබඳු ලෙස මාත්‍ර ගොඩ චොදනා කිරීමෙන් දුතිය අමූලක සංඝාදිශෙෂය වේ.

ජාති නාම ගොත්ත ලිඞ්ග ආපත්ති පත්ත චීවර උපජ්ඣාය ආචරිය සෙනාසන යන මේ දසවිධ ලෙසයෝ මීට ගොදුරු වෙති.

පාරාජිකා පාළියෙහි

> "ලෙසො නාම දස ලෙසා ජාති ලෙසො නාම ලෙසො ගොත්ත ලෙසො ලිඞ්ග ලෙසො ආපත්ති ලෙසො පත්ත ලෙසො චීවර ලෙසො උපජ්ඣාය ලෙසො ආචරිය ලෙසො සෙනාසන ලෙසොති"

ප්‍රථම අමූලක ශික්ෂාපදයෙහි අනුන්ගෙන් ඇසුවෙමි යි ඇසුවක් ගරුකොට චොදනා කිරීමය දෙවෙනි අමූලක ශික්ෂා පදයෙහි සියැසින් දිටිමි යි දුටුවක් ගරුකොට චොදනා කිරීමය යනුම වෙනසි. මේ ශික්ෂාවන්ට දුඨදොෂ නාමය ද අටුවා වල ව්‍යවහාර කරණු ලැබේ. යටකී අඞ්ග පසට ලෙසාංගය එක්වැ මෙහි ෂඞ්ංග වෙති.

මූලසික්ඛ වණ්ණනාවෙහි

**ගරුකාපත්ති නිද්දේශය නිමි.**

---

## 13 විකප්පනමධිට්ඨාන මකත්වා කාලචීවරං
## දසාහමතිමාපෙති තස්ස නිස්සග්ගියං සියා

(යො භික්ඛු, යම් මහණෙක් තෙමේ) **අකාල** චීවරං, නොකල්හි උපන් සිවුරක්; විකප්පනං, (ච) විකපුන් ද; අධිට්ඨානං, (ච) අදිටන් ද; අකත්වා, නො කොට; දසාහං, දින දසයක්; **අතිමාපෙති**, ඉක්මවන්නේ වීනම්; (තස්ස, ඒ මහණහට) නිස්සග්ගියං, හැර **දූමීම්** සංඛ්‍යාත විනය කර්මය ඇති පචිත්තිය; සියා වන්නේ යි.

### සං:- 1. විකප්පනං.

විශෙෂයෙන් තැන්පත් කිරීම විකප්පන නම්. සම්මුඛ පරම්මුඛ වශයෙන් ඒ විකප්පනය ද්විප්‍රකාර වේ. එයින්, සම්මුඛ විකප්පනය නම් **"ඉමං චීවරං තුය්හං විකප්පෙමි"** යි බැණ **එක්** භික්ෂුවක් සමීපයෙහි විකප්පනය කළ ඉක්බිති විකප්පනය ලැබූ භික්ෂු තෙමේ **"ඉමං චීවරං මය්හං සන්තකං පරිභුඤ්ජසි වා විස්සජ්ජෙසි වා යථාපච්චයං කරොහි"** යි බැණ පෙරළා විකප්පනය කටයුතු නොහොත් සිවුරු හිමියාට දියයුතු.

පරම්මුඛ විකප්පනය නම් **"ඉමං චීවරං තුය්හං විකප්පනත්ථාය ද**ම්මි" යි භික්ෂුවක් සමීපයෙහි බැණ විකප්පනය කළ යුතු විකප්පනය ලැබූ භික්ෂු තෙමේ **"ඉත්ථන්නාමස්ස සන්තකං පරිභුඤ්ජසි වා විස්සජ්ජෙසි වා යථාපච්චයං වා කරොහි"** යි මෙරමා සමීපයෙහි බැණ සිවුරු හිමියාහට සිවුර දිය යුත්තේය.

(අ) සම්මුඛ විකප්පනයෙන් තෙමේ විකපා අන්‍යයන් ලවා පච්චුද්ධරණය කරවීම ද පරම්මුඛ විකප්පනයෙන් අන්‍යයන් ලවා විකපවා අන්‍යයන් ලවා පච්චුද්ධරණය කරවීම ද මෙහි භේදය වෙයි.

පාළිමුත්තක විනය විනිච්ඡය සංග්‍රහයෙහි.

> "සම්මුඛා විකප්පනායං සයං විකප්පෙත්වා පරෙන පච්චුද්ධරාපෙති පරම්මුඛා විකප්පනායං පරෙනෙව විකප්පාපෙත්වා පරෙනෙව පච්චුද්ධරාපෙති ඉදමෙත්ථ නානා කරණං"

## සං:- 2 අධිට්ඨානං.

සිව්රු ඉටා ගැණීම අධිෂ්ඨාන නම්. දෙරියන් සමාරක්වූ අත්පස ඇතුලෙහි තුබූ සහල සිව්ර **"ඉමං සංඝාටිං අධිට්ඨාමි"** යි තෙවරක් බැණ ඉටිය යුතු. සෙසු සිව්රු කෙරෙහි දු මේ නයමැ යි.

අත්පසින් පිටත්හි වූ සහල සිව්ර **"එතං සංඝාටිං අධිට්ඨාමි"** යි තුන්යලක් බැණ ඉටිය යුතු.

(අ) වියතකට වඩා විස්තාරවූ රියනකට වඩා ආයත වූ වස්ත්‍ර ජාතීහු **"ඉමානි චීවරානි පරික්ඛාරචෝලානි අධිට්ඨාමි"** යි තුන්යලක් බැණ පරිෂ්කාර චොල වශයෙන් ඉටිය යුතු වේ.

## සං:- 3 අකාලචීවරං.

පවුරුණු මස ශුක්ල පක්ෂයෙහි පඤ්චමිය පටන් පවුරුණු පසළොස්වක දක්වා ඇති අචෙචක චීවර කාලයවූ එකොළොස් දිනය ද පවුරුණුයෙහි පටන් කඨිනක්ෂෙත්‍ර වූ මාසය ද හෙමන්ත සාරමස දැයි මේ පස්මස් එකොළොස් දිනය චීවර ලාභයට යොග්‍ය හෙයින් චීවරකාලය යි කියනු ලැබේ. මෙයින් පිටත්හි වූ ගිම්හාණ සාරමස ද වස්සානයෙහි දෙමස් එකුන්විසි දිනය ද යන සමස්එකුන්විසි දින අකාලය යි කියනු ලැබේ. මෙහි අකාලයෙහි ලැබූ සිව්රු අකාල චීවර නම් වේ. අකාල චීවර ලබා දස දිනකට පෙර විකල්පනය හෝ අධිෂ්ඨානය නොකරන්නාවූ භික්ෂු තෙමේ නිසගි පචිත්තියට පැමිණෙයි. යථොක්ත කාල අකාලවය කඨිනානිසංසයෙහි ශීඝ්‍රප්‍රාප්තයාහට ම වේ කඨිනොද්ධාරයාහට නො වේ. කඨිනොද්ධාරප්‍රාප්තයාහට වනාහි කඨිනොද්ධාරයෙන් සෙසු කාලය ද අකාලබවට පැමිණි මෙන් අකාලය දීඝ වන්නේය. කාලය හ්‍රස්ව වන්නේය. කාලයෙහි මේ දසාහාතික්කමන චීවර නිස්සග්ගිය නො වේ. මෙහි චීවර ශබ්දයෙන් වස්ත්‍රාදිය ද ගැණේ.

(අ) **"අතික්කමාපෙති"** යි කියයුත්තේ නමුදු කකාරයන් ලොප් කොට **"අතිමාපෙති"** යි ඡන්දානුරක්ෂණය සඳහා කිවුය.

## සං:- 4 නිස්සග්ගියං.

**"නිස්සජ්ජනං නිස්සග්ගියං"** යි නිර්වචන හෙයින් වස්තුව හැර දැමීම් සංඛ්‍යාත විනයෙහි යෙදුම නිස්සග්ගිය නම්.

පරිවාර පාළියෙහි.

> * **"නිස්සග්ගියන්ති යං වුත්තං තං සුණොහි යථා තථං**
> **සංඝමජ්ඣෙ ගණමජ්ඣෙ එකකස්සෙව එකතො**
> **නිස්සජ්ජිත්වාන දෙසෙති තෙනෙතං ඉති වුච්චති"**

නිසඟි පචිති ලත් භික්ෂූන් විසින් තම තමන්ට අකැපවූ ඒ ඒ වස්තූන් කෙරෙහි තුබූ ආලය මුදා සඝගණපුගුලන් වෙත පැවරූ ඉක්බිති භික්ෂුවක් හමුවෙහි ඇවැත් දෙසීමෙන් ආපත්ති වුඨානය කළයුත්තේ යි.

**"ඉදං මෙ භන්තෙ වීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමි"** යි සංඝයා හමුවෙහි තුන්යලක් බැණ වසතු හලයුත්තේය. ඉක්බිති ඇවැත් දෙසූ කල්හි සංඝයා විසින් මෙහෙයූ භික්ෂුවක් විසින් **"''ඉමාහං චීවරං ආයස්මතො දම්මි"**යි බැණ සිවුරු හිමියාට ම පෙරළා සිවුර දිය යුත්තේය. මේ වනාහි සංඝයා කෙරෙන් ආපත්තිවුඨාන ක්‍රමය යි.

**"ඉදං මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං ඉමාහං ආයස්මන්තානං නිස්සජ්ජාමි"**යි ගණයා හමුවෙහි තුන් යලක් බැණ වසතුහලයුත්තේය. ඉක්බිති ඇවැත් දෙසූකල්හි ගණයා විසින් මෙහෙයනලද භික්ෂුවක් විසින් **"ඉමාහං චීවරං ආයස්මතො දම්මි"** යි බැණ සිවුරු හිමියාට ම පෙරළා සිවුර දියයුත්තේය. මේ වනාහි ගණයා කෙරෙන් ආපත්තිවුඨාන ක්‍රමය යි.

**"ඉදං මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි"**යි වෘධ භික්ෂුවක් හමුවෙහි තුන්යලක් බැණ වසතු හලයුත්තේය. ඉක්බිති ඇවැත් දෙසූ කල්හි නිසදුම්ලද භික්ෂුව විසින් **"ඉමාහං චීවරං ආයස්මතො දම්මි"**යි බැණ සිවුරු හිමියාට ම පෙරළා සිවුර දියයුත්තේය. මේ වනාහි පුද්ගලයා කෙරෙන් ආපත්තිවුඨාන නයයි.

---

* **නිස්සග්ගියං ඉති**, නිස්සග්ගිය යයි; **යං**, යමක්; **වුත්තං**, කියනලද ද; **තං**, එය; **යථා තථං**, තතු සේ; **සුණොහි**, අසව; **සංඝමජ්ඣෙ**, සංඝයාමැද හෝ; **ගණමජ්ඣෙ**, ගණයාමැද හෝ; **එකකස්සෙව**, එකෙක්හට ම; **එකතො**, එකෙක්; **නිස්සජ්ජිත්වාන**, යම් වසතුවක් නිසඳා; **දෙසෙති**, ඇවැත් දෙසා ද; **තෙන**, එබැවින්; **එතං**, මේ ඇවත; **ඉති වුච්චති**, නිස්සග්ගිය යි මෙසේ කියනු ලැබේ.

## 14 භික්ඛු සම්මුතියාඤ්ඤත්‍ර තිචීවරමධිට්ඨිතං එකාහමතිමාපෙන්ති නිස්සග්ගි සමයං විනා

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ) අධිට්ඨිතං, නාම් වශයෙන් ඉටාගන්නාලද්දාවූ; තිචීවරං, තුන් සිව්රෙන්; (කරණ උපයොගයි) භික්ඛු සම්මුයා අඤ්ඤත්‍ර, සම්මුතිය ලැබුවාවූ භික්ෂුවක් හැර; සමයං විනා, චීවර කාලය තබා; එකාහං, එක් දිනක්; අතිමාපෙති, ඉක්මවන්නේ වී නම්; (තස්ස, ඒ භික්ෂුහට;) නිස්සග්ගියං, හැරදැමීම් සංඛ්‍යාත විනය කර්මය ඇත්තාවූ චීවර **විප්පවාස** නම් නිසගි පචිතිය වේ.

"**නිස්ස**ග්ගියං" යි කිණිය යුතු තන්හී ඡන්දනු රක්ෂණ වශයෙන් "**නිස්ස**ග්ගි" යි වියූ.

සං:- 1 **තිචීවරං.**

**සංඝාටි** උත්තරාසංග අන්තරවාසක යන චීවරත්‍රය තිචීවර නම් වෙයි. ඒ තුන් සිව්රු අතුරෙන් **එක්** සිව්රකින් නමුත් අත්පසින් තොරව අරුණු ඉක්මවනලද්දේ තුන් සිව්රු ඉක්මවූයේ නම් වේ.

සමන්ත පාසාදිකාවෙහි.

"**තිචීවරෙනාති** අධිට්ඨිත **තිචීවරෙසු** යෙන කෙනචි **එ**කෙන විප්පවුත්ථොපි හි තිචීවරෙන විප්පවුත්ථො හොති" යි.

**"අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස චීවරෙන විප්පවසිතුං"** යි පණවා වදාළ හෙයින් ගිලනුන්ට චීවරවිප්පවාසය කළහැකි බැව් පෙනේ. තිචීවර නාමයෙන් අධිෂ්ඨාන කළාවූ තිචීවරිකයා සඳහා ම මේ චීවර විප්පවාස නිස්සග්ගිය කියන ලද්දේමය. පරිෂ්කාරචොල නාමයෙන් ඉටන ලද්දහු සඳහා නො කියන ලද්දේ යි. පරිෂ්කාර චොලිකයාහට චීවරවිප්පවාසය වූයේ නමුදු **නිසගි** නොවේ. **එ**හෙයින් චීවර පරිහරණ පහසු පිණිස පෞරාණිකාචාර්‍යවරු ඇතම් විට මෙය භාවිතා කොළෝ.

**සමන්ත පාසාදිකාවෙහි.**

"පරික්ඛාරචොලං නාම පාටෙක්කං නිධානමුඛමෙතං **තිචීවරං පරික්ඛාරචොලං** ති අධිට්ඨිත්වා පරිභුඤ්ජිතුං වට්ටති" යි.

සං:- 2 **සමයං විනා.**

කඨිනය නො අතුලකල්හී චීවර මාසය පමණක් කාලය වශයෙන් ද කඨිනය අතුලකල්හී චීවර මාසය හා හෙමන්ත

සාරමස ද යි පස්මස කාලය වශයෙන් ද මෙහි විවෘත කරණු ලැබේ.

පාරාජිකා පාළියෙහි

> “අකාලචීවරං නාම අනත්ථතෙ කඨිනෙ එකාදසමාසෙ උප්පන්නං අත්ථතෙ කඨිනෙ සත්තමාසෙ උප්පන්නං”යි

සමන්තපාසාදිකාවෙහි ද

> “එකාදසමාසෙ ති එකං පච්ඡිමකත්තිකමාසං ඨපෙත්වා සෙස එකාදසමාසෙ. සත්තමාසෙ ති කත්තිකමාසං හෙමන්තිකෙ ච චත්තාරො ති පඤ්චමාසෙ ඨපෙත්වා සෙසසත්තමාසෙ”ති

චීවරවිප්පවාසයෙන් නිසගි පචිති ලත් භික්ෂු තෙමේ සංඝයා හමුවෙහි “**ඉදං මෙ භන්තෙ චීවරං රත්තිං විප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජ්ජාමි**”යි බැණ ඇවැත් දෙසීමෙන් මේ චීවරවිප්පවාසනිස්සග්ගියෙන් මිදේ. ඉක්බිති ඇවතින් මිදුනුකල්හි සංඝයා විසින් අණවනලද භික්ෂුවක් විසින් “**ඉමාහං චීවරං ආයස්මතො දම්මි**”යි බැණ සිව්රු හිමියාට ම පෙරළා සිව්ර දියයුතු ගණ පුගුලන් කෙරෙන් ද යෙදෙන සේ යෙදිය යුතු යි.

**15 අඤ්ඤාතිකා භික්ඛුණියා පුරාණචීවරමපන ධොවාපෙති රජාපෙති ආකොටාපෙති තං සියා**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) අඤ්ඤාතිකාය, නෑ නොවන්නාවූ; භික්ඛුණියා, මෙහෙණින්නක් ලවා; පුරාණචීවරං පත, හැඳීම් මාත්‍රයක් කළාවූ සිව්ර; ධොවාපෙති වා, දොවවන්නේ හෝ වේද; රජාපෙති වා, රඳවන්නේ හෝ වේද; ආකොටාපෙති වා, අපුල්ලවන්නේ හෝ වේද; තං, (තස්ස) ඒ මහණහට; නිස්සග්ගියං, පුරාණචීවර ධොවාපන නම් නිසගි පචිතිය; සියා, වන්නේ යි.

“අඤ්ඤාතිකාය”යි කිණියයුතු තන්හී ඡන්දස් පිණිස යකාර ලෝපයෙන් “අඤ්ඤාතිකා”යි කීහු.

“තං”යි සම්ප්‍රදානාර්ථ උපයෝග වචන යි

“වා” ශබ්දය ඡන්දස්හුගේ හානිය වලකාණු පිණිස ලුපත යි

සං:- 1 අඤ්ඤාතිකාය.

මව් පසින් හෝ පිය පසින් හෝ සත්වෙනි කුලපරම්පරාව දක්වා කිසි ක්‍රමයකින් ඥාතිසම්බන්ධයක් නුවූවා අඤ්ඤාතිකා නම් වන්නී ය.

කඞ්ඛා විතරණීයෙහි

"මාතිතො වා පිතිතො යාව සත්තමයුගං තාව කෙනෙචි ආකාරෙන අසම්බඞ්ධායා"ති.

සං:- 2 පුරාණචීවරං පන.

වරක් හඳින ලද හෝ පොරෝනා ලද සිවුරු පුරාණචීවර බවට යෙති.

පාරාජිකා පාළියෙහි

"පුරාණචීවරං නාම සකිං නිවත්ථම්පි සකිං පාරුතම්පි"යි යටත්පිරිසයින් පාරිභොග වශයෙන් අංසයෙහි හෝ හිසෙහි හෝ ලාගණ මාගීයට පිළිපන්නේ ද හිස යට තබා ගණ වැදහොත්තේ ද එපමණකිනුත් පරණ බව වේ.

කඞ්ඛා විතරණීයෙහි

"යං අන්තමසො පරිභොගසීසෙන අංසෙ වා මත්ථකෙ වා කත්වා මග්ගං ගතො හොති උස්සීසකං වා කත්වා නිපන්නො එතම්පි පුරාණචීවර මෙව"යි.

16 අඤ්ඤාතිකාය භික්ඛුණියා හත්ථතො කිඤ්චි මූලකං අදත්වා චීවරාදානෙ නිස්සග්ගියං මුදීරිතං

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) කිඤ්චිමූලකං, කිසි වටිනා මිලයක්; අදත්වා, නො දී; අඤ්ඤාතිකාය, නෑ නොවන්නාවූ; භික්ඛුණියා, මෙහෙණින්නකගේ; හත්ථතො, අතින්; චීවරං, සිවුරක්; (ගණ්හාති, ගන්නේ වේ ද; තස්ස, ඒ මහණහට;) චීවරාදානෙ, සිවුරු ගැණීම හෙතුකොට ගෙණ; නිස්සග්ගියං, චීවරාදාන නම් නිසඟි පචිතිය; (භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්) උදීරිතං, ප්‍රකාශ කරණ ලද්දේ යි.

"චීවරාදානෙ"යි අපාදානාර්ථ භුම්මවචන යි.

17 අප්පවාරිතමඤ්ඤාතිං විඤ්ඤාපෙන්තස්ස චීවරං අඤ්ඤත්‍ර සමයා තස්ස නිස්සග්ගිය මුදීරිතං.

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) අප්පවාරිතං, නොපවරණ ලද්දාවූ; අඤ්ඤාතිං, නෑ නොවන්නාවූ ගිහියෙකු අතින්; චීවරං, සිවුරක්; අඤ්ඤත්‍ර සමයා, සිවුරු විනාශවූ කාලය හැර; විඤ්ඤාපෙන්තස්ස, ඉල්වන්නාවූ; තස්ස, ඒ මහණහට; නිස්සග්ගියං, චීවර විඤ්ඤාපන නම් නිසඟි පචිතිය; (භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්) උදීරිතං, ප්‍රකාශකරණ ලද්දේ යි.

"**අප්පවාරිතමඤ්ඤති**"යි අපාදනාර්‍ථ උපයොග වචන යි. "**සමයා**"යි කම්‍මාර්‍ථ නිස්සක්ක වචන යි.

සං:- 1 **අප්පවාරිතමඤ්ඤති.**

කප්පිය කාරකාදී වශයෙන් පැවරූවෙක් හෝ නෑයෙක් **අතින්** ඉල්වන්නාහට නිසගි නො වේ.

සං:- 2 **විඤ්ඤාපෙන්තස්ස**

ඉල්වීම් සංඛ්‍යාත ප්‍රයෝගය ඇතිකල්හි දුකුලාව ද වස්තු ලාභ යෙන් නිසගි ඇවත ද වේ.

කඞ්ඛා විතරණියෙහි

"විඤ්ඤාපන පයොගෙ දුක්කටං පටිලාභෙන නිස්සග්ගියං හොති"

(අ) මෙරමාගේ ප්‍රයෝජනය සඳහා ඉල්වන්නාහට ඇවැත් නො වේ.

සමන්ත පාසාදිකාවෙහි

"අඤ්ඤස්සාපි අත්‍ථාය විඤ්ඤාපෙන්තස්ස අනාපත්ති"යි.

සං:- 3 **අඤ්ඤත්‍ර සමයා.**

රජචෝරාදීන් විසින් සිවුරු පැහැරගත් කාලය හෝ **දිය** ගිනි ආදියෙන් නැසුනු කාලය මෙහි කාලය වන්නාහ.

18 **රජතං ජාතරූපං වා මාසකං වා කහාපණං**
**ගණ්හෙය්‍ය වා ගණ්හාපෙය්‍ය නිස්සග්ගි සාදියෙය්‍ය වා.**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) රජතං වා, රිදී හෝ; ජාතරූපං වා, **සවණ්ණයක්** හෝ; මාසකං වා, **මස්සක්** හෝ; කහාප ණං වා, කහවණුවක් හෝ; ගණ්හෙය්‍ය වා, තෙමේ ගණී නම් හෝ; ගණ්හාපෙය්‍ය වා, මෙරමාලවා ගන්නවා නම් හෝ; සාදි යෙය්‍ය වා, සිතින් ඉවසා නම් හෝ; (තස්ස, ඒ මහණහට) නිස්සග්ගියං, රූපිය පටිග්ගහණ නම් නිසගි පචිතිය වන්නේයි.

**නිස්සග්ගියං**,යි කිණිය යුතු තන්හි ඡන්දස් පිණිස "යං" කාර ලොපය යි.

සං:- 1 **මාසකං.**

ලොහමාසක දූරුමාසක ජතුමාසක යයි මසුභෙදත්‍රයක් වේ. ලොහාදියෙන් නිපයූ මසු ලොහමාසක නම්. දූව අරටු උන පතුරු ආදියෙන් හෝ නිපයූ මසු (යවත්පිරිසයින් රූපසවහන්

නැගූ තලපත්‍ර හෝ ව්‍යවහාරයට යේ නම් එය) දාරුමාසක නම් වේ. ලාකඩ මැලියම් ආදියෙන් නිපයූ මසු ජතුමාසක නම්.

(අ) රන් රිදී මසු කහවණු යයි කියනලද නිසඟි වස්තූහු තෙමේ සඳහා පිළි ගැණීමෙන් නිසඟි ද මෙරමා සඳහා නම් දුකුලා ද වේ.

සමන්ත පාසාදිකාවෙහි

> “අත්තනො අත්ථාය සම්පටිච්ඡතො නිස්සග්ගියං පාචිත්තියං සෙසානං අත්ථාය දුක්කටං”යි.

(ආ) භික්ෂූන් විසින් කොයිම ක්‍රමයකින්වත් රන් රිදී මසු කහවණු ඉවසීම හා සෙවීම නොවටී.

මහාවග්ග පාළියෙහි

> “නත්වෙවාහං භික්ඛවෙ කෙනචි පරියායෙන ජාතරූපරජතං සාදිතබ්බං ති වදාමි”යි.

(ඉ) ඇතැම් සැදැහැතියෝ මේ මුදලින් ආර්‍ය්‍යයන් වහන්සේට යමක් කැපනම් එය සපයා දෙවයි කැපකරුවන්ට මුදල් පවරත්. එසේ දෙනලද මුදලින් කැපවූවක් සපයා වළඳන්ට වටී. තවද ඉකුත් කල මහා පදුම නම් තෙරනු කෙනෙක් විසින් පුෂ්පපූජා සඳහා කහවණු ගණ්වා තිබෙන බැව් ද පෙනේ.

මහාවග්ග පාළියෙහි

> “සන්ති භික්ඛවෙ මනුස්සා සද්ධා පසන්නා තෙ කප්පියකාරකානං හත්ථෙ උපනික්ඛිපන්ති ඉමිනා යං අය්‍යස්ස කප්පියං තං දෙථාති=අනුජානාමි භික්ඛවෙ යං තතො කප්පියං තං සාදියිතුං”යි

සමන්ත පාසාදිකාවෙහි

> “මහා පදුමත්ථෙරොපි කිර වසභරඤ්ඤො දෙවියා රොගෙ උප්පන්නෙ එකාය ඉත්ථියා ආගන්ත්වා පුච්ඡිතො නජානාමී ති අවත්වා එව මෙව භික්ඛූහි සද්ධිං සල්ලපෙසි. තං සුත්වා තස්සා භෙසජ්ජමකංසු උපසන්තෙ ච රොගෙ තිචීවරෙන ච තීහි ච කහාපණසතෙහි සද්ධිං භෙසජ්ජචඞ්ගොටකං පූරෙත්වා ආහරිත්වා ථෙරස්ස පාදමූලෙ ඨපෙත්වා භන්තෙ පුප්ඵපූජං කරොථා ති ආහංසු, ථෙරො ආචරියභාගො අයං ති කප්පිය වසෙන ගාහාපෙත්වා පුප්ඵපූජං අකාසි”.

**"අහං භණෙන රූපියං පටිග්ගහෙසිං ඉදං මෙ භණෙත නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජ්ජාමි"** යි සංඝයා හමුවෙහි බැණ වස්තු නිසඳ ඇවැත් දෙසීමෙන් මෙහි වුඨානය ලැබේ.

**"එතානි දුතියං පත්තං සංඝෙ සෙසානි ලබ්භරෙ"** යි විග්‍රු හෙයින් රූපිය පටිග්ගහණ රූපිය පරිවත්තන උභණ පංචබන්ධන යන ආපත්තිත්‍රය සංඝයා කෙරෙන්ම ද සෙසු සත්විසි නිසගි ඇවැත් සංඝ ගණ පුද්ගලයන් කෙරෙන් ද නැගීම වේ.

19 **පරිවත්තෙන්තස්ස නිස්සග්ගි රජතාදි චතුබ්බිධං**
**කප්පියං කප්පියෙනා පි ඨපෙත්වා සහධම්මිකෙ**

(යො භික්ඛු, යම් භික්‍ෂුවක් තෙමේ) රජතාදි චතුබ්බිධං, රිදී ආදී සිව් වැදෑරුම් අකප්පිය වස්තුව; පරිවත්තෙන්තස්ස, අනිකකින් පෙරළන්නේ වී නම් හෙවත් විකුට ගන්නේ වී නම්; නිස්සග්ගියං, රූපිය පරිවත්තන නම් නිසගි පචිති වේ; කප්පියං, කැපවූ පාත්‍රාදී වස්තුවක්; කප්පියෙන අපි, කැපවූ පාත්‍රාදී වස්තුවකිනුදු; සහධම්මිකෙ, සහධාර්මිකයන් පස් දෙන; ඨපෙත්වා, හැර, පරිවත්තෙන්තස්ස, පෙරළන්නේ හෙවත් මාරුකරන්නේ නම්; නිස්සග්ගියං, කය වික්කය නම් නිසගි පචිති වේ.

සං:- 1 **කප්පියං.**

තල තෙල් මී පැනි ආදී බෙහෙත් ද්‍රව්‍ය හෝ පාත්‍ර සිවුරු ආදී පරිෂ්කාර හෝ කැප වස්තු නම් වෙත්.

**සමන්ත පාසාදිකාවෙහි**

"තෙලං මධුඵාණිතං භෙසජ්ජං ච ඉදං කප්පිය වත්‍ථු" යි.

සං:- 2 **සහධම්මිකෙ.**

භික්‍ෂු භික්‍ෂුණී සාමණේර සාමණේරි සික්ඛාමානා, යන මොව්හු පස් දෙන සහධර්මිකයෝ වෙති. මොවුන් සමග කැප වස්තුව කින් පෙරළා ගැණීමෙන් නිසගි පචිති නො වේ.

**සමන්ත පාසාදිකාවෙහි**

"පඤ්චහි සහධම්මිකෙහි සද්ධිං ඉදං ගහෙත්වා ඉදං දෙථා ති කය වික්කයං කරොන්තස්සා පි අනාපත්ති" යි.

(අ) දෙවසක් මුලුල්ලෙහි එක හත්තජ්ඣක සීලයෙහි පිහිට, හික්මුණු තැනැත්තිය ශික්ෂාමානා නම් වේ.

කඞ්ඛා විතරණීයෙහි

“වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිත සික්ඛමානං”යි ආපත්ති වුට්ඨානක්‍රම පෙරනයින් සැලකිය යුතු.

20 **විකප්පන මධිට්ඨාන මකත්වාන පමාණිකං**
**දසාහමතිමාපෙති පත්තං නිස්සග්ගියං සියා**

(සො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ) පමාණිකං, ප්‍රමාණයෙන් යුක්තවූ; පත්තං, පාත්‍රය; විකප්පනං ච, විකල්පනය කිරීමද; අධිට්ඨානං ච, අධිෂ්ඨාන කිරීමද; අකත්වාන, නොකොට; දසාහං, දස දිනක්; අතිමාපෙති, ඉක්මවන්නේ වී නම්; (තස්ස, ඒ මහණහට) නිස්සග්ගියං, දසාහතික්කමන පත්ත නිස්සග්ගිය නම් ඇවත; සියා, වන්නේ යි.

සං:– 1 **පමාණිකං**

සිංහල ද්වීපයෙහි ප්‍රකෘති නැලිය මහත් වෙයි. දෙමළ දෙශයෙහි නැලිය කුඩා වෙයි. මගධ දෙශයෙහි නැලිය මෙහි දක්වන පමණට සුදුසු වෙයි. ඒ මගධ නැලියෙන් එකහමාරක් සිංහල නැලියක් වෙයි.

සමන්ත පාසාදිකාවෙහි

“සීහලදීපෙ පකතිනාලි මහන්තා දමිළනාලි ඛුද්දිකා මගධ නාලි පමාණයුත්තා තාය මගධනාලියා දියඩ්ඪනාලි එකා සීහලනාලි හොති”

සං:– 2. **පත්තං.**

**“පත්තො නාම වෙ පත්තා අයො පත්තො මත්තිකා පත්තො”** යි පාරාජිකා පාළියෙහි ප්‍රකාශිත හෙයින් යකඩ පාත්‍රය මැටි පාත්‍රය යි ප්‍රධාන වශයෙන් පාත්‍රා දෙකක් බැව් පෙනේ. ඒ දෙක උක්කට්ඨය උක්කට්ඨුක්කට්ඨය උක්කට්ඨොමකය මජ්ඣිමය මජ්ඣිමුක්කට්ඨය මජ්ඣිමොමකය ඔමකය ඔමකුක්කට්ඨය ඔමකොමකය යි නවප්‍රභෙදයකි. ඒ උභය නවකය පිඬුකොට ගත් කල්හි අටලොසක් ප්‍රභෙද වන්නාහ.

මගධ නැලියෙන් පරණ ඇල් සහල් නැලි දෙකකින් ලැබූ බත් හා ඒ බතින් සතරෙන් කොටසක්වූ සූපය බහා ලූ කල යට රේඛාව හා සම වේ නම් හේ උක්කට්ඨ පාත්‍ර නම් වේ. එකී භක්තව්‍යඤ්ජනය බහා ලූ කල රේඛාවෙන් යට බසී නම්

හේ උක්කට්ඨුක්කඨ නම් වේ. රේඛාවෙන් මතු වේ නම් හේ උක්කට්ඨොමක නම් වේ.

මගධ නැළියක සහලින් ලැබූ බත් හා ඒ බතින් සතරෙන් කොටසක්වූ ව්‍යඤ්ජනය බහා ලූ කල යට රේඛාව හා සම වේ නම් හේ මජ්ඣිම නම් වේ. රේඛාවෙන් යට බසී නම් හේ මජ්ඣිමුක්කඨ නම් වේ. රේඛාවෙන් මතු වේ නම් හේ මජ්ඣිමොමක නම් වේ.

මගධ නැලිබාගයක සහලින් ලැබූ බත් හා ඒ බතින් සතරෙන් කොටසක්වූ සූපය බහා ලූ කල රේඛාව හා සම වේ නම් හේ ඔමක නම් වේ. රේඛාවෙන් යට බසී නම් හේ ඔමකුක්කඨ නම් වේ. රේඛාවෙන් මතු වේ නම් හේ ඔමකොමක නම් වේ. මෙ කී පාත්‍රා අතුරෙන් උක්කට්ඨුක්කට්ඨ ඔමකොමක යන් හැර සෙසු පාත්‍රා අධිෂ්ඨාන විකල්පනයන්ට සුදුසු වෙති.

(අ) ප්‍රමාණවත් මැටි පාත්‍රා දෙවරක් ද අයො පාත්‍රා පස්වරක් ද පිස අධිෂ්ඨාන හෝ විකල්පනය කළ යුතු වේ. නො පිසූ පාත්‍රා ද කාකණිකා මාත්‍රයක් පමණකුදු අන් සතුවූ පාත්‍රා ද අධිෂ්ඨාන විකල්පනයන්ට සුදුසු නො වේ.

සමන්ත පාසාදිකාවෙහි

"සචෙ එකොපි පාකො ඌනො හොති කාකණිකමත්තම්පි වා
මූලං අදින්නං න අධිට්ඨානූපගො විකප්පනූපගො"යි

රසවාහිණී ටීකාවෙහි

"කාකණිකමත්තන්නාම දියඩ්ඪ වීහි ති වදන්ති"

(අ) අදිටන් හෝ විකපූ පාත්‍රා මෙරමාහට දීමෙන් ද ගිහි වීමෙන් ද ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙන් ද කළුරිය කිරීමෙන් ද ලිඟු පෙරළීමෙන් ද ඉදිරීමෙන් ද මුව විටින් දෑඟුල් පමණ යට භාගයෙහි සිදුරු හටගැණීමෙන් ද යන මේ සත් ආකාරයෙන් පාත්‍රය පිළිබඳවූ අධිෂ්ඨාන විකල්පනයෝ බිඳෙත්.

සමන්ත පාසාදිකාවෙහි

"දින්න විබ්භන්ත පච්චක්ඛා කාලකිරියකතෙන ච
ලිඞ්ගපරිවුත්තිරා චෙව ඡිද්දෙන භවති සත්තමන්ති"

හල යුතු පාත්‍රය නො හලා බොජුන් වළඳ දෙවූ කල්හි දුකුලාවට පැමිණේ. ඉක්බිති ප්‍රයොග පමණින් ද දුකුලා වේ.

සමන්ත පාසාදිකාවෙහි

"නිස්සග්ගිය පත්තං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජතී ති යාගුං පිවිත්වා ධොතෙ දුක්කටං ති එවං පයොගෙ පයොගෙ දුක්කටං"

(ඉ) අධිෂ්ඨාන විකල්පනයන්ට නුසුදුසු පාත්‍රා හෝ තඹ මැටි යකඩමය බඳුන් භාජන පරිභොගයෙන් පරිහරණය කිරීමෙන් ඇවැත් නොවේ.

කුදුසිකෙහි

"කප්පියා ථාලකා තිස්සො තම්බායො මත්තිකාමයා" යි

සමන්ත පාසාදිකාවෙහි

"එතෙ භාජන පරිභොගෙන පරිභුඤ්ජිතබ්බා අනධිට්ඨානුපගා න විකප්පනූපගා" යි.

**21 පඤ්චබන්ධනතො ඌන පත්තෙන සති පරම්පන විඤ්ඤාපෙති නවම්පත්තං තස්ස නිස්සග්ගියං සියා**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ) පඤ්චබන්ධනතො, පස් බැඳුමකින් (පිළියම් පසකින්) යට; ඌනපත්තෙන සති, අඩුවූ පාත්‍රය ඇති කල්හි; පරංපන, අන්‍යවූ; නවං පත්තං, අලුත් පාත්‍රයක්; විඤ්ඤාපෙති, නො නෑ නො පැවරූවන් අතින් ඉල්වන්නේ වී නම්; (තස්ස, ඒ මහණහට,) නිස්සග්ගියං, හලයුතුවූ පචිති ඇවත; සියා, වන්නේ යි.

සං:- 1 **පඤ්චබන්ධනතො ඌනපත්තෙන සති.**

අදිටන් කළ පාත්‍රයෙහි යට රේඛාවෙන් පටන් ගෙණ දෑඟුල් දෑඟුල් අතර හැර පිළියම් පස පිරිය යුත්තේය. ලොහො මැඩිල්ලකින් පිළියම් නො කට හැකි තරම් සිදුරු මහත් වේ ද පිණ්ඩපාතය හෝ ගිලිහේ ද එබඳුවූ පාත්‍ර අකැප වෙති. අකැපවූ පාත්‍ර ඇතියේ ඉල්වී නම් ඕහට මේ ඌනපඤ්චබන්ධන පත්ත නිස්සග්ගිය නො වේ.

සමන්ත පාසාදිකාවෙහි

"එකම්පිදදුම්පි මහන්තං හොති පත්තෙන ආමිසං ලග්ගති අකප්පියො හොති අයං පත්තො අඤ්ඤො විඤ්ඤාපෙතබ්බො"

(අ) සංඝ නිමන්ත්‍රණය ඇතිතන්හි පුණු පස් බැඳුමෙන් ද පුද්ගල නිමන්ත්‍රණය ඇතිතන්හි ඌණු පස් බැඳුමෙන් ද ඉල්වීම වටී.

සමන්ත පාසාදිකාවෙහි

"එත්ථ ච සංඝවසෙන පවාරිතට්ඨානෙ පඤ්චබන්ධනෙනෙව වට්ටති පුග්ගලවසෙන පවාරිතට්ඨානෙ ඌනපඤ්චබන්ධනෙනපි වට්ටති"

22 **පටිග්ගහෙත්වා භුඤ්ජෙය්‍යා සප්පිතෙලාදිකම්පන**
**සත්තාහමතිමාපෙති තස්ස නිස්සග්ගියං සියා**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) **සප්පිතෙලාදිකං**, ගිතෙල් තලතෙල් ආදියක්; **පටිග්ගහෙත්වා**, පිළිගෙණ; **භුඤ්ජෙය්‍යා**, වළඳනුයේ; **සත්තාහං**, සත් දිනක්; **අතිමාපෙති**, ඉක්මවා නම්; **තස්ස**, ඒ භික්ෂුහට; **නිස්සග්ගියං**, **සත්තාහාතික්කමන** නිසගි පචිතිය; සියා, වන්නේ යි.

සං:- 1 **සප්පිතෙලාදිකම්පන**

මෙහි පන ශබ්දය පද පූරණ යි. ආදි ශබ්දයෙන් වෙඩරු මීපැනි උක්සකුරු යන තිදෙන ගැණෙත්.

23 **භික්ඛුස්ස චීවරං දත්වා අච්ඡින්දන්තස්ස තම්පුන**
**සකසඤ්ඤාය නිස්සග්ගි අච්ඡින්දාපයතො පි වා**

භික්ඛුස්ස, **එක් භික්ෂුවක්හට**; චීවරං දත්වා, සිවුරක් දී; පුන, නැවත; තං, ඒ සිවුර; **සකසඤ්ඤාය**, තමාගේය යන කල්පනාවෙන්; **අච්ඡින්දන්තස්ස** වා, පැහැර ගන්නා මහණහට ද; අච්ඡින්දාපයතො පි වා, පැහැර ගණ්වන්නාවූ මහණ හට ද; නිස්සග්ගියං, **චීවර අච්ඡින්දන** නම් නිසගි පචිතිය; සියා, වන්නේ යි.

සං:- 1 **අච්ඡින්දාපයතො පි වා.**

මෙහෙවර කරවා ගැණීමේ අභිලාසයෙන් මෙරමාහට සිවුරු දී මෙහෙවර නොලැබීමෙන් නැවත සිවුරු ගණිතම් ඒ මහණහට මේ ඇවත සිදු වේ. ගැණීම සඳහා ඇණවුම් කළහු දුකුළාවට ද ඇණවුම් ලදහු ගත් කල දෙදෙන ම නිසගියට ද පැමිණේ.

24 **අප්පවාරිතමඤ්ඤාතිං සුත්තං යාචිය චීවරං**
**වායාපෙන්තස්ස නිස්සග්ගි විනා ඤාතිපවාරිතෙ**

**අප්පවාරිතං**, නොපවරණ ලද්දාවූ; **අඤ්ඤාතිං**, නොනෑයෙකු අතින්; **සුත්තං** යාචිය, නූල් ඉල්වාගෙණ; **ඤාතිපවාරිතෙ**, නෑයන් පැවරූවන්; විනා, හැර; චීවරං, සිවුරක්; වායාපෙන්තස්ස, වියවන්නාවූ මහණහට; **නිස්සග්ගියං**, **චීවර වායාපන** නම් **නිසගිය**; **සියා**, වන්නේ යි;

## මූලසික වණ්ණනාව.

### සං:- 1 අප්පවාරිත මඤ්ඤතිං.

නෑ පැවරූවන් අතින් හෝ භික්ෂරින් නො ලබන්නහු විසින් නොනෑ නො පැවරූවන් අතින් තමුන් ඉල්වා ගත යුතු වේ.

සමන්ත පාසාදිකාවෙහි

"ඤාතිපවාරිතට්ඨානතො වා භික්ඛාචාරවත්තෙන වා පරියෙසිතබ්බං තථා අලභන්තෙන අඤ්ඤාති අප්පවාරිතට්ඨානතො යාචිත්වා පි ගහෙතබ්බං".

### 25 ජානන්තො භික්ඛුසංඝස්ස ලාභං පරිණතම්පන අත්තනො පරිණාමෙති තස්ස නිස්සග්ගියං සියා.

භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ; ජානන්තො, දැන දැන; සංඝස්ස, සංඝයාහට; පරිණතං, පිරිනැමූවාවූ; ලාභං, ලාභයක්; අත්තනො, තමන්ට; (නො:- තමා කරා) පරිණාමෙති, පිරිනැමුම් කරවා ගණී නම්; තස්ස, ඒ භික්ෂුහට; නිස්සග්ගියං, **ලාභ පරිණාමන නම් නිසගිය**; සියා, වන්නේ යි.

**"අත්තනො"** යි කම්මට්ඨ සම්ප්‍රදානයි.

### සං:- 1 ලාභං

චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍යය යි කියනලද සිව්පසය හෝ යටත් පිරිසයින් හුණු පිඩක් පමණකුදු වස්තුව ලාභ වශයෙන් ගත යුතු වේ.

පාරාජිකා පාළියෙහි

"ලාභො නාම චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්පච්චය භෙසජ්ජපරික්ඛාරා අන්තමසො චුණ්ණපිණ්ඩො පි"

### සං:- 2 පරිණතං.

සංඝයාට දෙන්නෙමි පූජාකරන්නෙමි යි වාග් බිණීම පරිණත නම්. සංඝයා සඳහා එලවා තබනලද්ද දෙමියි වාග් භෙද නො කළේ ද සංඝයා අතට නො ලැබුනේද එය සඟ සතුවූයේ නම් වේ.

පාරාජිකා පාළියෙහි

"පරිණතං නාම දස්සාමි කරිස්සාමී ති වාචා භින්නා හොති"

සමන්ත පාසාදිකාවෙහි

"සො හි සංඝස්ස පරිණතත්තා හත්ථං අනාරූළ්හො පි එකෙන පරියායෙන සංඝස්ස සන්තකො හොති"

### සං:- 3 පරිණාමෙති.

සංඝයා උදෙසා තබතලද්ද යටත් පිරිසයින් මව් සතුවූයේ නමුත් තමහට පමුණුවා ගැණීමට වෑයම් කිරීමෙන් දුකුලා ද වසතුව හස්‍තගත කර ගැණීමෙන් තිසගි ද වේ.

කඞ්ඛා විතරණීයෙහි

"අන්‍තමසො මාතුසන්‍තකම්පි අත්‍තනො පරිණාමෙන්‍තස්‍ස දුක්‍කටං පටිලාභෙන නිස්‍සග්ගියං"

(අ) සංඝයා සඳහා වෙන් කල දෙයක් අන්‍ය චෛත්‍ය සංඝ ගණ පුද්ගලයන් කෙරෙහි ද චෛත්‍ය සඳහා වෙන් කල දෙයක් අන්‍ය චෛත්‍ය සංඝ ගණ පුද්ගලයන් කෙරෙහි ද පුද්ගලයෙක් සඳහා වෙන් කල දෙයක් අන්‍ය පුද්ගල චෛත්‍ය සංඝ ගණයා කෙරෙහි ද දෙවන්නේ නම් දුකුලා වේ.

පාරාජිකා පාළියෙහි

''සංඝස්‍ස පරිණතං අඤ්ඤ සංඝස්‍ස වා චෙතියස්‍ස වා පරිණාමෙති ආපත්‍ති දුක්‍කටස්‍ස චෙතියස්‍ස පරිණතං අඤ්ඤ චෙතියස්‍ස වා සංඝස්‍ස වා ගණස්‍ස වා පුග්ගලස්‍ස වා පරිණාමෙති''.

මූලසික වණ්ණනාවෙහි

**නිස්‍සග්ගිය නිද්දේශය නිමි.**

---

### 26 සම්පජානමුසාවාදෙ පාචිත්‍තිය මුදීරිතං
### භික්‍ඛුං ච ඔමසන්‍තස්‍ස පෙසුඤ්ඤහරණෙ පි ච.

සම්පජාන මුසාවාදෙ, දැන දැන බොරු කීම නිමිත්තකොටගෙණ; පාචිත්තියං, සම්පජාන මුසාවාද නම් සුඛ පචිති ඇවත; (භගවතා, භාග්‍යවත්හු විසින්;) උදීරිතං, ප්‍රකාශකරණ ලදී. භික්‍ඛුං, භික්‍ෂුවකට; ඔමසන්‍තස්‍ස, ගර්හාකරන්නාවූ භික්‍ෂුහට ද (භාග්‍යවත්හු විසින් ඔමසවාද නම් සුඛ පචිතිය කියන ලදි) පෙසුඤ්ඤ හරණෙ පි ච, ඔවුනොවුන්ගේ කේලාම් බස් ගෙණ යාමෙන් ද පෙසුඤ්ඤ හරණ නම් සුඛ පචිති ඇවත කියන ලදී.

### සං:- 1 සම්පජානමුසාවාදෙ පාචිත්තියං.

"සම්පජානමුසාවාදෙ" යනු නිමිත්තාර්ථ සත්තමී වචන යි.

"පාතෙති කුසලං ධම්මන්‍ති, පාචිත්තියං"යි නිර්වචන හෙයින් කුසලධර්මය හෙලානුයි පාචිත්තිය නම් වේ.

පරිවාර පාළියෙහි

* "පාචිත්තියන්ති යං වුත්තං තං සුණොහි යථා තථං
පාතෙති කුසලං ධම්මං ඊයමග්ගං පරජ්ඣති
චිත්තස්ස මොහනට්ඨානං තෙනෙතං ඉති වුච්චති".

(අ) උතුරු මිනිස් දම් උසුරුවනු වස් මුසවා කිව පරිජී වේ. අමූල් පරිජියෙන් ගටනු වස් මුසවා කිව සඟ වෙසෙස් වේ. සඟ වෙසෙසින් ගටනු වස් මුසවා කිව පචිති වේ. දුසිරිතෙන් ගටනු වස් මුසවා කිව දුකුළා වේ. හුදෙක් මෙරමා විසංවාදනයෙහි පොහො සත් බොරු බස් කීණීමෙන් වන පචිතීයම මෙහි නිදර්ශිත යි.

කඞ්ඛා විතරණියෙහි

"උත්තරි මනුස්ස ධම්මං රොචනත්ථං මුසාභණන්තස්ස පාරාජිකං අමූලකෙන පාරාජිකෙන අනුධංසනත්ථං සංඝාදිසෙසො සංඝා දිසෙසෙන අනුධංසනත්ථං පාචිත්තියං ආචාරවිපත්තියා අනුධංසනත්ථං දුක්කටං කෙවලං මුසාභණන්තස්ස ඉධ පාචිත්තියං"යි.

සං:– 2 ඔමසනත්ථස්ස.

භික්ෂූන්ට පරිභව සඳහා යොදන කණිකටුක හෘදය පෙලන භූත අභූත වාග් ප්‍රයොගය ඔසම්වාද නම් වේ ආක්‍රොෂ සිතින් තොරව හුදෙක් ක්‍රීඩා පිණිස කියා නම් දුර්භාෂිත ද වේ. අර්ථ ධර්මානුශාසනා පෙරටුව හෝ උමතුව කීමෙන් ඇවැත් නො වේ.

කඞ්ඛා විතරණියෙහි

"අනුපසම්පන්නං අක්කොසිතුකාමස්ස කෙවලං දවකම්‍යතාය වදතො සබ්බත්ථ දුබ්භාසිතං අත්ථධම්මඅනුසාසනී පුරෙක්ඛාරානං උම්මත්තකාදීනං ච අනාපත්ති"යි

සං:– 3 පෙසුඤ්ඤ හරණෙ.

උභයන් පිළිබඳ ප්‍රියභාවය ශූන්‍යකරණ වාග් භෙද පෙසුඤ්ඤ නම් වේ. එබඳු ප්‍රිය ශූන්‍යතා වාග් භෙද යම් භික්ෂුවක් කරා එලවා නම් පෙසුඤ්ඤ හරණ නම් සුඛ පචිතිය වේ.

---

* පාචිත්තියං ඉති, පාචිත්තියයි; යං, යමක්; වුත්තං, කියන ලද ද; තං, එය; යථා තථං, තතු සේ; සුණොහි, අසව; කුසලං ධම්මං, කුසල චිත්තය; පාතෙති, හෙලා ද; අරියමග්ගං, ආර්‍ය මාර්ගය; පරජ්ඣති, වලකාද; චිත්තස්ස, චිත්තයාගේ; මොහනට්ඨානං, මූලාවට කාරණා වේ ද; තෙන, එහෙයින්; එතං, මෙ ඇවත; ඉති, මෙසේ පචිති ඇවතැයි; වුච්චති, කියනු ලැබේ.

(අ) හුදෙක් පාප ගර්හා පිණිස කියන්නන්ට ද උමතුවූවන්ට ද ඇවැත් නො වේ.

කඞ්ඛා විතරණියෙහි

"කෙවලං පාපගරහිතාය වදන්තස්ස උම්මත්තකාදීනං ච අනාපත්ති"යි.

27 **ඨපෙත්වා භික්ඛුණිං භික්ඛුං අඤ්ඤත්‍ර පිටකත්තයං පදසො ධම්මං භණන්තස්ස පාචිත්තිය මුදීරිතං,**

භික්ඛුණිං, භික්ෂුණිය ද; භික්ඛුං; භික්ෂුව ද; ඨපෙත්වා, හැර; අඤ්ඤත්‍ර, අන්‍ය ගිහි හෙරණුන් හා සමග; පිටකත්තයං, පිටකත්‍ර යෙහි ඇතුලත්වූ; ධම්මං, ධර්‍මය; පදසො, පද වශයෙන්; භණන්තස්ස, ඉගැන්වීම පිණිස කියන්නාවූ භික්ෂුහට; පාචිත්තියං, **පදසො ධර්‍ම** නම් සුඩ පචිති ඇවත; උදීරිතං, භාග්‍යවත්හු විසින් වදාරණ ලද්දේ යි.

සං:- 1 **පිටකත්තයං ධම්මං**

බුඩ භාෂිතවූ ශ්‍රාවක භාෂිතවූ **ඍෂි** භාෂිතවූ දෙව භාෂිතවූ **සංගීතිත්‍රය** පයඞාපන්න පිටකත්‍රය ධර්‍මය ද විවට්ට හෙතුවූ අර්‍ථ කථා ඇසුරු කල ධර්‍මය ද පාළිය ඇසුරු කල ධර්‍මය ද මෙහි ධර්‍ම වශයෙන් ගත යුත්තේ යි.

පාචිත්ති පාළියෙහි

"ධම්මො නාම බුඩ භාසිතො සාවක භාසිතො ඉසි භාසිතො දෙව භාසිතො අත්ථූපසංහිතො ධම්මූපසංහිතො"

(අ) නානා භාෂා ශාස්ත්‍රවලට නගනලද ත්‍රිපිටක ධර්‍මය හෝ බාහිර ධර්‍ම පදවශයෙන් කීමෙන් ඇවැත් නො වේ.

සමන්ත පාසාදිකාවෙහි

"නානා භාසාවසෙන ගාථා සිලොකබන්ධාදීහි අභිසංඛතෙ අනාපත්ති"යි.

සං:- 2 **පදසො.**

"**පදසො**"යි කොඨාස වාචක නිපාතයි.

පද අනුපද අන්වක්ඛර අනුබ්‍යඤ්ජන යන චතුර්විධ කොඨාසයෝ මෙහි පද වශයෙන් ගතයුත්තාහ. එසේ වූ ධර්‍ම පද උගැන්වීම් වශයෙන් උපසපන් යම් ආචාර්‍ය වරයෙක් එකොච්චාරණ විධියෙන් කියා නම් ඇවැත් වේ.

1– **පදවිනිශ්චය**:– උපසපන් ඇදුරු තෙමේ අනුපසපනුන් සමග "මනො පුබ්බඞ්ගමා" යනාදී සිව් පද ගාථාවෙහි පළමුවෙනි පදයවූ "මනො පුබ්බඞ්ගමා" යන්න එකට උසුරුවීම පටන් ගෙණ එකට අවශාන කෙරේ නම් ඇදුරුහට පද වශයෙන් කීම ලැබේ. එහෙයින් ඇදුරු තෙමේ පදසො ධම්ම පාචිත්තියට පැමිණේ.

2– **අනුපද විනිශ්චය**:– උපසපන් ඇදුරු තෙමේ "මනො පුබ්බඞ්ගමා" යන පළමුවෙනි පදයෙන් ද හෙරණ තෙමේ "මනො සෙට්ඨා" යන දෙවෙනි පදයෙන් ද දෙවරට පටන් ගෙණ එකවර අවශාන කෙරේ නම් ඇදුරුහට අනුපද කීම ලැබේ. එහෙයින් ඇදුරුහට ඇවැත් වේ.

3– **අන්වක්ඛර විනිශ්චය**:– "**රූපං අනිච්චං**"යි කියනු ලබන් නාවූ ඇදුරු තෙමේ "**රූ**" කියා හෝ "**රූපං**" කියා හෝ සිටව සිටවා දෙවරට අවශාන කෙරේ නම් ඇදුරුහට අන්වක්ඛර කීමෙන් ඇවැත් වේ.

4– **අනුබ්‍යඤ්ජන විනිශ්චය**:– "රූපං **අනිච්චං**"යි උගන්වන කල්හි උගැණීමෙන් දක්‍ෂවූ හෙරණ තෙමේ "**වෙදනා අනිච්චා**"යි වෙනම ශබ්ද පතුරුවා ද එසේ වෙනම ශබ්ද කෙළේ නමුදු උගැන් වීම් ප්‍රයත්නය එහි විද්‍යමාන හෙයින් අනුබ්‍යඤ්ජන කීම ලැබේ. එහෙයින් ඇදුරුහට ඇවැත් වේ. මේ සතරාකාර පදයන්ගේ වශයෙන් උගන්වන ආචාර්‍ය්‍ය භික්‍ෂුහට මේ පදසො ධම්ම සුඛ පචිත්තිය වේ.

(අ) උපසපන් අනුපසපන් දෙදෙනෙක් සමීපයෙහි හිඳුවාගෙණ උගණ්වන්නාවූ උපසපන් ආචාර්‍ය්‍ය භික්‍ෂු තෙමේ හිඳිනවුන් සමග කියම් යි ඔවුන් දෙදෙනා සමග එකට කියා නම් ඇදුරුහට ඇවැත් වේ. උගෙණීම් වශයෙන් කී භික්‍ෂුහට ඇවැත් නො වේ. සිටුවාගෙණ උගණ්වන්නවුන් කෙරෙහි ද මේ නය මැයි. භික්‍ෂුව හිඳුවා හෙරණ සිටුවා උගණ්වන උපසපන් ආචාර්‍ය්‍ය භික්‍ෂු තෙමේ හිඳිනහු සමග කියම් යි ඔවුන් සමග එකට කියා නම් ඇදුරුහට ද උගෙණීම් වශයෙන් කී භික්‍ෂුහට ද ඇවැත් නො වේ. භික්‍ෂුව සිටුවා හෙරණ හිඳුවා උගණ්වන කල ද මේ නය මැයි.

(ආ) අනුපසම්පන්නයන් සමග එකට හදාරන්නාහට ද අනුප සම්පන්න ආචාරීන් සමග එකට කියන්නාහට ද ප්‍රගුණ ග්‍රන්ථ කියන්නාහට ද සභා මධ්‍යයෙහි සැකව නවතින්නහු සමග මෙසේ කියව යි එකට කියන්නාහට ද ඇවැත් නො වේ.

පාචිත්ති පාළියෙහි

"අනාපත්ති එකතො උද්දිසාපෙන්තො එකතො සජ්ඣායං කරොන්තො යෙභුය්‍යෙන පගුණං ගන්ථං භණන්තං ඔපාතෙති ඔසාරෙන්තං ඔපාතෙති".

සිඛවළඳ විනිසෙහි

"මෙහි පදසො ධම් නම් අනුපසපන්නක්හු තමා කෙරෙහි පෙළ ධම් කියවාගන්නා සඳ ඔහු හා සමග එක් පදයක් මුලුල්ලෙන් එවි ඒ ඒ පෙදෙහි පටන් අකුරක් එවි අවසන් අකුරක් එවි එක් වැ කියා නම් පෙදෙහි පෙදෙහි එවි අකුරෙහි අකුරෙහි එවි පචිති ඇවැත් වේ. අනුපසපන්නක්හු කෙරේ තමා කියවා ගන්නා සඳ එවි ඔහු හා තමා එක් වැ පිරිවහන සඳ එවි එක් වැ හදාරන සඳ එවි එහු හෝ තමා හෝ පිළිවිස්නා සඳ එවි බොහොසුයෙන් ඔහට පුහුණු පෙළක් එවි එක් වැ කියා නම් වරද නැති".

(ඉ) මේ ඇවත උගන්වන ආචාරීන් කෙරෙහිම යෙදෙන්නක් බැව් සැලකිය යුතු වේ. ඉදානීන්තනික ඇතැම් ආචාර්‍ය්‍යවරු හෙරණුන් සමග එකට පිරිත් කිණීමෙහි මේ පදසො ධම්මපචිත්තිය වන්නේය යි මතිභ්‍රමයට පැමිණ සිටිති. පිරිත් කීම වනාහි භික්ෂු සංවාසික වතකි. එය ගිහින් සමග නො යෙදේ. මේ පද වශයෙන් කීම ගිහින් සමග ද යෙදෙන්නක් විය යුතුමය. එහෙයින් හුදු පිරිත් කිණීම ම මෙහි නො යෙදේ. මෙරමාගේ හෝ තමාගේ උවදුරු සංසිඳුවා ගැණීම පිණිස පිරිත් කීමෙහි පද වශයෙන් උගැන්වීම නො ලැබෙන හෙයින් ඇවැත් නොවන බැව් හැගේ. ඉගෙණ ගන්නා අදහසින් අනුපසම්පන්නයන් සමග එකට කියන් නාවූ භික්ෂුහට ඇවැත් නො වේ යයි කී හෙයින් උගන්වන්නා හට ම මේ ඇවත වන්නේය යි විසඳිය යුත්තාහ.

### 28* අනුපසම්පන්නෙනෙව සයිත්වාන තිරත්තියං
### පාචිත්ති සහ සෙය්‍යාය චතුත්ථත්ථං ගතෙ පුන.

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) අනුපසම්පන්නෙන එව, අනුපසම්පන්නුන් සමගම; තිරත්තියං, තුන් රැයක් මුළුල්ලෙහි; සයිත්වාන, එක් පියස්සක්යට සැතපී; චතුත්ථෙ, සතරවන දවස්හි, අත්ථං ගතෙ, හිරු උදාවීමට පැමිණි කල්හි; පුන, නැවත (සයති; සයනය කෙරේ ද; තස්ස, ඒ භික්ෂුහට;) සහ සෙය්‍යාය, අනුපසම්පන්නුන් සමග සයනය කිරීමෙන්; පාචිත්ති, සහ සෙය්‍ය නම් සුඛ පචිති ඇවත වන්නේයි.

### සං:- 1 අනුපසම්පන්නෙනෙව

මෛථුන ධර්මයට වස්තුවූ තිරිසන් ගතිකයා ද මෙහි අනුපසම්පන්න සංඛ්‍යාවට යේ.

විනයත්ථ මඤ්ජූසාවෙහි

> “අනුපසම්පන්නො නාම ති වචනතො තිරච්ඡානගතො පි අනුපසම්පන්නො සො ච ඛො පන සබ්බො මෙථුන ධම්ම සමාපත්තියා වත්ථුභූතො වා ති”.

### සං:- 2 සයිත්වාන තිරත්තියං.

රෑ දෙකක් වැස තුන්වන රැය අරුණට පළමුව නික්ම කුටියෙන් පිටතදී අරුණ ගෙවා සිව්වන රැය වසා නම් ඇවැත් නොවේ.

පාචිත්ති පාළියෙහි

> “වෙ රත්තියො වසිත්වා තතියාය රත්තියා පුරා අරුණා නික්ඛමිත්වා පුන වසති”.

29 **ඉත්ථියා එකරත්තම්පි සෙය්‍යං කප්පයතො පි වා**
**දෙසෙන්තස්ස විනා විඤ්ඤුං ධම්මං ච ඡප්පදුත්තරිං**

ඉත්ථියා, එදවස් උපන් මිනිස් මාගමක් හා සමග; එකරත්තං අපි; එක් රැයක් පමණ කාලයකුදු; සෙය්‍යං කප්පයතො අපි, එක සෙනස්නෙහි සයනය කරන්නාවූ මහණහට **මාතුගාම සහසෙය්‍ය** නම් ඇවතද; විඤ්ඤුං විනා, දැනගැණීමෙහි සමර්ථ පුරුෂයෙකු නැතිව; ඉත්ථියා, මාගමක්හට; ඡප්පදුත්තරිං, සපදයකින් අධිකාවූ; ධම්මං, පිටකත්‍රය ධර්මය; දෙසෙන්තස්ස අපි වා, දෙසන්නාවූ මහණහට **ධම්මදෙසනා** නම් සුඛ පචිති ඇවැත ද වන්නේයි

### සං:- 1 ඉත්ථියා·

යටත් පිරිසයින් එදවස් උපන් මිනිස් මාගම පවා වස්තුවීමෙන් මාතුගාම සහසෙය්‍ය නම් සුඛ පචිති වන්නේය. මිනිස් රූ මවාගත් යක්ෂිණිය පණ්ඩකිය තිරිසනිය යන මොවුන් සමග විසීමෙන් දුකුළා වේ.

කඞ්ඛා විතරණියෙහි

> “මාතුගාමෙනා ති අන්තමසො තදහුජාතාය පි මනුස්සිත්ථියා දිස්සමානරූපා පන යක්ඛිපෙතියො පණ්ඩකො මෙථුනවත්ථුභූතා ච තිරච්ඡානිත්ථියො ඉධ දුක්කටවත්ථුකා හොන්ති”.

## සං:- 2 විඤ්ඤූං විනා.

සභ්‍යාසභ්‍ය තෙපුල් දැනීමෙහි සමර්ථ මිනිස් පුරුෂ තෙමේ විඥ නම්. එබඳු විඥයෙක් නැති තන්හි ඇවැත් වේ. පෞරාණික ආචාර්‍ය්‍යවරු ස්ත්‍රීපුරුෂ මහපිරිස් මැද ධර්මදේශනා අවස්ථාවන්හි විඥ පුරුෂයෙකු ඉදිරිපත් කොට ධර්මදේශනා කිරීම මේ ඇවැතින් නිදහස් වනුපිණිස පරිචිත බැව් සැලකිය හැකිවේ.

පාචිත්ති පාළියෙහි.

> “විඤ්ඤූ නාම පුරිසවිග්ගහො පටිබලො හොති සුභාසිත දුබ්භාසිතං දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආජානිතුං”යි.

## සං:- 3 ඡප්පඤ්චුත්තරිං.

අකුරු අටක් ඇති ගාථා පදය එක් වචනයක් වෙයි. මෙහි වාග් ප්‍රමාණය මෙසේ ගිණිය යුතුයි.

සමන්ත පාසාදිකාවෙහි.

“තත්‍ථ එකො ගාථාපාදො එකා වාචාති එවං සබ්බත්‍ථ වාචා පමාණං වෙදිතබ්බං.”

(අ) අටුවා පද කියනු කැමැත්තනු විසින් අටුවා පද සයක් ද පෙළ අටුවා මිශ්‍ර කොට කියනු කැමැත්තහු විසින් මිශ්‍රවූ සපද කොතෙක් ද කියයුතු වේ. ප්‍රමාණය ඉක්ම වා නම් ධර්මදේශනා නම් සුඛ පචිති ඇවැත් වේ.

විනයත්‍ථ මඤ්ජූසාවෙහි.

> “සචෙ අට්ඨකථං ධම්මපදං ජාතකාදිවත්‍ථුං වා කථෙතුකාමො හොති ඡප්පදමත්තමෙව කථෙතුං වට්ටති පාළියා සද්ධිං කථෙන්තෙන එකං පදං පාළිතො පඤ්ච අට්ඨකථාතො ති එවං ඡප්පදානි අනතික්කමිත්‍වා ව කථෙතබ්බං.”

(ආ) යම් කිසි මාගමක් තොමෝ භික්ෂුවක් අතින් සවාමීනි දික්සඟිය කුමන අර්ථයක් භගවන්නේ දූයි විචාරණුලැබූ භික්ෂු තෙමේ සියලු දික්සඟිය කියේ නමුත් ඇවැත් නො වේ.

සමන්ත පාසාදිකාවෙහි.

> “මාතුගාමො දීඝනිකායො කිමත්‍ථං දීපෙති ති පුච්ඡති එවං පඤ්හං පුට්ඨො භික්ඛු සබ්බම්පි දීඝනිකායං කථෙති අනාපත්ති.”

### 30 දුට්ඨුල්ලං භික්ඛුනො වජ්ජං භික්ඛු සම්මුතියා විනා අභික්ඛුනො වදන්තස්ස පාචිත්තියමුදීරිතං

භික්ඛුනො, භික්ෂුවක්හුගේ; දුට්ඨුල්ලං, ලාමකවූ; වජ්ජං, සඟ වෙසෙස් ඇවතක්; භික්ඛු සම්මුතියා, සම්මුතිය ලැබුවාවූ භික්ෂුවක්; විනා, හැර; අභික්ඛුනො, අනුපසම්පන්නයෙක්හට; වදන්තස්ස, කියන භික්ෂුවහට; පාචිත්තියං, දුට්ඨුල්ලාරොචන නම් සුඩ පචිතිය; උදීරිතං, භාග්‍යවත්හු විසින් වදාරණලදී.

සං:- 1 දුට්ඨුල්ලං.

පරිජි සඟවෙසෙස් යන ඇවතුන්ට "දුට්ඨුල්ල"යි නමකි. ඔවුන් අතරෙන් තෙළෙස් සඟවෙසෙස් ම මෙහි දුට්ඨුල්ල වශයෙන් දැක්වූහ. කඩ්ඛාවිතරණියෙහි.

> "දුට්ඨුල්ලන්ති කිඤ්චාපි චින්නං ආපත්තික්ඛන්ධානමෙතං අධිවචනං ඉධ පන සංඝාදිසෙසමෙව අධිවචනං"

(අ) අසුචි මුදවා සඟවෙසෙස් ඇවතට පැමිණියේය. යනාදී ක්‍රමයෙන් වස්තුව සමග ඇවත ගවා කියන්නහුහට ම දුට්ඨුල්ලා රොචන පචිතිය වේ. හුදකලා වස්තුව හෝ ඇවත කියන්නාහට ඇවත් නො වේ.

සමන්ත පාසාදිකාවෙහි.

> "අයං අසුචිං මොචෙත්වා සංඝාදිසෙසං ආපන්නො ති ආදිනා පන නයෙන වත්ථුනා සද්ධිං ආපත්තිං ඝටෙත්වා ආරොචෙන්තස්සෙව ආපත්ති."

පාචිත්ති පාළියෙහි ද

> "අනාපත්ති වත්ථුං ආරොචෙති නො ආපත්තිං ආපත්තිං ආරොචෙති නො වත්ථුං"

### 31 ඛණෙය්‍යවා ඛණාපෙය්‍ය පඨවිඤ්ච අකප්පියං භූතගාමං විකොපෙය්‍ය තස්ස පාචිත්තියං සියා

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ) අකප්පියං, කැපනොවූ; පඨවිඤ්ච, පොළොව ද; ඛණෙය්‍ය වා, තමා කණින්නේ හෝ වේ ද; ඛණාපෙය්‍ය වා, මෙරමාලවා කණවන්නේ හෝ වේ ද; තස්ස, ඔහට; පාචිත්තියං, පඨවිඛණන නම් සුඩ පචිතිය; සියා, වන්නේ ය; භූතගාමඤ්ච, තෘණවෘක්ෂාදී භූතගාම සමූහය ද; විකොපෙය්‍ය,

සිඳීම් බිඳීම් ආදියෙන් විනාශ කරන්නේ වී නම්; තස්ස, ඔහට; පාචිත්තියං, **භූතගාම පාතව්‍යතා** නම් සුඛ පචිත්තිය; සියා වන්නේ යි.

**"සියා"**යි අස-භූවි-දයින් සත්තමී එය්‍යහට ඉයා ආදෙශ හා ධාත්වාදි ලෝපයෙන් සිඛ යි.

**සං:- 1 පඨවිකථාව අකප්පියං.**

පෘථුවි තොමෝ වනාහි ජාතා අජාතා වශයෙන් විධ වේ. ඉන් ජාතා පෘථුවිතොමෝ ශුඩය මිශ්‍රය පුඤ්ජ ය යි ත්‍රිවිධ වේ. ප්‍රකෘතියෙන් හුදු පස් ය හුදු මැටිය යි ශුඩ පෘථුවිය දෙයාකාර වන්නී ය අත්මිට් පමණ ඉකුත් කල ගල්ය මිට් පමණ ගල්ය කැට කැබිලිතිය කැටගල්ය වැලිය යන පංච පාසාණයන් සමග දෙගුණය බැගින් පස් මිශ්‍රවීමෙන් හටගත් පාංශුමිශ්‍රපෘථුවී පංචකය ද එසේම පංච පාසාණයන් සමග මැටි මිශ්‍රවීමෙන් හටගත් මත්තිකා මිශ්‍ර පෘථිවී පංචකය දැයි මිශ්‍ර පෘථිවී තොමෝ ප්‍රභෙද වශයෙන් දසයෙක් වන්නීය. පුඤ්ජ නම් පිඩ යි. ඉතිරි සිව් මස් මුලුල්ලෙහි වැසි වැස තෙමී පරණවූ පස් පිඩය මැටි පිඩය මිශ්‍ර පස් පිඩය මිශ්‍ර මැටි පිඩය යි පුඤ්ජ පෘථිවී තොමෝ සතරාකාර වන්නීය. මෙසේ ප්‍රභෙදයට ගියාවූ ජාතා පෘථිවිය මෙහි අකප්පිය වශයෙන් ගතයුත්තීය. නො දැවුනු පොළව ද ජාතා සංඛ්‍යාවට ම යේ.

පාචිත්ති පාලියෙහි.

> "පඨවී නාම වෙ පඨවියො ජාතා ච පඨවී අජාතා ච පඨවී ජාතා නාම පඨවී සුධපංසු සුධමත්තිකා අප්පපාසාණා අප්ප සක්ඛරා අප්පකඨලා අප්පමරුම්බා අප්පවාලිකා යෙභුය්‍යෙන පංසු යෙභුය්‍යෙන මත්තිකා අදඩ්ඪාපි වුච්චති ජාතා පඨවී යො පි පංසු පුඤ්ජො වා මත්තිකා පුඤ්ජො වා අතිරෙක චාතුමාසං ඔවට්ඨො සොපි වුච්චති ජාතා පඨවී."

හුදු පාසාණයෙන් හටගත් පාසාණ පෘථිවී පංචකය ද එක් ගුණයක් පස්වලට පංචපාසාණයන් දෙගුණය බැගින් මිශ්‍රවීමෙන් හටගත් මිශ්‍රපෘථුවී දසකය ද දැවුණු පෘථිවිය ද උණුසිව්මස් තෙමීමෙන් පරණවූ පුඤ්ජ පෘථිවී චතුශ්කය ද අජාතා පෘථුවී යයි දක්වන ලද්දැහ.

පාචිත්ති පාළියෙහි.

"අජාතා නාම පඨවී සුද්ධ පාසාණා සුද්ධ සක්ඛරා සුද්ධ කඨලා සුද්ධ මරුම්බා සුද්ධ වාලිකා අප්පපංසු අප්පමත්තිකා යෙභුයෙයන පාසාණා යෙභුයෙයන සක්ඛරා යෙභුයෙයන කඨලා යෙභුයෙයන මරුම්බා යෙභුයෙයන වාලිකා දඩ්ඪාපි වුච්චති අජාතා පඨවී යො පි පංසුපුඤ්ජො වා මත්තිකා පුඤ්ජො වා ඔමක චාතුමාසං ඔවට්ටො සො පි වුච්චති අජාතා පඨවී"

යථොක්ත පෘථුවීන් අතුරෙන් යම් පෘථුවියක් ජාතා වන්නී ද ඕතොමෝ අකපපිය වන්නීය. ජාතා පෘථුවිය යම් භික්ෂුවක් තෙමේ තමා සාරාද කැඩීම් බිඳීම් ඉරිඇඳීම් ආදියෙන් මෙරමාලවා විකොපණය කරවාද ඒ භික්ෂුහට ප්‍රයොගගණනින් පචිති ඇවැත් වේ.

කඞ්ඛා විතරණියෙහි.

"තත්ථ යා ජාතා පඨවී ති වුත්තා අයං අකපපිය පඨවී යො භික්ඛු තං එවරූපං පඨවිං සයං ඛණති ඛණන භෙදන විලෙඛණ පචනාදීහි විකොපෙති තස්ස පයොග ගණනාය පාචිත්තියං"යි.

(අ) මෙය දනුව මෙය දෙව මෙය ගෙණෙව මෙයින් මට ප්‍රයොජනය. මෙය කැප කරව යි කියන්නාහට ද ස්ථාන නියම යක් නැතිව පොකුණක් සාරව වලක් සාරව කඳක් සාරව යි කපපිය ව්‍යවහාරයෙන් කියන්නාහට ද සියලු ආජාතා පෘථිවි ය විකොපණය කරන්නාහට ද පඨවිඛණන පචිති නො වන්නේ යි.

පාචිත්ති පාළියෙහි.

"අනාපත්ති ඉමං ජාන ඉමං දෙහි ඉමං ආහර ඉමිනා අත්ථො ඉමං කපපියං කරොහි ති භණති"යි.

කඞ්ඛා විතරණියෙහි.

"ඔකාසං අනියමෙත්වා පොක්ඛරණිං ඛණ ආවාටං ඛණ කන්දං ඛණාති ආදීති භණන්තස්ස අනාපත්ති සබ්බං අජාතපඨවිං විකොපෙන්තස්ස අනාපත්ති"යි

සං:- 2 භූතගාමං විකොපෙය්‍ය

උදකසථ ඵලසථ වශයෙන් වැඩුනාවූ නිල්ගතියට පැමිණ වැඩි ගණ යන්නාවූ භූතගාම සංඛ්‍යාත වෘක්ෂතෘණ ලතාදීන්ගේ ද පැලවෙන ගති ඇති මූල් පුරුක් අතු ගෙඩි ඇට යන පස් වැදූරුම්

බීජගාමයාගේ ද කැපීම් කැඩීම් බිඳීම් පැලීම් ඉගිලීම් ආදිය කිරීමෙන් හා කපව කඩව පලව බිඳුව උගුල්වව යනාදී අකැප ව්‍යවහාරයෙන් සිඳීම් ආදිය කරවීමෙන් මෙම භූතගාම පාතව්‍යතා පචිතිය වේ.

මෙය දනුව මෙය දෙව මෙය ගෙණෙව මෙයින් මට ප්‍රයෝජනය මෙය කැපකරව යි යන කප්පිය ව්‍යවහාරයෙන් සිඳීම් බිඳීම් ආදිය කරවන්නාහට මෙම ඇවත සිදු නොවේ.

(අ) වණස්පතී රුක් සිඳින්නාහට පාරාජිකාව ද තෘණලතාදිය සිඳින්නාහට පචිතිය ද අඞ්ගජාතය සිඳින්නාහට තුලසිය ද වන්නේ යි.

සමන්ත පාසාදිකාවෙහි.

> “ඡින්දන්තස්ස ආපත්තී ති වණප්පතිං ඡින්දන්තස්ස පාරාජිකං තිණලතාදිං ඡින්දන්තස්ස පාචිත්තියං අඞ්ගජාතං ඡින්දන්තස්ස ථුල්ලච්චයං”යි

**32 අජ්ඣොකාසෙ තු මඤ්චාදිං කත්වා සන්ථරණාදිකං
සංඝිකං යාති පාචිත්තී අකත්වා පුච්ඡනාදිකං**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ) අජ්ඣොකාසෙ, අබ්‍යාවකාශයෙහි; සංඝිකං, සඟ සතුවූ; මඤ්චාදිං, ඇඳ පුටු ආදිය; **සන්ථරණාදිකං**, තමා විසින් ඇතිරීම් ආදිය; කත්වා, කොට; ආපුච්ඡනාදිකං, තමා විසින් විචාරීම් ආදිය; අකත්වා, නො කොට; යාති, අන් දිසාවකට යේ නම් (තස්ස, ඒ මහණහට) පාචිත්තියං, **අජ්ඣොකාස සන්ථරණ** නම් සුඩ පචිතිය වන්නේ යි.

a “තු” ශබ්දය පද පූරණයෙහි වේ.

b **“මඤ්චාදිං”** යන්නෙහි ආදි ශබ්දයෙන් කොච්ච මෙට්ට ආදිය ගැණේ.

c **“සන්ථරණාදිකං”** යන්නෙහි ආදි ශබ්දයෙන් මෙරමාහට අතුරුවා දීම ගැණේ.

d **“ආපුච්ඡනාදිකං”** යන්නෙහි ආදි ශබ්දයෙන් මෙරම්‍ා විචාරීම ගැණේ.

**සං:– 1 සංඝිකං.**

සඟ සතු ඇඳ පුටු ආදිය ම මෙහි දක්වූ හෙයින් පුද්ගලික ඇඳ පුටු ආදිය හගා නො තැබීමෙහි ඇවැත් නො වන බැව් හැගේ.

**33 සංඝිකාවසථෙ සෙය්‍යං සන්ථත්වා සන්ථරණාදිකං**
**අකත්වා පුච්ඡනාදිං යො යාති පාචිත්ති තස්ස පි**

යො, යම් භික්ෂුවක් තෙමේ; සංඝිකාවසථෙ, සඟ සතු ආවාස යෙක්හි; **සෙය්‍යං**, දසප්‍රකාර සයනයන් අතුරෙන් සයනයක්; **සන්ථරණාදිකං**, තමා ඇතිරීම් ආදිය; කත්වා, කොට; ආපුච්ඡනාදිකං, තමා විචාරීම් ආදිය; අකත්වා, නො කොට; යාති, බැහැර යේ නම්; තස්ස අපි, ඒ භික්ෂුහට ද, පාචිත්තියං, **විහාරසන්ථරණ** නම් සුඛ පචිති ඇවැත් වන්නේ යි.

සං:– 1 සෙය්‍යං.

ඇඳ පුටු ආදියෙහි ලන හිසිය පිළියම් කළ බිම රක්නා පිණිස අතුරණ චිමිලිකාය ඇඳ පුටු ආදියෙහි අතුරණ ඇතිරිලිය කලාල ආදි බිම අතුරණ පලස් ය පණින් හෝ වැහැරින් කළ පැදුරු ය කපපියසම් ය නිසීදන චීවර ය පලස් ආදී පසතුරුණු ය තණ ඇතිරි ය කොල ඇතිරි ය යන මේ දසය සෙය්‍යා නමි.

පාචිත්ති පාළියෙහි.

> “සෙය්‍යං නාම භිසි චිමිලිකා උත්තරත්ථරණං භුම්මත්ථරණා තට්ටිකා චම්මඛණ්ඩො නිසීදනං පච්චත්ථරණං තිණසන්ථාරො පණ්ණසන්ථාරො”යි.

**34 ජානං සප්පාණකං තොයං පාචිත්ති පරිභුඤ්ජයෙ**
**අඤ්ඤාතිකා භික්ඛුණියා ඨපෙත්වා පාරිවට්ටකං**

**35 චීවරං දෙති පාචිත්ති චීවරං සිබ්බතො පි ච ***
**අතිරිත්තං අකාරෙත්වා පවාරෙත්වාන භුඤ්ජතො**

සප්පාණකං, ප්‍රාණීන් සහිතවූ; තොයං, ජලය; ජානං, (ජානන්තො) දන්නේ; පරිභුඤ්ජයෙ, පරිභොග කෙරේ නම්; පාචිත්ති, **සප්පාණක** නම් සුඛ පචිති වන්නේ ය; (යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) අඤ්ඤාතිකාය භික්ඛුණියා, නො නෑ භික්ෂුණියක් හට; පාරිවට්ටකං, පෙරළා දීම් ගැණීම්, ඨපෙත්වා, හැර; චිවරං, සිවුරක්; දෙති, දේ නම්; (තස්ස, ඒ භික්ෂුහට;) පාචිත්ති, **චිවරදාන** නම් සුඛ පචිති වන්නේය; **අඤ්ඤාතිකාය භික්ඛුණියා**, නො නෑ භික්ෂුණියක්හුගේ; චීවරං, සිවුරක්; සිබ්බතො පි ච, ගෙත්තම් කරණ භික්ෂුහට ද; පාචිත්ති, **චීවර සිබ්බන** නම් සුඛ පචිති වන්නේය. පවාරෙත්වාන, අත්පසට ගෙණා බොජුන් ප්‍රතික්ෂෙප කොට; **අතිරිත්තං**, නැවත එම බොජුන් පිළිබඳ අතිරිත්ත විනය

කාමීය; අකාරෙත්වා, නො කරවා; පරිභුඤ්ජතො, අනුභව කරන් නාවූ භික්‍ෂුහට ද; පාචිත්ති, **අනතිරිත්තභොජන** නම් සුඛ පචිති වන්නේ යි.

**සං:- 1 ඨපෙත්වා පාරිවට්ටකං.**

සුළු දෙයින් මහ දෙයක් හෝ මහ දෙයින් සුළු දෙයක් හෝ මාරුකිරීම පාරිවට්ටක නම්. ඒ පාරිවට්ටකය පස්සහ දැමියන් සමග සිදුකිරීමෙහි ඇවැත් නො වේ.

පාචිත්ති පාළියෙහි

"අනුජානාමි භික්ඛවෙ පඤ්චන්නං පාරිවට්ටකං දාතුං භික්ඛුස්ස භික්ඛුණියා සික්ඛමානාය සාමණෙරස්ස සාමණෙරියා අනුජානාමි භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං පාරිවට්ටකං දාතුං"යි.

ඥාතිභික්‍ෂුණීන්ට දීමය් විශ්වාසග්‍රහණය තාවකාලික ගැණීමය යන මෙහි ඇවැත් නො වේ.

**සං:- 2 සිබ්බනො.**

තෙමේ මැශීම කෙරේ නම් හිඳි පහර බැගින් චීවර සිබ්බන පචිතිය වේ.

පාචිත්ති පාළියෙහි

"සයං සිබ්බති ආරපථෙ ආරපථෙ ආපත්ති පාචිත්තියස්ස"යි.

**සං:- 3 පවාරෙත්වා න භොජනං**

ඔදනය යව පූපය (නො:- යවයෙන් කළ රොටිය) අගලාය දිය මස්ය ගොඩ මස්ය යන පංචවිධ භොජනයන් අතුරෙන් යම් කිසි බොජුනක් වැළඳීමය වළඳන බඳුනෙහි තිම නොකළ බොජුන් ඇති බවය බොජුන් දෙරියන් සමාරක්වූ අත්පසට ගෙණර්මය. අත්පස සිට දෙන්ට සැරසීමය පිළිගන්නා භික්‍ෂුවගේ කාය වචන වලින් ප්‍රතික්‍ෂේප කිරීමය යන පසග පිරීමෙන් පවාරිතය වන්නේ යි.

සිඛවළඳ විනිසෙහි

"ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං" යන මෙ පස් බොජුන් අතුරෙන් එක්තර බොජුනක් සිඛතු මාත්‍රාවකුදු පරගලා කළ සඳ එවැ වැනි බොජුනක් මියෙහි ඇත වළඳන බජනේ එව් ඇති සඳ පස් බොජනෙන් බොජනක් ගෙනැ දෙරියන් වියත් අත් පසැ සිටැ දෙන්නට එළවූ සඳ කයින් එව් තෙප් ලෙන් එව් පිළිබෙව් කෙළේ නම් මේ පසගින් පැවැරිවේ. මෙහි පසග නම්:- බොජුන් පරගලා කිරීම් එකැ, පරගලා නොකළ

බොජුන් ඇති බව් එකෑ, බොජුන් ගෙනෑ අත් පසැට ආ බව් එකෑ, අත්පසෑ සිට දෙන්නට නතු කොට එළවූ බව් එකෑ, පිළිගන්නා පැවිජ්ජාගේ පිළිබෙව් එකෑ, යන මෙ පසඟි"

විනය විනිච්ඡයෙහි

"අසනං භොජනං චෙව හත්ථපාසාභිහාරතා
කායවාචා පටික්ඛෙපො පඤ්චඞ්ගහි පවාරණා"

### සං:- 4 අතිරිත්තං අකාරෙත්වා.

පවාරිතවූ භික්ෂු තෙමේ දන්වළඳන්නාවූ එක් භික්ෂුවක්හුගේ සමීපයට ගොස් **"අතිරිත්තං කරොථ භන්තෙ"** යි බැණ පාත්‍රය දීලා අතිරිත්තය කරවියයුතු. අතික් භික්ෂු තෙමේ පාත්‍රයෙහි ආහාරය පිඩු දෙපිඩු ඇතියේ නමුදු හෝ ගෙණ **"අලමෙතං සබ්බං"**යි අතිරිත්තය පෙරළා දිය යුත්තේය. මෙසේ අතිරිත්ත විනය කළ කල්හි පවාරිත භික්ෂුව විසින් ඒම අහර වැළඳුව ඇවැත් නො වේ.

36 **භික්ඛුං ආසාදනාපෙක්ඛො පවාරෙති පවාරිතං**
**නාතිරිත්තෙන භුත්තෙ තු පාචිත්තිය මුදීරිතං**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) ආසාදනාපෙක්ඛො, චොදනා කරණු කැමැත්තේ; පවාරිතං, පවාරණය ලැබූ; භික්ඛුං, භික්ෂුවකට; අනතිරිත්තෙන, අතිරිත්ත විනය කර්මය නොකළාවූ බොජුනෙන් (අධික භොජනයෙන්) පවාරෙති, පවරන්නේ වී නම්; භුත්තෙ තු, ඒ බොජුන් වැළඳූ කල්හි වනාහි (තස්ස, ඒ අධික බොජුන් පැවරූ මහණහට) පාචිත්තියං, **ආසාදනාපෙක්ඛ** නම් සුඛ පචිත්තිය; උදීරිතං, භාග්‍යවත්හු විසින් වදාරණ ලද්දේයි.

"**අනතිරිත්තෙන**"යි කිණිය යුතු තන්හි ඡන්දස් පිණිස පූර්ව අකාරය ලොප් කොට **"නාතිරිත්තෙන"**යි වියූ.

37 **සන්නිධිභොජනං භුඤ්ජ විකාලෙ යාවකාලිකං**
**භුඤ්ජතො වා පි පාචිත්ති අගිලානො පණීතකං**

38 **විඤ්ඤාපෙත්වාන භුඤ්ජෙය්‍ය සප්පිභත්තාදිකම්පි ච**
**අපටිග්ගහිතං භුඤ්ජ දන්තකට්ඨොදකං විනා**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) සන්නිධිභොජනං, සන්නිධි භොජනය; භුඤ්ජ, අනුභව කරන්නේ වී නම්; ඔහට **සන්නිධිභොජන** නම් සුඛ පචිති වන්නේය) විකාලෙ, ඉර අවරවූ

කල්හි; යාවකාලිකං, යාවකාලිකවූ බොජුනක්; භුඤ්ජෙය්‍ය වා අපි, බුදින්නාවූ මහණහට ද; පාචිත්තියං, **විකාල භොජන** නම් සුද්ධ පචිතිය වන්නේය. අගිලානො, නො ගිලන් භික්ෂු තෙමේ; පණීතකං, ප්‍රණීතවූ; සප්පිභත්තාදිකං අපි ච; ගිතෙල් මිශ්‍රවූ බත් ආදියක් ද; විඤ්ඤාපෙත්වාන, ඉල්වාගෙණ; භුඤ්ජෙය්‍ය, වළඳන්නේ වී නම් ඔහට **පණීතභොජන** නම් සුද්ධ පචිතිය වන්නේය; දන්ත කට්ඨොදකං විනා, දූවටි දඬු හා ජලය හැර; අපටිග්ගහිතං අපි ච, නො පිළිගත් බොජුනක් ද; භුඤ්ජෙ, වළඳන්නේ වී නම් ඔහට **අපටිග්ගහිත භොජන** නම් සුද්ධ පචිතිය වන්නේ යි.

### සං:- 1 **සන්නිධි භොජනං.**

පිළිගත් බොජුන් අරුණක් ඉක්මීමෙන් සන්නිධිභොජනය වේ.

පාචිත්ති පාළියෙහි

"සන්නිධිකාරකන්නාම අජ්ජ පටිග්ගහිතං අපරජ්ජු"යි

(අ) ආමගීනය නො කොට තුබූසේ ම යම් කිසිවකින් වසා තබනලද බොජුන් දෙවෙනි දවස්හි වළඳන්නාහට ඇවැත් නො වේ. හේ පිළිගෙණම වැළඳිය යුත්තේ යි.

සමන්ත පාසාදිකාවෙහි

"යථා ඨිතං යෙව අනාමසිත්වා කෙනචි පිදහිත්වා ඨපිතං දුතිය දිවසෙ පි පරිභුඤ්ජිතුං වට්ටති සන්නිධිපච්චයා අනාපත්ති පටිග්ගහෙත්වා පන පරිභුඤ්ජිතබ්බං"

### සං:- 2 **යාවකාලිකං.**

පිළිගන්නාලද පිණ්ඩපාත ගිලානප්‍රත්‍යයෝ යාවකාලිකය යාමකාලිකය සත්තාහකාලිකය යාවජීවිකය යි බුදීම් වශයෙන් සිව් වැදෑරුම් වෙති. පිටි මුල් ගෙඩි ආදියක් පිළිගෙණ හිර අවරවන තෙක් ප්‍රයෝජන ගත හැකි හෙයින් හේ යාවකාලික නම්. අඹ ජම්බාදි අෂ්ටවිධපාන හා අනුලොම් පාන අරුණෝදය තෙක් ප්‍රයෝජන ගත හැකි හෙයින් යාමකාලික නම්. ගිතෙල් වෙඬරු ආදිය දින සතක් මුළුල්ලෙහි පරිභොගකළ හැකි හෙයින් සත්තාහ කාලික නම්. ඉඟුරු එනු වදකසා ආදී බෙහෙත් වගී පිළිගෙණ දිවි ඇතිතෙක් පරිභොග කළ හැකි බැවින් යාවජීවික නම් වේ.

## සං:- 3 සප්පිභත්තාදිකං.

**"සප්පිනා සංසඨ්ඨං භත්තං, සප්පිභත්තං"**යි මධ්‍යපදලෝප තෘතීයා තත්පුරුෂ සමාසයි. (සප්පිනා, ගිතෙල් හා; සංසඨ්ඨං, මිශ්‍රවූ; භත්තං, බත; සප්පිභත්තං, සප්පිභත්ත නම්) **"සප්පිභත්තං එව ආදි සප්පිභත්තාදි"**යි අවධාරණ කර්මධාරය සමාසයි. (සප්පි භත්තං එව, ගිතෙල් හා මිශ්‍රවූ බතම; ආදි, අවයවයෙක්නුයි; සප්පිභත්තාදි, සප්පිභත්තාදි නම්;) **"සප්පිභත්තාදි අස්ස අත්ථි ති සප්පිභත්තාදිකං"**යි අස්සත්ථි තද්ධිතයි. ඉක ප්‍රත්‍යය යි. (අස්ස, ඒ ප්‍රණීත භෝජනයට; සප්පිභත්තාදි, ගිතෙල් හා මිශ්‍රවූ බත අවයවයෙක් කොට; අත්ථි, ඇත්තේ වේ ද; ඉති, එහෙයින්; සප්පි භත්තාදිකං, සප්පිභත්තාදික නම්.)

**"සප්පිභත්තාදිකං"** යන්නෙහි ආදි ශබ්දයෙන් නවනීත බතය තලතෙල් බතය මධුබතය ඵාණිතබතය මච්ඡබතය මංසබතය ඛීර බතය දධිබතය යන මොව්හු ගතයුත්තාහුය. යම් භික්ෂුවක් තෙමේ මෙබඳු ප්‍රණීත බොජුන් තමා සඳහා ඉල්වාගෙණ වළඳා නම් පණීත භොජන පචිතිය වේ.

පාචිත්ති පාළියෙහි

> "යානි ඛො පන තානි පණීත භෝජනානි සෙය්‍යථිදං? සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං මච්ඡො මංසං ඛීරං දධි යො පන භික්ඛු එවරූපානි භොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පාචිත්තියං".

(අ) හුදු ගිතෙල් ආදිය ඉල්වාගෙණ වළඳනුයේ පණීත භොජන පචිතියට නො පැමිණේ. ශෛක්‍ෂ ශික්‍ෂාවෙහි ඇතුලත්වූ සූපොදන දුකුලාවට ම පැමිණේ යි, බත් මිශ්‍රවූ ගිතෙල් ආදිය ඉල්වාගෙණ වළඳන්නාවූ භික්‍ෂු තෙමේම පණීත භොජන පචිතියට පැමිණේ.

සමන්ත පාසාදිකාවෙහි

> "සුද්ධානි සප්පි ආදීනි විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තො පාචිත්තියං නාපජ්ජති සෙඛියෙසු සූපොදනවිඤ්ඤත්ති දුක්කටං ආපජ්ජති ඔදනසංසට්ඨානි පන විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තො පාචිත්තියං ආපජ්ජතී ති වෙදිතබ්බං".

## සං:- 4 දන්තකට්ඨොදකං විනා.

මූව පිරිසිඳු කිරීම මූත් නොගිලිනා හෙයින් දැවටිදඬු හා දිය පිළි නො ගෙණම වැළඳිය හැකිවෙයි. අනික් දෙයක් නොහැකි

වෙයි. කැපකරු ආදී කිසිවෙක් නැතිකල හැම දෙයක්ම පිළි නොගෙණ වැලඳිය හැකි බැව් පෙනේ.

පාචිත්ති පාළියෙහි

"අසති කප්පියකාරකෙ සාමං ගහෙත්වා පරිභුඤ්ජති අනාපත්ති"

39 **තිත්ථියස්ස දදෙ කිඤ්චි භුඤ්ජිතබ්බං සහත්ථතො නිසජ්ජං වා රහො කපෙ මාතුගාමෙන වෙකතො**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ;) තිත්ථියස්ස, වස්ත්‍ර නොහඳනා තීර්ථකයෙක්හට; කිඤ්චි, යම් කිසි; භුඤ්ජිතබ්බං, බුදියයුතු දෙයක්; සහත්ථතො, සිය අතින්; දදෙ, දෙන්නේ වී නම්; (ඔහට **අචේලකාදන** නම් සුඛ පචිතිය වන්නේය;) මාතුගාමෙන, මාගමක් හා; එකතො, එක්ව; රහො, කණට හා ඇසට රහස් ස්ථාන යෙක්හි; නිසජ්ජං වා, හිඳීමක් හෝ; කපෙ, කරන්නේ වී නම් (ඔහට **රහොනිසජ්ජ** නාම් සුඛ පචිතිය වන්නේයි.)

"වා" ශබ්දය අර්ථ රහිත නිපාත මාත්‍රයකි.

සං:- 1 **සහත්ථතො.**

සියතින්ය කී හෙයින් මෙරමාලවා දෙවා නම් ඇවැත් නො වේ.

සං:- 2 **නිසජ්ජං.**

විඥපුරුෂයෙක් දෙවෙනි කොට ඇති තන්හි හිඳීම ඇවැත් නො වේ.

පාචිත්ති පාළියෙහි

"අනාපත්ති යො කොචි විඤ්ඤූපුරිසො දුතියො හොති".

(අ) මෙකල ධූමරථාදියෙහි මාගමුන් හා එකට හිඳීමෙහි ඇවැත් නො වේ. විඥපුරුෂයෙක් නැති නම් භෙද නොමැනවි.

40 **සුරාමෙරයපානෙ පි පාචිත්තිය මුදීරිතං අඞ්ගුලිපතොදකෙ වාපි හසධම්මෙපි චොදකෙ.**

සුරාමෙරයපානෙ **අපි,** රහමෙර පීම හෙතුකොට ගෙණ ද; පාචිත්තියං, **සුරාමෙරයපාන** නම් සුඛ පචිතිය; උදීරිතං, භාග්‍ය වත්හු විසින් වදරණ ලදී; අඞ්ගුලිපතොදකෙ ච අපි, ඇඟිලිවලින් ඇණ ගිරි කැවීම හෙතුකොටගෙණ ද (**අඞ්ගුලිපතොද** නම් සුඛ

පචිත්තිය වදාරණලදී.) උදකෙ, ජලයෙහි; හසධම්මෙ ච අපි, සිනාසෙමින් ක්‍රීඩා කිරීම හෙතුකොටගෙණ ද (**උදකහසධම්ම** නම් සුඩ පචිත්තිය වදාරණ ලද්දේයි.)

සං:– 1 **සුරාමෙරයපානෙ පි.**

මද්‍යයට බඳු පැහැඇති මද්‍යයට බඳු ගඳඇති මද්‍යයට බඳු රසඇති මද්‍ය නොවූවක් පීමෙන් සුරාමේරයපාන පචිත්තිය නො වේ.

පාචිත්ති පාළියෙහි

"අනාපත්ති අමජ්ජං ච හොති මජ්ජවණ්ණං මජ්ජගන්ධං මජ්ජරසං තං පිවති".

සං:– 2 **උදකෙ හසධම්මෙ**

"**කිඤ්චි කීළිතං න කීළිතබ්බං**"යි වදාළ හෙයින් දියෙහි පමණක් නොව ගොඩෙහි ද කිසි ක්‍රීඩාවක් නොකටයුතු.

41 **අනාදරෙ පි පාචිත්ති භික්ඛුං භිංසයතො පි වා**
**භයානකං කථං කත්වා දස්සෙත්වා වා භයානකං**

අනාදරෙ අපි, අවවාදී පුද්ගලයාහට හෝ ධර්මයට අගරු කිරීමෙහි ද; පාචිත්තියං, **අනාදරිය** නම් සුඩ පචිත්තිය වන්නේය. භයානකං, භය උපදවන්නාවූ; කථං කත්වා වා, කථාවක් කොට හෝ; භයානකං, භයවිය යුතු රූපයක්; දස්සෙත්වා වා, දක්වා හෝ; භික්ඛුං, භික්ෂුවක්; භිංසයතො පි වා, භයගණ්වන්නාවූ භික්ෂුහට ද; පාචිත්තියං, **භිංසාපනක** නම් සුඩ පචිති වන්නේයි.

42 **ඨපෙත්වා පච්චයං කිඤ්චි අගිලානො ජලෙය්‍ය වා**
**ජොතිං ජලාපයෙය්‍ය වා තස්ස පාචිත්තියං සියා**

අගිලානො, නොගිලන්වූයේ; කිඤ්චි පච්චයං, පහන් දැල්වීම් පාත්‍රා පිසීම් ආදී යම් කිසි හෙතුවක්; ඨපෙත්වා, හැර; ජොතිං, ගින්නක්; ජලෙය්‍ය වා, තමා දල්වන්නේ නම් හෝ; ජලාපයෙය්‍ය වා, අනුන් ලවා දල්වවන්නේ නම් හෝ; තස්ස, ඒ මහණහට; පාචිත්තියං, **ජොතිසමාදහන** නම් සුඩ පචිත්තිය; සියා, වන්නේයි.

සං:– 1 **අගිලානො.**

යම් රෝගයක් ගිනි තැපීමෙන් තොරව සුව නො වේ නම් එබඳු රෝගීහු මෙහි ගිලනුන් වශයෙන් සලකණ ලදී.

පාචිත්ති පාළියෙහි

"ගිලානො නාම යස්ස විනා අග්ගිං න ඵාසු හොති"

අනුන් විසින් සිය කැමැත්තෙන් කළ ගිනි ද ගිනිහල් ගෙවල ගිනි ද තැපීමෙන් ඇවැත් නො වේ.

43 **කප්පබින්දුමනාදාය නවචීවරයොගිනො**
**හස්සාපෙක්ඛස්ස පාචිත්ති භික්ඛුනො චීවරාදිකං**

44 **අපනෙත්වා නිධෙන්තස්ස නිධාපෙන්තස්ස වා පන**
**ජානං පාණං මරන්තස්ස තිරච්ඡානගතම්පි ච**

කප්පබින්දුං, කප්බින්දුව; අනාදාය, නොගෙණ (නොගසා) නවචීවරයොගිනො වා, අළුත් සිවුරු දරන්නාවූ භික්ෂුහටද; පාචිත්තියං, **කප්පබින්දු අනාදාන** නම් සුඩ පචිතිය වන්නේය. භික්ඛුනො, අන් භික්ෂුවක්හුගේ; චීවරාදිකං, සිවුරු ආදි පිරිකරක්; අපනෙත්වා, පහකොට; හස්සාපෙක්ඛස්ස, සිනාසෙනු කැමතිව; නිධෙන්තස්ස වා, නිධාන කොට (සඟවා) තබන්නාවූ භික්ෂුහට ද; නිධාපෙන්තස්ස වා, අනුන් ලවා සඟවා තබ්බවන්නාවූ භික්ෂුහට ද; පාචිත්තියං, **චීවරාපනිධාන** නම් සුඩ පචිතිය වන්නේය; ජානං, ප්‍රාණියෙකැයි දැන දැන; තිරච්ඡානගතං, තිරිසන් ගතිඇති; පාණං, සතෙකු; මරන්තස්ස අපි ච, මරන්නාවූ භික්ෂුහට ද; පාචිත්තියං, **ජීවිතා වොරොපන** නම් සුඩ පචිතිය වන්නේයි.

මෙහි "**පන**" ශබ්දය අර්ථ රහිත නිපාත මාත්‍රයකි.

සං:– 1 **කප්පබින්දුං.**

කප්බින්දුව වනාහී සිවුරෙහි කොණක හෝ කොණ් දෙකක හෝ කොණ් තුණක හෝ කොණ් සතරෙහි ම හෝ වශී රියන් ප්‍රදෙශය තුල නීලාදී වර්ණයකින් මොනරැස් මකුණුපිටි පමණ සටහන් තැබිය යුතු.

සමන්ත පාසාදිකාවෙහි

"තං ච පන කප්පං ආදියන්තෙන චීවරං රජිත්වා චතූසු වා කොණෙසු තීසු වීසු වා එකස්මිං වා කොණෙ මොරස්ස අක්ඛිමණ්ඩලමත්තං වා මඞ්කුණපිඨිමත්තං වා ආදාතබ්බං"

කඞ්ඛා විතරණියෙහි

"නිවාසනපාරුපනූපගං එකං චීවරං ලභිත්වා තස්ස නිඨිත රජනස්ස යස්මිං වා තස්මිං වා පදෙසෙ කංසනීලෙන වා පත්තනීලෙන වා කද්දමෙන වා යෙන කෙනචි කාළෙන වා මොරක්ඛිමණ්ඩලමඞ්කුණපිට්ඨිනං අඤ්ඤතරප්පමාණං කප්පබින්දුං ආදියිත්වා තං චීවරං පරිභුඤ්ජිතබ්බං"

### සං:– 2 නවචීවර

"නවං නාම අකතකප්පං වුච්චති"යි පාචිත්ති පාළියෙහි දක්වෙන හෙයින් හුදෙක් අළුත් සිවුරුම නොව අනුන්ට දී ලැබූ වාවූ පරණ සිවුරුද ගතයුත්තාහුය.

45 **ඡාදෙතුකාමො ඡාදෙති දුට්ඨුල්ලං භික්ඛුනො පි ච**
**ගාමන්තරගතස්සාපි සංවිධායිත්ථියා සහ**

භික්ඛුනො අපි ච, භික්ෂුවක්හුගේද; දුට්ඨුල්ලං, සඟවෙසෙස් ආදී ලාමක ඇවතක්; ඡාදෙතුකාමො, වසනු කැමතිවූයේ; ඡාදෙති, සඟවා නම්; (**දුට්ඨුල්ලපටිච්ඡාදන** නම් සුඛ පචිතිය වන්නේය.) සංවිධාය, මන්ත්‍රණය කොට; ඉත්ථියා සහ. ස්ත්‍රියක් හා සමඟ; ගාමන්තරගතස්ස අපි, එක්ගමකට ගියාවූ භික්ෂුහට ද; **සංවිධාන ගමන** නම් සුඛ පචිතිය වන්නේයි.

### සං:– 1 දුට්ඨුල්ලං

පරිජි හා සඟවෙසෙස් දුට්ඨුල්ල නමි. ඉතිරි වූයේ අදුට්ඨුල්ල නමි.

පාචිත්ති පාළියෙහි

> "දුට්ඨුල්ලා නාම ආපත්ති චත්තාරි ච පාරාජිකානි තෙරස සංඝාදිසෙසා"යි.

දුට්ඨුල්ලාපත්තිය දැන දැන අදුට්ඨුල්ලයයි සලකා ප්‍රතිච්ඡාදනය කරන්නාවූ මහණහට දුකුළා වේ.

පාචිත්ති පාළියෙහි

> "දුට්ඨුල්ලාය ආපත්තියා අදුට්ඨුල්ලාපත්ති සඤ්ඤී පටිච්ඡාදෙති ආපත්ති දුක්කටස්ස"

46 **භික්ඛුං පහරතො වා පි තලසත්තිකමුග්ගිරෙ**
**චොදෙති වා චොදපෙති ගරුකා මූලකෙන පි**

භික්ඛුං, භික්ෂුවකට; පහරතො වා අපි, පහරදෙන්නා වූ මහණහට ද; **පහාරදාන** නම් සුඛ පචිති වන්නේය. තලසත්තිකං, අතුල් තලනමැති ආවුධය; උග්ගිරෙ, පහරදෙනු පිණිස ඔසවන්නේ වී නම් **තලසත්තික උග්ගිරණ** නම් සුඛ පචිති වන්නේය. අමූලකෙන අපි, දැකීම් ඇසීම් සැක කිරීම් වශයෙන් මූලක් නැත්තාවූ; ගරුකා, ගරුකාපත්තියකින්; චොදෙති

වා, තමා චොදනා කරන්නේ හෝ වේ ද; චොදපෙති වා, අනුන් ලවා චොදනා කරවන්නේ හෝ වේ ද; ඕහට **චොදපනා** නම් සුඛ පචිත්තිය වන්නේයි.

සං:– 1 **පහරතො.**

කිසිවෙක් විසින් වෙහෙසනු ලබන්නේ මිදීම පිණිස පහර දේ නම් මේ පහාරදාන පචිත්තිය නොවේ.

පාචිත්ති පාළියෙහි

"කෙනචි විහෙඨියමානො මොක්ඛාධිප්පායො පහාරං දෙති"

සං:– 2 **ගරුකා.**

පරිජි සඟවෙසෙස් ගරුක නමුදු මෙහි සඟවෙසෙස් ම අභිප්‍රෙතයි.

(අ) අනුපසම්පන්නයෙක්හට ගරු ඇවතකින් චොදනා කිරීමෙන් දුකුළා වේ

පාචිත්ති පාළියෙහි

"අනුපසම්පන්නං අනුද්ධංසෙති ආපත්ති දුක්කටස්ස"

**47 කුක්කුච්චුප්පාදනෙ චා පි භණ්ඩනත්ථායුපස්සුතිං**
**සොතුං භණ්ඩනජාතානං යාති පාචිත්තියං සියා**

(භික්ඛුස්ස, උපසපන්, භික්ෂුවක්හට;) කුක්කුච්චුප්පාදනෙ ච අපි, අනුපසපන්නෙහැයි කුකුස් ඉපද වීමෙහි ද; **කුක්කුච්චුප්පාදනා** නම් සුඛ පචිත්තිය වන්නේය. භණ්ඩනත්ථාය, ඩබර පිණිස; භණ්ඩනජාතානං, ඩබරකරුවන්ගේ; සොතුං, වචන ඇසීමට; යාති, පැමිණේ නම් පාචිත්තියං සියා, **උපස්සුති** නම් සුඛ පචිත්තිය වන්නේයි.

**48 සඞ්ඝස්ස ලාභං පරිණාමිතං තු**
**නාමෙති යො තං පරපුග්ගලස්ස**
**පුච්ඡං අකත්වා පි ච සන්තභික්ඛුං**
**පාචිත්ති ගාමස්ස ගමෙ විකාලෙ.**

යො, යම් භික්ෂුවක් තෙමේ; සංඝස්ස, සංඝයා හට; පරිණාමිතං, පිරිණමන ලද; ලාභං, චීවරාදී යම් ලාභයක් වේ නම්; තං තු, ඒ ලාභය වනාහී; නාමෙති, (අන්පුගුලෙක් වෙත) පිරිණමවන්නේ වී නම් (ඕහට) **ලාභපරිණාමනා** නම් සුඛ පචිති

වන්නේය. සන්තං භික්ඛුං, ප්‍රකටව ඇත්තාවූ භික්ෂුවක් කෙරෙන්; පුච්ඡං, විචාරීම; අකත්වා, නොකොට; විකාලෙ, විකාල යෙහි; ගාමස්ස, ගමට; ගතෙ අපි ච, වැදුනාහට ද; පාචිත්ති යං, **විකාලගාමප්පවෙසන** නම් සුඛ පචිත්තිය වන්නේයි.

> **"ගාමස්ස"** යි කම්මත්ථ සාමිවචන යි. **"ගතෙ"** යි සම්ප්‍රද නාර්ථ භුම්ම වචනයි.

සං:- 1 **සන්තභික්ඛුං.**

**ප්‍රකෘති** වචන ඇස්වියහැකි ස්ථානයෙහි සිටියාවූ භික්ෂුව **සන්තභික්ඛු** නම්.

**සමන්ත** පාසාදිකාවෙහි

> "යං පස්සෙ වා අභිමුඛෙ වා පස්සන්ති යස්ස සඞ්ඛා හොති, පකතිවචනෙන ආරොචෙතුං අයං සන්තො නාම"

(අ) **"ඉන්ද්‍රදිකා තා වජිරා ජගාගො"** යි වුත්තොදයෙහි නිර්දිෂ්ඨ හෙයින් එකොළොස්කුරින්යුත් පාදසතරක් ඇති ඉන්ද්‍රවජ්‍රා නම් වෘතයෙන් මේ ගාථාව ගොතා තිබේ. හේ ගණ ගරු වශයෙන් උච්චාරණය කටයුතු වේ

මූලසික්ඛා වණ්ණනාවෙහි

**සුඛ පාචිත්තිය නිර්දේශය නිමි.**

---

49 **සංඝිකං ගරුභණ්ඩං යො දෙත්‍යඤ්ඤස්ස ඉස්සරො**
**ථුල්ලච්චයං යථාවත්ථු ථෙය්‍යා පාරාජිකාදි පි**

යො, යම් භික්ෂුවක් තෙමේ; සංඝිකං, සඟසතුවූ; ගරුකං භණ්ඩං, ගරුභාණ්ඩයක්; ඉස්සරො, ඉසුරුවූයේ; අඤ්ඤස්ස, අනිකෙක්හට; දෙති, දෙන්නේ වී නම්; (ඕහට) **ගරුභණ්ඩදාන** නම් ථුලසි ඇවත වන්නේය. ථෙය්‍යාය, සොරකම් කරණු කැමති සිතින් දෙන්නේ වී නම්; යථාවත්ථුං, වස්තුවට සුදුසුවූ; පාරාජිකාදි පි, පාරාජිකාපත්ති ආදිය වන්නාහ.

> **ථෙය්‍යාය"** යි බිණිය යුතු තන්හි **"ථෙය්‍යා"** යි ඡන්දස් පිණිස යකාර ලොපය යි.

**"පාරාජිකාදිපි"** යන්නෙහි ආදි ශබ්දයෙන් ථුලසි දුකුළා ද වාච්‍ය කෙරෙත්.

සං:– 2 **ගරුභණ්ඩං.**

1. ආරාමය. 2. ආරාමවසතුය. = 3. විහාරය. 4. විහාර වසතුය. = 5 ඇඳය. 6. පුටුය. 7. කොට්ටය 8. මෙට්ටය. = 9. ලොහො සැලිය 10. ලොහො කටාරම්ය. 11. මහලොහො සැලිය. 12. ලොහො කලගෙඩිය. 13. කෙවේරිය 14. මහවෑය. 15. පොරෝය 16. හුදලුය. 17. නියම්ය. = 18. වේවැල් ආදී වැල්ය. 19. හුණබට ආදියය 20. ඉලුක් ආදී සෙවිලි කරණ තෘණය. 21. මැටිය. 22. මුදුතණය. 23. බබුස් තණය. 24. මැටි බඳුන්ය. 25. ලී බඳුන්ය යන මේ පස්රැසකින් යුත් පස්විසි වැදෑරුම් වසතු ජාතය ගරුභාණ්ඩ නම් වෙත්.

සමන්ත පාසාදිකාවෙහි

"විසඞ්ගහානි වෙ හොනති තතියං චතුසඞ්ගහං
චතුත්ථං නවකොඨාසං පංචමං අඨභෙදනං
ඉති පඤ්චහි රාසීහි පඤ්චනිම්මලලොචනො
පඤ්චවීසවිධං නාථො ගරුභණ්ඩං පකාසයි"

සං:– 2 **ථුල්ලච්චයං.**

**"ථූලො ච සො අච්චයො චෙ ති ථුල්ලච්චයො"** යි කර්මධාරය සමාසයි. **"තං ථුල්ලච්චයං"** යි විතීයානත යි.

පරිවාර පාළියෙහි

† "ථුල්ලච්චයනති යං වුත්තං තං සුණොහි යථා තථං
**එකස්ස** මූලෙ දෙසෙති යො ච තං පටිගණ්හති
අච්චයො තෙන සමො නත්ථි තෙනෙතං ඉති වුච්චති"

---

† ථුල්ලච්චයං ඉති, ථුල්ලච්චය යයි; යං, යමක්; වුත්තං, කියන ලද්දේ ද; තං, එය; යථා තථං, තත්වූ පරිදි; සුණොහි, අසව; **එකස්ස,** එක් භික්ෂුවක්හුගේ; මූලෙ, සමීපයෙහි; දෙසෙති, දෙසයි ද; යො ච, දෙසනු ලැබූයේ යමෙක් නම් හෙතෙම; තං, ඒ ඇවත; පටිගණ්හති, පිළිගණී ද; ඉති, මෙසේවූ අපරාධයන් අතුරෙන් (නො:– දෙශනාගාමිනී ඇවතුන් අතුරෙන්) තෙන සමො, තුලසි ඇවත සමාන; අච්චයො, වරදෙක්; නත්ථි, නැත් තේ වේ ද; තෙන, එහෙයින්; තං, ඒ තුලැසි තෙමේ; ඉති, මෙසේ තුලැසි යයි; වුච්චති කියනු ලැබේ.

ඇවත් දෙසීම් සංඛ්‍යාත දෙශනා සුඩියෙන් සුඩියට පැමිණෙන ඇවතුන් අතර මහවරදවූයේ තුලසි නම් වේ.

50 **කුසාදිමයචීරානි කම්බලං කෙසවාලජං**
**සමයං විනා ධාරයතො ථූලපක්ඛාජිනක්ඛිපං.**

කුසාදිමයචීරානි ච, කුසතණ ආදියෙන් තිපයූ වැහැරි සිව්රුද; කෙසවාලජං, මනුෂ්‍ය හිසකේ හා සෙමර වාලධියෙන් තිපයූ සිව්රුද; කම්බලං, කම්බිලියෙන් තිපයූ සිව්රුද; ථූලපක්ඛාජිනක්ඛිපං, බකමූණු පියාපතින් හා කළුදිවිසමින් තිපයූ සිවුරුද; සමයං විනා, නෂ්ටචීවරකාලය තබා; ධාරයතො, දරන්නාවූ භික්‍ෂුහට; (ථුල්ලච්චයං,) **චීරධාරණනම්** තුලැසිය වන්නේයි.

"**කුසාදි**" යන්නෙහි ආදිශබ්දයෙන් සෙසු තෘණයෙන් කළ සිව්රු ගැණෙත්.

51 **සත්ථකම්ම වත්ථිකම්ම සම්බාධෙ ලොම හාරණං** ... 

(සම්බාධෙ, ගැහැටවූ ස්ථානයෙහි) සත්ථකම්ම ච, කුඩා ශස්ත්‍රවලින් ලේ මිදෙන කෘත්‍ය කිරීමෙන් ද **සත්ථකම්ම නම්** තුලසිය වන්නේය. වත්ථිකම්ම ච, වස්තියෙහි වස්ත්‍රවලින් වෙලා බෙහෙත් යොදන්නාවූ කෘත්‍ය කිරීමෙන් ද **වත්ථිකම්ම** නම් තුලසිය වන්නේය; සනිමිත්තං, ස්වාංගජාතය; ඡින්දතො, සිඳීමෙන්ද **නිමිත්තච්ඡෙදන** නම් තුලසිය වන්නේය; මනුස්සානං, මිනිසුන්ගේ; මංසාදි භොජනෙ පි වා, මාංශාදිය අනුභව කිරීමෙන් ද; ථුල්ලච්චයං, **මනුස්සමංසඛාදන** නම් තුලසිය වන්නේයි.

"**මංසාදි**" යන්නෙහි ආදි ශබ්දයෙන් ලේ නහර ලොම් ගැණෙත්.

සං:- 1 **සත්ථකම්ම වත්ථිකම්ම**

අංගජාතය හාත්පස දෑඟුල් පමණ ප්‍රදෙශයෙහි ශස්ත්‍ර කර්මය ද මූත්‍රමාර්ග සංඛ්‍යාත අංගජාතයෙහි වස්තිකර්මය ද ප්‍රතික්ෂිප්තයි.

මහාවග්ග පාළියෙහි

"න භික්ඛවෙ සම්බාධස්ස සාමන්තා ද්වංගුලා සත්ථකම්මං වා වත්ථිකම්මං වා න කාරාපෙතබ්බං යො කාරෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස"

සමන්ත පාසාදිකාවෙහි

"එත්ථ ච සම්බාධස්ස සාමන්තා වංගුලා ති ඉදං සත්ථකම්මමෙව සන්ධාය වුත්තං වත්ථිකම්මං පන සම්බාධස්සෙව පටික්ඛිත්තං"

52 **කදලෙරකක්කදුස්සානි පොත්ථකං සබ්බනීලකං**
**සබ්බපීතාදිකං චාපි ධාරයන්තස්ස දුක්කටං**

කදලෙරකක්කදුස්සානි ච, කෙහෙල් පට්ටා ඒරුපත් වරාදුහුල් යන මෙයින් කළ පිළීද; පොත්ථකං, මකාවි දුහුලෙන් කළ පිළීද; සබ්බනීලකං ච, සියල්ල නිල්වන් පිළීද; සබ්බපීතාදිකං ච අපි, සියල්ල රන්වන් පිළී ආදිය ද; ධාරයන්තස්ස, දරණ මහණහට; දුක්කටං, **චීවරධාරණ** නම් දුකුළා වන්නේයි.

"**සබ්බපීතාදිකං**" යන්නෙහි ආදි ශබ්දයෙන් සර්වලෝහිතක සර්වකෘෂ්ණක සර්වමාංජෙෂ්ඨක පිළීද ගැණෙත්.

සං– 1 **දුක්කටං.**

වරදවා කරනලද්ද හෝ ගර්හාකටයුත්ත දුෂ්කට නම්.

"**දුට්ඨුකතං දුක්කටං**"යි ද "**දුකුච්ඡිතං ගරහිතබ්බං කතං දුක්කටං**"යි ද "**දුක්ඛෙන අකාරීති දුක්කටං**"යි ද නිර්වචනයි.

පාරිවාර පාළියෙහි

"දුක්කටන්ති යං වුත්තං තං සුණොහි යථා තථං
අපරද්ධං විරද්ධඤ්ච ඛලිතං යඤ්ච දුක්කටං
යං මනුස්සො කරෙ පාපං ආවි වා යදි වා රහො
දුක්කටන්ති පවෙදෙන්ති තෙනෙතං ඉති වුච්චති"

53 **හත්ථස්සුරගසොණානං සීහබ්‍යග්ඝච්ඡදීපිනං**
**තරච්ඡස්ස ච මංසාදිං උද්දිස්සකතකම්පි ච**

54 **අනාපුච්ඡිත මංසඤ්ච භුඤ්ජතො දුක්කටං සියා**
**යථානුපුබ්බං තිට්ඨාන දුක්කටාදිකං වදෙ**

හත්ථිස්සුරගසොණානං, ඇත් අස් සර්ප සුණඛයන්ගේ ද; සීහබ්‍යග්ඝච්ඡදීපිනං, සිංහ ව්‍යාඝ්‍ර වලස් දිවියන්ගේ ද; තරච්ඡස්ස ච, කළුහිස් වලසුන්ගේ ද; මංසාදිං ච, මාංශාදිය ද; උද්දිස්සකතකම්පි ච, තමන් උදෙසා මැරුවාවූ මාංශය ද; අනාපුච්ඡිතමංසං ච, නොවිචාළ මාංශය ද; භුඤ්ජතො, අනුභවකරන්නාහට; දුක්කටං, **මාංශභොජන** නම් දුකුළාව, සියා, වන්නේය. යථානුපුබ්බං,

පැමිණි පිළිවෙල; හිත්වා, හැර; උදකතිත්ථාදිකං, පැන් තොටු ආදියට; වජෙ, යන්නේ නම් ඝටානුපුබ්බජහන නම් දුකුළා වන්නේ යි.

සං:- 1 **උද්දිස්සකතකම්පි ච.**

තමා උදෙසා මැරූ බැව් සියැසින් දුටීමය කණින් ඇසීමය සැක ඇතිවීමට අවකාශ ලැබීමය යන කොටිත්‍රිකය උද්දිස්සකතමාංශයෙහි ලැබිය යුත්තාහ. එසේවූ උද්දිස්සකත මාංශය බුදින්නාහට දුකුළා වේ. උක්තප්‍රකාර කොටිත්‍රයෙන් මිදුනු මත්ස්‍ය මාංශ වැළඳීමෙන් ඇවැත් නොවේ.
මහාවග්ග පාළියෙහි

> “න භික්ඛවෙ ජානං උද්දිස්සකතං මංසං පරිභුඤ්ජිතබ්බං යො පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස=අනුජානාමි භික්ඛවෙ තිකොටිපරිසුද්ධං මච්ඡමංසං අදිට්ඨං අසුතං අපරිසඞ්කිතං”යි

සං:- 2 **අනාපුච්ඡිතමංසං ච.**

මේ කිනම් මසක් දැයි නොවිචාරා වැළඳුකල්හි දුකුළා වෙයි. කැපමසැයි නිසැකව දැනනොවිචාරා වැළඳීමෙන් ඇවැත් නොවේ.

සමන්ත පාසාදිකාවෙහි

> “සචෙ පන අසුකමංසම්පි ජානාති පටිපුච්ඡිතකිච්චං නත්ථි”

55 **සහසා උබ්භජිත්වාන පවිසෙ නික්ඛමෙය්‍ය වා**
**වච්චපස්සාවකුටිකං විනා උක්කාසිකං විසෙ**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ) සහසාව, යුහුසුලුවම; උබ්භජිත්වාන, සිවුර උස්කොට; වච්චපස්සාවකුටිකං, වැසිකිළියට හා කැසකිළියට; පවිසෙ, ඇතුල්වන්නේ වීනම් **වච්චකුටිපවිසන** නම් දුකුළා ද, නික්ඛමෙය්‍ය වා, (එසේම එයින්) නික්මේ නම් **වච්චකුටිනික්ඛමන** නම් දුකුළා ද වන්නේය; උක්කාසිකං විනා, කැසි කැරීම් රහිතව; විසෙ. ප්‍රවිෂ්ට වන්නේ නම් ඕහට **පවිසන** නම් දුකුළා වන්නේයි.

56 **නිට්ඨුභන්තො කරෙ වච්චං දන්තකට්ඨං ච ඛාදයං**
**වච්චපස්සාව දොණීනං බහිවච්චාදිකං කරෙ**

(යො භික්ඛු, යම් භික්ෂුවක් තෙමේ) නිට්ඨුභන්තො ච, තටමමින් හෝ කෙළ ගසමින් ද; දන්තකට්ඨං ච ඛාදයං, දැවටි දඹු කමින් ද;

වච්චං කරෙ, මලපහකෙරේ නම් **වච්චකරණ** නම් දුකුලා වන් නේය. වච්චපස්සාව දෙණ්ණං, වැසිකිළි කැසකිළි ආවාටයන්ගේ; බහි, පිටත්හී; වච්චාදිකං, මල ආදිය; කරෙ, හෙළීම කෙරේ නම් **වච්චබිපන** නම් දුකුලා වන්නේයි.

57 **ඛරෙනචාවලෙඛෙය්‍ය කට්ඨම්පාතෙය්‍ය කූපකෙ**
**උහතං ච න ධොවෙය්‍ය උකලාපං ච න සොධයෙ**

ඛරෙන ච, කොරොස් පුසකින්; අවලෙඛෙය්‍ය, මලසුඩකෙරේ නම් **අවලෙඛණ** නම් දුකුලාද කඨං, පුසන් කාෂ්ඨය; කූපකෙ, වැසිකිළි ආවාටයෙහි; පාතෙය්‍ය, හෙලන්නේ වී නම් **කඨපාත** නම් දුකුලා ද; උහතං ච, වැසිකිළි පාදුකාවෙහි තැවරුණු මල ද; න ධොවෙය්‍ය, නොදෙවන්නෝ වී නම් **අධොවන** නම් දුකුලා ද උකලාපං ච, වැසිකිළියෙහි තුබූ කැලිකසල ද; න සොධයෙ, සුඩ නොකරන්නෝ වී නම් **අසොධන** නම් දුකුලා ද වන්නේ යි.

58 **දකකිච්චං කරොන්තස්ස කත්වා චපුචපු ති ච**
**අනජ්ඣිට්ඨොව ථෙරෙන පාතිමොක්ඛම්පි උද්දිසෙ**

චපුචපු ඉති, චපු චපු යන ශබ්දය; කත්වා, කොට; උදකකිච්චං, ජලකෘත්‍යය; කරොන්තස්ස, කරන්නාවූ මහණහට; **ආචමනකරණ** නම් දුකුලා වන්නේය. ථෙරෙන, සංඝස්ථවිරයන් විසින්; අනජ්ඣිට්ඨො එව, නො අණවන ලද්දේ ම; පාතිමොක්ඛං, ප්‍රාතිමොක්ෂය; උද්දිසෙ ප්‍රකාශකරන්නේ වීනම් **පාතිමොක්ඛුද්දෙසන** නම් දුකුලා වන්නේයි.

59 **අනාපුච්ඡාය පඤ්හස්ස කථනෙ විස්සජ්ජනෙ පි ච**
**සජ්ඣායකරණෙ දීපජාලනෙ විජ්ඣාපනෙ පි ච**

අනාපුච්ඡාය, වෘඩතෙරුන් නො පිළිවිස; පඤ්හස්ස කථනෙ, ප්‍රශන ඇසීමෙහි **පඤ්හකථන** නම් දුකුලා ද; විස්සජ්ජනෙ අපි ච වෘඩයන් නොවිචාරා ප්‍රශන විසදීමෙහි **පඤ්හවිස්සජ්ජන** නම් දුකුලා ද; **සජ්ඣායකරණෙ,** වෘඩයන් නොවිචාරා ග්‍රන්ථ හැදෑරීමෙහි **සජ්ඣායකරණ** නම් දුකුලා ද; දීපජාලනෙ වෘඩයන් නොවිචාරා පහන් දැල්වීමෙහි **දීපජාලන** නම් දුකුලාද, විජ්ඣාපනෙ අපි ච, වෘඩයන් නොවිචාරා පහන් නිවීමෙහි **විජ්ඣාපන** නම් දුකුලා ද වන්නේයි.

**"අනාදුවජාය"** යි පචේවක සම්බන්ධ යි.

60 **වාතපානකවාටාදිං විවරෙය්‍ය එකෙය්‍ය වා
වඤ්චනාදිං කරෙ නගෙගා ගමනං භොජනාදිකං.**

වාතපානකවාටාදිං, වා හමන්නාවූ දෙරකවුළු ආදිය; විවරෙය්‍ය, වෑඩයන් නො විචාරා විවෘතකරන්නේ නම් **මාරවිවරණ** නම් දුකුලා ද; එකෙය්‍ය වා, **එසේ ම** ආවරණය කරන්නේ නම් **මාරථකන** නම් දුකුලා ද; නගෙගා, නග්නවූයේ; වඤ්චනාදිං වා වැඳීම් ආදිය ද; ගමනං, මාර්ගයෙහි යාම ද; භොජනාදිකං, අහර වැළඳුම් ආදිය ද; කරෙ, කරන්නේ වීනම් **නගග** නම් දුකුලා ද වන්නේයි.

61 **පරිකම්මංකරෙ කාරෙ තිපටිච්ඡන්නකං විනා
කායං නහායං සංඝෙය්‍ය කුඩ්ඩෙ එමෙහ තරුම්හි වා**

තිපටිච්ඡන්නකං, තුන් ස්ථානයක්; විනා, හැර; නහායං, ජලස්නානය කරන්නාවූ මහණ තෙමේ; පරිකම්මං, සියතින් කුණු ඉලීම් සංඛ්‍යාත කෘත්‍යය; කරෙ, තෙමේ කරන්නේ ද; කාරෙ, මෙරමා ලවා කරවන්නේ ද ඔහට **පරිකම්** නම් දුකුලා වන්නේය. නහායං, ජලස්නානය කරන්නේ; කායං, ශරීරය; කුඩ්ඩෙවා, භිත්තියෙහි හෝ; එමෙහවා, වැඹෙක හෝ; තරුම්හි වා, රුකෙක හෝ; සංඝෙය්‍ය, ගවන්නේ වීනම් **ශරීරඝට්ටන** නම් දුකුලා වන්නේයි.

සං:- 1 **තිපටිච්ඡන්නකං.**

ගඩොල් ආදි බැම්වලින් වටකරණ ලද ස්ථානය ජලයෙන් වට කරණ ලද ස්ථානය වස්ත්‍රයෙන් වටකරණලද ස්ථානය යන ස්ථානත්‍රය ගතයුත්තාහ.

චුල්ලවග්ග පාළියෙහි

"අනුජානාමි භික්ඛවෙ තිස්සො පටිච්ඡාදියො ජන්තාඝර පටිච්ඡාදිං උදකපටිච්ඡාදිං වත්ථපටිච්ඡාදිං"යි.

(අ) රාත්‍රිකාලයෙහි අන්ධකාරයෙන් වැසීම පාළියෙහි නො වදාළ නමුදු බැම්වලින් වැසීම හා සවභාව සදෘශ හෙයින් අන්ධකාර ප්‍රතිච්ඡාදියද ආචාර්‍ය්‍යවරු අනුමතකාලහ.

## 62 කුරුවින්දකසුත්තෙන අඤ්ඤමඤ්ඤස්ස කායතො අගිලානො බහාරාමෙ චරෙය්‍ය සඋපාහනො

කුරුවින්දකසුත්තෙන, කුරුවින්ද සූත්‍රයෙන්; අඤ්ඤමඤ්ඤස්ස, එකෙක් තෙමේ එකෙක්හුගේ; කායතො ශරීරයෙහි උලන්නේ වීනම් **නහාන** නම් දුකුළා ද; අගිලානො, නොගිලන්වූ භික්ෂු තෙමේ; බහාරාමෙ, ආරාමයෙන් පිටත්හිවූ ගමෙහි; සඋපාහනො, වහන් සහිතවූයේ; චරෙය්‍ය, හැසිරෙන්නේ වීනම් **උපාහණරූහණ** නම් දුකුළාද වන්නේයි.

### සං:– 1 කුරුවින්දකසුත්තෙන.

රඹුක්ගල් චදුරුස්සගල් නාමයෙන් වර්‍තමානයෙහි වහරවියේ කුරුවින්ද පාෂාණ නම්. ඒ කුරුවින්දගල් සුනු ලාකඩවත් කොට කදුරුමල් (නො– හිඳිමල්) පෙළක්සේ දූවපත්නක අවුනා ඇඟ ඉලිමට සපයන ලද්දේ කුරුවින්දසූත්‍ර නම්. (මෙකල ඇඳුන් පිරිසි දුකරණ බුරුසු වැනි භාණ්ඩයකැයි සැලකිය හැකිවේ).

කුදුසික ටීකාවෙහි

> "කුරුවින්දකසුත්තියා"ති කුරුවින්දකපාසාණචුණ්ණානි ලාඛාය බන්ධිත්වා කතගුළිකා වලියා සුත්තෙන ආවුනිතසුත්තියා"යි.

සිඛවළඳ විනිසෙහි

> "කුරුඳු සුනුලා සුමු කොටැ ලකවලි සෙයින් වටා කුරුඳුමල්වැල සෙයින් අවුනා පිට ගහා නහති- මේ කුරුඳුවැළ නම්".

### සං:– 2 අගිලානො.

ගිලන් භික්ෂුහට වහන් පයලා ඇතුල්ගම් වැදීමෙහි ඇවැත් නොවේ.

මහාවග්ග පාළියෙහි

> "අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා සඋපහානෙන ගාමං පවිසිතුං"යි.

(අ) සාමාන්‍ය රොගීහු ගිලනුන් වශයෙන් ග්‍රාහිත නොවේ. වහන් පය නොලෑමෙන් පයට දුක් වේදනා හටගන්නාවූ පාපැළුම් මස්දළු ලියලුම් ආදි ආබාධයෙන් බාධිතභික්ෂුහුම මෙහි ගිලනුන් වශයෙන් ගැණෙත්.

මහාවග්ග පාළියෙහි

"අනුජානාමි භික්ඛවෙ යස්ස පාදා වා දුක්ඛා පාදා වා ඵාලිතා පාදඛීලො වා ආබාධො උපාහණං ධාරෙතුං"යි.

(ආ) තුන්පටකට අධිකවූ සතවහන් පයලෑමෙන් දුකුලා වේ. ගිහින් විසින් පාවිච්චිකොට ඉවත්කළ සතවහන් පයලෑමෙන් ඇවැත් නොවේ.

මහාවග්ග පාළියෙහි

"න භික්ඛවෙ ගණං ගණුපාහණං ධාරෙතබ්බා යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස=අනුජානාමි භික්ඛවෙ ඔමුක්කං ගණං ගණුපාහණං"

63 **උපාහණං යො ධාරෙති සබ්බනීලාදිකම්පි ච**
**නිමිත්තං ඉත්ථියා රත්තො මුඛං වා භික්ඛදායිකා**

සබ්බනීලාදිකං, සියලු නීලාදිවර්ණ ඇත්තාවූ; උපාහණං අපි ච, වහන්ද; යො, යම් භික්ෂුවක් තෙමේ; ධාරෙති, දරන්නේ වීනම් ඔහට **උපාහණ ධාරණ** නම් දුකුලාද; රත්තො, ඇළුනු සිත් ඇතියේ; භික්ඛදායිකා, පිණ්ඩපාතය පුදන්නාවූ; ඉත්ථියා, ස්ත්‍රියගේ; නිමිත්තං වා, අඞ්ගජාතය හෝ; මුඛං වා, මුහුණ හෝ; (පස්සෙය්‍ය, බලන්නේ වීනම් ඔහට **ඉත්ථිඔලොකන** නම් දුකුලාද වන්නේයි).

"**සබ්බනීලාදිකං**" යන්නෙහි ආදි ශබ්දයෙන් සියලු රත්වූ සියලුරන්වන්වූ සියලු පඬුවන්වූ වහන් ද වර්ණ විනාශවූ වහන් ද ගැණෙත්.

"**භික්ඛදායිකා**"යි උපලක්ෂණයි. පිණ්ඩපාතය පුදන්නාවූ හෝ නුපුදන්නාවූ යම් කිසි මාගමක් හෝ වේවා පුරුෂයෙකු හෝ වේවා ඇළුනු සිතින් බලා නම් දුකුලා වේ.

මූලසික්ඛා ටීකාවෙහි

"එත්ථ ච භික්ඛදායිකා ති උපලක්ඛණවසෙන වුත්තං යාය කායචි ඉත්ථියා වා පුරිසස්ස පි මුඛං සාරත්තො ඔලොකෙන්තස්ස දුක්කටමෙවා ති"

"**මුඛංවා**" යන්නෙහි "**වා**" ශබ්දතොමෝ අනියමාර්ථ වන්නේය. එහෙයින් ස්ත්‍රී පුරුෂයන්ගේ මුහුණම නොගතයුතු. යම් කිසි ශරීරාංගයක් අරමුණු කිරීමම ගතයුත්තේය.

64 **උජ්ඣානසඤ්ඤී අඤ්ඤස්ස පත්තං වා අත්තනො මුඛං ආදාසාදිම්හි පෙක්ඛෙය්‍ය උච්චාසනමහාසනෙ**

65 **නිසජ්ජාදිං කරොන්තස්ස දුක්කටං වන්දනෙපි ච උක්ඛිත්තානුපසම්පන්න නානාසංවාසකාදිනං**

උජ්ඣානසඤ්ඤී, ගරහණු කැමති සිත් ඇතියේ; අඤ්ඤස්ස, අනික් භික්ෂුවක්හුගේ; පත්තං වා, පාත්‍රය හෝ; පෙක්ඛෙය්‍ය, බලා නම් ඕහට **උජ්ඣානසඤ්ඤිපත්තඔලොකණ** නම් දුකුලා ද; ආදාසාදිම්හි, කැඩපත් ආදියෙහි; අත්තනො මුඛං වා, තමාගේ මුහුණ ද; පෙක්ඛෙය්‍ය, ඇලුනු සිතින් බලා නම් ඕහට **ආදාසොලොකණ** නම් දුකුලා ද; උච්චාසනමහාසනෙ, උස්ආසන උතුම් ආසන යන මෙහි; නිසජ්ජාදිං, හිඳීම් ආදිය; කරොන්තස්ස, කරන්නාවූ මහණ හට; දුක්කටං, **උච්චාසන මහාසන** නම් දුකුලා ද, උක්ඛිත්ත, උක්ඛිත්ත භික්ෂුව ද; අනුපසම්පන්න, අනුපසම්පන්නයා ද; නානාසංවාසකාදිනං, නානාසංවාසකය යනාදීහු ද; වන්දනෙ අපි ච, වැඳීමෙන් ද **උක්ඛිත්තවන්දන, අනුපසම්පන්නවන්දන, නානාසංවාසකවන්දන,** නම් දුකුලාවෝ වන්නාහුයි.

සං:– 1 **ආදාසාදිම්හි**

කැඩපතෙහි පමණක් නොව බඳුනක නමුත් ඇළුනු සිත් ඇතිව තම මූව නිමිති ගණී නම් දුකුලා වේ.

චූල්ලවග්ග පාළියෙහි

"න භික්ඛවෙ ආදාසෙ වා උදකපත්තෙ වා මුඛනිමිත්තං ඔලොකෙතබ්බං යො ඔලොකෙය්‍ය ආපත්ති දුක්කටස්සා ති".

(අ) කාංසපාත්‍රාදි සෙසුබඳුනක හෝ කැඳ ආදි අහර බඳුනක හෝ මුඛනිමිත්ත වැටහේ නම් ඒ සියළු බඳුන් ආදාස සංඛ්‍යාවටම පැමිණේ. මේ ආදි කොයි ක්‍රමයකින් නමුත් ඇළුනු සිතින් මුඛනිමිත්ත බලන්නාහට දුකුලා වේ.

සමන්ත පාසාදිකාවෙහි

"එත්ථ කංසපත්තාදීනි පි යෙසු මුඛනිමිත්තං පඤ්ඤායති සබ්බානි ආදාසසංඛමෙව ගච්ඡන්ති කඤ්ජියාදීනිපි ච උදකපත්තසංඛමෙව තස්මා යත්ථ කත්ථචි ඔලොකෙන්තස්ස දුක්කටං"යි

(ආ) ආබාධයක් පිණිස හෝ ආයු ගෙවුනේ වෙම් දැයි පරීක්ෂා කිරීම පිණිස හෝ මුවනිමිති බලා නම් ඇවැත් නොවේ.

චුල්ලවග්ග පාළියෙහි

"අනුජානාමි භික්ඛවෙ ආබාධපච්චයා ආදාසෙ වා උදකපත්තෙ වා මුඛනිමිත්තං ඔලොකෙතුං."

සමන්ත පාසාදිකාවෙහි

"ජිණ්ණොනුඛො නො ති ආයුසංඛාරං ඔලොකණත්ථම්පි වට්ටති"

### ස :- 2 උච්චාසනමහාසනෙ.

පමණ ඉකුත් කළ අසුන් උසසුන් නම්. යම් අසුනක පාදන්තය සිට පාසණ්ඩිය දක්වා යටත් පිරිසයින් සුගත් අඟලෙන් අටඟුල් පමණවූයේ හෝ ප්‍රකෘති පුරුෂයෙකුගේ අතින් මිටක් සහිත රියන් පමණවූ යේ පමණ නම් මින් පිටත්වූයේ නොවටි.

මනොරථ පූරණියෙහි

"උච්චාසනං වුච්චති පමාණාතික්කන්තං තස්ස පමාණං පන යස්ස පාදතො යාව අටනියා හෙට්ඨිමන්තෙන සුගතඞ්ගුලෙන අට්ඨඞ්ගුලප්පමාණො මජ්ඣිමපුරිසස්ස හත්ථෙන මුට්ඨිරතනප්පමාණො පාදකො හොති තං පමාණිකං නාම වට්ටති තතො අධිකං පමාණාතික්කන්තං නාම නවට්ටති".

ව්‍යාලමෘගයන්ගේ රූ සටහන්කළ බොහෝ වටිනාකම් ඇති පලස් අතුට බිම හෝ උඩ පැණවූ උත්තම අසුන් මහසුන් නම්.

"**නිසජ්ජාදිං**" යන්නෙහි ආදි ශබ්දයෙන් සයනය කිරීමද ගැණේ.

### ස :- 3 උක්ඛිත්තානුසම්පන්නනානාසංවාසකාදිනං.

ශික්ෂාව නොරක්නා හෙයින් ද පැමිණි ඇවත පිරිසිදු නොකරණ හෙයින් ද මිථ්‍යාවාද නොහරණ හෙයින් ද සංඝයා විසින් උපොෂථ දෙශනාදියෙන් හැරදමන ලද භික්‍ෂු තෙමේ උක්ඛිත්ත නම්වේ. (වර්තමානයෙහි භික්‍ෂූන් **නාසනම්** කිරීම උක්ඛිත්තකත්ව යෙහිලා සැලකිය යුතුවේ. **නාසනම්** ලද මහණ තෙමේ ද උපොෂථ දෙශනාදියෙන් වර්ජිත හෙයිනි.)

**එයින් කීහ**

"ආපත්තියා අදස්සනෙ තථා අප්පටිකම්මකෙ
උක්ඛිත්තකො අනිස්සග්ගෙ පාපිකාය ච දිට්ඨියා"

නානාසංවාසක තෙමේ ද කර්මලබ්ධිසීමා විසින් තෙවැදෑරුම්. උක්ඛිත්තක තෙමේ කර්මනානාසංවාසක නම් උක්ඛිත්තානුවත්තක

තෙමේ ලද්ධිනානාසංවාසක නම්. සීමාවෙන් බිහිවූයේ සීමා නානාසංවාසක නම්. උක්ඛිත්තක ශබ්දයෙන් කර්මනානාසංවාසකයා හැඟෙන හෙයින් මෙහි නානාසංවාසක ශබ්දයෙන් ලද්ධිනානාසංවාසකයා ම ගතයුත්තේය. කර්මලද්ධි නානාසංවාසකයන් හා කර්ම කිරීමෙන් කර්ම කොප්‍යවේ.

විනය විනිච්ඡයෙහි

“කම්මුනා ලද්ධිසීමාහි නානාසංවාසකා තයො
උක්ඛිත්තො තිවිධො කම්මනානාසංවාසකො මතො
අධම්මවාදිපක්ඛස්මිං නිසින්නොව විචින්තයං
ධම්මවාදී පනෙතෙති උප්පන්නෙ පන මානසෙ
නානාසංවාසකො නාම ලද්ධියා යං පකාසිතො
තත්‍රට්ඨො පන සො චින්නං කම්මං කොපෙති සංඝිකං
බහිසීමගතො සීමා නානාසංවාසකො මතො
නානාසංවාසකා එවං තයො වුත්තා මහෙසිනා”.

**“නානාසංවාසකාදිනං”** යන්නෙහි ආදි ශබ්දයෙන් නග්න භික්ෂුවය පසුව උපසපන්වූ භික්ෂුවය මාගමය පණ්ඩකාදී **එකාදස** අභව්‍යපුද්ගලයෝය පිරිවෙසෙහි පිහිටියාවූ භික්ෂුවය මූලට ඇතුලත් වනු පිණිස සුදුසුවූ භික්ෂුවය මානතට සුදුසුවූ භික්ෂුවය මානතෙහි පිහිටි භික්ෂුවය අබ්භානයට සුදුසු භික්ෂුවය යන මොව්හු ගැණෙත්.

විනය විනිච්ඡයෙහි

“නග්ගො අනුපසම්පන්නො නානාසංවාසකො පි ච
යො පච්ඡා උපසම්පන්නො උක්ඛිත්තො මාතුගාමකො
**එකාදස**අභබ්බා ච ගරුකට්ඨා ච පඤ්චිමෙ
වන්දතො දුක්කටං වුත්තං බාවීසති ච පුග්ගලෙ”

චුල්ලවග්ග පාළියෙහි

“දස ඉමෙ භික්ඛවෙ අවන්දියා පුරෙ උපසම්පන්නෙන පච්ඡා උපසම්පන්නො අවන්දියො අනුපසම්පන්නො අවන්දියො නානාසංවාසකො වුඩ්ඪතරො අධම්මවාදී අවන්දියො මාතුගාමො අවන්දියො පණ්ඩකො අවන්දියො පාරිවාසිකො අවන්දියො මූලාය පටිකස්සනාරහො අවන්දියො මානත්තාරහො අවන්දියො මානත්තචාරිකො අවන්දියො අබ්භානාරහො අවන්දියො ඉමෙ ඛො භික්ඛවෙ දස අවන්දියා”

66 **එකතො පණ්ඩකිත්ථිහි උභතොබ්‍යඤ්ජනෙන වා**
**දීඝාසනෙ නිසීදෙය්‍ය අදීඝෙ ආසනෙ පන**

67 **අසමානාසනිකෙන මඤ්චපීඨෙ සයෙය්‍ය වා**
**කුලසංගහත්ථං දදතො ඵලපුප්ඵාදිකම්පි ච**

පණ්ඩකිත්ථිහි, පණ්ඩකය ස්ත්‍රිය යන මොවුන් හා සමග ද; උභතොබ්‍යඤ්ජනෙන වා, උභතොබ්‍යඤ්ජනකයා හා සමග ද; එකතො, එක්ව; දීඝාසනෙ, දිගසුන්හි; නිසීදෙය්‍ය, හිඳීනම් **දීඝාසන නිසජ්ජ** නම් දුකුළා ද; අදීඝෙ, දිග්නොවූ; මඤ්චපීඨෙ, ඇඳපුටුවූ; ආසනෙ පන, අසුනෙහි ද, අසමානාසනිකෙන, අසමානාසනික භික්ෂුව සමග ද; සයෙය්‍ය වා, හොවීනම් **අදීඝාසන සයන** නම් දුකුළා ද; කුලසංගහත්ථං, කුලසංග්‍රහය පිණිස; ඵලපුප්ඵාදිකං, ගෙඩි මල් ආදිය; දදතො අපි ච, දෙන්නාවූ මහණහට ද; **කුලසංගහ** නම් දුකුළා ද වන්නේයි.

“**සයෙය්‍යවා**” යන තන්හි **වා** ශබ්දය සමුච්චයාර්ථ හෙයින් හිඳීම ද ගැණේ.

සං:- 1 **දීඝාසනෙ**

යටත්පිරිසයින් තිදෙනෙකු හිඳීමට පොහොනා ආසන දීර්ඝාශන නම් වේ. උඩත්පිරිසයින් දෙදෙනෙකු හිඳීමට පොහොනා ආසන අදීර්ඝාශන නම් වේ.

චුල්ලවග්ග පාළියෙහි

“අනුජානාමි භික්ඛවෙ යං තිණ්ණන්නං පහොති එත්තකං පච්ඡිමං දීඝාසනං”

සං:- 2 **අසමානාසනිකෙන.**

තෙවසින් වැඩි හෝ අඩු භික්ෂූහු අසමානාසනික වෙති. දෙවසක් වැඩි හෝ අඩු භික්ෂූහු සමානාසනික නම් වෙත්. දිගසුන්හි සමානාසනික අසමානාසනිකයන් හා ද අදිගසුන්හි සමානාසනිකයන් හා ද හිඳීමෙන් ඇවැත් නොවේ.

චුල්ලවග්ග පාළියෙහි

“අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා පණ්ඩකං මාතුගාමං උභතොබ්‍යඤ්ජනකං අසමානාසනිකෙහි සහ දීඝාසනෙ නිසීදිතුං= අනුජානාමි භික්ඛවෙ තිවස්සන්තරෙන සහ නිසීදිතුං”

68 **ගන්ථිමාදිං කරෙ කාරෙ ජිනවාරිත පච්චයෙ**
**පරිභුඤ්ජෙය්‍ය අබ්‍යත්තො අනිස්සාය වසෙය්‍ය වා**

ගන්ථිමාදිං, මල්දම් ආදිය; කරෙ, තමා කරන්නේ නම්; කාරෙ, මෙරමා ලවා කරවන්නේ නම් **පුප්ඵකරණ** නම් දුකුළා ද; ජිනවා

රිතපච්චයෙ, භාගෳවත්හු විසින් තහණම් කොට වදාරණ ලද සිව්පසය; පරිභුඤ්ජ්‍ය, වළඳන්නේ නම් **පච්චයපරිභොග** නම් දුකුලා ද; අබ්‍යත්තො, විනය ශික්‍ෂාවෙහි අදක්‍ෂවූයේ; අනිස්සාය, විනයෙහි දක්‍ෂයෙක් සෙවනය නොකොට; වසෙය්‍ය, වාසය කරන්නේ නම් **නිස්සයවිප්පවාස** නම් දුකුලා ද වන්නේයි.

"**ගන්ථෙන නිබද්ධනං දාමං ගන්ථිමං**"යි විනයාලංකාර ටීකා යි. ගෙතීමෙන් තිපයූ මල්දම **ගන්ථිම** නම් වේ.

**69 අනුඤ්ඤාතෙහි අඤ්ඤස්ස හෙසජ්ජං වා කරෙ වදෙ**
**කරෙ සාපත්තිකො භික්ඛු උපොසථපවාරණං**

අනුඤ්ඤාතෙහි, බුදුන් විසින් අනුදතනවුන් කෙරෙන්; අඤ්ඤස්ස, අනිකෙක්හට; හෙසජ්ජං, පිළියම්; කරෙ, කෙරේ නම්; **හෙසජ්ජකරණ** නම් දුකුලා ද; සාපත්තිකො, සවභාව සඳාශවූ ඇවැත් ඇති; භික්ඛු, භික්‍ෂු තෙමේ; උපොසථපවාරණං, පොහෝ පවුරුණු; කරෙ, කෙරේ නම් **උපොසථ පවාරණ** නම් දුකුලා ද වන්නේ යි.

සං:- 1 **අනුඤ්ඤාතෙහි**

**සත්මුතු පරම්පරාවේ** ඤාතිය පස්සහදාමිය **පණ්ඩුපලාසය** සංඝයාගේ මෙහෙවරෙහි තියුක්තයෝය කප්පියකාරකයෝය යන **මොව්හු** පිළියම් කිරීමට බුදුන් විසින් අනුදත්තෝ වෙති.

**70 වාරබන්ධාදිකෙ ඨානෙ පරිවත්තකවාටකං**
**අපිධාය විනාභොගං නියොගං වා සයෙ දිවා**

වාරබන්ධාදිකෙ, දොරබැදීම් ආදිය ඇත්තාවූ; ඨානෙ ස්ථාන යෙහි; පරිවත්තකවාටකං, පෙරළිය හැකි වාරකපාලය; අපිධාය, නොවසා; ආභොගං වා, අසවලා දොරපියන්නේය යි මෙනෙහි කිරීම ද; තියොගං වා, මෙරමාහට කරණ ලද තියොගය ද; විනා, නැතිව; දිවා, දහවල් කාලයෙහි; සයෙ, සයනය කරන්නේ වීනම් ඔහට **දිවා සෙය්‍ය** නම් දුකුලා වන්නේයි

සං:- 1 **අපිධාය**

යම් ස්ථානයක් බොහෝ දෙනාට සාධාරණ වේ ද දොරවැසූ කාමුත් වැසූ පරිදි නොපිහිටයි ද එබඳු ස්ථානයෙහි දොර නොවසා දහවල් සයනය කිරීමෙන් ඇවැත් නොවේ.

**71 ධඤ්ඤිත්ථිරූපරතනං ආවුධිත්ථිපසාධනං**
**තූරියභණ්ඩං ඵලං රුක්ඛ පුබ්බණ්ණාදිං ච ආමසෙ**

ධඤ්ඤං ච, ධාන්‍යවර්ගී ද; ඉත්ථිරූපං ච, ස්ත්‍රීරූපය ද; රතනං ච, දසවිධරුවන් ද; ආවුධං ච, අඩයටිතෝමරාදි ආවුධ ද; ඉත්ථිපසාධනං ච, ස්ත්‍රීපළඳනාවන් ද; තූරියභණ්ඩං ච, තූර්‍ය්‍ය භාණ්ඩයන් ද; ඵලං ච, වෘක්ෂඵල ද; රුක්ඛ, රුක්හී; (පිහිටි) පුබ්බණ්ණාදිං ච, ධාන්‍ය විශෙෂය ද; ආමසෙ, අල්වන්නේ වීනම් ඔහට **ආමසන** නම් දුකුලා වන්නේයි.

සං:- 1 ධඤ්ඤං

හැල්ය වීවිශෙෂය යවය තණය අමුය වරකය තිරිඟුය යන සත්වැදෑරුම් ධාන්‍යයෝ මෙහි සංග්‍රහයට යෙති.

අභිධානප්පදීපිකාවෙහි

“සාලිවීහි ච කුද්‍රූසො ගොධුමො වරකො යවො කඞ්ගූති
සත්තධඤ්ඤානි.

සං:- 2 රතනං.

මුතුය මැණික්ය වෛඩූර්‍ය්‍යය සංඛය සිලාය ප්‍රවාලය රිදීය රත්රන්ය මැසිරිගල්ය ලොහිතඞ්කය යන දස වැදෑරුම් රත්නයෝ මෙහි වාච්‍ය වෙති. එයින් කීහ.

“මුත්තාමණිවෙළුරියං සංඛං සිලාපවාලං රජතං සුවණ්ණං
මසාරගල්ලං පි ච ලොහිතඞ්කං දසප්පකාරං රතනං වදන්ති”

**72 සසිත්ථොදකතෙලෙහි ඵණහත්ථඵණෙහි වා**
**කොසමොසණ්හනෙකස්මිං භාජනෙ භුඤ්ජනෙ පි ච**

සසිත්ථොදකතෙලෙහි, ඉටිමුසු දියමුසු තෙලෙන් ද; ඵණහත්ථ ඵණෙහි වා, දන්තමය පනාවෙන් හෝ හස්තාඟුලිපනාවෙන්; කොසං, හිසකේ; ඔසණ්හනෙ වා, මටසිලුටු කිරීමෙහි **කොසොසණ්හණ** නම් දුකුලා ද; එකස්මිං භාජනෙ, එකබඳුනෙක්හී; භුඤ්ජනෙ පි ච, අනිකෙකු හා වැළදීමෙහි ද; **එකතොභොජන** නම් දුකුලා ද වන්නේයි.

**73 එකත්ථරණපාපුරණා සයෙය්‍යුං මෙකමඤ්චකෙ**
**දන්තකඨං ච ඛාදෙය්‍ය අධිකූනං පමාණතො.**

වෙ, භික්ෂූහු දෙදෙනෙක් තුමූ; **එකත්ථරණපාපුරණා**, එක් ඇතිරියක් හා එක් පෙරවිල්ලක් ඇතිව; **එකමඤ්චකෙ**, **එක**

ඇදෙහි; සයෙය්‍යං, සයනය කරන්නාහු නම්; **එකතොසයන** නම් දුකුලා ද; පමාණතො, දිගපුළුලින්; අධිකූනං, වැඩිඅඩුවූ; දන්තකට්ඨං ච, දැවටිදඬු ද; ඛාදයං, කන්නේ වීනම් **දන්තකට්ඨඛාදන** නම් දුකුලා ද වන්නේ යි.

**74 යොජෙති යොජාපෙති නච්චගීතං ච වාදිතං**
**දස්සනං සවණං තෙසං කරොන්තස්ස ච දුක්කටං**

නච්චගීතං ච නැටීම හා ගීකීම ද; වාදිතං ච, වාද්‍යකිරීම ද; යොජෙති, තමා යොදා ද; යොජාපෙති, මෙරමාලවා යොදවා ද; ඕහට **නච්චන** දුකුලා ද; තෙසං, ඒ නෘත්‍ය ගීතයන්ගේ; දස්සනං, දැකීම ද; සවණං, ඇසීම ද; කරොන්තස්ස, කරන්නාවූ මහණහට; දුක්කටං ච, **නච්චදස්සන** දුකුලා ද වන්නේයි.

**75 වීහාදිරොපිමෙ චා පි බහිපාකාරකුඩ්ඩකෙ**
**වච්චාදිඡඩ්ඩනාදිම්හි දීඝකෙසාදිධාරණෙ**

වීහාදිරොපිමෙ චා පි, වීආදිය රොපිත තන්හි ද; බහිපාකාරකුඩ්ඩකෙ, පව්රුබිත්ති සමීපයෙහි; වච්චාදිඡඩ්ඩනාදිම්හි, මලමූත්‍ර තෙමේ දැමීමෙන් **වච්ච ඡඩ්ඩන** නම් දුකුලා ද; දීඝකෙසාදි ධාරණෙ, දික්හිසකේ ආදිය දැරීමෙන් **දීඝකෙසධාරණ** නම් දුකුලා ද වන්නේයි.

සං:– 1 **වීහාදිරොපිමෙ.**

මෙහි **“ආදි”** ශබ්දයෙන් අතිකුදු බීජගාමය වපුල තැන් ගැණෙත්. මූත්‍රබරින් පිඩාවූ භික්ෂු තෙමේ සුදුසුබිම් නැතිකල්හි හෝ ගිලන් උවටැනක යෙදී සිටින කල්හි වීආදිය රොපිත තැනක නමුත් මූත්‍රකිරීමෙන් ඇවැත් නොවේ.
සමන්ත පාසාදිකාවෙහි

“අහරිතට්ඨානං ඔලොකෙන්තස්ස සහසා නික්ඛමති ගිලානො පට්ඨානෙ ඨිතො හොති වට්ටති”

“**ඡඩ්ඩනාදි**” යන්නෙහි ආදි ශබ්දයෙන් මෙරමාලවා දැම්ම වීම ගැණේ.

සං:– 2 **දීඝකෙසාදිධාරණෙ.**

මෙහි “**ආදි**” **ශබ්ද**යෙන් නාසිකාරොමය ගැණේ. **කාලවශ**යෙන් දෙමස්වූ ද ප්‍රමාණ වශයෙන් අහල් දෙකක්වූ ද **කේසය** **දැ**රීමෙන් ඇවැත් නොවේ

චුල්ලවග්ග පාළියෙහි

> "අනුජානාමි භික්ඛවෙ දුමාසිකං වා ද්වඞ්ගුලං වා කෙසෙ ධාරෙතුං"

### 76 **නඛමට්ඨකරාදිම්හි සම්බාධෙ ලොමහාරණෙ පරිකම්මකතං භූමිං අක්කමෙ සඋපාහනෙ**

නඛමට්ඨකරාදිම්හි, අත්නිය පානිය මටසිළුටු කිරීමෙහි **නඛමට්ඨකරණ** නම් දුකුළා ද; සම්බාධෙ, සම්බාධස්ථානයෙහි; ලොමහාරණෙ, ලොම් හැරීමෙහි; **සම්බාධලොමහරණ** නම් දුකුළා ද; සඋපාහනෙ, පයළු වහන් ඇත්තේ; පරිකම්මකතං, පිරියම් කරණලද්දාවූ; භූමිං, බිම; අක්කමෙ, ඇක්මීමෙහි, **පරිකම්මකතභූමිඅක්කමන** නම් දුකුළා ද වන්නේයි.

සං:– 1 **සම්බාධෙ**

බාහුමූල අඞ්ගජාතස්ථාන සම්බාධ නම් වේ. "**උපකච්ඡාදීනිපි එත්ථ සම්බාධො නාම**"යි එහෙයින් දක්වූහ. ආබාධයක් සඳහා සම්බාධස්ථානයන්හි ලොම් හැරපීනම් ඇවැත් නොවේ.

### 77 **අධොතඅල්ලපාදෙහි සංඝිකං මඤ්චපීඨකං පරිකම්මකතං භිත්තිං ආමසන්තස්ස දුක්කටං**

අධොතඅල්ලපාදෙහි, නොදෝනා හෝ තෙත් පාවලින්; සංඝිකං, සඟසතුවූ; මඤ්චපීඨකං, ඇඳපුටු ඇක්මීමෙන් **අක්කමන** දුකුළා ද; පරිකම්මකතං, පිරියම්කළාවූ; භිත්තිං, භිත්තිය; ආමසන්තස්ස, අල්වන්නාවූ මහණහට, දුක්කටං, **පරිකම්මකතභිත්තිආමසන** නම් දුකුළා වන්නේයි.

සං:– 1 **අධොතඅල්ලපාදෙහි.**

නොදෙවූ පාවලින් සඟසතු සෙනසුන් පෑගීමෙන් අධොතපාදඅක්කමණ දුකුළා ද තෙත්වූ පාවලින් සඟසතු සෙනසුන් පෑගීමෙන් අල්ලපාදඅක්කමණ දුකුළා දැයි දෙකක් සිදුවන්නාහ.

චුල්ලවග්ග පාළියෙහි

> "න භික්ඛවෙ අධොතපාදෙහි සෙනාසනං අක්කමිතබ්බං යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්ස = න භික්ඛවෙ අල්ල පාදෙහි සෙනාසනං අක්කමිතබ්බං යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්සා ති"

## සං:- 2 පරිකම්මකතං භිත්තිං.

සුණුපිරියම් කළ සේතවණ් භිත්ති හෝ සායමින් සිතුවම් කළ භිත්ති මෙහි පරිකම් භිත්ති නම් වේ. හුදෙක් එයම නොගත යුතු. දොර වාකවුළු හිඳිනා පුවරු ගල්කණු දැවකණු ආදිය ද ගත යුත්තේයි. මොව්නු යම්කිසි රෙදිකැබැල්ලකින් වසා සපශී කිරීමෙන් ඇවැත් නොවේ.

**සමන්ත පාසාදිකාවෙහි**

"සෙතභිත්ති වා චිත්තකම්මකතා වා න කෙවලං ච භිත්තිමෙව ද්වාරම්පි වාතපානම්පි අපස්සෙනඵලකම්පි පාසාණත්ථම්භම්පි රුක්ඛත්ථම්භම්පි චීවරෙන වා කෙනචි වා අප්පටිච්ඡාදෙත්වා අපස්සයිතුං න ලබ්භති යෙව".

(අ) ඉඳින් හෝනා භික්ෂු තෙමේ පසතුරුණු හැකුළුනු කල්හි තම සිරුරහ ඇඳ පුටුවල අපරිභොග ශීෂීයෙන් සපශීවීමෙන් දුකුලාවට පැමිණේ. යම්හෙයකින් රෝමකූපයකුදු සපශීවී නම් ලොම් ගණනින් ඇවැත් වේ. පරිභොගශීෂීයෙන් සපශීකරන්නා හට කියනු කිම. අත්පාතල සපශීවීමෙන් ද ඇඳ පුටු තැන්පත් කරණ කල සිරුරහ සපශීවීමෙන් ද ඇවැත් නො වන්නේය.

**සමන්ත පාසාදිකාවෙහි**

"සචෙ නිද්දායතො පි පච්චත්ථරණෙ සඞ්කුටිතෙ කොචි සරීරාවයවො මඤ්චං වා පීඨං වා ඵුසති ආපත්තියෙව ලොමෙසු පන ලොමගණනාය ආපත්තියෙව පරිභොගසීසෙන අපස්සයන්තස්සාපි එසෙව නයො හත්ථතල පාදතලෙහි පන ඵුසිතුං වා අක්කමිතුං වා වට්ටති මඤ්චපීඨං නීහරන්තස්ස කායෙ පටිහඤ්ඤති අනාපත්ති".

78 **සංඝාටියාපි පල්ලත්ථං දුප්පභුඤ්ජෙය්‍ය චීවරං**
**අකායබන්ධනො ගාමං වජෙ කත්වාන වච්චකං**

79 **නාචමෙය්‍යුදකෙ සන්තෙ සම්බොදෙය්‍ය අකප්පියෙ**
**දෙසනාරොචනාදිම්හි සභාගාපත්තියා පිච**

සංඝාටියා, ඉටු සඟලසිවුරෙන්; පල්ලත්ථෙ, ආයොගපට්ටබන්ධනය කිරීමෙන් **පල්ලත්ථ** නම් දුකුලාව ද; චීවරං, සිවුර; දුප්පරිභුඤ්ජෙය්‍ය, නපුරුසේ පරිභොගකිරීමෙන් **චීවරදුප්පරිභොග** නම් දුකුලා ද; අකායබන්ධනො, කාබහනින් නොරවූයේ; ගාමං, ගමට; වජෙ,

යන්නේ වීනම් **අභාසබන්ධගාමප්පවෙසන** නම් දුකුළං ද; වච්චකං, මලකිස; කත්වාන, කොට; උදකෙ සන්තෙ, දිය ඇති කල්හි; නාවමෙය්‍ය, නොදෙවන්නේ වීනම් **නාචමන** නම් දුකුලා ද; අකප්පියෙ, කැපනොවූ ස්ථානයෙහි; සමාදෙය්‍ය, මෙරමා යොදවන්නේ වීනම් **අකප්පියසමාදාන** නම් දුකුලා ද; සභාගාපත්තියා ච, සවභාව සදෘශවූ ඇවැත්හු ද; දෙසනාරොචනා දිමහි, දෙශනා ඇස්වීමය යනාදියෙහි **සභාගාපත්තිදෙසනා රොචන** නම් දුකුලා ද වන්නේ යි.

සං:- 1 **සංඝාටියා**

සියලුම සිවුරු සංඝටිත හෙයින් සංඝාටි යි කියනු ලැබේ.

සමන්ත පාසාදිකාවෙහි

"සබ්බානි පි චීවරානි සංඝටිතත්තා සංඝාටීති වුච්චති"

සං:- 2 **දුප්පභුඤ්ජයං.**

"**දුප්පරිභුඤ්ජයං**"යි කියයුතු තන්හි ඡන්දස් පිණිස "**දුප්ප භුඤ්ජයං**"යි වියූ. ඇතිරියක් නැතිව බිම හිඳීම ද බොරළු කටු ඇති තන්හි හිඳීම ද නපුරුකොට සිවුරු වැළඳීම නම් වේ.

මූලසික්ඛා ටීකාවෙහි

"දුප්පරිභුඤ්ජනං නාම භූමියං වා කණ්ටකාදිසු වා නිසීදනං"

සං:- 3 **දෙසනාරොචනාදිමහි**

"**අහං භණෙන සම්බහුලා නානාවත්ථුකා ආපත්තියො ආපජ්ජිං**" යනාදි වශයෙන් කිණුම දෙශනා නම්. මෙසේ නො කියා මම අසවල් ඇවතට පැමිණියෙමි යි ඒ ඒ අවස්ථාවෙහි කීම ආරොචනා නම්.

80 **වසෙ වස්සං විසංවාදෙ සුඛවිනෙත පටිස්සවං**
**වස්සං වසිත්වා ගමනෙ අනනුඤ්ඤාතකිච්චතො**

වස්සං, වස්විසීම; (න) වසෙ, නො වසන්නේ වීනම් **අවසන** නම් දුකුලා ද; පටිස්සවං, දෙනලද ප්‍රතිඥාව; සුඛවිනෙන, සුඛවිත්තයෙන්; විසංවාදෙ, වරදවා කිරීමෙහි **පටිස්සවවිසංවාදන** නම් දුකුලා ද; වස්සං වසිත්වා, වස්විසීම කොට; අනනුඤ්ඤාත

කිච්චතො, බුදුන් විසින් අනුනොදත් කටයුතු සඳහා සත්තාහ කරණයෙන්; ගමනෙ, අන්දිගකට යාමෙහි **වස්සච්ඡෙද** නම් දුකුළා ද වන්නේ යි.

සං:- 1 **වසෙ වස්සං**

**"න වසෙ වස්සං"**යි කියයුතු තන්හි ඡන්දස් පිණිස **"වසෙ වස්සං"**යි වියූ. මෙහි **"න"** කාරය ලුප්ත ප්‍රතිෂෙධයි. අනතුරු නිසා පෙරවස් එළඹිය නොහැකිවූ භික්ෂු තෙමේ ද පසුවස් දිනට පළමුව වියූ පෙරවස් සුත් භික්ෂුතෙමේ ද පසුවස් එළඹිය යුත්තේය.

සික්ඛාපදවලඤ්ජ නයෙහි

"ආසාළ්හිපුණ්ණමාය අනන්තරපාටිපදදිවසෙ වස්සං අනුප ගතෙනාපි ජිත්තාවසෙසනාපි තතො අපරාය පුණ්ණමාය අනන්තරපාටිපදදිවසෙ වස්සං උපගන්තබ්බං".

සං:- 2 **පටිස්සවං**

ආයුෂ්මත් නුඹවහන්සේ අපගේ විහාරයෙහි වස්වසන සේක්වා. මේ වස් තුන්මස මුළුල්ලෙහි අපගේ සිව්පසය පිළිගන්නා සේක්වා යි දායකයින්ගේ ආරාධනා වචනද අපි මේ විහාරයෙහි වස්වසමහ. මේ ග්‍රන්ථය විශෙෂ වශයෙන් උගණ්හුමහ යි භික්ෂුහු ඔවුනොවුන් කතිකාකරගත් වචනද පටිස්සව හෙවත් ප්‍රතිඥ නම් වේ. එබඳු ප්‍රතිඥ කඩකිරීම පටිස්සව විසංවාද නම් වේ

(අ) මම සිවුරු හැර යන්නෙමි මම අහර නොවළඳන්නෙමි යනාදි ප්‍රතිඥ කඩකිරීමෙන් ඇවත් නොවේ.

සික්ඛාපදවලඤ්ජ නයෙහි

"විබ්භමිස්සාමි ආහාරං නගණ්හිස්සාමි ඉච්චාදිං පටිච්ච විසංවාදෙ නත්ථි දෙසො"යි.

සං:- 3 **අනනුඤ්ඤාතකිච්චතො**

පස්සහදාමියන්ගේ හා මව්පියන්ගේ කටයුතු ගැණද ඔවුන්ට උවටැන් කරන්නවුන්ගේ කටයුතු ගැණද දන් දෙමි බණ අසමි නුඹ වහන්සේ දක්නෙමි යි දායකයින්ගේ ආරාධනා ගැණද සත්තාහ

කාරණය කොට ගියාවූ භික්ෂුතෙමේ බුදුන් අනුදත් කෘත්‍යයෙන් ගියේ නම් වේ. මෙයින් පිටත් කටයුතු සඳහා ගියේ දුකුළාවට පැමිණේ. විස්තර දතුවන් විසින් සමන්ත පාසාදිකාව බැලිය යුතු.

**81 විනාපදං තරුස්සුද්ධං පොරිසම්භාභිරූහණෙ**
**අපරිස්සාවනොද්ධානං වජෙ තං යාචතො නදෙ**

ආපදං විනා, අනතුරක් නැතිව; පොරිසම්භා, පුරුෂප්‍රමාණයෙන්; උද්ධං, මතු; තරුස්ස, රුකකට; අභිරූහණෙ, නැගීම හෙතුකොට ගෙණ; **රුක්ඛ අභිරූහණ** නම් දුකුළා ද; අපරිස්සාවනො, පෙරහණක් නැත්තේ; අද්ධානං, දිග්මගට; වජෙ, පිළිපන්නේ වීනම්; **අද්ධානමග්ගපටිපන්න** නම් දුකුළා ද; තං, පෙරහන්කඩ; යාචතො, ඉල්වන්නාහට; නදෙ, නොදෙන්නේ වීනම් **පරිස්සාවන අදාන** නම් දුකුළා ද වන්නේයි.

සං:- 1 **ආපදං**

ව්‍යාලමෘගයන් නිසාවූ බිය ආපද නම්. එබඳු බියක් ඇතිවිට පුරුෂප්‍රමාණය ඉක්මවා රුක්වලට නැගීමෙන් ඇවැත් නොවේ.

සං:- 2 **අද්ධානං**

**"අද්ධානන්ති පනෙත්ථ ඡසීමගතෙන අද්ධයොජනං අධිප්පෙතං"**යි ටීකාවෙහි ආහෙයින් යටත් පිරිසයින් අඩයොදුන් මග **අද්ධාන** යී ගතයුතු.

**82 අත්තනො ඝාතනෙ ඉත්ථි රූපාදිං කාරයෙය්‍ය වා**
**හිත්වා මාලාදිකං චිත්තං ජාතකාදිං සයං කරෙ**

අත්තනො, තමාගේ ශරීරය; ඝාතනෙ, තමා මැරීමෙහි **අත්තඝාතන** නම් දුකුළා ද; ඉත්ථිරූපාදිං, ස්ත්‍රී රූපාදිය; (කරෙය්‍ය වා, තමා කරන්නේ හෝ) කාරයෙය්‍ය වා, මෙරමාලවා කරවන්නේ වීනම් හෝ **ඉත්ථිරූපකාරණ** නම් දුකුළා ද; චිත්තං, විසිතුරුවූ; මාලාදිකං, මල් ආදිය; හිත්වා, තබා; ජාතකාදිං, අසදෘශජාතකාදී රූප; සයං කරෙ, තෙමේ කරන්නේ වීනම් **චිත්තකම්ම** නම් දුකුළා ද වන්නේයි.

සං:- 1 **අත්තනො ඝාතනෙ**

ආහාරූපච්ඡේදාදී යම් මාර්ගයකින් සිය දිවි නසා ගැණීම අත්තඝාතන නම් වේ.

### සං:– 2 ඉත්ථිරූපාදිං කාරෙය්‍ය වා

මෙහි **"ආදි"** ශබ්දයෙන් පුරුෂ රූප ද ගැණේ. හුදෙක් ස්ත්‍රී පුරුෂ රූපම නොගත යුතු. තිරිසන් රූද ගතයුතු. අන්තිම වශයෙන් බියසුළු ගැඩවිල් රූවක් කරවයි කියන්ට ද නොවටී.

**සමන්ත පාසාදිකාවෙහි**

"න කෙවලං ඉත්ථිපුරිසරූපමෙව තිරච්ඡාන රූපම්පි අන්තමසො ගණ්ඩුප්පාදරූපම්පි".

**"කාරෙය්‍ය වා"** යන තන්හි වා ශබ්දය ක්‍රියාසමුච්චයාර්ථ හෙයින් **"කරෙය්‍ය"**යි සුඩ ක්‍රියා වාච්‍ය කෙරේ.

83 **භුඤ්ජන්තමුඨපෙන්තස්ස සාලාදීසු නිසීදතො**
**වුඩ්ඪානං පන ඔකාසං අදත්වා වාපි දුක්කටං**

සාලාදීසු, බොජුන්හල් ආදියෙහි; භුඤ්ජන්තං, වළඳන්නහු; වුඨපෙන්තස්ස, හුනස්නෙන් නැගිටුවන්නාහට **භුඤ්ජන්තවුඨාපන** නම් දුකුළා ද; වුඩ්ඪානං, වැඩිමහළුතැන්හට; ඔකාසං, හිඳිනා අවකාශය; අදත්වා, නොදී; නිසීදතො වා අපි, හිඳිනා භික්ෂුහට ද; දුක්කටං, **ඔකාසඅදාන** නම් දුකුළා වන්නේයි

84 **යානාදිමභිරූහෙය්‍ය කල්ලකො රතනත්තයං**
**ආරබ්භ දවෙ වදෙය්‍යඤ්ඤ පරිසායොපලාලනෙ**

කල්ලකො, නිරොගිවූයේ; යානාදිං, යානාදියට; අභිරූහෙය්‍ය, නගීනම් **යානාභිරූහණ** නම් දුකුළා ද; රතනත්තයං, රත්නත්‍රය; ආරබ්භ, අරමුණුකොට; දවෙ, ක්‍රීඩාවචන; වදෙ, කියන්නේ නම් **දවකරණ** නම් දුකුළා ද; අඤ්ඤපරිසාය, අනික් පිරිසක්හට; උපලාලනෙ, රැවටීම් හෙතුකොට ගෙණ **පරිසොපලාලන** නම් දුකුළා ද වන්නේයි.

### සං:- 1 කල්ලකො

ගමන් කළහැකි රොගීහු මෙහි රොගීහු නම් නො වෙති. යානාවෙන් තොරව යානොහැක්කෝ මෙහි රොගි නම් වේ.

**මූලුසික ටීකාවෙහි**

"යො පන නසක්කොති විනා යානෙන ගන්තුං එවරූපො සො අකල්ලකො නාම".

### සං:- 2 රතනත්තයං ආරබ්භ

කවරෙක් බුද්ධ ද සිලා බුද්ධ ද කාෂ්ට බුද්ධ දැයි කිණීමෙන් බුදුන්ට පරිහාස කෙළේ නම් වෙයි. භාග්‍යවත් තෙමේ ධර්මයක් දෙසූයේය. හේගවධර්මයක් ද සූනබ ධර්මයක් දැයි කිණීමෙන් ධර්මයට පරිහාස කෙළේ නම් වෙයි. සංඝරත්නයක් විද්‍යමානය හේ ගොසංඝ ද අජසංඝ දැයි කීමෙන් අරිසඟනට පරිහාස කෙළේ නම් වෙයි. මෙසේ රත්නත්‍රය උදෙසා ගර්හා කිරීමෙන් දුකුළා වන්නේය.

### සං:- 3 උපලාලනෙ

තොපට මාගේ පාත්‍රය දෙන්නෙමි. සිවුරු දෙන්නෙමි තොපගේ ආචාර්‍ය්‍ය උපාධ්‍යයෝ දුශ්ශීලයහ. මා සමීපයෙහි වසව යනාදි ලොල් වචන බැණ තමා වෙත නතුකර ගැණීම උපලාලන නම් වේ.

(අ) යමෙක් තෙමේම තම උපාධ්‍යාචාර්‍ය්‍යවරුන්ගේ අගුණ දැන උපාධ්‍යාචාර්‍ය්‍යත්වය ඉල්වා නම් දෙන්ට වටනේයි.

සමන්ත පාසාදිකාවෙහි

“සචෙ සො සයමෙව ජානිත්වා උපජ්ඣායං වා නිස්සයං වා යාචති දාතුං වට්ටති”.

85 **කායාදිං විවරිත්වාන භික්ඛුණීනං නිදස්සයෙ**
**වාචෙ ලොකායතං විජ්ජං පලිතං ගණ්හාපෙය්‍ය වා**

කායාදිං, සිරුරු ආදිය; විවරිත්වාන, විවෘතකොට; භික්ඛුණීනං, මෙහෙණීන්ට; නිදස්සයෙ, දක්වන්නේ වීනම් **කායවිවරණ** නම් දුකුළාද; ලොකායතං විජ්ජං, තිරශ්චීන විද්‍යා හෝ නීතික ශිල්ප; වාචෙ, උගණිවන්නේ වීනම් **ලොකායතුග්ගහණ** නම් දුකුළා ද; පලිතං, අකාලයෙහි පැසුනු හිසකේ; (ගණ්හෙය්‍ය, තෙමේ උගුල්ලන්නේ හෝ) ගණ්හාපෙය්‍ය වා, මෙරමාලවා උගුල්ලවන්නේ වීනම් **පලිත ගාහ ගහණ** නම් දුකුළා වන්නේයි.

“**ගණ්හාපෙය්‍ය වා**” යන තන්හි **වා** ශබ්දය ක්‍රියා සමුච්චයාර්ථ හෙයින් “**ගණ්හෙය්‍ය**”යි සුද්ධ ක්‍රියා වාච්‍ය කෙරේ.

### සං:- 1 ලොකායතං විජ්ජං

ලොකයෙහි පුණ්‍ය කර්මයෙන් සිත මුළා පංචකාමයෙහි සිත යොදවන යම් ශාස්ත්‍රයක් වේ නම් ඒ ලෝකායත ශාස්ත්‍රය වේ.

86 යත්‍ථ කත්‍ථචි පෙලාසං භුඤ්ජන්‍තො පත්‍තහත්‍ථකො
වාතපානකවාටං වා පණාමෙ සොදකම්පි ච

87 උණ්හස්‍ස පටිසාමෙය්‍ය අතිඋණ්හස්‍ස වොදකං
ඨපෙය්‍ය භූමියං පත්‍තං අඞ්කෙ වා මඤ්චපීඨකෙ

පත්‍තං, පාත්‍රය; යත්‍ථකත්‍ථචි, යම්කිසි; පෙලාසං, පැසක් මතු යෙහි තබා; භුඤ්ජන්‍තො, වළඳන්නාහට **පෙලාභුඤ්ජන** නම් දුකුලා වන්නේය. පත්‍තහත්‍ථකො, පාත්‍රය ගත් අත් ඇත්තේ; වාතපානකවාටං වා, වාකච්ළුදොරබා හෝ; පණාමෙ, විවෘත කරන්නේ ද; සොදකම්පි ච, ජලසහිතවූ පාත්‍රය; උණ්හස්‍ස, උණුසුම් කරන්නේ ද; පටිසාමෙය්‍ය, තැන්පත් කරන්නේ ද; වොදකම්පි ච, පහවූ දියඇති පාත්‍රය ද; අතිඋණ්හස්‍ස, ඉරඅව්වේ තබා ඉතා උණුසුම් කරන්නේ ද; භූමියං වා, බිම හෝ; අඞ්කෙ වා, ඇකයෙහි හෝ; මඤ්චපීඨකෙ වා, ඇඳ පුටුවෙහි හෝ; ඨපෙය්‍ය, තබන්නේ ද ඕහට **පත්‍තඨපන** නම් දුකුලාවෝ වන්නාහුයි.

සං:– 1 පත්‍තහත්‍ථකො

පාත්‍රය ගත් අත් ඇත්තේ පත්‍තහත්‍ථක නම්. යම්කිසි ශරීරාව යවයක පාත්‍රය ඇතිකල්හි අතින් හෝ පයින් හෝ හිසින් හෝ යම්කිසි ශරීරාවයවයකින් දොරබා අරින්ට හෝ පියන්ට අගුල් ඔසවන්ට හෝ හෙලන්ට කෙස්සෙන් දොර අරින්ට හෝ පියන්ට නොවටී. එසේ කළාහට ඇවැත් වේ. අංසකූටයෙහි ම පාත්‍රය එල්වා ගෙණ සුවසේ අරින්ට හෝ පියන්ට වටනේය.

සමන්‍තපාසාදිකාවෙහි

"යත්‍ථ කත්‍ථචි සරීරාවයවෙ පත්‍තසම්ං සති හත්‍ථෙන වා පාදෙන වා සීසෙන වා යෙන කෙනචි සරීරාවයවෙන කවාටං පණාමෙතුං ඝටිකං වා උක්ඛිපිතුං සූචිං වා කුඤ්චිකාය අවාපුරිතුං න ලභති අංසකූටෙ පන පත්‍තං ලග්ගෙත්‍වා යථා සුඛං අවාපුරිතුං ලභති".

සං – 2 භූමියං

රළු එරුෂ !බිම් භූමි නම්. යම් බිමක පාත්‍රය තැබීමෙන් වණ්ණය නොනැසේද එබඳු බිම්වල පාත්‍රය යටිකුරුව තැබීමෙන් ඇවැත් නොවේ.

සං:– 3 මඤ්චපීඨකෙ

ඉදින් ඇඳ හෝ පුටු හෝ ඔසවා චීවරවංසාදියෙහි අටළු පියසි සමග එකට බැඳ තබනලද්දේද එබඳු ඇඳ පුටුවල පාත්‍රය තැබීමෙන් ඇවැත් නොවේ.

88 **මීඩනෙන පරිභණ්ඩනෙන පාදෙ ඡතෙන ඨපෙෂ්‍ය වා**
**චලකාදිං ඨපෙ පතෙන පතෙන වා හන්‍ඩොවනෙ**

මීඩනෙන, පිල්බිත්ති කෙලවරක හෝ; පරිභණ්ඩනෙන, බිත්ති පාදමක හෝ; පාදෙවා, පාපිටෙහි හෝ; ඡතෙනවා, සැතෙහි හෝ; ඨපෙයා, පාත්‍රය තබන්නේ නම් **පත්තඨපන** නම් දුකුලා වන්නාහ. පතෙත, පාත්‍රයතුල; චලකාදිං, සපා කෑ ඇට කටු ආදිය; ඨපෙ, තබන්නේ නම් **චලක** නම් දුකුලාද; පතෙත, පාත්‍රය තුල; හන්‍ඩොවනෙ, අත සේදීමෙහි **හන්‍ඩොවන** නම් දුකුලා වන්නේයි.

**"චලකාදිං"** යන්නෙහි **"ආදි"** ශබ්දයෙන් වෙනත් කොලපතුරු දඬු ආදී සැපූ දෙය ගැණෙත්.

යං:- 1 **මීඩනෙන**

පිල් කෙලවර මීඩනත නම්. ඉදින් පාත්‍රය පෙරලී බිම නොවැටී එහිම පිහිටයිද එබඳු පලල් බිත්ති කොන්වල පාත්‍රය තැබීමෙන් ඇවැත් නොවේ.

සමන්ත පාසාදිකාවෙහි

"සචෙ පන පරිවටෙටණා තත්‍රෙව පතිඨාපෙති එවරූපාය විත්‍ථිණ්ණාය මීඩියා ඨපෙතුං වට්ටති".

සං:- 2 **පරිභණ්ඩනෙන**

ගෘහ බිත්ති බොහෝ කල් පැවැත්මට පිටතින් බඳින බිත්ති පාදම හෙවත් තුණී බිත්තිය පරිභණ්ඩනත නම් වේ. එබඳු බිත්ති පාදම්වල ආධාරකයක් මතුයෙහි පාත්‍රය තැබීමෙන් ඇවැත් නොවේ.

පාලිමුත්තාකවිනය විනිච්ඡයසංගහ ටීකාවෙහි

"පරිභණ්ඩනෙනති එත්‍ථ පන භණ්ඩං නාම ගෙහස්ස බහිකුඩ්ඩ පාදස්ස පිරහාවත්‍ථං කතා තනුකම්ඩිකා වුච්චති= තනුකම්ඩිකායාති බුද්දකම්ඩිකාය මීඩනෙතපි අධාරකෙ ඨපෙතුං වට්ටති".

89 **පතෙතන නීහරනතස්ස උච්ඡිඨමුදකම්පි ච**
**අකප්පියම්පි පත්තං වා පරිභුඤ්ජෙය්‍ය දුක්කටං**

උච්ඡිඨමුදකම්පි ච, අත්සේදූ ඉඳුල් ජලයද; පතෙතන, පාත්‍රයෙන්; නීහරනතස්ස, පිටත තික්මවන්නාහට; දුක්කටං, **උච්ඡිට්ඨ උදකනීහරණ** නම් දුකුලා ද; අකප්පියං, කැපනොවූ; පත්තං වා, පාත්‍රයක් හෝ; පරිභුඤ්ජෙය්‍ය, පරිභොගකරන්නේ වීනම්, **අකප්පිය පත්ත පරිභොග** නම් දුකුලා ද වන්නේයි.

පාත්‍රය පිළිබඳ කප්පියාකප්පියතා 46 පිටේ 2 වෙති සංලක්ෂ්‍ය යෙන් දතහැකිවේ

90 **වදෙ ජීවාති බිපිතෙ භසික්ඛති අනාදරො**
**පරිමණ්ඩලකාදිම්හි සෙඛියෙ දුක්කටං සියා**

බිපිතෙ, කිබිසිකල්හි; ජීවාති, බොහෝ කල් ජීවත් වෙව යන වචනය; වදෙ, කියන්නේ වීනම්; **ජීවාතිවදන** නම් දුකුලා ද; පරිමණ්ඩලකාදිම්හි, පිරිමඬුලුලගැලපෙනසේ හැදීම් ආදීවූ; සෙඛියෙ, ශෛක්‍ෂවත්හී; **අනාදරො**, ආදර රහිතවූයේ; න සික්ඛති, නොහික්මේ නම්; **දුක්කටං**, **සෙඛියඅනාදර** නම් දුකුලා; සියා, වන්නේයි.

91 **යො භණ්ඩගාරෙ පයුතොව භණ්ඩකං**
**මාතුන පාචිත්තියමස්ස ගොපයෙ**
**දවාය හීනෙනපි ජාතිආදිනා**
**වදෙය්‍ය දුබ්භාසිතමුත්තමමපි යො**

යො, යම් භික්ෂුවක් තෙමේ; භණ්ඩගාරෙ, භාණ්ඩාගාරයෙහි; **පයුතොව**, යෙදුනේම; මාතුනං, මව්පියන්ගේ; භණ්ඩකං, භාණ්ඩයක් පවා; ගොපයෙ, ආරක්‍ෂාකරන්නේ වීනම්; අස්ස, ඒ මහණ හට; **පාචිත්තියං**, **භණ්ඩපටිසාමන** නම් සුඩ පචිති ඇවත වන්නේය. උත්තමං අපි, උත්තමයෙකු හා හීනයෙකු; හීනෙන අපි, හීනවූ හෝ උතුම්වූ; ජාතිආදිනා, ජාත්‍යාදියකින්; දවාය, ක්‍රීඩා පිණිස; වදෙය්‍ය, කියන්නේ වීනම්; දුබ්භාසිතං, දුර්භාෂිත ඇවැත් වන්නේයි

මේ ගාථා තොමෝ චතාඟි ඉන්ද්‍රවංස වංසඪ යන වෘත්තය මිශ්‍ර කොට ගොතනලද උපජාති ගාථාවකි. **"භණ්ඩාගාරෙ"**යි යෙදුවමනා තන්හි ඡන්දානුරක්‍ෂණය පිණිස **"භණ්ඩගාරෙ"**යි යෙදූහ. **"මාතූනං"**යි යෙදුවමනා තන්හි ඡන්දානුරක්‍ෂණය පිණිස නිග්ගහීතය ලොප් කොට **"මාතුන"**යි යෙදූහ. **"ජාතිආදිනා"** යන තන්හි ආදි ශබ්දයෙන් නාමය ගොත්‍රය කටයුත්තය ශිල්පය රොගය වර්ණය කෙලශය ආපත්තිය යන මේ ආක්‍රොෂයෝගැණෙති.

මෙහි දක්වූ **භණ්ඩපටිසාමන පාචිත්තිය** පාචිත්තිය නිර්දේශයෙහි නොදක්වා දුස්සෘත ප්‍රකාශකරණ ස්ථානයෙහි කුමක් හෙයින් දක්විද යත්? බුදුන් විසින් පණවා වදාළ දෙඅනූවක් පචිතීන්ගෙන් වෙන්වූ බුඬාදෙව දත් සංගායනාචාරීන් විසින් පණවන ලද්දක් බැවින් දුස්සෘත ප්‍රකාශකළ තන්හි දක්වන ලදූයි සැලකිය යුතු වන්නේයි.

"**දුරාභට්ඨං භාසිතං දුබ්භාසිතං**"යි නිර්වචනයි. නපුරුකොට කියනලද වචනය දුර්භාෂිත නම් වේ.

පරිවාර පාළියෙහි

"දුබ්භාසිතන්ති යං වුත්තං තං සුණොහි යථා තථං
දුබ්භාසිතං දුරාභට්ඨං සංකිලිට්ඨං ච යං පදං
යඤ්ච විඤ්ඤූ ගරහන්ති තෙනෙතං **ඉති වුච්චති**".

මූලසික්ඛා වණ්ණනාවෙහි
**ප්‍රකීර්ණක නිර්දේශය නිමි.**

---

92 **උපජ්ඣාචෙරවත්තං ච ගමිකාගන්තුකම්පි ච**
**සෙනාසනාදිවත්තං ච කාතබ්බං පියසීලිනා**

උපජ්ඣාචෙරවත්තං ච, උපාධ්‍යවත් හා ආචාර්‍ය්‍යවත් ද; ගමිකං, ගමිකවත් ද; ආගන්තුකම්පි ච, ආගන්තුකවත් ද; සෙනාසනාදිවත්තං ච, සෙනසුන් ආදියෙහි වත්ද; පියසීලිනා, සිල් කැමැත්තහු විසින්; කාතබ්බං, කටයුතුවෙයි.

සං - 1 **උපජ්ඣාචෙරවත්තං ච ගමිකාගන්තුකම්පි ච.**

උපාධ්‍යවරුන්ට අතවැසියන් විසින් කටයුතු වත් උපාධ්‍ය වත් නම්. ආචාර්‍ය්‍යවරුන්ට අතවැසියන් විසින් කටයුතු වත් ආචාර්‍ය්‍ය වත් නම් අන්දිගකට යනු කැමති විහාරික භික්ෂූන් විසින් කටයුතුවත් ගමිකවත් නම්. විහරස්ථානය කරා පැමිණෙන අමුතු භික්ෂූන් විසින් කටයුතුවත් ආගන්තුකවත් නම්.

"**සෙනාසනාදි**" යන්නෙහි ආදි ශබ්දයෙන් භත්තාග්‍රවත් ජන්තාඝරවත් වච්චකුටිවත් අන්තෙවාසිකවත් සද්ධිවිහාරිකවත් යන මොවුහු ගැණෙති. මෙ කීතන්හි වත් බිඳින්නහුට දුකුලා වේ. විස්තර දතුවන් විසින් වත්තක්ඛන්ධකය බැලිය යුතු.

93 **හත්ථපාසෙ ඨිතො කිඤ්චි ගහිතබ්බං දදෙ තිධා**
**ගහෙතුකාමො ගණ්හෙය්‍ය ද්විධායං සම්පටිග්ගහො**

හත්ථපාසෙ, අත්පසතුල; ඨිතො, සිටියේ; කිඤ්චිගහිතබ්බං, කිසි ගතයුතු වස්තුවක්; තිධා, තුන්ප්‍රකාරයකින්; දදෙ, දෙන්නේ වීනම්; ගහෙතුකාමො, ගණු කැමති පුද්ගල තෙමේ; ද්විධා, දෙයාකාරයකින්; ගණ්හෙය්‍ය, ගන්නේය; අයං, මෙසේ ද්විප්‍රකාරයකින් ගැණීම; සම්පටිග්ගහො, මනා පිළිගැණීම නම් වෙයි.

### සං:- 1 **හත්ථපාසෙ ඨිතො**

දෙරියන් හමාරක් පමණ ප්‍රදේශය අත්පස නම්. හිඳිනහුගේ ආසන පශ්චිමාන්තය පටන් ද සිටියහුගේ විළුඹ අන්තය පටන් ද වැදහොත්තහුගේ වැදහොත් පාර්ශ්වයෙහි ඈත කෙලවර පටන් ද හිඳිනාවූ ද සිටිනාවූ ද හෝනාවූ ද දායකයාගේ දික්කල අත තබා යම් අවයවයක් ඉතා ආසන්න ද ඒ අවයවයෙහි මෑතභාගය පටන් දෙරියන් සමාරක්වූ අත්පස පිරිසිඳිය යුත්තේය.

සමන්ත පාසාදිකාවෙහි

> "හත්ථපාසෙ ඨිතො"ති එත්ථ පන සචෙ භික්ඛු නිසින්නො
> හොති ආසනස්ස පච්ඡිමන්තතො පට්ඨාය සචෙ ඨිතො
> පණ්හිඅන්තතො පට්ඨාය සචෙ නිපන්නො යෙන පස්සෙන
> නිපන්නො තස්ස පාරිමන්තතො පට්ඨාය දායකස්ස නිසින්නස්ස
> වා ඨිතස්ස වා නිපන්නස්ස වා ඨපෙත්වා පසාරිතහත්ථං යං
> ආසන්නතරං අඞ්ගං තස්ස ඔරිමන්තෙන පරිච්ඡින්දිත්වා
> අඩ්ඪතෙය්‍ය හත්ථො හත්ථපාසො ති වෙදිතබ්බො"

### සං:- 2 **නිධා**

ශරීරාඞ්ගයෙන් දීමය ශරීරය හා සම්බන්ධවූ හැඳි ආදියෙන් දීමය මැටිකිතති දූවකිතති ආදිය ඉක්මවා නිස්සග්ගිය ප්‍රයෝගයෙන් දීමය යනු ත්‍රිවිධාකාර දීම් වෙත්.

### සං:- 3 **ඞිධා**

ශරීරාඞ්ගයෙන් පිළිගැණීමය ශරීරය හා සම්බන්ධවූ පාත්‍රාදි භාජනවලින් පිළිගැණීමය යන මේ දෙයාකාර පිළිගැණීමයි.

94 **සඞ්ඝාටිමුත්තරාසඞ්ගං තථා අන්තරවාසකං**
**එතං ඉමං අධිට්ඨාමි තථා පච්චුද්ධරාමි ති**

සඞ්ඝාටිං, සඟලසිව්ර ද; උත්තරාසඞ්ගං, උත්තරාසඞ්ගය ද; තථා, එයින් අන්‍යවූ; අන්තරවාසකං, අඳනය ද; ඉමං, මේ සඟල සිව්ර; අධිට්ඨාමි, ඉටමි; එතං, තෙල සඟලසිව්ර; අධිට්ඨාමි ඉති, ඉටමි යි; (අධිට්ඨෙ, ඉටන්නේය;) තථා, එසේම; ඉමං, මේ සඟල සිව්ර; පච්චුද්ධරාමි, පසුදුරමි; එතං, තෙල සඟලසිව්ර, පච්චුද්ධරාමි ඉති, පසුදුරමි යි; (පච්චුද්ධරෙ, පසුදුරන්නේය.)

අත්පසතුල තුබූ සඟලසිව්ර ඉටන්නාවූ භික්ෂුව විසින් එම සිව්ර ,අතින් ආභොගකරමින් "**ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි**"යි ද

අත්පසින් බැහර අභිමුඛයෙහි තුබූ සඟලසිවුර සලකා **"එතං සඞ්ඝාටිං අධිට්ඨාමි"**යි ද තෙවර බැගින් බැණ ඉටිය යුත්තේය. සෙසු චීවර ද මේ නයමැයි.

අත්පසතුල තුබූ සඟලසිවුර පසුදුරන්නාවූ භික්ෂුව විසින් **"ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි"**යි ද අත්පසින් පිට තිබූ සඟලසිවුර **"එතං සඞ්ඝාටිං පච්චුද්ධරාමි"**යි ද තෙවර බැගින් බැණ පසුදිරිය යුතු. සෙසු සිවුරුද මේ නයමැයි.

### 95 ඉමං ඉමානි එතානි එතම්පි චීවරන්ති වා පරික්ඛාරචෝළානීති තථා පච්චුද්ධරාමි ති

අපි, යලිදු; ඉමං චීවරං, මේ සිවුර; පරික්ඛාරචෝළං ඉති, පරිෂ්කාරචොළයයි; අධිට්ඨාමි, ඉටමි; ඉමානි චීවරානි, මේ සිවුරු; පරික්ඛාරචෝළානි ඉති, පරිෂ්කාරචොළයන යි; අධිට්ඨාමි, ඉටමි; ඉති වා, මෙසේ හෝ; එතං චීවරං, තෙල සිවුර; පරික්ඛාරචෝළං ඉති, පරිෂ්කාරචොළය යි; අධිට්ඨාමි, ඉටමි; එතානි චීවරානි, තෙල සිවුරු; පරික්ඛාරචෝළානි ඉති, පරිෂ්කාරචොළයන යි; අධිට්ඨාමි, ඉටමි; ඉති වා, මෙසේ හෝ; (අධිට්ඨේ, ඉටන්නේය.) තථා එපරිද්දෙන්ම; පච්චුද්ධරාමි ඉති, පසුදුරමි යි; (පච්චුද්ධරේ, පසුදුරන්නේය.)

අත්පසෙහිවූ සිවුර පරිෂ්කාරචොළ වශයෙන් ඉටන්නහු විසින් **"ඉමං චීවරං පරික්ඛාරචෝළන්ති අධිට්ඨාමි"**යි ද බොහෝ සිවුරු වෙත් නම් **"ඉමානි චීවරානි පරික්ඛාරචෝළානීති අධිට්ඨාමි"**යි ද අත්පසින් බැහැර අභිමුඛයෙහිවූ සිවුර ඉටන්නහු විසින් **"එතං චීවරං පරික්ඛාරචෝළන්ති අධිට්ඨාමි"**යි ද සිවුරු බොහෝ නම් **"එතානි චීවරානි පරික්ඛාරචෝළානීති අධිට්ඨාමි"**යි ද තෙවර බැගින් බැණ ඉටිය යුත්තේය.

අත්පසෙහිවූ පරිෂ්කාරචොළ චීවරය පසුදුරන්නහු විසින් **"ඉමං චීවරං පරික්ඛාරචෝළන්ති පච්චුද්ධරාමි"**යි ද සිවුරු එකකට වැඩි නම් **"ඉමානි චීවරානි පරික්ඛාරචෝළානීති පච්චුද්ධරාමි"**යි ද අත්පසින් තොරවූ සිවුර **"එතං චීවරං පරික්ඛාරචෝළන්ති පච්චුද්ධරාමි"**යි ද සිවුරු එකකට වැඩි නම් **"එතානි චීවරානි පරික්ඛාරචෝළානීති පච්චුද්ධරාමි"**යි ද තෙවර බැගින් බැණ පසුදිරිය යුත්තේය.

### 96 එතං ඉමං අධිට්ඨාමි පත්තං පච්චුද්ධරාමි ති එවං පච්චුද්ධරෙධිට්ඨේ චීවරාදිං යථා විධි

ඉමං පත්තං, මේ පාත්‍රය; අධිට්ඨාමි, ඉටමි; එතං පත්තං, තෙල පාත්‍රය; අධිට්ඨාමි, ඉටමි; ඉමං පත්තං, මේ පාත්‍රය; පච්චුද්ධරාමි,

පසුදුරම්; එතං පත්තං, තෙල පාත්‍රය; පච්චුද්ධරාමි ඉති, පසුදුරම් යි; එවං, මෙසේ; චීවරාදිං, සිවුරු ආදිය; යථා විධිං, කියනලද ප්‍රකාරයෙන්; අධිට්ඨෙ, ඉටන්නේය; පච්චුද්ධරෙ, පසුදුරන්නේයි.

පාත්‍රා එකකට වඩා නොඉටිය හැකි හෙයින් මෙහි "එතං ඉමං"යි එකවචනයම යෙදූහ. අත්පසෙහිවූ පාත්‍රය "ඉමං පත්තං අධිට්ඨාමි"යි ද අත්පසින් පිටත්හිවූ පාත්‍රය "එතං පත්තං අධිට්ඨාමි"යි ද තුන්යලක් බැණ ඉටිය යුත්තේයි. පසුදිරීමෙහි ද "අධිට්ඨාමි" යනු "පච්චුද්ධරාමි"යි යොදා වාක්‍ය ගැලපිය යුත්තේයි.

97 **සඤ්චරිත්තං විනා සෙසා සචිත්තා ගරුකානතිමා**
**අවජ්ඣානං පරිණතං හිත්වා නිස්සග්ගියමචිත්තකං**

සඤ්චරිත්තං, සඤ්චරිත්ත ශික්ෂාපදය; විනා, හැර; සෙසා, අවශිෂ්ටවූ; ගරුකා ච, සඟවෙසෙස්හු ද; අනතිමා ච, සතර පරිජි ද; සචිත්තා, සචිත්තක නම් වෙත්; අවජ්ඣානං, අවජ්ඣාන ශික්ෂාව ද; පරිණතං, පරිණත ශික්ෂාව ද; හිත්වා, හැර; නිස්සග්ගියං, සේසු නිසගි තෙමේ; අචිත්තකං, අචිත්තක නම් වේ.

98 **පදසො ධම්මං දුවෙ සෙය්‍යා ඉත්ථියා ධම්මදෙසනා**
**දුවෙ සෙනාසනානිපි සිබ්බනං චීවරස්සපි**

99 **පවාරිතං සුරාපානං පඤ්චසන්නිධි ආදිකං**
**ජෝතිනුජ්ජාලනඤ්චෙව කප්පබින්දුමනාදියං**
**ගාමප්පවෙසනඤ්චෙත පාචිත්තිසු අචිත්තකා**

පාචිත්තිසු, දෙඅනූ පචිති ශික්ෂාවන් අතුරෙන්; පදසො ධම්මං, පදසොධම්ම ශික්ෂාවද; දුවෙ සෙය්‍යා, විප්‍රකාරසහසෙය්‍යා ශික්ෂාවෝ ද; ඉත්ථියා, මාගමට; ධම්මදෙසනා, බණකීමෙහි පැණවූ ධර්ම දෙශනා ශික්ෂාව ද; දුවෙ සෙනාසනානි අපි, විප්‍රකාරසෙනාසන ශික්ෂාවෝ ද; චීවරස්සසිබ්බනං අපි, චීවරසිබ්බන ශික්ෂාව ද; පවාරිතං, ප්‍රතික්ෂෙපකළ බොජුන් වැළඳීමෙහි පැණවූ අනතිරිත්ත භොජන ශික්ෂාව ද; සුරාපානං, සුරාපාන ශික්ෂාව ද; පඤ්චසන්නිධි ආදිකං, සන්නිධි ශික්ෂාව ආදී ශික්ෂා පස ද; ජෝතිනුජ්ජාලනං ච එව, ජෝතිසමාදහන ශික්ෂාව ද; කප්පබින්දුං. කප්බිඳු; අනාදියං, නොගැසීමෙහි පැණවූ කප්පබින්දුඅනාදාන ශික්ෂාව ද; ගාමප්පවෙසනං තා, ගාමප්පවෙසන ශික්ෂාව අවශන් කොට ඇති; එතෙ, මේ සතළොස් ශික්ෂාවෝ තුමූ; අචිත්තකා, අචිත්තක නම් වෙත්.

"**සන්නිධිආදිකං**" යන්නෙහි ආදි ශබ්දයෙන් විකාලභොජන, **පණීතභොජන, දන්තපොන, තිත්ථියදාන** ශික්ෂාවෝ ගැණෙත්.

100 **පකිණ්ණකෙසු උද්දිස්ස කතං ඨිත්වාඤ්ඤමංසකං**
**එකත්ථරණපාපුරණං එකමඤ්චෙව තුවට්ටනං**

101 **එකතො භුඤ්ජනඤ්චාපි නච්චගීතාදිසත්තපි**
**අකායබන්ධනඤ්චාපි පත්තහත්ථ කවාටකං**
**අචිත්තකමිදං සබ්බං සෙසමෙත්ථ සචිත්තකං**

පකිණ්ණකෙසු, ප්‍රකීර්ණක ශික්ෂාපදයන් අතුරෙන්; උද්දිස්ස කතං, උදෙසා කරණලද මාංශය අනුභවකිරීමෙහි පැණවූ උද්දිස්සකත මංසභොජන ශික්ෂාව; ඨිත්වා, හැර; අඤ්ඤමංසකං, සෙසු අකප්පිය මාංශවැළඳීමෙහි පැණවූ අකප්පිය මංසභොජන ශික්ෂාව ද; එකත්ථරණපාපුරණං, එක් ඇතිරියක් අතුරාගෙණ එක්පෙරවියක් පොරවාගෙණ සයනය කිරීමෙහි පැණවූ එකතො සයන ශික්ෂාව ද; එකමඤ්චෙව, එක ඇඳෙහි; තුවට්ටනං, සයනය කිරීමෙහි පැණවූ එකතොසයන ශික්ෂාව ද; එකතො, එක්ව; භුඤ්ජනඤ්චාපි, එකබඳුනෙහි වැළඳීමෙහි පැණවූ එකතොභුඤ්ජන ශික්ෂාව ද; නච්චගීතාදිසත්තපි, නැටීම් ගී කීම්හි පැණවූ නච්චදස්සන ගීතසවන ශික්ෂා ආදී සත් ශික්ෂාවෝ ද; අකායබන්ධනඤ්චාපි, කාබහන් නොබැඳ ගම් වැදීමෙහි පැණවූ අකාය බන්ධන ශික්ෂාව ද; පත්තහත්ථකවාටකං, පාත්‍රයගත් අත් ඇතිව දොර විවෘත කිරීමෙහි පැණවූ වාරවිවරණ ශික්ෂාව ද; ඉදං සබ්බං, යන මේ සියළු ශික්ෂා පද තෙමේ; අචිත්තකං, අචිත්තක නම් වේ. එත්ථ, මේ ප්‍රකීර්ණක නිර්දේශයෙහි; සෙසං, අවශෙෂවූ ශික්ෂා පද තෙමේ; සචිත්තකං, සචිත්තක නම් වේ.

"**නච්චගීතාදි**" යන්නෙහි ආදි ශබ්දයෙන් වච්චජඩ්ඩන, දීඝකෙසධාරණ, නඛමට්ටකරණ, සම්බාධලොමහරණ, සඋපාහණ අඞ්කමන, ශික්ෂාවෝ ගැණෙත්.

102 **වීතික්කමචිතෙනා සචිත්තකමචිත්තකං**
**පඤ්ඤත්තිජානනෙනාපි වදන්තාචරියා තථා**

වීතික්කමචිතෙන, වස්තුව ඉක්මවනු කැමති සිතින් (ආපජ්ජිතං, පැමිණෙන ලද ශික්ෂාපද තෙමේ) සචිත්තකං, සචිත්තක නම් වේ. අචිත්තකං, අන්‍ය ශික්ෂාපද තෙමේ අචිත්තක නම් වේ. තථා, එපරිද්දෙන්; පඤ්ඤත්තිජානනෙනාපි, ප්‍රඥප්තිය දැන ගැණීමෙන් සචිත්තකය සිද නොදැනීමෙන් අචිත්තක යයි ද; ආචරියා, ආචාර්‍ය්‍යයෝ; වදන්ති, කියත්.

සං:- 1 සවිතක්කමවිතක්ක.

ඉක්මවනු කැමති සිත ඇතිකල්හි ඇවතට පැමිණීම් ඇති ශික්ෂා තොමෝ සවිතක්ක වන්නීය. ඉක්මවන සිත නැතිකල්හි ඇවතට පැමිණීම් ඇති ශික්ෂා තොමෝ අවිතක්ක වන්නීය. සවිතක්කය ලොකවද්‍ය වෙයි. අවිතක්කය ප්‍රඥප්ති වද්‍ය වෙයි. සවිතක්කය බෙහෙවින් අකුසල් සිත්හි වෙයි. අවිතක්කය කුශලාකුසල අව්‍යාකෘත ත්‍රිවිත්තයෙහි වෙයි.

103 පුබ්බකරණාදිකං කත්වා උපොසථපවාරණං
නවධා දීපිතං සබ්බං ඤාතබ්බං පියසීලිනා

පියසීලිනා, සිල් කැමැත්තහු විසින්; පුබ්බකරණාදිකං, පූර්වකරණාදිය; කත්වා, කොට; නවධා, නවප්‍රකාරයකින්; දීපිතං, ප්‍රකාශකරණලද්දාවූ; උපොසථපවාරණං, පොහෝ පවුරුණු; ඤාතබ්බං, කටයුත්තේ යි.

“පුබ්බකරණාදිකං” යන්නෙහි ආදි ශබ්දයෙන් පූර්වකෘත්‍ය පස්දෙන ද ප්‍රාප්තකාලාඞ්ග සතර දෙන ද ආරාධනය ද ගැණේ.

104 පාරිසුද්ධි අධිට්ඨාන සුත්තුද්දෙසවසා තිධා
ගණපුග්ගලසංඝා ච තං කරෙය්‍යුං යථාක්කමං

පාරිසුද්ධි, පිරිසිදු පොහොය; අධිට්ඨාන, ඉටන් පොහොය; සුත්තුද්දෙසවසා, පාමොක් උදෙසන පොහොය යන මොවුන්ගේ වශයෙන්; තිධා, පොහොය තෙවැදෑරුම් වේ. තං, ඒ පොහොය; ගණපුග්ගලසංඝා ච, ගණයාය පුද්ගලයාය සංඝයාය යන මොව්හු; යථාක්කමං, පිළිවෙලින්; කරෙය්‍යුං, කරන්නාහුය

සං - 1 යථාක්කමං

පිරිසිදු පොහොය ගණයා විසින් ද ඉටන් පොහොය පුද්ගලයා විසින් ද සුත්තුද්දෙස පොහොය සංඝයා විසින් ද කිරීම පිළිවෙල නම් වේ.

105 චාතුද්දසො පණ්ණරසො සාමග්ගිදිනතො තිධා
දිනපුග්ගලකත්තබ්බා කාරතො ච නවෙරිතා

චාතුද්දසො, තුදුස්වක් පොහොය; පණ්ණරසො, පසළොස්වක් පොහොය; සාමග්ගි, සමගි පොහොය යි; දිනතො, දවස් වශයෙන්; තිධා, තෙවැදෑරුම් වේ. තෙ, ඒ උපෝසථයෝ තුමූ;

දිනපුග්ගලකත්තබ්බාකාරතො, දවස්ය පුද්ගලයෝය කටයුතු ආකාරය යන මොවුන්ගේ වශයෙන්; නව, නවදෙනෙකැයි; ඊරිතා, කියනලද්දුහ.

සං:– 1 නවෙරිතා

චාතුද්දසී, පණ්ණරසී, සාමග්ගි යයි දිනවශයෙන් තුණක් ද ගණපුග්ගල සංඝය යි පුද්ගල භෙදයෙන් තුණක් ද පාරිසුද්ධි අධිඨාන සුත්තුද්දෙස යයි තුණක් දැයි මෙසේ නව උපෝෂථයෝ වන්නාහ.

(අ) පශ්චිම කාත්තිකමාසය හැර සෙසු එකොළොස් මස්හි භින්නසංඝයාගේ යම් සාමග්‍රී දිනයක් වේ නම් එදින කරණ සුත්තුද්දෙස පොහොය සාමග්ගි උපෝෂථ නම්.

සික්ඛාපදවලඤ්ජ නයෙහි

"තත්‍ථ සාමග්ගිඋපොසථො නාම විවාදූපනෙන අනුපොසථෙන භික්ඛු සඞ්ඝෙන සාමග්ගිවසෙන කාතබ්බො".

සමන්ත පාසාදිකාවෙහි

"ඨපෙත්වා කත්තිකමාසං අවසෙසෙසු එකාදසසු මාසෙසු භින්න සංඝස්ස සාමග්ගිදිවසො ච".

106 තයො තයොති කත්වාන දිනපුග්ගලභෙදතො

තෙවාචී වෙකවාචීති නවවුත්තා පවාරණා

දිනපුග්ගල භෙදතො, දවස් පුද්ගලයන්ගේ භෙද වශයෙන්; තයො තයො ඉති, තුණ තුණ බැගින්; කත්වාන, කොට; තෙවාචී වෙකවාචී ඉති, තෙවාචී වෙවාචී එකවාචී යයි; නවපවාරණා නවපවුරුණු කෙනෙක්; වුත්තා, වදාරණලද්දුහුය.

සං:- 1 පවාරණා

චාතුද්දසී පණ්ණරසී සාමග්ගී යයි දින වශයෙන් තුණක් ද; සංඝගණපුද්ගලවශයෙන් තුණක් ද තෙවාචි වෙවාචි එකවාචී යයි කළයුතු ආකාර වශයෙන් තුණක් දැයි මෙසේ නවපවුරුණු වන්නාහ.

(අ) පශ්චිම කාතීක කාලපක්ෂයෙහි තුදුස්වක් පොහෝ දින චාතුද්දසී පවාරණ දිනය වන්නේය. භණ්ඩනාදි යම් උවදුරු නිමිත්තක් හෙතුකොට ගෙණ ඇදගත් පවුරුණු ඇති පෙරවස් විසූ භික්ෂූන් විසින් පශ්චිමකාර්තිකචාතුද්දසී පණ්ණරසී දෙදින පවාරණය කළයුත්තේය.

පාලිමුත්තක විනයෙහි

"සචෙ භණ්ඩනකාරකෙහි උපද්දුතා පවාරණං පච්චුක්කඩ්ඪන්ති අථ කත්තිකමාසස්ස කාළපක්ඛ චාතුද්දසෙ වා පච්ඡිම කත්තිකපුණ්ණමා වා"

(අ) මහා පවාරණය හැර අවපෑලවිය පටන් පශ්චිම කාර්තික පෞර්ණමිය තෙක් ඇති අටවිසිදිනයන්හි සමගි පවුරණු කළ යුත්තාහ. එයින් පෙර හෝ පසුව සමගි පවුරුණු කළ නොහේ.

සමන්ත පාසාදිකාවෙහි

"සාමග්ගිපවාරණං කරොන්තෙහි ච පඨමපවාරණං ඨපෙත්වා පාටිපදතො පට්ඨාය යාවකත්තිය චාතුමාසිනී පුණ්ණමා එත්ථන්තරෙ කාතබ්බා තතො පච්ඡා වා පුරෙ වා න වට්ටති".

107 **කත්තිකන්තිමපක්ඛම්හා හෙමං ඵග්ගුණපුණ්ණමා**
**තස්ස අන්තිමපක්ඛම්හා ගිම්හා ආසාළ්හි පුණ්ණමා**
**වස්සකාලං තතො සෙසං චතුවීසතුපොසථා**

කත්තිකන්තිමපක්ඛම්හා, පශ්චිමකාර්තික හෙවත් ඉල්මස අවපෑලවිය පටන්, ඵග්ගුණපුණ්ණමා, මැදින්මස මැදිපොහොය දක්වා ඇති කාලතෙමේ; හෙමං, හෙමන්ත ඍතු නම් වේ; තස්ස, ඒ මැදින්මාසයාගේ; අන්තිමපක්ඛම්හා, අවපෑලවිය පටන්; ආසාළ්හිපුණ්ණමා, ඇසළ මස මැදිපොහොය දක්වා ඇති කාලතෙමේ; ගිම්හං, ග්‍රීෂ්මඍතු නම් වේ; තතො, ඒ ඍතුවයෙන්; සෙසං, අවශිෂ්ට කාලතෙමේ; වස්සකාලං, වර්ෂාකාල නම් වේ. චතුවීසති උපොසථා, එකෙකී ඍතුවෙහි අට බැගින් සුවිසි උපොසථයෝ වෙත්,

108 **චාතුද්දසා ඡ එතෙසු පක්ඛා තතියසත්තමා**
**සෙසා පණ්ණරසා ඤෙය්‍යා අට්ඨාරස උපොසථා**

එතෙසු, ඒ සුවිසිපක්ෂයන් අතුරෙන්; තතියසත්තමා පක්ඛා, තුන්වෙනි සත්වෙනි පක්ෂපෞෂධයෝ; ඡ, සදෙනතුමූ; චාතුද්දසා චාතුර්දසී උපෞෂධ නම් වෙත්. සෙසා, අවශෙෂවූ; අට්ඨාරස උපොසථා, අටළොස් උපෞෂධයෝ තුමූ; පණ්ණරසා, පණ්ණරසී උපෞෂධහ යි, ඤෙය්‍යා, දතයුත්තාහුය.

109 **ඡන්දං දම්මි ඡන්දං මෙ හර**
**ඡන්දං මෙ ආරොචෙහීති ඡන්දං දාතබ්බං**

ඡන්දං දම්මි ඡන්දං මෙ හර ඡන්දං මෙ ආරොචෙහි ඉති, ඡන්දං දම්මි ඡන්දං මෙ හර ඡන්දං මෙ ආරොචෙහි යි; ඡන්දං, ඡන්දය හෙවත් කැමැත්ත, දාතබ්බං, දිය යුත්තේයි.

(ඡන්දං, කැමැත්ත; දම්මි, දෙමි; මෙ, මාගේ; ඡන්දං, කැමැත්ත; හර, ගෙණයව; මෙ, මාගේ; ඡන්දං, කැමැත්ත; ආරොචෙහි, සංඝයාට අස්වව;

110 පාරිසුද්ධිං දම්මි පාරිසුද්ධිං මෙ හර
පාරිසුද්ධිං මෙ ආරොචෙහිති පාරිසුද්ධි දාතබ්බා

පාරිසුද්ධිං දම්මි පාරිසුද්ධිං මෙ හර පාරිසුද්ධිං මෙ ආරොචෙහි ඉති පාරිසුද්ධිං දම්මි පාරිසුද්ධිං මෙ හර පාරිසුද්ධිං මෙ ආරොචෙහි යී; පාරිසුද්ධි, පාරිසුද්ධි තොමෝ; දාතබ්බා, දියයුත්තීය.

(පාරිසුද්ධිං, පාරිසුද්ධිය; දම්මි, දෙමි; මෙ, මාගේ; පාරිසුද්ධිං, පාරිසුද්ධිය; හර, ගෙණයව; මෙ, මාගේ, පාරිසුද්ධිං, පිරිසිදු බව; ආරොචෙහි, සංඝයාට කියව).

සං:- 1 පාරිසුද්ධිං.

තමන්ගේ ආපත්ති අනාපත්තිතා කියා පැමෙන් පාරිසුද්ධියට පැමිණේ. එසේ පාරිසුද්ධිය දැන්වීමෙන් සංඝයාගේ ද තමාගේද පොහෝකරණය සමපූණී වෙයි. පාරිසුද්ධිය දෙන්නහු විසින් ඡන්දයද දිය යුත්තේය. ඡන්දය දීමෙන් සංඝයාගේ පොහෝ කරණයද සෙසු සංඝකර්මද සම්පාදනය වෙයි. යමෙක් තෙමේ පොහෝකර්මයට ඡන්දය පමණක් දේ නම් තමාගේ පොහෝ කරණය නොවී සංඝ කටයුතුම පමණක් සිද්ධ වෙයි. පාරිසුද්ධිය පමණක් දේනම් තමාගේ හා සංඝයාගේ පොහෝ කරණය මුත් සෙසු සංඝකර්ම නොසැපයෙයි. එහෙයින් පාරිසුද්ධිය දෙන්නහු විසින් ඡන්දයද දිය යුතු.

111 පවාරණං දම්මි පවාරණං මෙ හර පවාරණං මෙ
ආරොචෙහි මමත්ථාය පවාරෙහිති පවාරණා දාතබ්බා

පවාරණං දම්මි පවාරණං මෙ හර පවාරණං මෙ ආරොචෙහි මමත්ථාය පවාරෙහි ඉති, පවාරණං දම්මි =පෙ= පවාරෙහි යී; පවාරණා, පවුරුණු තොමෝ; දාතබ්බා, දියයුත්තීය

(පවාරණං, පවුරුණු; දම්මි, දෙමි; මෙ, මාගේ; පවාරණං, පවුරුණු; හර, ගෙණයව; මෙ, මාගේ; පවාරණං, පවුරුණු; ආරොචෙහි, සංඝයාට කියව; මමත්ථාය, මා පිණිස; පවාරෙහි, පවරව;)

සං: 1 **පවාරණං දම්මි**

පවුරුණු දෙනු කැමති භික්ෂුව විසින් අන් භික්ෂුවක් කරා එළඹ බඩාඤ්ජලීව උක්කුටුකයෙන් හිඳ යථොක්ත වාක්‍ය තුන් යලක් බැණ පවුරුණු දියයුත්තීය. පවුරුණු දෙන්නහු විසින් ඡන්දයද දිය යුතු වේ පව්රුණු ගෙණයන භික්ෂුව විසින් සීමාව තුල රැස්වූ සඟ මැදට පැමිණ බඩාජලීව උක්කුටුකයෙන් හිඳ **"තිස්සො භන්තෙ භික්ඛු සංඝං පවාරෙති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු තං භන්තෙ සංඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සති. දුතියම්පි භන්තෙ තිස්සො භික්ඛු =පෙ= තතියම්පි =පෙ= පටිකරිස්සතී"**යි සමන්තපාසාදිකා වෙහි ආනයින් බැණ පැවරිය යුත්තේය. පවුරුණු දුන්නහුගේ නම **තිස්සො** යන්නට ගලපා වාක්‍ය යෙදිය යුතු වේ

112 **ආපත්තිදෙසකෙන අහම්භන්තෙ සම්බහුලා නානාවත්ථුකා ආපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමීති වත්වා පස්සසි ආවුසො තා ආපත්තියොති පටිග්ගණ්හන්තෙන වුත්තෙ ආම භන්තෙ පස්සාමීති වත්වා පුන පටිග්ගණ්හන්තෙන ආයතිං ආවුසො සංවරෙය්‍යාසීති වුත්තෙ සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමීති තික්ඛත්තුං වත්වා දෙසෙතබ්බා**

ආපත්තිදෙසකෙන, ඇවැත් දෙසන්නහු විසින්; අහංභන්තෙ සම්බහුලා නානාවත්ථුකා ආපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමි ඉති, අහං භන්තෙ =පෙ= පටිදෙසෙමි (භන්තෙ, වහන්ස; අහං, මම; සම්බහුලා, බොහෝවූ; නානාවත්ථුකා, නොයෙක් වස්තු ඇත්තාවූ; ආපත්තියො, ඇවතුන්ට; ආපජ්ජිං පැමිණියෙමි; තා, ඒ ඇවැත්හු; තුම්හමූලෙ, තුඹවහන්සේ හමුවෙහි; පටිදෙසෙමි, අස්වන්නෙමි)යි; වත්වා, කියා; පස්සසි ආවුසො තා ආපත්තියො ඉති, පස්සසි ආවුසො තා ආපත්තියො (ආවුසො, ඇවත; තා අපත්තියො, ඒ ඇවැත්හු; පස්සසි, දක්නෙහිද)යි; පටිගණ්හන්තෙන, පිළිගන්නහු විසින්; වුත්තෙ, කීකල්හි; ආම භන්තෙ පස්සාමි ඉති, ආම භන්තෙ පස්සාමි (භන්තෙ, වහන්ස; ආම, එසේය; පස්සාමි, දකිමි)යි, වත්වා, කියා; පුන, නැවත; පටිග්ගණ්හන්තෙන, පිළිගන්නහු විසින්; ආයතිං ආවුසො සංවරෙය්‍යාසි ඉති, ආයතිං ආවුසො සංවරෙය්‍යාසි (ආවුසො, ඇවත; ආයතිං, මත්තෙහි; සංවරෙය්‍යාසි, සංවරයෙහි පිහිටුව)යි; වුත්තෙ, කීකල්හී; සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමි ඉති,

සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමි (භන්තෙ, වහන්ස; සාධු සුට්ඨු, ස්ථිර වශයෙන්; සංවරිස්සාමි, රක්ෂාකරන්නෙමි)යි; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; දෙසෙතබ්බා, දෙසිය යුත්තීය.

113 **විමතිං ආරොචෙන්තෙන අහම්භන්තෙ සම්බහුලාසු නානාවත්ථුකාසු ආපත්තීසු වෙමතිකො යදා නිබ්බෙමතිකො භවිස්සාමි තදා තා ආපත්තියො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා ආරොචෙතබ්බා**

විමතිං, සැකඇති ඇවත; ආරොචෙන්තෙන, අස්වන්නහු විසින්; අහම්භන්තෙ සම්බහුලාසු නානාවත්ථුකාසු ආපත්තීසු වෙමතිකො යදා නිබ්බෙමතිකො භවිස්සාමි තදා තා ආපත්තියො පටිකරිස්සාමි ඉති, අහම්භන්තෙ =පෙ= පටිකරිස්සාමි (භන්තෙ, වහන්ස; අහං, මම; සම්බහුලාසු, බොහෝවූ; නානාවත්ථුකාසු, නොයෙක් වස්තු ඇත්තාවූ; ආපත්තීසු, ඇවතුන් කෙරෙහි; වෙමතිකො, සැක ඇත්තෙමි; යදා, යම් කාලෙක්හි; නිබ්බෙමතිකො, සැකයෙන් පහවූයේ; භවිස්සාමි, වන්නෙම් ද; තදා, එකල්හී; තා ආපත්තියො, ඒ ඇවතුන්ට; පටිකරිස්සාමි, පිළියම් කෙරෙමි)යි; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; ආරොචෙතබ්බා, ඇස්විය යුත්තීය.

114 **අජ්ජ මෙ උපොසථො පණ්ණරසො චාතුද්දසොති වා අධිට්ඨාමීති තික්ඛත්තුං වත්වා පුග්ගලෙන අධිට්ඨානුපොසථො කාතබ්බො**

අජ්ජ මෙ උපොසථො පණ්ණරසො චාතුද්දසොති වා අධිට්ඨාමි ඉති, අජ්ජ මෙ උපොසථො පණ්ණරසොති අධිට්ඨාමි, =හෝ= අජ්ජ මෙ උපොසථො චාතුද්දසොති අධිට්ඨාමි (අජ්ජ, අද; මෙ, මාගේ; උපොසථො, උපෝෂථය; පණ්ණරසො, පණ්ණරසිය වෙයි; ඉති, මෙසේ; අධිට්ඨාමි, ඉටමි) හෝ; තික්ඛත්තුං, තුන් යලක්; වත්වා, කියා; පුග්ගලෙන, පුද්ගලයා විසින්; අධිට්ඨානුපොසථො, ඉටන් පොහොය; කාතබ්බො, කටයුතුයි.

සං:- 1 **අධිට්ඨානුපොසථො**

ඉටන් පොහොය වනාහී හුදකලා භික්ෂුව විසින් කළයුතු පොහොයකි; ශීමාවක්තුල පූර්වකරණයන් කොට නිමාලූ භික්ෂුව විසින් අන් භික්ෂුවක් හුගේ නොපැමිණීම සලකමින් භික්ෂූන් ඇතැයි වැටහෙන දිසාවකට උක්කුටුකයෙන් බඩාජලීව හිඳ පණ්ණරසිය වීනම් **“අජ්ජ මෙ උපොසථො පණ්ණරසොති**

**අධිෂ්ඨාමි**"යිද චාතුද්දසිය වීනම් **"අජ්ජ මෙ උපොසථො චාතුද්දසොති අධිට්ඨාමි**"යිද තෙවරක් බැණ ඉටන් පොහෝ කළ යුත්තේයි.

115 **ථීසු පන ථෙරෙන පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධොති මං ධාරෙහිති තික්ඛත්තුං වත්තබ්බං**

ථීසු පන, දෙදෙනා අතුරෙන් වනාහී; ථෙරෙන, වැඩිමහළු භික්ෂුව විසින් පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධොති මං ධාරෙහි ඉති, පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධොති මං ධාරෙහි (ආවුසො, ඇවැත; අහං, මම; පරිසුද්ධො, ඇවතින් පිරිසිදුවූයෙමි; මං, මා; පරිසුද්ධො ඉති, පිරිසිදුය යි; ධාරෙහි, දැනගණුව)යි; තික්ඛත්තුං, තුන්යලක්; වත්තබ්බං, කිය යුතුයි.

116 **නවකෙනාපි තථෙව වත්තබ්බං අහං භන්තෙ මං ධාරෙථාති වචනමෙව විසෙසො**

නවකෙන, නවක භික්ෂුව විසින් ද; තථා එව, ඒ වැඩිමහළු භික්ෂුව මෙන්ම; වත්තබ්බං, කිය යුතුයි අහං භන්තෙ මං ධාරෙථ ඉති අහං භන්තෙ මං ධාරෙථ යන; වචනං එව, කීමම; විසෙසො, වෙනස වේ. (නවකයා විසින් **"අහං භන්තෙ පරිසුද්ධොති මං ධාරෙථ"** යනු කියයුතු.)

117 **තීසු පන සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො පණ්ණරසො චාතුද්දසොති වා යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධි උපොසථං කරෙය්‍යාමාති ඤත්තිං ඨපෙත්වා පටිපාටියා වුත්තනයෙනෙව පාරිසුද්ධි උපොසථො කාතබ්බො**

තීසු පන, භික්ෂුන් තිදෙනා අතුරෙන් (භික්ෂුවක් විසින්) සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො පණ්ණරසො ඉති වා, සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො පණ්ණරසො (ආයස්මන්තා, ආයුෂ්මත්නි; මෙ, මාගේ වචනය; සුණන්තු, අසත්වා; අජ්ජ, අද; උපොසථො, පොහොය තෙමේ; පණ්ණරසො, පණ්ණරසිය වෙයි) කියා හෝ; චාතුද්දසො ඉති වා, සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො චාතුද්දසො කියා හෝ; යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධි උපොසථං කරෙය්‍යාම ඉති, යදායස්මන්තානං –පෙ= කරෙය්‍යාම (ආයස්මන්තානං, ආයුෂ්මතුන්ට; පත්තකල්ලං, සුදුසුකල් ඇත්තාවූ

කාමී තෙමේ; යදි, ඉදින් වන්නේ නම්; මයං, අපි; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; පාරිසුද්ධි උපොසථං, පිරිසිදු පොහොය; කරෙය්‍යාම, කරමහ)යි; ඤත්තිං, ඤත්තිය; ඨපෙත්වා, තබා; පටිපාටියා, වැඩිමහළු පිළිවලින්; වුත්තනයෙන එව, කියනලද ක්‍රමයෙන්ම; පාරිසුද්ධි උපොසථො, පිරිසිදු පොහො තෙමේ; කාතබ්බො, කටයුත්තේයි.

### සං:- 1 **පාරිසුද්ධිඋපොසථො**

පාරිසුද්ධි උපෝෂථය වනාහි ශීමාවෙක්තුල පූර්වකරණයන් කොට තිමාලූ භික්ෂු ගණයා විසින් ඤත්තිය තබා හෝ නොතබා කළ යුත්තකි දෙදෙනෙක් කෙරෙහි ඤත්තිය නොතබා ද තුන් දෙනෙක් සතරදෙනෙක් කෙරෙහි ඤත්තිය තබාද මෙම පාරිසුද්ධි උපෝෂථය කළයුතු වේ. **‘‘ඡන්ද පාරිසුද්ධි ච සංඝ මජ්ඣෙ යෙව ආගච්ඡති න ගණමජ්ඣං’’**යි පාළිමුත්තකවිනය ටීකා හෙයින් ඡන්දපාරිසුද්ධි ගෙණර්ම සඟමැදට මුත් ගණයා මැදට නොවන බැව් සැලකිය යුත්තේයි.

118 **අජ්ජ මෙ පවාරණා පණ්ණරසී චාතුද්දසීති වා අධිට්ඨාමීති තික්ඛත්තුං වත්වා එකෙන පවාරෙතබ්බං**

අජ්ජ මෙ පවාරණා පණ්ණරසීති අධිට්ඨාමීති වා, අජ්ජ මෙ පවාරණා පණ්ණරසීති අධිට්ඨාමි (අජ්ජ, අද; මෙ, මාගේ; පවාරණා පවුරුණු තොමෝ; පණ්ණරසී ඉති, පණ්ණරසී යයි; අධිට්ඨාමි ඉටමි) යි හෝ; චාතුද්දසීති අධිට්ඨාමීති වා, අජ්ජ මෙ පවාරණා චාතුද්දසීති අධිට්ඨාමි යි හෝ; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; එකෙන, එක භික්ෂුව විසින්; පවාරෙතබ්බං, පැවරිය යුතු.

119 විසු **පන ථෙරෙන අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං**

විසු පන, භික්ෂූන් දෙදෙනෙකු අතුරෙන් වනාහී; ථෙරෙන, වැඩිමහළු භික්ෂුව විසින්; අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි ඉති, අහං ආවුසො =පෙ= පටිකරිස්සාමි (ආවුසො, ඇවැත; අහං, මම; ආයස්මන්තෙ, ආයුෂ්මත්හු; පවාරෙමි, පවරමි (ආරාධනා කරමි) ආයස්මා,

ආයුෂ්මත් තෙමේ; මං, මට; දිට්ඨෙන වා, දැකීමෙන් හෝ; සුතෙන වා, ඇසීමෙන් හෝ; පරිසඞ්කාය වා, සැක ඇති බැවින් හෝ; අනුකම්පං, කරුණාව; උපාදාය, කරණකොට ගෙණ; වදන්තු, කියන්සේක්වා; පස්සන්තො, වරද දක්නෙම්; පටිකරිස්සාමි, පිළියම් කෙරෙමි) යි; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං, ආරාධනා කළ යුත්තේයි.

120 **නවකෙනාපි තථෙව වත්තබ්බං භන්තෙති වචනමෙව විසෙසො**

නවකෙන අපි, නවක භික්ෂුව විසිනුදු; තථා එව, එසේම; වත්තබ්බං, කියයුතුයි; භන්තෙ ඉති, භන්තෙ යන; වචනං එව, වචනයම; විසෙසො, වෙනසයි.

121 **තීසු වා චතූසු වා පන සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජ පවාරණා පණ්ණරසීති වා චාතුද්දසීති වා යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාමාති ඤත්තිං ඨපෙත්වා ථෙරෙන අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං.**

තීසු වා, තුන්දෙනෙක් අතුරෙහි හෝ; චතූසු වා පන, සතර දෙනෙක් අතුරෙහි හෝ; සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජ පවාරණා පණ්ණරසී ඉති වා, සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජ පවාරණා පණ්ණරසී (ආයස්මන්තා, ආයුෂ්මත්හු තුමූ; මෙ, මා කියන්නක්; සුණන්තු, අසත්වා; අජ්ජ, අද; පවාරණා, පවුරුණු තොමෝ; පණ්ණරසී, පණ්ණරසිය වෙයි) කියා හෝ; චාතුද්දසී ඉති වා, සුණන්තු මෙ =පෙ= චාතුද්දසී කියා හෝ; යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම ඉති, යදා =පෙ= පවාරෙය්‍යාම යී; ඤත්තිං ඨපෙත්වා, ඤත්තිය තබා; ථෙරෙන, වැඩිමහළු භික්ෂුව විසින්; අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තු මං ආයස්මන්තා අනුකම්පං උපාදාය පස්සන්තා පටිකරිස්සාමි ඉති, අහං =පෙ= පටිකරිස්සාමි යී; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා,කියා;පවාරෙතබ්බං, පැවරිය යුත්තේයි.

122 **නවකෙහි පි තථෙව පටිපාටියා පවාරෙතබ්බං භන්තෙති වචනමෙව විසෙසො**

නවකෙහි පි, නවක භික්ෂුව විසිනුදු; තථා එව, වැඩිමල් භික්ෂුව සේම්; පටිපාටියා, පිළිවෙලින්; පවාරෙතබ්බං, පැවරිය යුතු; භණෙන්ත ඉති, භණෙනා යන; වචනං එව, වචනයම; විසෙසො, වෙනසයි.

123 **චතූහි අධිකෙසු පන සුණාතු මෙ ආවුසො සංඝො අජ්ජ පවාරණා පණ්ණරසී චාතුද්දසීති වා යදි සංඝස්ස පත්තකල්ලං සංඝො පවාරෙය්‍යාති ඤත්තිං ඨපෙත්වා වුඩ්ඪතරෙන සංඝං ආවුසො පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං සංඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං**

චතූහි, සතර දෙනෙකුට වඩා; අධිකෙසු, අධිකවූ භික්ෂු සමූහයා අතුරෙන්; වුඩ්ඪතරෙන පන, වැඩිමහලු භික්ෂුව විසින් වනාහී; සුණාතු මෙ ආවුසො සංඝො අජ්ජ පවාරණා පණ්ණරසී ඉති වා, සුණාතු මෙ ආවුසො සංඝො අජ්ජ පවාරණා පණ්ණරසී (ආවුසො, ඇවැත්නි; සංඝො, සංඝ තෙමේ; මෙ, මාගේ වචනය; සුණාතු අසනසේක්වා; අජ්ජ, අද; පවාරණා, පවුරුණු තොමෝ; පණ්ණරසී, පණ්ණරසිය වෙයි කියා හෝ; චාතුද්දසී ඉතිවා, සුණාතු =පෙ= චාතුද්දසී කියා හෝ; යදිසංඝස්ස පත්තකල්ලං සංඝො පවාරෙය්‍ය ඉති; යදි =පෙ= පවාරෙය්‍ය (සංඝස්ස, සංඝයා හට; පත්තකල්ලං, සුදුසු කල් ඇති කාමයක් තෙමේ; යදි, ඉදින් වන්නේ නම්; සංඝො, සංඝ තෙමේ; පවාරෙය්‍ය, පවරන්නේය)යි; ඤත්තිං ඨපෙත්වා, ඤත්තිය තබා; සංඝං ආවුසො පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං සංඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමී ඉති, සංඝං ආවුසො =පෙ= පටිකරිස්සාමි (ආවුසො, ඇවැත්නි; සංඝං සංඝයාට; පවාරෙමි, ආරාධනා කරමි; සංඝො, සංඝ තෙම; මං, මට; අනුකම්පං, කාරුණාව; උපාදාය, කාරණකොට ගෙණ; දිට්ඨෙන වා, දැකීමෙන් හෝ; සුතෙන වා, ඇසීමෙන් හෝ; පරිසඞ්කාය වා, සැක කිරීමෙන් හෝ; (වරදක් ඇත්නම් එය) වදතු, කියනසේක්වා; පස්සන්තො, වරද දක්නෙම්; පටිකරිස්සාමි, පිළියම් කරන්නෙමි යි; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං පැවරිය යුත්තේයි.

124 **නවකෙහිපි තථෙව පටිපාටියා සංඝං භණන්තෙන පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං සංඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං.**

## නිට්ඨිතා මූලසික්ඛා.

නවකෙහි අපි, නවකයන් විසිනුදු; තථා එව, වැඩිමහලු භික්ෂූන් මෙන්ම; පටිපාටියා, පිළිවෙලින්; සංඝං භන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං සංඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි ඉති, සංඝං =පෙ= පටිකරිස්සාමි යි; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං, පැවරිය යුතුයි.

සං:- 1 **සංඝං භන්තෙ පවාරෙමි**

“**පවාරණන්ති නිසෙධනං වා කාමප්පදානං වා**”යි ශබ්ද නීති හෙයින් කාම්‍යදානය හෙවත් තමා කෙරෙහි දොස් **දක්වීමෙහිලා** කැමැත්තදීම මෙහි පවාරණ නම්. **සංඝගණ** පුද්ගලාදී නව වැදෑරුම් පවාරණයන් අතුරෙන් පඤ්චාතිරෙකපඤ්චවග්ගී සංඝයා හමුවෙහි ඤත්තිය තබා පැවරීම සංඝපවාරණ නම් වන්නේයි. අඤ්ඤමඤ්ඤානුලොමතා ආපත්තිවුට්ඨානතා විනයපුරෙක්ඛාරතාවන් පෙරටුකොට දිට්ඨසුතපරිසඞ්කිත සඞ්ඛ්‍යාත ස්ථානත්‍රයෙන් පැවරිය යුතු බව භාග්‍යවත්හු විසින් වස්විසූ භික්ෂූන්ට අනුදත වදාළහ. ඔවුනොවුන් වරද කීමෙහි සුදුසු බව අඤ්ඤමඤ්ඤානුලොමතා නම්. “**වදතු මං සංඝො**” (වදන්තු මං ආයස්මන්තො)යි බණන්නහුට අඤ්ඤමඤ්ඤානුලොමතා ලැබෙන හෙයින් ඇතිවරද කියහැකි වේ. එසේ අඤ්ඤමඤ්ඤානුලොමතා නොලබන්නෙකුට ඇතිවරද කිය නොහේ. මෙකී අඤ්ඤමඤ්ඤානුලොමතාව සංඝගණ පවුරුණුයෙහි ලැබේ. අධිට්ඨානයෙහි නො ලැබේ. ඇවතින් මිදීම ආපත්තිවුට්ඨානතා නම්. “**වදතු මං සංඝො**”යි පුග්ගලසම්මුඛතා බණන්නේ ඇවතින් මිදේ. වස්විසූ භික්ෂුවට පවාරණය නොකිරීමෙන් සිදුවන දුකුළාවෙන් මිදීම මෙහි ඇවතින් මිදීම වේ. ඇවතින් මිදුනේ හික්මීම පෙරටුකොට හැසිරෙන්නෙක් වීමෙන් විනය පුරෙක්ඛාරතාද ලැබේ. සංඝගණ පුද්ගලාදී හැම පවුරුණුයෙහිම ආපත්තිවුට්ඨානතා විනයපුරෙක්ඛාරතාවෝ ලැබෙත්.

මහාවග්ග පාළියෙහි

> “අනුජානාමි භික්ඛවෙ වස්සං වුත්ථානං භික්ඛූනං තීහි ඨානෙහි පවාරෙතුං දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා සා වො භවිස්සති අඤ්ඤමඤ්ඤානුලොමතා ආපත්තිවුට්ඨානතා විනය පුරෙක්ඛාරතා”යි

සමන්තපාසාදිකාවෙහි

> “අඤ්ඤමඤ්ඤානුලොමතාති, අඤ්ඤමඤ්ඤං වත්තුං අනුලොමභාවො වදන්තු මං ආයස්මන්තොති හි වදන්තං සක්කා හොති කිඤ්චි වත්තුං න ඉතරං = ආපත්තිවුට්ඨානතා විනය පුරෙක්ඛාරතාති ආපත්තීහි වුට්ඨානභාවො විනයං පුරතො කත්වා චරණභාවො වදන්තුමං ආයස්මන්තොති හි එවං වදන්තො ආපත්තීහි වුට්ඨහිස්සති විනයං ච පුරක්ඛත්වා විහරතීති වුච්චති”.

## සං:- 2 **වදතු මං සඞ්ඝො**

“**වදන්තු මං සඞ්ඝා**”යි පුග්ගල සම්මුඛතාව බහුවචනයෙන් යෙදුවමනා තන්හි “**වදතු මං සඞ්ඝො**”යි **එකවචනය** යෙදූහ. ශාසන ව්‍යවහාරයෙහි සංඝ ශබ්දයාගේ එකවචනයම බෙහෙවින් අභිමතවූ හෙයින් **සඞ්ඝා** යි තබා **සඞ්ඝො** යි එකවචනය යෙදූ බැව් පෙනේ. **වදන්තු** යි බහුවචනයෙන් කිණිය යුතු වුවත් සංඝ ශබ්දයාගේ එකවචනයෝග හෙතුවෙන් **වදතු** යි එකවචනයම කිණුහ. ගණ පවාරණයට වඩා සංඝපවාරණයෙහි වෙනසක් හඟවනු කැමති ආචාර්යවරු “**වදන්තු මං ආයස්මන්තො**”යි පෙළෙහි ආපරිදි නොබැණ ‘**වදතු මං සඞ්ඝො**”යි වාක්‍ය කිණුහයි සිතිය හැක. මේ වාක්‍ය යොජනාව ලිපිභ්‍රමජ අශුද්ධපාඨය කැයි ඇතැම්හු සලකති. ඒ එසේ නොවේ. මෙය **බුද්ධඝොස** කාලයටත් පෙර සිට වහරවූ බැව් සමන්තපාසාදිකාවෙහි පවාරණාකාරක වාක්‍යයෙන් පෙනේ. (111 වෙනි වාක්‍යයෙහි 1 වෙනි සංලක්‍ෂ්‍ය බලනු) එබැවින් මේ වාක්‍යය බැහැරලිය නොහේ

“**එකභික්ඛුපි පාතිමොක්ඛසංවරාදයො සීලසමූහං ධාරෙති රක්ඛති ගොපයතීති සඞ්ඝො**”යි දක්වෙන හෙයින් සංඝ ශබ්ද තෙමේ එකභික්ෂුවද වාච්‍යකෙරේ. එහෙයින් මෙහි සංඝශබ්දයාගේ පුද්ගල වාචිත්වහෙතුවෙන් අඤ්ඤමඤ්ඤානුලොමතා ආපත්ති වුට්ඨානතා විනයපුරෙක්ඛාරතාවන් ලැබීමෙන් පවාරණසුද්ධිය සැලසේ. මෙහි සංඝ ශබ්දයාගේ සමූහවාචිත්වය සලකා නම් එකී සම්මුඛතාවෙන් බාහ්‍යවීමෙන් පවාරණ දූෂ්‍යය වේ.

තවද ඤත්තිඤත්තිදුතියාදී සියලු සංඝ කර්මයන්හි සංඝ සම්මුඛතා ධම්මසම්මුඛතා පුග්ගලසම්මුඛතා විනයසම්මුඛතා යි සතර සම්මුඛතාවෝ ලැබිය යුත්තාහුය. එහෙයින් මෙම සංඝපවාරණ යෙහිද එම සතරසම්මුඛතා ලැබිය යුතුමය. “**සඞ්ඝං භන්තෙ පවාරෙමි**”යි වාක්‍යාරම්භයෙහි සංඝයාට පවරමියි දැන්වීමෙන් සංඝ සම්මුඛතාද “**දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා**”යි බැණ යථාධර්මය හෙළිකිරීමෙන් ධම්මසම්මුඛතාද “**වදතු මං සඞ්ඝො**”යි බැණ දෙස්දැක්වීමේ බලය පුද්ගලයන් කෙරෙහි ඉදිරිපත් කිරීමෙන් පුග්ගල සම්මුඛතාද “**පස්සන්තො පටිකරිස්සාමි**”යි බැණ විනය පෙරටු හැසිරීම හෙළිකරණ හෙයින් විනයසම්මුඛතාදැ යි සතර සම්මුඛතාවෝ මෙසේ මෙහිදු යෙදීපවත්නාහ. යථොක්ත සතර සම්මුඛතාවෙන් පොෂනයවූ හෙයින් “**සඞ්ඝං භන්තෙ පවාරෙමි**” =පෙ=**වදතුමංසඞ්ඝා** =පෙ= **පටිකරිස්සාමි**” යන මූලශික්‍ෂා පාඨයද පවාරණයෙහි යෙදෙන බැව් සැලකියුතු වේ.

**මූලසික්ඛා වණ්ණනාවෙහි**
**වචනාදි නිර්දේශය නිමි.**

## වණ්ණනා කත්තුසන්දස්සනං

1 මරම්මවිසයානීතා 'හිත්ථෙරපරම්පරා
ලඞ්කායාත්‍රාමරපුර සංඝතී සංවිරාජතෙ

2 තාය සංඝතියා ලද්ධ පබ්බජ්ජාවොපසම්පදෙ
අධිවුත්ථො තාලරුක්ඛා රාමෙ ච වස්සබගගකෙ

3 බුද්ධිමා බුද්ධවිසයෙ බුද්ධි භාසන්තරෙසු ච
ථෙරො **සූගතපාලාභිධ්‍යො** සංසෙසවඞ්සස්සරොහවි

4 පච්ඡිමො පූතසිස්සෙසු සිස්සන්වයගතෙස්වපි
සපිණ්ඩා බන්ධුවග්ගෙසු තස්සාවෙරවරස්ස ච

5 සීතාවත්ත ඉතිගාමෙ **ගුණාලඞ්කාර**මව්හයො
පුලිනතලාරාමස්මිං නිවාසොධිපතිට්ඨිතා

6 සුගතදස්සනාරාම වාසිකෙන මනීසිනා
අජ්ඣෙසිතො **ධම්මපාල ථෙරෙන** පිරවෙතසා

7 එකීලොකසින්ධුකරෙ ජිනනිබ්බුතියා සමා
ඵුස්සම්හි ජුණ්හකෙ පක්ඛෙ දසමෙ බුධවාසරෙ

8 පාළිඅට්ඨකථාටීකා නයං සමනුවත්තයං
සමාපෙසිං රචිත්වාන **මූලසික්ඛාය වණ්ණනං**

9 යං පුඤ්ඤං පසුතං හොති රචයන්තෙනිමං මයා
තෙන පුඤ්ඤෙන යෙ ලොකා ඵුසන්තු මමතං පදං

10 භවනෙත්‍යත්ථ කාලුස්සං සොධයන්තු විචක්ඛණා
සාසනස්ස ඨිතත්ථාය සුද්ධෙන මනසාසඨා.

**මූලසික්ඛා වණ්ණනාව සමාප්තයි.**

---

**සිද්ධිරත්ථු.**

# මූලසික්ඛා පාළි.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1 නත්වා නාථං පවක්ඛාමි මූලසික්ඛං සමාසතො
භික්ඛූනං නවකෙනාදෙ මූලභාසාය සික්ඛිතුං

2 සනිමිත්තං පවෙසෙන්තො භික්ඛු මග්ගත්තයෙ චුතො
පවෙසන ඨිතුද්ධාරපවිට්ඨෙ චෙපි සාදියං

3 අදින්නං මානුසං භණ්ඩං ථෙය්‍යායෙකෙන ආදියං
පඤ්චවීසාවහාරෙසු ගරුකං වෙ චුතො භවෙ

4 මනුස්සපාණං පාණොති ජානං වධකචෙතසා
ජීවිතා යො වියොජෙති සාසනා සො පරාජිතො

5 ඣානාදිභෙදං හදයෙ අසන්තං
අඤ්ඤාපදෙසඤ්ච විනාධිමානං
මනුස්සජාතිස්ස වදෙය්‍ය භික්ඛු
ඤාතක්ඛණෙ තෙන පරාජිකොති.

## පාරාජිකනිද්දෙසො නිට්ඨිතො.

6 මොචෙතුකාමචිත්තෙන උපක්කම්ම විමොචයං
සුක්කමඤ්ඤත්‍ර සුපිනා සමණො ගරුකං ඵුසෙ

7 කායසංසග්ගරාගෙන මනුස්සිත්ථිං පරාමසං
ඉත්ථිසඤ්ඤී උපක්කම්ම සමණො ගරුකං ඵුසෙ

8 දුට්ඨුල්ලවාචාස්සාදෙන මග්ගං වා රබ්භ මෙථුනං
ඔභාසන්තො මනුස්සිත්ථිං සුණමානං ගරුං ඵුසෙ

9 වණ්ණං වත්වාත්තනො කාම පාරිචරියාය මෙථුනං
ඉත්ථිං මෙථුනරාගෙන යාචමානො ගරුං ඵුසෙ

10 සන්දෙසං පටිගණ්හිත්වා පුරිසස්සිත්ථියා පි වා
වීමංසිත්වා හරං පච්චා සමණො ගරුකං ඵුසෙ

11 චාවෙතුකාමො චොදෙන්තො අමූලන්තිමවත්ථුනා
චොදාපයං වා සමණො සුණමානං ගරුං ඵුසෙ

12 ලෙසමත්තමුපාදාය අමූලන්තිමවත්ථුනා
චාවෙතුකාමො චොදෙන්තො සුණමානං ගරුං ඵුසෙ

## ගරුකාපත්තිනිද්දෙසො නිට්ඨිතො.

13 විකප්පනමධිට්ඨාන මකත්වාකාලචීවරං
දසාහමතිමාපෙති තස්ස නිස්සග්ගියං සියා

14 භික්ඛුසම්මුතියාඤ්ඤත්‍ර තිචීවරමධිට්ඨිතං
එකාහමතිමාපෙති නිස්සග්ගි සමයං විනා

15 අඤ්ඤාතිකා භික්ඛුණියා පුරාණචීවරම්පන
ධොවාපෙති රජාපෙති ආකොටාපෙති තං සියා

16 අඤ්ඤාතිකා භික්ඛුණියා හත්ථතො කිඤ්චි මූලකං
අදත්වා චීවරාදානෙ නිස්සග්ගියමුදීරිතං

17 අප්පවාරිතමඤ්ඤාතිං විඤ්ඤාපෙන්තස්ස චීවරං
අඤ්ඤත්‍ර සමයා තස්ස නිස්සග්ගියමුදීරිතං

18 රජතං ජාතරූපං වා මාසකං වා කහාපණං
ගණ්හෙය්‍ය වා ගණ්හාපෙය්‍ය නිස්සග්ගි සාදියෙය්‍ය වා

19 පරිවත්තෙය්‍ය නිස්සග්ගි රජතාදිචතුබ්බිධං
කප්පියං කප්පියෙනාපි ඨපෙත්වා සහධම්මිකෙ

20 විකප්පනමධිට්ඨාන මකත්වාන පමාණිකං
දසාහමතිමාපෙති පත්තං නිස්සග්ගියං සියා

21 පඤ්චබන්ධනතො ඌන පත්තෙ සති පරම්පන
විඤ්ඤාපෙති නවං පත්තං තස්ස නිස්සග්ගියං සියා

22 පටිග්ගහෙත්වා භුඤ්ජන්තො සප්පිතෙලාදිකම්පන
සත්තාහමතිමාපෙති තස්ස නිස්සග්ගියං සියා

23 භික්ඛුස්ස චීවරං දත්වා අච්ඡින්දන්තස්ස තම්පුන
සකාසඤ්ඤාය නිස්සග්ගි අච්ඡින්දාපයතො පි වා

24 අප්පවාරිතමඤ්ඤාතිං සුත්තං යාචිය චීවරං
වායාපෙන්තස්ස නිස්සග්ගි විනා ඤාතිපවාරිතෙ

25 ජානන්තො භික්ඛුසඞ්ඝස්ස ලාභං පරිණතම්පන
අත්තනො පරිණාමෙති තස්ස නිස්සග්ගියං සියා

**නිස්සග්ගි පාචිත්තිය නිද්දෙසො නිට්ඨිතො.**

26 සම්පජානමුසාවාදෙ පාචිත්තියමුදීරිතං
භික්ඛුං ච ඔමසන්තස්ස පෙසුඤ්ඤහරණෙපි ච

27 ඨපෙත්වා භික්ඛුණිං භික්ඛුං අඤ්ඤෙන පිටකත්තයං
පදසො ධම්මං භණන්තස්ස පාචිත්තියමුදීරිතං

28 අනුපසම්පන්නෙනෙව සයිත්වාන තිරත්තියං
පාචිත්ති සහසෙය්‍යාය චතුත්ථං ගතෙ පුන

29 ඉත්ථියා එකරත්තම්පි සෙය්‍යං කප්පයතොපි වා
දෙසෙන්තස්ස විනා විඤ්ඤුං ධම්මං ච ඡප්පදුත්තරිං

30 දුට්ඨුල්ලං භික්ඛුනො වජ්ජං භික්ඛුසම්මුතියා විනා
අභික්ඛුනො වදන්තස්ස පාචිත්තියමුදීරිතං

31 ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය පථවිං අකප්පියං
භූතගාමං විකොපෙය්‍ය තස්ස පාචිත්තියං සියා

32 අජ්ඣොකාසෙතුමඤ්චාදිං කත්වා සන්ථරණාදිකං
සංඝිකං යාති පාචිත්ති අකත්වා පුච්ඡනාදිකං

33 සංඝිකාවසථෙ සෙය්‍යං කත්වා සන්ථරණාදිකං
අකත්වා පුච්ඡනාදිං යො යාති පාචිත්ති තස්සපි

34 ජානං සප්පාණකං තොයං පාචිත්ති පරිභුඤ්ජයෙ
අඤ්ඤාතිකා භික්ඛුණියා ඨපෙත්වා පාරිවට්ටකං

35 චීවරං දෙති පාචිත්ති චීවරං සිබ්බතොපි ච
අතිරිත්තං අකාරෙත්වා පවාරෙත්වාන භුඤ්ජතො

36 භික්ඛුං ආසාදනාපෙක්ඛො පවාරෙති පවාරිතං
නාතිරිත්තෙන භුත්තෙ තු පාචිත්තියමුදීරිතං

37 සන්නිධිභොජනං භුඤ්ජෙ විකාලෙ යාවකාලිකං
භුඤ්ජතො වාපි පාචිත්ති අගිලානො පණීතකං

38 විඤ්ඤාපෙත්වාන භුඤ්ජෙය්‍ය සප්පිභත්තාදිකම්පි ච
අපටිග්ගහිතං භුඤ්ජෙ දන්තකට්ඨොදකං විනා

39 තිත්ථියස්ස දදෙ කිඤ්චි භුඤ්ජිතබ්බං සහත්ථතො
නිසජ්ජං වා රහො කප්පෙ මාතුගාමෙන චෙකතො

40 සුරාමෙරයපානෙපි පාචිත්තියමුදීරිතං
අඞ්ගුලිපතොදකෙ චාපි හසධම්මෙපි වොදකෙ

41 අනාදරෙපි පාචිත්ති භික්ඛුං භිංසයතොපි වා
භයානකං කථං කත්වා දස්සෙත්වා වා භයානකං

42 ඨපෙත්වා පච්චයං කිඤ්චි අගිලානො ජලෙය්‍ය වා
ජොතිං ජලාපයෙය්‍ය වා තස්ස පාචිත්තියං සියා

43 කප්පබින්දු මනාදාය නවචීවරයොගිනො
හසාපෙක්ඛස්ස පාචිත්ති භික්ඛුනො චීවරාදිකං

44 අපනෙත්වා නිධෙන්තස්ස නිධාපෙන්තස්ස වා පුන
ජානං පාණං මරන්තස්ස තිරච්ඡානගතම්පි ච

45 ඡාදෙතුකාමො ඡාදෙති දුට්ඨුල්ලං භික්ඛුනොපි ච
ගාමන්තරගතස්සාපි සංවිධායිත්ථියා සහ

46 භික්ඛුං පහරතො වාපි තලසත්තිකමුග්ගිරෙ
චොදෙති වා චොදාපෙති ගරුකාමූලකෙනපි

47 කුක්කුච්චුප්පාදනෙ චාපි භණ්ඩනත්ථායුපස්සුතිං
සොතුං භණ්ඩනජාතානං යාති පාචිත්තියං සියා

48 සංඝස්ස ලාභං පරිණාමිතන්තු
නාමෙති යො තං පරපුග්ගලස්ස
පුච්ඡං අකත්වා පිච සන්තභික්ඛුං
පාචිත්ති ගාමස්ස ගතෙ විකාලෙ

## ඛුද්දපාචිත්තිය නිද්දෙසො නිට්ඨිතො.

49 සංඝිකං ගරුභණ්ඩං යො දෙත්‍යිස්සරස්ස ඉස්සරො
ථුල්ලච්චයං යථාවත්ථු ථෙය්‍යා පාරාජිකාදිපි
50 කුසාදිමයචීරානි කම්බලං කෙසවාලජං
සමයං විනා ධාරයතො ලූකපක්ඛාජිනක්ඛිපං
51 සත්ථකම්මෙ වත්ථිකම්මෙ සඞ්ගනිමිත්තං ච ඡින්දතො
ථුල්ලච්චයං මනුස්සානං මංසාදිභොජනෙපි වා
52 කදලෙරකක්කදුස්සානි පොත්ථකං සබ්බනීලකං
සබ්බපීතාදිකං වාපි ධාරයන්තස්ස දුක්කටං
53 හත්ථිස්සුරගසොණානං සීහබ්‍යග්ඝච්ඡදීපිනං
තරච්ඡස්ස ච මංසාදිං උද්දිස්සකතකම්පි ච
54 අනාපුච්ඡිතමංසඤ්ච භුඤ්ජතො දුක්කටං සියා
යථානුපුබ්බිං හිත්වාන දකතිත්ථාදිකං වජෙ
55 සහසාවුබ්භජිත්වාන පවිසෙ නික්ඛමෙය්‍ය වා
වච්චපස්සාවකුටිකං විනා උක්කාසිකං විසෙ
56 නිත්ථුනන්තො කරෙ වච්චං දන්තකට්ඨං ච ඛාදයං
වච්චපස්සාවදොණීනං බහිවච්චාදිකං කරෙ
57 ඛරෙන චාවලෙඛෙය්‍ය කට්ඨපාතෙය්‍ය කූපකෙ
උහතං ච නධොවෙය්‍ය උක්ලාපං ච නසොධයෙ
58 දකකිච්චං කරොන්තස්ස කත්වා චපුචපූති ච
අනජ්ඣිට්ඨො ච ථෙරෙන පාතිමොක්ඛම්පි උද්දිසෙ
59 අනාපුච්ඡාය පඤ්හස්ස කථනෙ විස්සජ්ජනෙපි ච
සජ්ඣායකරණෙ දීප ජාලනෙ විජ්ඣාපනෙපි ච
60 වාතපානකවාටාදිං විවරෙය්‍ය ථකෙය්‍ය වා
වන්දනාදිං කරෙ නග්ගො ගමනං භොජනාදිකං
61 පරිකම්මං කරෙ කාරෙ තිපටිච්ඡන්නකං විනා
කායං නහායං ඝංසෙය්‍ය කුඩ්ඩෙ ථම්භෙ තරුම්හි වා
62 කුරුවින්දකසුත්තෙන අඤ්ඤමඤ්ඤස්ස කායතො
අගිලානො බහාරාමෙ චරෙය්‍ය සඋපාහනො
63 උපාහනං යො ධාරෙති සබ්බනීලාදිකම්පි ච
නිමිත්තං ඉත්ථියා රත්තො මුඛං වා භික්ඛදායියා

64 උජ්ඣානසඤ්ඤී අඤ්ඤස්ස පත්තං වා අත්තනො මුඛං
ආදාසාදිම්හි පස්සෙය්‍ය උච්චාසනමහාසනෙ

65 නිසජ්ජාදිං කරොන්තස්ස දුක්කටං වන්දතෙපි ච
උක්ඛිත්තානුපසම්පන්න නානාසංවාසකාදිනං

66 එකතො පණ්ඩකිත්ථීහි උභතො බ්‍යඤ්ජනෙන වා
දීඝාසනෙ නිසීදෙය්‍ය අදීඝෙ ආසනෙ පන

67 අසමානාසනිකෙන මඤ්චපීඨෙ සයෙය්‍ය වා
කුලසංගහත්ථං දදතො ඵලපුප්ඵාදිකම්පි ච

68 ගන්ථිමාදිං කරෙ කාරෙ ජීනචාරිතපච්චයෙ
පරිභුඤ්ජෙය්‍ය අබ්‍යත්තො අනිස්සාය වසෙය්‍ය වා

69 අනුඤ්ඤාතෙහි අඤ්ඤස්ස භෙසජ්ජං වා කරෙ විදෙ
කරෙ සාපත්තිකො භික්ඛු උපොසථපවාරණං

70 වාරබන්ධාදිකෙ ඨානෙ පරිවත්තකවාටකං
අපිධාය විනා භොගං නියොගං වා සයෙ දිවා

71 ධඤ්ඤිත්ථිරූපරතනං ආවුධිත්ථිපසාධනං
තූරියභණ්ඩං ඵලං රුක්ඛෙ පුබ්බණ්ණාදිං ච ආමසෙ

72 සසිත්ථොදකතෙලෙහි ඵණහත්ථඵණෙහි වා
කොසමොසණ්හතෙකස්මිං භාජනෙ භුඤ්ජතෙපි ච

73 එකත්ථරණපාපුරණා සයෙය්‍යුං වෙකමඤ්චකෙ
දන්තකට්ඨං ච ඛාදෙය්‍ය අධිකූනං පමාණතො

74 යොජෙති යොජාපෙති නච්චගීතං ච වාදිතං
දස්සනං සවණං තෙසං කරොන්තස්ස ච දුක්කටං

75 වීහාදිරොපිමෙ වාපි බහිපාකාරකුඩ්ඩකෙ
වච්චාදිඡඩ්ඩනාදිම්හි දීඝකෙසාදිධාරණෙ

76 නඛමට්ඨකරාදිම්හි සම්බාධෙ ලොමහාරණෙ
පරිකම්මකතං භූමිං අක්කමෙ සඋපාහනො

77 අධොතඅල්ලපාදෙහි සංඝිකං මඤ්චපීඨකං
පරිකම්මකතං භිත්තිං ආමසන්තස්ස දුක්කටං

78 සංඝාටියාපි පල්ලත්ථෙ දුප්පභුඤ්ජෙය්‍ය චීවරං
අකායබන්ධනො ගාමං වජෙ කත්වාන වච්චකං

79 නාචමෙය්‍යුදකෙ සන්තෙ සමාදෙය්‍ය අකප්පියෙ
දෙසනාරොචනාදිම්හි සභාගාපත්තියාපි ච

80 වසෙ වස්සං විසංවාදෙ සුද්ධචිත්තෙන පටිස්සවං
වස්සං වසිත්වා ගමනෙ අනනුඤ්ඤාත කිච්චතො.

81 විනා පදං තරුං සුද්ධං පොරිසම්හාභිරූහණෙ
අපරිස්සාවනොද්ධානං වජෙ තං යාචතො නදෙ

82 අත්තනො ඝාතනෙ ඉත්ථි රූපාදිං කාරයෙය්‍ය වා
භිත්වා මාලාදිකං චිත්තං ජාතකාදිං සයං කරෙ

83 භුඤ්ජන්තමුට්ඨපෙන්තස්ස සාලාදීසු නිසීදතො
වුඩ්ඪානං පන ඔකාසං අදත්වා වාපි දුක්කටං

84 යානාදිමභිරූහෙය්‍ය කල්ලකො රතනත්තයං
ආරබ්භ දවෙ වදෙඤ්ඤ පරිසායොපලාලනෙ

85 කායාදිං විවරිත්වාන භික්ඛුණීනං නිදස්සයෙ
වාචෙ ලොකායතං විජ්ජං පලිතං ගණ්හාපෙය්‍ය වා

86 යත්ථ කත්ථචි පෙළායං භුඤ්ජතො පත්තහත්ථකො
වාතපානකවාටං වා පණාමෙ සොදකම්පි ච

87 උණ්හයෙය්‍ය පටිසාමෙය්‍ය අතිඋණ්හයෙය්‍ය වොදකං
ඨපෙය්‍ය භූමියං පත්තං අඩ්ඩෙ වා මඤ්චපීඨකෙ

88 මීඪන්තෙ පරිභණ්ඩන්තෙ පාදෙ ඡත්තෙ ඨපෙය්‍ය වා
චලකාදිං ඨපෙ පත්තෙ පත්තෙන වා හත්ථධොවනෙ

89 පත්තෙන නීහරන්තස්ස උච්ඡිට්ඨමුදකම්පි ච
අකප්පියම්පි පත්තං වා පරිභුඤ්ජෙය්‍ය දුක්කටං

90 වදෙ ජීවාති ඛිපිතෙ නසික්ඛති අනාදරො
පරිමණ්ඩලකාදිම්හි සෙඛියෙ දුක්කටං සියා

91 යො භණ්ඩගාරෙ පයුත්තොව භණ්ඩකං
මාතුන පාචිත්තියමස්ස ගොපයෙ
දවාය ගීතෙනපි ජාතිආදිනා
වදෙය්‍ය දුබ්භාසිතමුත්තමඤ්ඤපි යො

**පකිණ්ණක නිද්දෙසො නිට්ඨිතො.**

92 උපජ්ඣාචෙරවත්තං ච ගමිකාගන්තුකම්පි ච
සෙනාසනාදිවත්තං ච කාතබ්බං පියසීලිනා

93 හත්ථපාසෙ ඨිතො කිඤ්චි ගහිතබ්බං දදෙ තිධා
ගහෙතුකාමො ගණ්හෙය්‍ය විධායං සම්පටිග්ගහො

94 සංඝාටිමුත්තරාසඞ්ගං තථා අන්තරවාසකං
එතං ඉමං අධිට්ඨාමි තථා පච්චුද්ධරාමිති

95 ඉමං ඉමානි එතානි එතම්පි චීවරන්ති වා
පරික්ඛාරචොළානීති තථා පච්චුද්ධරාමිති

96 එතං ඉමං අධිට්ඨාමි පත්තං පච්චුද්ධරාමිති
එවං පච්චුද්ධරෙධිට්ඨෙ චීවරාදිං යථාවිධි

97 සඤ්චරිත්තං විනා සෙසා සචිත්තා ගරුකන්තිමා
අජ්ඣිත්තං පරිණතං හිත්වා නිස්සග්ගියමචිත්තකා

98 පදසො ධම්මං දුවෙ සෙය්‍යා ඉත්ථියා ධම්මදෙසනා
ද්වෙ සෙනාසනානීපි සිබ්බනං චීවරස්සපි

99 පචාරිතං සුරාපානං පඤ්චසන්නිධිආදිකං
ජොතිනුජ්ජාලනඤ්චෙව කප්පබින්දුමනාදියං
ගාමප්පවෙසනන්තෙතෙ පාචිත්තීසු අචිත්තකා

100 පකිණ්ණකෙසු උද්දිස්ස කතං හිත්වාඤ්ඤමංසකං
එකත්ථරණපාපුරණං එකමඤ්චතුවට්ටනං

101 එකතො භුඤ්ජනඤ්චාපි නච්චගීතාදිසත්තපි
අකායබන්ධනඤ්චාපි පත්තහත්ථකවාටකං
අචිත්තකමිදං සබ්බං සෙසමෙත්ථ සචිත්තකං

102 වීතික්කමචීතෙනන සචිත්තකමචිත්තකං
පණ්ණත්තිජානතෙනාපි වදන්තාචරියා තථා

103 පුබ්බකරණාදිකං කත්වා උපොසථපවාරණං
නවධා දීපිතං සබ්බං කාතබ්බං පියසීලිනා

104 පාරිසුද්ධිඅධිට්ඨාන සුත්තුද්දෙසවසා තිධා
ගණපුග්ගලසංඝා ච තං කරෙය්‍යුං යථාක්කමං

105 චාතුද්දසො පණ්ණරසො සාමග්ගීදිනතො තිධා
දිනපුග්ගලකත්තබ්බා කාරතො තෙ නවෙරිතා

106 තයො තයොති කත්වාන දිනපුග්ගලභෙදතො
තෙවාචී චෙකවාචීති නව වුත්තා පවාරණා

107 කත්තිකන්තිමපක්ඛම්හා හෙමං ඵග්ගුණපුණ්ණමා
තස්ස අන්තිමපක්ඛම්හා ගිම්හා ආසාළ්හිපුණ්ණමා
වස්සකාලං තතො සෙසං චතුවීසතුපොසථා

108 චාතුද්දසා ඡ එතෙසු පක්ඛා තතියසත්තමා
සෙසා පණ්ණරසා ඤෙය්‍යා අට්ඨාරස උපොසථා

109 ඡන්දං දම්මි ඡන්දං මෙ හර ඡන්දං මෙ ආරොචෙහීති ඡන්දං දාතබ්බං

110 පාරිසුද්ධිං දම්මි පාරිසුද්ධිං මෙ හර පාරිසුද්ධිං මෙ ආරොචෙහීති පාරිසුද්ධි දාතබ්බා

111 පවාරණං දම්මි පවාරණං මෙ හර පවාරණං මෙ ආරොචෙහි මමත්ථාය පවාරෙහීති පවාරණා දාතබ්බා

112 ආපත්තිදෙසකෙන අහම්භන්තෙ සම්බහුලා නානාවත්ථුකා ආපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමීති වත්වා පස්සසි ආවුසො තා ආපත්තියොති පටිග්ගණ්හන්තෙන වුත්තෙ ආම භන්තෙ පස්සාමීති වත්වා පුන පටිග්ගණ්හන්තෙන ආයතිං ආවුසො සංවරෙය්‍යාසීති වුත්තෙ සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමීති තික්ඛත්තුං වත්වා දෙසෙතබ්බා.

113 විමතිං ආරොචෙන්තෙන අහම්භන්තෙ සම්බහුලාසු නානාවත්ථුකාසු ආපත්තීසු වෙමතිකො යදා නිබ්බෙමතිකො භවිස්සාමි තදා තා ආපත්තියො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා ආරොචෙතබ්බා

114 අජ්ජ මෙ උපොසථො පණ්ණරසො චාතුද්දසොති වා අධිට්ඨාමීති තික්ඛත්තුං වත්වා පුග්ගලෙන අධිට්ඨානුපොසථො කාතබ්බො

115 තීසු පන ථෙරෙන පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධොති මං ධාරෙහීති තික්ඛත්තුං වත්තබ්බං

116 නවකෙනාපි තථෙව වත්තබ්බං අහම්භන්තෙ මං ධාරෙථාති වචනමෙව විසෙසො

117 තීසු පන සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො පණ්ණරසො චාතුද්දසොති වා යදා යස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධිඋපොසථං කරෙය්‍යාමාති ඤත්තිං ඨපෙත්වා පටිපාටියා වුත්තනයෙනෙව පාරිසුද්ධිඋපොසථො කාතබ්බො

118 අජ්ජ මෙ පවාරණා පණ්ණරසී චාතුද්දසීති වා අධිට්ඨාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං

119 තීසු පන ථෙරෙන අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං

120 නවකෙනාපි තථෙව වත්තබ්බං භන්තෙති වචනමෙව විසෙසො

121 තීසු වා චතුසු වා පන සුණන්තු මෙ ආයස්මන්තො අජ්ජ පවාරණා පණ්ණරසී චාතුද්දසීති වා යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාමාති ඤත්තිං ඨපෙත්වා ථෙරෙන අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය පස්සන්තො පරිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං

122 නවකෙහිපි තථෙව පටිපාටියා පවාරෙතබ්බං භන්තෙති වචනමෙව විසෙසො

123 චතුහි අධිකෙසු පන සුණාතු මෙ ආවුසො සංඝො අජ්ජ පවාරණා පණ්ණරසී චාතුද්දසීති වා යදි සංඝස්ස පත්තකල්ලං සංඝො පවාරෙය්‍යාති ඤත්තිං ඨපෙත්වා වුඩ්ඪතරෙන සංඝං ආවුසො පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං සංඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං

124 නවකෙහිපි තථෙව පටිපාටියා සංඝං භන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං සංඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං.

**වත්තාදිනිද්දෙසො නිට්ඨිතො**

## නිට්ඨිතා මූලසික්ඛා පාළි.

# සංවණ්ණිත පදානුක්‍රමණිකාව.


| | පිට. |
|---|---|
| අකාල චීවරං | 38 |
| අගිලානො | 68 79 |
| අචිණ්ණූපගතොපි වා | 49 |
| අඤ්ඤාපදෙසං | 27 |
| අඤ්ඤත්‍ර සුපිනා | 29 |
| අඤ්ඤත්‍ර සමයා | 43 |
| අඤ්ඤාතිකාය | 41 |
| අත්තනොකාම පාරිචරියාය | 34 |
| අත්තනො ඝාතනෙ | 92 |
| අතිරිත්තං අකාරෙත්වා | 64 |
| අදින්නං | 5 |
| අධිට්ඨානං | 38 |
| අධිට්ඨානූපොසථො | 108 |
| අධොත අල්ලපාදෙහි | 88 |
| අද්ධානං | 92 |
| අනනුඤ්ඤාත කිච්චතො | 91 |
| අනාපුච්ඡිත මංසං ච | 76 |
| අනුඤ්ඤාතෙහි | 85 |
| අනුපසම්පන්නෙනෙව | 56 |
| අප්පවාරිත මඤ්ඤාති | 43 50 |
| අමූලන්තිම වත්ථූනා | 35 |
| අසමානාසනිකෙන | 84 |
| ආදාසාදිම්හි | 81 |
| ආපදං | 92 |
| ඉත්ථිං | 34 |
| ඉත්ථියං | 56 |
| ඉත්ථිරූපාදිං කාරෙය්‍යවා | 93 |
| ඉත්ථි සඤ්ඤී | 32 |
| උක්ඛිත්තානුපසම්පන්න නානා සංවාසකාදිනං | 82 |
| උච්චාසන මහාසනෙ | 82 |
| උද්දිස්ස කතකම්පිච | 76 |
| උදකෙ හසධම්මෙ | 68 |
| උපක්කමම | 28 32 |
| උපජ්ඣාචෙර වත්තං ච ගාමිකාගන්තුකම්පි ච | 98 |
| උපලාලනෙ | 94 |
| ඔමසන්තස්ස | 52 |
| කප්පබින්දුං | 69 |
| කප්පියං | 45 |
| කාලලකො | 93 |
| කායසංසග්ගරාගෙන | 31 |
| කුරුවින්දක සුත්තෙන | 79 |
| ගරුකං | 17 29 |
| ගරුකා | 71 |
| ගරුභණ්ඩං | 73 |
| චාවෙතු කාමො | 35 |
| ඡප්පදුත්තරිං | 57 |
| ඣානාදිභෙදං | 26 |
| ඤාතකඛණෙ | 27 |
| ඨපෙත්වා පාරිවට්ටකං | 63 |
| තිචීවරං | 40 |
| තිධා | 99 |
| තිපටිච්ඡන්නකං | 78 |
| ථෙය්‍යාය | 7 |
| ථුල්ලච්චයං | 73 |
| ද්විධා | 99 |
| දන්තකට්ඨොදකං විනා | 66 |
| දීඝාසනෙ | 84 |
| දීඝ කෙසධාරණෙ | 87 |
| දුක්කටං | 75 |
| දුබ්බල්ලං | 58 70 |
| දුබ්බල්ලවාචාස්සාදෙන | 32 |
| දෙසනාරොචනාදිම්හි | 90 |
| ධඤ්ඤං | 86 |
| නවකෙන භික්ඛුනා | 3 |
| නවචීවර | 70 |
| නාවෙරිතා | 104 |
| නිස්සග්ගියං | 38 |
| නිසජ්ජං | 67 |

| | පිට. | | පිට. |
|---|---|---|---|
| පඤ්චබන්ධනතො ඌන පත්තෙ සති | 48 | රතනං | 86 |
| පඤ්චවීසාවහාරෙසු | 7 | රතනත්තයං ආරබ්භ | 94 |
| පටිස්සවං | 91 | වදතු මං සංඝො | 114 |
| පඨවිඛණ අකප්පියං | 59 | වධකචෙතසා | 21 |
| පත්තං | 46 | වසෙ වස්සං | 91 |
| පත්තහත්ථකො | 95 | විඤ්ඤූපෙන්තස්ස | 43 |
| පමාණිකං | 46 | විඤ්ඤූං විනා | 57 |
| පරාජිකො | 24 | වියොජෙති | 22 |
| පරිණතං | 50 | වීහාදිරොපිමෙ | 87 |
| පරිණාමෙති | 51 | ලාභං | 50 |
| පරිකම්මකතං භිත්තිං | 89 | ලෙසමත්තං | 36 |
| පරිභණ්ඩන්තො | 96 | සංඝාටියා | 90 |
| පවාරණා | 104 | සංඝං භන්තෙ පවාරෙමි | 113 |
| පවාරණං දම්මි | 107 | සංඝිකං | 61 |
| පවාරෙත්වාන භොජනං | 63 | සචිත්තකමචිත්තකං | 103 |
| පවෙසනඝිතුඩාරපවිඡෙ | 4 | සන්දෙසං | 35 |
| පාරිසුද්ධිං | 106 | සත්ථකම්මෙ වත්ථිකම්මෙ | 74 |
| පාරිසුද්ධි උපොසථො | 110 | සන්තභික්ඛුං | 72 |
| පිටකත්තයං ධම්මං | 53 | සන්නිධි භොජනං | 65 |
| පුරාණචීවරම්පන | 42 | සන්නිමිත්තං | 5 |
| පෙසුඤ්ඤහරණෙ | 52 | සප්පිතෙලාදිකම්පන | 49 |
| භූතගාමං විකොපෙය්‍ය | 60 | සප්පිභත්තාදිකං | 66 |
| භූමියං | 95 | සම්පජාන මුසාවාදෙ පාචිත්තියං | 51 |
| මග්ගත්තයෙ | 5 | සම්බාධෙ | 88 |
| මඤ්චපීඨකා | 95 | සමයං විනා | 40 |
| මනුස්සපාණං | 20 | සයිත්වාන තිරත්තියං | 56 |
| මනුස්සජාතිස්ස | 27 | සහත්ථතො | 67 |
| මනුස්සිත්ථිං | 31 | සහධම්මිකො | 45 |
| මානුසං භණ්ඩං | 6 | සික්ඛිතුං | 3 |
| මාසකං | 43 | සිබ්බතො | 63 |
| මිස්සෙන්ත | 96 | සුණමානං | 33 35 |
| මූලසික්ඛං | 2 | සුරාමෙරය පානෙපි | 68 |
| මෙථුනං | 33 | සෙය්‍යං | 62 |
| මොචෙතුකාම චිත්තෙන | 28 | හත්ථපාසෙ ඨිතො | 99 |
| යථාක්කමං | 103 | හදයෙ අසන්තං | 27 |
| යාවමානො | 34 | | |
| යාවකාලිකං | 65 | | |


සංවණ්ණිත පදානුක්කමණිකාව

නිමි.

සිවමස්තු.

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 2 | 19 | තඳීපතො | තදීපතො |
| 2 | 25 | පජොතජ්ජාතං | පජ්ජොතාතං |
| 4 | 15 | පාරාජකාපාළි + | පාරාජිකපාළි |
| 4 | 27 | පරාජිකාවට | පාරාජිකාවට |
| 6 | 20 | සංඛං | සඞ්ඛං |
| 7 | 2 | විපයසීංශයි | විපයසීංසයි |
| 7 | 26 | දුකූලාවට + | දුකූලාවට |
| 8 | 4 | නිපති ආක්ඛිපති | නික්ඛිපති ආපතති |
| 8 | 11 | සිනින් | සිතින් |
| 12 | 5 | සාත්ථිහකාය | සාහත්ථිකාය |
| 15 | 10 | කාමම | කාමමං |
| 20 | 23 | මිණිස් + | මිනිස් |
| 21 | 13 | තත්‍යුත්පන්න | ප්‍රත්‍යුත්පන්න |
| 27 | 21 | පාරාජිකා නිදේශය | පාරාජිකානිදේශය |
| 31 | 28 | මණුස්සිත්ථිං | මනුස්සිත්ථිං |
| 33 | 31 | මාගකැයි | මාගමකැයි |
| 34 | 23 | 0 | 10 |
| 39 | 22 | නිස්සග්ගියං + | නිස්සග්ගියං |
| 58 | 5 | චිනා | විනා |
| 59 | 26 | මත්තීකා | මත්තිකා |
| 62 | 16 | භුම්මත්ථරණ | භුම්මත්ථරණං |
| 72 | 23 | ඔහට | ථුල්ලච්චයං (ඔහට) |
| 73 | 19 | විතීයාන්තයි | නපුංසක ප්‍රථමායි |
| 74 | 16 | සත්ථිකම්ම | සත්ථකම්ම |
| 88 | 5 | සඋපාහණේ + | සඋපාහණො |
| 100 | 25 | පරිසකාරචොළ | පරිසකාරචොළ |
| 106 | 29 | පවුරුණු | පවුරුණු |
| 107 | 1 | දම්මි | දම්මි |
| 107 | 7 | සුත්තෙනවා | සුත්තෙන වා |
| 107 | 28 | පටිගණ්හන්තන | පටිග්ගණ්හන්තන |
| 108 | 1 | සාධුසුඩු | සාධු සුඩු |
| 108 | 17 | කෙරෙමි | කරන්නෙමි |
| 109 | 24 | භිකුෂුන් | භික්ෂූන් |
| 111 | 29 | පරිසඬකෘයවා | පරිසඬකායවා |

+ මෙබඳු තැන් මෙසේම ශුද්ධියට පැමිණ විය යුතු.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු